

# පදසාධනය.



# PADASADHANA.

# පදසාධනය.

**පූජාචාර්‍ය්‍ය පියදස්සිමහාස්ථවිර පාදයන්වහන්සේ**
විසින් විරචිතයි.

දිඹුලාගල මේධඞ්කරාභිධාන මහායති
ශ්‍රේෂ්ඨයන්වහන්සේගේ ශිෂ්‍යවූ
**ආනන්දමහාස්ථවිර පාදයන්වහන්සේ විසින්**
ලියනලද ව්‍යාඛ්‍යානයෙන් සමුපලක්ෂිතයි.

**දෙඩන්දූවේ ධර්‍මසේන මහත්මයා විසින්**
සංශොධිතයි.

**සි. පී. ඇස්. ප්‍රේරා විසින්**
කොලඹ ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි
මුද්‍රණය කරවනලදී.

PUBLISHED BY
C. P. S. PERERA
PRINTED
AT THE LANKABHINAWA VISSRUTA PRESS, PETTAH,
COLOMBO.

**ශ්‍රී බුද්ධ වර්ෂ 2447.**

1905.

# සංඥාපනය.

## පදසාධනය.

මේ වනාහි මොග්ගල්ලායන ව්‍යාකරණ සම්බන්ධ පරිවාරග්‍රන්ථයන් අතුරෙන් ශ්‍රේෂ්ඨතර ග්‍රන්ථයබැව් මොග්ගල්ලායන ව්‍යාකරණ පරිශීලනයකළෝ එකහෙළා පිළිගනිති. මෙය මහා වෛයාකරණාචාර්ය්‍ය මොග්ගල්ලායන මහාසාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ පූජ්‍යාචාර්ය්‍ය පියදස්සිමහාස්ථවිර පාදයන්වහන්සේ විසින් විරචිතයි. මේ ප්‍රකරණයෙහි සන්දර්භය ගැණ සිතා බලනවිට මේ ප්‍රකරණ කර්තෘවරයන්වහන්සේ ස්වකීය ආචාර්ය්‍යයන් වහන්සේට වඩා ව්‍යාකරණ චාතුර්ය්‍යයෙන් කිසිසේත් ඌනනොවනබව සමීක්ෂ්‍යකාරී පණ්ඩිතයන්ට වැටහේමැයි. වෛයාකරණාඞ්ගයෙන් සම්පූර්ණවීමට ආසා ඇත්තවුන් විසින් මොග්ගල්ලායන ව්‍යාකරණ සම්බන්ධ පොත් ඉගෙනිය යුතුවේ. මොග්ගල්ලායන මහාසාමිපාදයන්වහන්සේ විසින් රචනාකළ මූලව්‍යාකරණය අසන්දිග්ධනිරාකුලතාදි ගුණයෙන් සමන්විතනමුදු බාලයන්ට එය අවබෝධකිරීම අතිශය දුෂ්කරබැව් මෙනෙහිකළ ආචාර්ය්‍ය පියදස්සි මහාස්ථවිරයන්වහන්සේ විසින් මේ ප්‍රකරණය මෙසේ රචනාකරණලද්දේයයි සිතිය යුතුයි. පරිවාර ග්‍රන්ථසහිත කාත්‍යායන ව්‍යාකරණ ඉගැනීමෙන්වත් සම්පූර්ණ ව්‍යාකරණාඞ්ගයෙන් යුක්තවීම කිසිසේත් නොකළහැකිවේ මක්නිසාදයත්? එහි ඇතැම් ව්‍යාකරණාඞ්ග සම්පූර්ණයෙන් දක්වා නැතිහෙයිනි. කාත්‍යායන ව්‍යාකරණ පමණක් උගත් ඇතැම්අය අපේ මේවචන ගැණ අපට අවමන්කිරීම වද කල්පනාකරන්මැයි. ඔවුන්ද මේ ව්‍යාකරණය නිසි ගුරුපදෙස ඇතිව ඉගෙනගත්තොත් අපේ මේ වචන සත්‍යබැව් ඔවුන්ටද වැටහේ. ලක්දිව ව්‍යාකරණ ශාස්ත්‍රය පසුබැසතිබුනු කාලයෙහි මේ ව්‍යාකරණ සම්බන්ධ පොත් සපයාගැනීම ඉතා දුෂ්කරව තිබුනුහෙයින්ද මේ සම්බන්ධකරුණු දැනගන්ට ඒ කාලයෙහි නොලැබීම හෙතුකොට ගෙනද මොග්ගල්ලායන ව්‍යාකරණය පුස්තකමාත්‍රයෙහි සිටියේයයි කියයුතුවේ. වර්තමාන කාලයෙහි උගත් කීපපලක් විසින් මේ ව්‍යාකරණය පරිශීලනයකරන්ට පටන්ගත්බැව් අපේ ආචාර්ය්‍යවරයන්ගෙන් දැනගනිමු. වර්තමාන කාලික සමහර පාරිවෙණිකාචාර්ය්‍ය වරයන්ද තවම මේ ව්‍යාකරණ සම්බන්ධ දැනගත්මක් නැතිව සිටිනබැව් නොයෙක් වතාවලදී අපට දැනගන්ට ලැබුනේය. මේ පදසාධන ව්‍යාඛ්‍යානයද දිඹුලාගල මේධඞ්කරාභිධාන මහායතිශ්‍රේෂ්ඨයන්වහන්සේගේ ශිෂ්‍යවූ ආනන්දනම් මහාස්ථවිරයන්වහන්සේ විසින් විරචිතබැව් එම ව්‍යාඛ්‍යානයේ අවසාන ගාථාවලින් පෙනේ. පදසාධනයට ටීකා ලියූ ෂඩ්භාෂා පරමේශ්වරාචාර්ය්‍ය තොටගමුවේ ශ්‍රීරාහුල සඞ්ඝරාජසාමිපාද

යන්වහන්සේ විසින් මේ සන්නය ගරුවශයෙන් සලකා ඊබෙනබැව් ඒ ටීකාවෙන් පෙණේ. ඒ කාරණයම මේ ව්‍යාඛ්‍යානයෙහි ප්‍රෞඪත්වයට සාක්ෂිවේ. එකම ආචාරීන් විසින් ලියනලදැයි ප්‍රසිද්ධියට පැමිණි පදසාධන ව්‍යාඛ්‍යාන දෙකක්ම දක්නාලැබේ. එකක සමාස කාණ්ඩය අවසන්කොටඇති ප්‍රථම භාගය බෙහෙවින් පදැපී පමණක් දක්වමින් ලියනලද්දේය. අනික පදරූපසිද්ධි දැක්වීමෙන් මුල පටන් අග දක්වාම සවිස්තරව ලියනලද්දේය. මුලින් කී ව්‍යාඛ්‍යානයේ අවසානභාගයද අනින් පොතේ අවසානභාගය හා එකකාරමැයි. මේ නිසා මේ පොතේ අවසානභාගය ලුප්තවීමෙන් අනින් පොතේ අවසානභාගය මිට යොදගන්නාලද්දේයයි සමහර පණ්ඩිතයන්ගේ මතයි. මූලභාගයට වඩා අවසානභාගයෙහි පදරූපසිද්ධි අවබොධකිරීම බාලයන්ට දුෂ්කරයයි සිතූ ආචාරීන් විසින් අවසානභාගයෙහි රූපසිද්ධි දක්වනලද්දේය. ප්‍රථම භාගයෙහි බෙහෙවින් පදවී පමණක් දක්වනලද්දේය. පසුකලකදී යම්කිසි උගතෙකු විසින් අවසානභාගයට සුදුසු පරිද්දෙන් මූලභාගයද ලියා එය වෙන සන්නයක් ලෙස පිළියෙළකරණලද්දේයයි සමහර උගතුන්ගේ මතයි.

එබැවින් අපිදු සංක්ෂිප්ත ප්‍රථම භාගඇති ව්‍යාඛ්‍යානය මේ සමග යොද මුද්‍රණයකරවීමු.

සාලියකෙනගකරෙහ සුධාකරස්මිං
සද්දත්ථභෙදනිපුණො සිරිධම්මසෙනො
ව්‍යාඛ්‍යංඉමංලිපිකරබ්භමදෙසදුඪං
සංසොධයී සපදසාධනමත්ථසුඩං.

## ශුද්ධි පත්‍රය.

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 7 | 29 | විසින් විසින්ද | විසින්ද |
| 15 | 3 | පරෙසවසං | පරෙසෙවසං |
| ,, | 17 | පච්චසත්‍යා | පච්චාසත්‍යා |
| 24 | 25 | විජ්ජාමානස්ස | විජ්ජමානස්ස |
| 27 | 29 | අනරාකතීය | අනිරාකතීය |
| ,, | 32 | බුද්ධාංසම් | බුද්ධංසමා |
| 31 | 13 | සෙවුනා | සෙවනා |
| ,, | 14 | සුළුවූයේ | සුලුවූයේ |
| 32 | 4 | එකෙච්ච | එකච්ච |
| 33 | 34 | ආදෙශො | ආදෙසො |
| 36 | 36 | අම්හි | අංම්හි |
| 37 | 29 | අත්තඅතුමානො | අත්තආතුමානො |
| 40 | 35 | නොහෙති | නොහොති |
| 41 | 12 | අම්හ් | අංම්හි |
| 48 | 31 | යොලොපනසුදිසො | යොලොපනිසුදිසො |
| 51 | 6 | ජන්තුහෙනවිසපෙහිවා | ජන්තුහෙත්විසපෙහිවා |
| ,, | 10 | හො | හොති |
| 53 | 15 | වෙවෙසු | වෙවොසු |
| 54 | 7 | නම්හ් | නාංම්හි |
| ,, | 9 | නම්හි | නාංම්හි |
| ,, | 24 | යොම්හිවාක්විචිති | යොම්හ්වාක්වචිති |
| 56 | 8 | ආරබ්ධාදෙෙසම්හා | ආරබ්ධාදෙසම්හා |
| 58 | 30 | ඩයනු | ඞයනු |
| 61 | 30 | වත්තමනො | වත්තමානො |
| 63 | 19 | ඉවජාණුණෑණා | ඉවණාණුවණ්ණා |
| 70 | 32 | අභිභූසයම්භූ ධම්මසද්ද යත | අභිභූසයම්භූධම්මසද්දෑ<br>අභිභූසයම්භූධම්මසද්දෑ යත |
| 72 | 31 | පසද | පසංද |
| 74 | 4 | සබ්බයමං | සබ්බසමං |
| 77 | 12 | අසස | අස්සා |
| 81 | 2 | ත්වමඃම්හි | ත්වමංම්හි |
| ,, | 25 | ත්වමම්හි | ත්වමංම්හි |
| 88 | 15 | විභත්තික්‍රමයෙක් | විභත්තික්‍රමයේන් |
| 89 | 2 | පුමෙනයා වත්තාරො | පුමෙනයොවත්තාරො |
| 91 | 30 | එව | එවං. |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 92 | 12 | සඞ්ඛ්‍යාවචාචී | සඞ්ඛ්‍යාවාචී |
| 95 | 31 | චිත්තාළිසති | චිවත්තාළිසති |
| 96 | 7 | යාගමො | යාගමෙ |
| 99 | 26 | අයනු | අංයනු |
| 106 | 35 | අංහොන් | අන්හොනි |
| ,, | ,, | අංයනාදෙශ | අන්යනාදෙශ |
| ,, | 36 | අංහොනි | අන්හොනි |
| ,, | ,, | අංයනාදෙශ | අන්යනාදෙශ |
| 107 | 18 | කුබ්‍රාහ්මණනම්වේ | { කුබ්‍රාහ්මණො, කුබ්‍රාහ්මණ නම්වේ |
| 110 | 22 | මත්ත | මත්තා |
| 111 | 25 | ධවකදිරපලාසනම්වේ | { ධවඛදිරපලාසං, ධවඛදිර පලාසනම්වේ |
| 113 | 5 | ආපදිත්තා | ආපාදිත්තා |
| 115 | 22 | ඉත්ථිපපච්චයනතා | ඉත්ථිපපච්චයනතා |
| 117 | 2 | ඉත්ථිපපච්චනතා | ඉත්ථිපපච්චයනතා |
| ,, | 3 | අළුණදයො | අළුණාදයො |
| 118 | 18 | රසචි | රාසචි |
| ,, | 20 | රසවපච්චං | රසවපච්චං |
| ,, | 21 | රසවපච්චං | රසවපච්චං |
| 120 | 27 | ගරුසිමාතාවගේ | ගරුධමාතාවගේ |
| ,, | 28 | කතන්තියා | කතන්තිකා |
| 126 | 36 | අධිනෙයතහෝ | අධිනෙයනුහෝ |
| 127 | 17 | විධානයෙහි | විධානයෙකි |
| 131 | 32 | චතුපි | චතුෂි |
| 140 | 15 | එකාය ආකිය | එකායකය ආකිය |
| 141 | 9 | ඩසතිසස | ඩෙසතිසස |
| ,, | 32 | චිපදයි | ත්‍රිපදයි |
| 143 | 8 | පසසායං | පසංසායං |
| ,, | 15 | ඉනතන්හි | යනතන්හි |
| 144 | 2 | පඨමනෙතතො | පඨමනතතො |
| 152 | 4 | අභූතබනාව | අභූතතබනාව |
| 158 | 13 | හොනනිති | හොනතීති |
| 159 | 13 | සමපුපනවූ | සමප්‍රාපනවූ |
| 160 | 8 | අසසානාපිමහි | අසසාණාපිමහි |
| ,, | 11 | කවණි | කවණි |
| ,, | 26 | සමපුපනවූ | සමප්‍රාපනවූ |

| පිට | පේළි | අශුඬ | ශුඬ |
|---|---|---|---|
| 161 | 6 | හවන්තයාදිකූපමානා | හවන්තයාදිතූපමානා |
| ,, | 12 | ඒඕනං, ඒකාරඕකාර, | එඔනං, එකාරඔකාර |
| 168 | 26 | ෂඨිසමාස | ෂෂ්ඨීසමාස |
| 173 | 35 | ඉච්චස්සං | ඉච්චස්ස |
| 175 | 32 | අප්‍රප්ත්‍ය | අප්‍රාප්තිය |
| 176 | 4 | ත්‍යාදසො | ත්‍යාදයො |
| ,, | 6 | වෙහ | වෙහ |
| 179 | 1 | රෙන්තන්තීනං | රෙනෙන්තන්තීනං |
| 180 | 20 | ආඊස්ස | අඊස්ස |
| 181 | 33 | ඊආදයො හොන්ති,<br>ඊආදිප්‍රත්‍යයෝවෙත් | ඊආදයො හොන්ති, ඊ ආදි ප්‍රත්‍යයෝවෙත්; භූතානජ්ජතනෙ, භූතානද්‍යතනයෙහි වක්ඛමානත්තා, ආ ඌ ආදි වූද; අඌ ආදිවූද ප්‍රත්‍යයන් ගේ වක්‍ෂ්‍යමාණබව හෙතු කොටගෙන; ඉමෙ, මේ ඊ ආදිහු |
| 186 | 35 | අපපච | පපච |
| 188 | 16 | අයිහුස්ස අයිහුස්සා | අහුයිස්ස. අහුයිස්සා |
| ,, | 21 | ස්සාදයො හොන්ති,<br>ස්සාදිප්‍රත්‍යයෝවෙත් | ස්සාදයො හොන්ති විභාසා, විකල්පයෙන් ස්සාදි ප්‍රත්‍යයෝවෙත්. |
| ,, | 28 | සම්භවයක් | සම්භවයක් |
| 189 | 7 | එය්‍යුංසසිං | එය්‍යුංසසුං |
| 191 | 19 | පන්තං, පාත්‍රය | හන්තං, බත |
| 192 | 33 | ණිණ්‍යපන්තා | ණිණාප්‍යන්තා |
| 194 | 20 | ලවිකරණලද | ලවිකරණද |

**සන්න සහිත**

# පදසාධනය.

---

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

බුද්ධම්බුජං නමස්සිත්වා සද්ධම්මමධු භාජනං
ගුණාමොදපදං සඞ්ඝ මධුබ්බතනිසෙවිතං.

මොග්ගල්ලායනාචරිය වරඤ්ච* යෙන ධීමතා
කතං ලහුමසන්දිද්ධමනූනං සද්දලක්ඛණං.

---

බුද්ධම්බුජං මොග්ගල්ලායනාචරියවරඤ්ච නමස්සිත්වා පදසාධනං ආරභිස්සං. යනුමෙහි ක්‍රියා කාරක පදසම්බන්ධයි

බුද්ධම්බුජං, සර්වඥ නැමති පද්මයද; මොග්ගල්ලායනාචරිය වරඤ්ච, මොග්ගල්ලායනනම්වූ ආචාර්‍ය්‍යොත්තමයාද; නමස්සිත්වා, වැඳ; පදසාධනං, පදසාධනනම්වූ ප්‍රකරණය; ආරභිස්සං, පටන්ගනිම්. කිංවිසිට්ඨං බුද්ධම්බුජං මොග්ගල්ලායනාචරිය වරඤ්ච නමස්සිත්වා කිම්භූතං පදසාධනං ආරභිස්සසීති, මේ කිමකින් විශිෂ්ටවූ සර්වඥනැමති පද්මයද මෞද්ගල්‍යායන නම්වූ ආචාර්‍ය්‍යොත්තමයාද වැඳ කෙබඳු පදසාධනනම්වූ; ප්‍රකරණයක් කියන්නෙහිදයත්?

සද්ධම්ම, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මනැමති; මධු, පුෂ්පරසයට; භාජනං, ආධාරවූ; ගුණ, ශීලසමාධ්‍යාදි ගුණ නැමති; ආමොද, සුගන්ධයට; පදං, පිහිටවූ; සඞ්ඝ, අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝනැමති; මධුබ්බත, භෘංගයන් විසින්; නිසෙවිතං සෙවුනාලද; බුද්ධම්බුජඤ්ච, සර්වඥනැමති පද්මයද; ධීමතා, ප්‍රශස්තවූ බුද්ධිඇති; යෙන, යම් ආචාර්‍ය්‍යොත්තමයකු විසින්; ලහුං, අල්පග්‍රන්ථ ප්‍රතිපත්තිවශයෙන් ලඝුවූ; අසන්දිද්ධං, අනාකූල ප්‍රසිද්ධ වචනයෙන් කියනලද හෙයින් සන්දෙහ රහිතවූ; අනූනං, අශෙෂලක්ෂණ පරිග්‍රහකළ හෙයින් සම්පූර්ණවූ; සද්දලක්ඛණං, ශබ්දානුශාසනයෙක්; කතං, කරණලදද; තං මොග්ගල්ලායනාචරියවරඤ්ච, ඒ මෞද්ගල්‍යායන නම්වූ ආචාර්‍ය්‍යොත්තමයාද; නමස්සිත්වා, කායාදිවාරත්‍රයෙන් සකසා වැඳ...... මොග්ගල්ලායන, මෞද්ගල්‍යායන නම්වූ; සද්ද, ශබ්දශාස්ත්‍ර නැමති; රත්නාකර,

---

* චකාරොවුත්තප්පකාරෙන බුද්ධම්බුජෙන සද්ධිං මාගධස්ස සද්දලක්ඛණස්ස කත්තාර මාචරියං නමනක්‍රියාය සම්පිණ්ඩෙතීති කෙචි වදන්ති. අයමෙපනෙත්ථ අම්හාකං ඛන්ති ච සදෙදෘහි ජිනදත්තො ආගතො තස්ස පුත්තොච ආගතොති ආදිසු විය අනුවාචකත්තො දට්ඨබ්බොතියනු ටීකායි.

ආරභිස්සං සමාසෙන බාලත්‍ථං පදසාධනං
මොග්ගල්ලායන සද්දත්‍ථරතනාකරපද්ධතිං.
සඤ්ඤාපරිග්ගහෙනෙව ලක්ඛණෙසු සරාදයො
ඤායන්තීති තමෙවාදෙ දස්සයිස්සං විභාගතො.

**අආදයො තිතාලීස වණ්ණා.**

ජිනවචනානුරූපා අකාරාදයො නිග්ගහීතන්තා තෙචත්තාලීසක්ඛරා පච්චෙකං වණ්ණා නාම හොන්ති—යථා—අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං ඉති—කකාරාදීස්වකාරො උච්චාරණත්‍ථො—වණ්ණීයති අත්‍ථො එතෙහීති වණ්ණා—අආදි මරියාදභූතො යෙසං තෙ අආදයො.

---

රුවන් ආකාරයට; පද්ධතිං, මාර්ගයක්බඳුවූ හෙවත් නොටවූ; බාලත්‍ථං, අව්‍යුත්පන්නජනයා ප්‍රයොජනකොට; පදසාධනං, පදසාධනනම්වූ ප්‍රකරණය, සමාසෙන, විස්තරමධ්‍යමහැර සංක්‍ෂෙපයෙන්; අහං, මම; ආරභිස්සං, ප්‍රකෘති ප්‍රත්‍යයාදි විභාග කල්පනාදි වශයෙන් කථනය කෙරෙමි හෙවත් කියමි—ලක්ඛණෙසු, "සරොලොපොසරෙ" යනාදී ඒ ඒ සූත්‍රප්‍රදෙශවල්හි දක්වනලද; සරාදයො, ස්වරාදි සංඥීහු; සඤ්ඤාපරිග්ගහෙනෙව, සංඥාව ගෙ පිරිසිඳ ගැන්මෙන්ම; ඤායන්තීති, දන්නා ලැබෙත්නුයි; තමෙව, ඒ ස්වරාදී සංඥාවම; ආදෙ, ප්‍රකරණාදියෙහි; විභාගතො, විභාගහෙයින් හෙවත් වෙන්වෙන්කොට; දස්සයිස්සං, දක්වමි—

අආදයො තිතාලීස වණ්ණායනු—වර්ණසංඥාවිධාන සූත්‍රයි. අආදයො යනු සංඥී නිර්දෙශ ප්‍රථමා බහුවචනාන්ත පදය; තිතාලීස යනු සංඥිවිශෙෂණවූ සංඛ්‍යානිර්දේශ ප්‍රථමෛක වචනාන්ත පදය; වණ්ණායනු සංඥානිර්දේශ ප්‍රථමා බහු වචනාන්තපදයි—ජිනවචන, සර්වඥ වචනයට හෙවත් ත්‍රිපිටක බුද්ධවචනයට; අනුරූප, සුදුසු හෙවත් අනුකූලවූ; අකාරාදයො, අකාරයා ආදිකොට ඇති; නිග්ගහීතන්තා, නිග්ගහීතයා අන්තකොට ඇති; තෙචත්තාලීසක්ඛරා, තෙසාලිසක් පමණ අක්‍ෂරයෝ; පච්චෙකං, අවයව හෙයින් වෙනවෙනම; වණ්ණා නාමහොන්ති, වර්ණයෝ නම්වෙත්; තං යථා, ඔහු කවරහ යත්, අආ—පෙ—අං ඉති? අං යන මොහුයි—කකාරාදීසු, කකාරාදීන් කෙරෙහි; අකාරො, අකාරතෙම; උච්චාරණත්‍ථො, සුඛොච්චාරණය ප්‍රයොජනකොට ඇත්තේයි. අත්‍ථො, සංවෘති පරමාර්ථ ප්‍රභෙදවූ අර්ථ යතෙම; එතෙහි, මේ අආද්‍යක්‍ෂරයන් කරණකොටගෙණ; වණ්ණීයතීති, වර්ණනාකරනුලැබේනුයි; වණ්ණා, වර්ණයෝ නම්වෙත්.

අ, අකාරතෙම; ආදියයිසේයි මරියාදභූතො, හිම්වූයේ හෙවත් උපලක්‍ෂණවූයේ යෙසං, යම්වර්ණකෙනෙකුන්ටද; තෙ, ඔහු; අආදයො,

අආදයොති වත්තතෙ යාව "බින්දුනිග්ගහීතන්ති", තඞ්ඛො අත්ථවසා විභත්තිවිපරිණාමොති සත්තම්‍යන්තමභිසම්බජ්ඣීයතෙ.

**දසාදො සරා.**

අආදිසවාදිම්හි නිද්දිට්ඨා ඔදන්තා දසවණ්ණා සරා නාම හොන්ති, යථා අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ—සරන්ති පවත්තන්තීති සරා—දසාදොති වත්තතෙ තීසු වක්ඛමානෙසු.

**ද්වෙ ද්වෙ සවණ්ණා.**

අආදිසවාදිමෙසු දසසු ද්වෙ ද්වෙ සවණ්ණා නාම හොන්ති යථාක්කමං, යථා–අආ ඉති, ඉඊ ඉති, උඌ ඉති, එඒ ඉති, ඔඕ ඉති–සමානා සදිසා වණ්ණා සවණ්ණා–සමානත්තඤ්ච ඨානතො.

---

අකාරාදීහු නමවෙත්. බින්දුනිග්ගහිතං ඉති, බින්දුනිග්ගහිතං යන සූත්‍රය; යාව, යම්තාක්ද; තාව, ඒතාක්; අආදයො ඉති, අආදයො යනු; වත්තතෙ, වැටේ; තඞ්ඛො, ඒඅනුවෘත්තිත ප්‍රථමාන්ත පදයද වනාහි; අත්ථවසා, අර්ථවශයෙන් හෙවත් අන්‍යථානුපපත්තිලක්‍ෂණවූ අර්ථබලයෙන්, විභත්ති විපරිණාමොති; විභක්තියගේ පෙරළීමනුයි, සත්තම්‍යන්තං, සප්තමී විභක්ති අන්තවූයේ; අභිසම්බජ්ඣීයතෙ, මතු මතු සූත්‍රහා සම්බන්ධකරනුලැබේ.

දසාදොසරා යනු ස්වරසංඥාවිධාන සූත්‍රයි–දසයනු–සංඛ්‍යා නිර්දේශ ප්‍රථමා බහු වචනාන්ත පදය, ආදොයනු සප්තම්‍යෙකවචනාන්තපදය, සරායනු සංඥානිර්දේශ ප්‍රථමා බහුවචනාන්තපදයි.

අආදිසු, අකාරාදීන් විෂයෙහි; ආදිම්හිනිද්දිට්ඨා, ආදියෙහිදක්වනලද; ඔදන්තා, ඔකාරයා අන්තකොටඇති; වණ්ණාදස, වර්ණයෝදස දෙන; සරානාම හොන්ති, ස්වරයෝනම්වෙත්; යථා, ඔහුකවරහයත්? අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ යන මොහුයි—සරන්ති යයි සේයි පවත්තන්ති ඉති, තම තමන්ගේ ප්‍රධානභාවයෙන් පවතිත්නුයි; සරා, ස්වරයෝ නම්වෙත්; වක්ඛමානෙසුතීසු, මතු කියනු ලබන සූත්‍රතුනෙහි; දසාදො ඉති, දසාදොයනු; වත්තතෙ, වැටේ.

ද්වෙද්වෙ සවණ්ණායනු, සවර්ණසංඥා විධානසූත්‍රයි; ද්වෙද්වෙයනු ප්‍රථමාබහු වචනාන්තපදය-සවණ්ණායනු ප්‍රථමාබහු වචනාන්තපදයි— අ ආ දිසු, අකාරාදීන් කෙරෙහි; ආදිමෙසුදසසු, ආදියෙහිදක්වනලද ස්වරයන් දසදෙනා අතුරෙන්; ද්වෙ ද්වෙ, දෙදෙනෙක් දෙදෙනෙක්; යථාක්කමං, පනාතීන්; සවණ්ණානාමහොන්ති, සවර්ණයෝනම්වෙත්; යථා, ඔහු කවරහ; අආ ඉති, අආ යන දෙදෙනය; ඉඊ ඉති, ඉඊ යන දෙදෙනය; උඌ ඉති උඌ යන දෙදෙනය, එඒ ඉති, එඒ යන දෙදෙනය; ඔ ඕ ඉති, ඔඕ යන දෙදෙනයි. සමානා, සමානයයි සේයි, සදිසා; සදෘශවූ; වණ්ණා, වර්ණයෝ; සවණ්ණා, සමාන වර්ණයෝ නම් වෙත්; සමානත්තඤ්ච, වර්ණයන්ගේ එක සමානබවද; ඨානතො උත්ප

ඡ වණ්ණානං හි උප්පත්තිට්ඨානානි කණ්ඨතාලුමුද්ධදන්තොට්ඨනා සිකාවසෙන තෙසු අවණ්ණකවග්ගහානං කණ්ඨො ඨානං භවති ඉවණ්ණ චවග්ගයානං තාලු ටවග්ගරළානං මුද්ධා තවග්ගලසානං දන්තා උවණ්ණපවග්ගානං ඔට්ඨා එවණ්ණස්ස කණ්ඨතාලු ඔවණ්ණස්ස කණ්ඨොට්ඨං වකාරස්ස දන්තොට්ඨං—නිග්ගහීතස්ස නාසිකා ඞඤණ නමානං සකට්ඨානං නාසිකා ච.

වෙවේ'ති. වත්තතෙ.

---

ත්තිස්ථාන හෙයිනි; හි, එසේමැයි; වණ්ණානං, අක්‍ෂරයන්ගේ; උප්පත්තිඨානානි, උත්පත්තිස්ථානයෝ; කණ්ඨ, කණ්ඨය; තාලු, තල්ලය; මුද්ධ, මුදුනය; දන්ත, දන්තය; ඔට්ඨ, ඔෂ්ඨය; නාසිකාවසෙන, නාසිකාවය යනමොවුන්ගේ වශයෙන්; ඡ, සදෙනෙකි-තෙසු, ඒඋත්පත්තිස්ථානයන් සදෙනා අතුරෙන්; අවණ්ණ, අවර්ණය; හෙවත් අආ යන දෙදෙනය; කවග්ග, කවර්ගීය හෙවත් ක ඛ ග ඝ ඞය; හානං, හකාරය යන මොවුන්ට; කණ්ඨො, කණ්ඨයතෙම; ඨානංභවති, උත්පත්තිස්ථානයවේ—ඉවණ්ණ, ඉවර්ණය; හෙවත් ඉඊ යන දෙදෙනය; චවග්ග, චවර්ගීය හෙවත් ච ඡ ජ ඣ ඤය; යානං, යකාරය යනමොවුන්ට; තාලු, තල්ල; ඨානංභවති, උත්පත්තිස්ථානයවේ—ටවග්ග, ටවර්ගීය හෙවත් ට ඨ ඩ ඪ ණ ය; රළානං, රකාරළකාරය යනමොවුන්ට මුද්ධ, මුදුන; ඨානං භවති උත්පත්තිස්ථානයවේ-තවග්ග, තවර්ගීය හෙවත් තථදධනය; ලසානං, ලකාර සකාර යන මොවුන්ට; දන්තා, දන්තයෝ; ඨානං භවති, උත්පත්තිස්ථානයවේ.

උවණ්ණ, උවවර්ණය හෙවත් උ ඌ යන දෙදෙනය පවග්ගානං, පවර්ගීය හෙවත්; ප ඵ බ භ ම ය යන මොවුන්ට; ඔට්ඨා, ඔෂ්ඨවය; ඨානං, භවති, උත්පත්තිස්ථානයවේ—එවණ්ණස්ස; එවර්ණයහට හෙවත් එ ඒ යන දෙදෙනහට; කණ්ඨතාලු; කණ්ඨයහා තල්ල; ඨානං භවති, උත්පත්තිස්ථානවේ—ඔවණ්ණස්ස, ඔවර්ණයහට හෙවත් ඔඕ යන දෙදෙනහට; කණ්ඨොට්ඨා; කණ්ඨයහා ඔෂ්ඨවය; ඨානංභවති; උත්පත්තිස්ථානවේ—වකාරස්ස, වකාරයහට; දන්තොට්ඨා; දන්තයන් හා ඔෂ්ඨවය; ඨානංභවති, උත්පත්තිස්ථානවේ—නිග්ගහීතස්ස; නිග්ගහීතයහට; නාසිකා; නාසිකාතොමෝ; ඨානංභවති; උත්පත්තිස්ථානයවේ—ඞ ඤ ණ නමානං, ඞ ඤ ණ න ම යන මොවුන්ට; සකට්ඨානං; තම, තමන්ට කීස්ථානයද; නාසිකාච, නාසිකාවද ඨානං භවති උත්පත්තිස්ථානවේ— වෙ වෙ ඉති, වෙ වෙ යනු වත්තතෙ, වැටේ.

**පුබ්බො රස්සො.**

තෙසේවව දසසු යෙ වෙ වෙ සවණ්ණා තෙසු යො යො පුබ්බො සො සො රස්සසඤ්ඤො හොති-යථා අ ඉ උ එ ඔ.

තෙසු සංයොග පුබ්බාව දිස්සන්ති වෙ පනන්තිමා,
දීපෙතුං තඤ්ච සාධුත්තං තෙසම්පි ඉධ සඞ්ගහො.

රස්සකාලයොගා තබ්බන්තතාය වා රස්සා තථාදිස්සා ඉධාපි වෙ වෙති වත්තතෙ.

**පරො දීඝො.**

අආදිස්වාදිභූතෙසු දසසු යෙ වෙ වෙ සවණ්ණා තෙසු යො යො පරො සො සො දීඝසඤ්ඤො හොති-යථා-ආ ඊ ඌ ඒ ඕ.

---

පුබ්බොරස්සො යනු හ්‍රස්වසංඥවිධාන සූත්‍රයි; පුබ්බො යනු ප්‍රථමෛකවචනාන්ත පදය; රස්සො යනු ප්‍රථමෛක වචනාන්තපදයි; තෙස්වෙවදසසු; එමස්වරයන් දසදෙනා අතුරෙහි; සවණ්ණා, සමාන වර්ණවූ; යෙවෙවෙ, යම් ස්වරයෝ දෙදෙනෙක් දෙදෙනෙක් ඇද්ද; තෙසු, ඔවුන්අතුරෙහි; යොයො, යමෙක් යමෙක්තෙම; පුබ්බො; පූර්වද; සොසො, හෙතෙම හෙතෙම; රස්සසඤ්ඤොහොති; හ්‍රස්වසංඥ ඇත්තේවේ-යථා, ඔහු කවරහයත් ?-අ ඉ උ එ ඔ යන මොහුයි-තෙසු, එහ්‍රස්වාක්‍ෂරයන් පස්දෙනා අතුරෙහි; අන්තිමාවෙපන, අන්තයෙවූ එ ඔ දෙදෙන වනාහි; සංයොගපුබ්බාව; සංයොගයක්හට පූර්වවූවාහුම; දිස්සන්ති, හ්‍රස්වාක්‍ෂරයයි දක්නාලැබෙති; තඤ්ච, එසංයොග පූර්වවිෂයෙහි; සාධුත්තං, නිෂ්පන්නබව; දීපෙතුං, ප්‍රකාශකරනුපිණිස; තෙසම්පි, එම දෙදෙනාගෙද ඉධ, මෙ මෞද්ගල්‍යායන ව්‍යාකරණයෙහි; සංගහො, සංග්‍රහයතෙම; (කතො, කරණලදී) රස්සකාලයොගා, හ්‍රස්වකාලය හා යෙදීමෙන් හෝ; තබ්බන්තතායවා, ඒ හ්‍රස්වකාලය ඇති බැවින්හෝ; රස්සා, හ්‍රස්වාක්‍ෂරයෝ නම්වෙත්; නිමෙෂොන්මෙෂයන් අතුරෙන් එක්තරා කාලයක්හා සමවූකාලය හ්‍රස්වකාලනම්; ඒහ්‍රස්වකාලයෙන් යුක්තවූ හෙයින් හෝ එහ්‍රස්වකාලය ඇති බැවින් හෝ එහ්‍රස්වකාලයෙන් යුක්තවූ උච්චාරණයඇති වර්ණයෝ හ්‍රස්වනම්වෙයි යනුභාවයි-තථා දීඝා, දීර්ඝාක්‍ෂරයෝද; තථා එසේමැයි; එබඳුනිමෙ ෂොන්මෙෂ දෙකින් යුක්තවූයේ දීර්ඝය යනුභාවයි—ඉධාපි, මේ මතුකියනු ලබන සූත්‍රයෙහිද; වෙ වෙ යනු; වත්තතෙ, වැටේ.

පරොදීඝො යනු දීර්ඝසංඥ විධාන සූත්‍රයි. පරොයනු ප්‍රථමෛක වචනාන්තපදයි—දීඝො, යනු ප්‍රථමෛක වචනාන්ත පදයි—අ ආ දීසු, අකාරාදීන්ංකෙරෙහි; ආදිභූතෙසු දසසු, ආදියෙහි දක්වනලද

**කාදයො බ්‍යඤ්ජනා.**

අආදිසු කාදයො නිග්ගහිතපරියන්තා තෙත්තිංස බ්‍යඤ්ජනා නාම හොන්ති-යථා-ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං—බ්‍යඤ්ජියති අත්‍ථො එතෙහීති බ්‍යඤ්ජනා, කාදයොති වත්තතෙ.

**පඤ්ච පඤ්චකා වග්ගා.**

අආදිසු කකාරාදයො මකාරන්තා පඤ්ච පඤ්චකා වග්ගා නාම හොන්ති යථා-කඛගඝඞ, චඡජඣඤ, ටඨඩඪණ, තථදධන, පඵබභම, වජ්ජෙන්ති යකාරාදයොති වග්ගා.

---

ස්වරයන් දසදෙනා අතුරෙහි; සවණ්ණා, සමානවර්ණවූ; යෙවෙවෙ, යම්ස්වරයෝ දෙදෙනෙක් දෙදෙනෙක් ඇද්ද; තෙසු, ඔවුන් අතුරෙහි; යොයොපරො, යමෙක් යමෙක්පරද; සො සො, හෙතෙම හෙතෙම; දීඝසඤ්ඤොහොති; දීර්ඝසංඥ ඇත්තේවේ-යථා, ඔහුකවරහ?; ආ ඊ ඌ ඒ ඕ යන මොහුයි.

කාදයොබ්‍යඤ්ජනා යනු බ්‍යඤ්ජන සංඥාවිධානසූත්‍රයි. කාදයො, යනු ප්‍රථමා බහු වචනාන්තපදය; බ්‍යඤ්ජනා; යනු ප්‍රථමා බහු වචනාන්තපදයි; අ ආ දීසු; අකාරාදීන් කෙරෙහි; කාදයො, කකාරයා ආදිකොට ඇති; නිග්ගහිත පරියන්තා නිග්ගහිතයා අවසන්කොට ඇති; තෙත්තිංස, තෙතිස්දෙන; බ්‍යඤ්ජනා නාමහොන්ති, බ්‍යඤ්ජනයෝ නම්වෙත්; යථා, ඔහුකවරහ?; ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ—පෙ—අං ඉති, අං යන මොහුයි—එතෙහි, මේ කකාරාද්‍යක්ෂරයන් කරණකොට ගෙන; අත්‍ථො, අර්ථයතෙම; බ්‍යඤ්ජියතීති, ප්‍රකාශකරනු ලැබේනුයි; බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනයෝ නම්වෙත්—කාදයො ඉති, කාදයෝ යනු; වත්තතෙ, වැටේ.

පඤ්ච පඤ්චකාවග්ගා යනු වර්ග සංඥාවිධාන සූත්‍රයි; පඤ්ච, යනු ප්‍රථමා බහුවචනාන්ත පදය; පඤ්චකා, යනු ප්‍රථමා බහුබහුවචනාන්තපදය; වග්ගා, යනු ප්‍රථමා බහුවචනාන්ත පදයි—අකාරාදිසු, අකාරාදීන් කෙරෙහි කකාරාදයො, කකාරය ආදිකොට ඇති; මකාරන්තා, මකාරය කෙළවරකොට ඇති; පඤ්ච පඤ්චකා, පඤ්චකයෝ පස්දෙන, වග්ගා නාමහොන්ති, වර්ගයෝනම්වෙත්—යථා, ඔහුකවරහ ?—ක ඛ ග ඝ ඞ —පෙ—ප ඵ බ භ ම යන මොහුයි; යකාරාදයො, යකාරාදීන්; වජ්ජෙන්තීති, දුරුකෙරෙත්නුයි; වග්ගා, වර්ගාක්ෂරයෝ නම්වෙත්.

බින්දුනිග්ගහිතං යනු නිග්ගහිත සංඥ විධාන සූත්‍රයි; බින්දුයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත රූසී පදය; නිග්ගහිතං යනු ප්‍රථමෛක වචනාන්ත පදයි; අකාරාදිසු, අකාරාදීන් කෙරෙහි; බින්දු මත්තො,

**බින්දු නිග්ගහීතං.**

අකාරාදිසු යවායං වණ්ණො බින්දුමත්තො සො නිග්ගහිතසඤ්ඤො හොති; රස්සසරං නිස්සාය ගහිතමුච්චාරිතං නිග්ගහීතං.

**සඤ්ඤා විධානං.**

——oo——

සන්ධි වුච්චතෙ.

පුරිස උත්තමො, පඤ්ඤා ඉන්ද්‍රියං, සති ආරක්ඛො, හොගී ඉනෙදුව කබු ආයතනං, අභිභූ ආයතනං, ධනමෙම අත්ථි, කුතො එත්ථ 'තිධ—

**සරෙ ලොපො සරෙ.**

සරො සරෙ ලොපනීයො හොති–සරෙනොපසිලෙසිකාධාරසත්තමි නතො වණ්ණකාලව්‍යවධානෙ කාරියං න හොති–ත්වමසි, කතමාචානන්ද අනිච්චසඤ්ඤා'ති-අඤ්ඤත්‍රාපි සංහිතායමොපසිලෙසිකාධාරෙයෙව සත්තමී—විධීති වත්තමානෙ.

---

බින්දුමාත්‍රවූ; යො අයං වණ්ණො, යම් මේ වර්ණයෙක් ඇද්ද; සො, හෙතෙම; නිග්ගහිත සඤ්ඤො හොති, නිග්ගහිත සංඥ ඇත්තේවේ–රස්ස සරං නිස්සාය, හ්‍රස්වස්වරයා නිසා ගහීතං යයි සෙයි, උච්චාරිතං කියනලද්දේ; නිග්ගහිතං, නිග්ගහිතනම්වේ.

සඤ්ඤාවිධානං, සංඥාවිධානයයි.

---

සන්ධිවුච්චතෙ–සංහිතාකාරිය කියනු ලැබේ.

පුරිස උත්තමො—පෙ—කුතො එත්ථඉති, කුතො එත්ථයන, ඉධ මෙති සන්ධි වුච්චතෙ, සංහිතාකාරිය කියනු ලැබේ.

සරොලොපොසරෙ යනුපූර්වස්වරලොපවිධාන සූත්‍රයි, සරො යනු කාරියී නිර්දේශ ප්‍රථමෛක වචනාන්තපදය; ලොපො, යනු කාරිය නිර්දේශ ප්‍රථමෛක වචනාන්ත පදය; සරෙ, යනු පරනිමිත්ත සප්ත මෛක වචනාන්තපදයි—සරෙ, ස්වරයාකෙරෙහි, සරො, අව්‍යවධානවූ ස්වරතෙම, ලොපනීයොහොති, ලොප්කටයුතුවේ—සරෙ ඉති, සරෙකියා; ඖපසිලෙසිකාධාර සත්තමී, ඖපශ්ලෙෂිකාධාර සත්තමී විභත්තිය නතො, එහෙයින්; වණ්ණෙ, වර්ණයක්හු විසින්ද කාල, කාලයක්හු විසින් විසින්ද; ව්‍යවධානෙ, බාධාවක්ඃ ඇතිකල්හි, කාරියං, සංහිතාකාරිය, නහොති, නොවේ; 'ත්වමසි කතමාචානන්ද අනිච්චසඤ්ඤාති, ත්වමසි කතමාචානන්ද අනිච්චසඤ්ඤාකියායි, ත්වමසි යනු වර්ණව්‍යවධානයට උදාහරණය, කතමාචානන්ද අනිච්චසඤ්ඤා යනු කාලව්‍යවධානයට උදාහරණයි—අඤ්ඤත්‍රාපිසංහිතායං, මෙයින් පිටත් සෙසු සන්ධි සූත්‍රයෙහිද; ඔපසිලෙසිකාධාරෙයෙව සත්තමී, ඔපසිලෙසි කාධාරයෙහිම සප්තමී විභක්තියි–විධීති, විධියනු; වත්තමානෙ, වැටෙන්නෙහි.

**සත්තමියං පුබ්බස්ස.**

සත්තමීනිද්දෙසෙ පුබ්බස්සෙව විධීති පුබ්බසරලොපො-පුරිසුත්තමො, පඤ්ඤින්ද්‍රියං, සත්තාරක්ඛා, භොගින්දො, චක්ඛායතනං, අභිභායතනං, ධනමත්ථි, කුතෙත්ථ. පුබ්බස්ස කාරියවිධානා සත්තමීනිද්දිට්ඨස්ස පරතාවගම්‍යතෙති පරෙතුපරි වචනම්පි ඝටතෙ.

සො අහං, චත්තාරො ඉමෙ, යතො උදකං, පාතො එව ‘තිධ- “සරොලොපො සරෙ” ‘ති වත්තතෙ.

**පරො ක්වචි.**

සරම්හා පරො සරො ක්වචි ලොපනීයො හොති-සොහං, චත්තාරොමෙ, යතොදකං, පාතොව, ක්වචීති කිං?-පඤ්ඤින්ද්‍රියං-අස්සාධිකාරො සබ්බසන්ධිසු-තස්ස ඉදං, තස්ස ඉදං, වාත ඊරිතං, වාත ඊරිතං, සීත උදකං, සීත් උදකං, වාම ඌරු, වාම් ඌරු, ඉතීධ-පුබ්බසර ලොපෙ- සරෙ වෙති ච වත්තතෙ.

---

සත්තමියම්පුබ්බස්ස යනු පරිභාෂා සූත්‍රයි; සත්තමියං, යනු සත්තම්‍යෙක වචනාන්තපදය, පුබ්බස්ස, යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදයි, සත්තමීනිද්දෙසෙ, සප්තමී විභක්තීන් දක්වීමක් ඇතිකල්හි; පුබ්බස්සෙව, පූර්වයහටම, විධීති, කාරියනුයි, පුබ්බසරලොපො, පූර්වස්වරලොපයවේ......පුරිසුත්තමො—පෙ—කුතෙත්ථ යනුවේ පුබ්බස්ස, පූර්වයහට, කාරියවිධානා, ලොපාදිකාරිය කළහෙයින්, සත්තමීනිද්දිට්ඨස්ස, සත්තමී විභක්තීන් දක්වන ලද්දහුගෙ; පරතා, පරබව; අවගම්‍යතෙති, දන්නාලැබෙනුයි; පරෙති, පරෙහියා; උපරි, මත්තෙහි; වචනම්පි, කීමද; ඝටතෙ, යෙදේ; සො අහං,—පෙ—පාතො, එව ඉති, පාතො එවයන ඉධ, මෙහි, සන්ධිවූවචනෙ, සංහිතා කාරිය කියනුලැබේ-සරොලොපො සරෙඉති, සරොලොපො සරෙ යනු; වත්තතෙ, වැටේ.

පරොක්වචි යනු පරස්වරලොපවිධාන සූත්‍රයි, පරොයනු ප්‍රථමෙක වචනාන්ත පදය, ක්වචියනු සප්තම්‍යෙක වචනාන්ත නිපාත පදයි-සරම්හා, ස්වරයාකෙරෙන්, පරොසරො, පරවූ ස්වරතෙම; ක්වචි, කිසි තැනෙක්හි; ලොපනීයොහොති, ලොප්කටයුතුවේ--සොහං, චත්තාරොමෙ, යතොදකං, පාතොව යනුවේ—ක්වචිඉති, ක්වචියනු කිං, කුමටය; පඤ්ඤින්ද්‍රියං යන තැන්හි පරස්වරලොප් නොවන පිණිසයි-සබ්බසන්ධිසු, සියළු සංහිතා සූත්‍රයන් කෙරෙහි; අස්ස, මේ ක්වචි ශබ්දයාගෙ; අධිකාරො, සම්බන්ධ කිරීමවේ—තස්සඉදං—පෙ—වාම ඌරුඉති, වාමඌරුයන; ඉධ, මෙහි; (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනු ලැබේ:) පුබ්බසරලොපො, පූර්වස්වරලොප්වේ—සරො, සරෙ යනුද; වෙතිච, වායනුද; වත්තතෙ, වැටේ.

**යුවණ්ණානමෙඔ ලුත්තා.**

ලුත්තා සරාපරෙසං ඉවණ්ණුවණ්ණානං එඔ හොන්ති වා යථාක්කමං.

**වණ්ණපරෙන සවණ්ණොපි.**

වණ්ණසද්දෙ පරෙ යස්මා තෙන සවණ්ණොපි ගය්හති සයමෙති ඊ ඌ නමපි එ ඔ-නසෙසදං, නස්සිදං-වානෙරිතං, වාතීරිතං-සීතොදකං, “බ්‍යඤ්ජනෙ දීඝරස්සා” ‘තිදීඝෙ-සීතූදකං-වාමොරූ, වාමූරූ, ලුත්තෙතිකිං ?-දස ඉමෙ.

අතිප්පසඞ්ගබාධකස්ස ක්වචිසද්දස්සානුවත්තනතො න විකප්පවිධී නියතා – තෙන උපෙතො ‘ති එවමාදිසු විකප්පො තාරක්ඛිතා දීසුවිධි ච න හොති—වි අකාසි, වි අකාසි, සු ආගතං, සු ආගතං ‘තීධ-සුවණ්ණානං වෙ‘ති ච වත්තතෙ.

---

යුවණ්ණානමෙඔලුත්තා, යනු විකල්පයෙන් එකාර ඔකාරාදෙශ විධාන සූත්‍රයි, යුවණ්ණානං, යනු ෂෂ්ඨිබහුවචනාන්ත පදය; එ ඔ, යනු ලුප්ත ප්‍රථමා බහු වචනාන්තපදය; ලුත්තා, යනු පඤ්චම්‍යෙකවචනාන්ත පදයි; ලුත්තාසරා, ලුප්තස්වරයා කෙරෙන්, පරෙසං, පරවූ; ඉවණ්ණු වණ්ණානං, ඉවර්ණ උවර්ණ දෙදෙනාහට; යථාක්කමං, පන්තීන්; වා, විකල්පයෙන්; එ ඔ හොන්ති, එකාර ඔකාරා දෙශයෝවෙත්.

වණ්ණපරෙන සවණ්ණොපි, යනු පරිභාෂා සූත්‍රයි, වණ්ණපරෙනයනු තෘතීයෛකවචනාන්තපදය; සවණ්ණොයනු ප්‍රථමෛක වචනාන්තපදය, අපියනු නිපාතපදයි; වණ්ණසද්දො, වර්ණශබ්දයතෙම; පරො, පරවූයේ; යස්මා, යමක්හු කෙරෙන්ද; තෙන, ඔහුවිසින්; සවණ්ණොපි, සමාන වර්ණද; සයඤෙවති, තෙමේද; ගය්හති, ගන්න ලැබේනුයි; ඊ ඌ නමපි, ඊකාර ඌකාර යනමොවුන්ටද; එඔ, එකාර ඔකාරාදෙශ වෙත්; නසෙසදං යනාදියවේ-බ්‍යඤ්ජනෙ දීඝරස්සාතිදීඝො “බ්‍යඤ්ජනෙ දීඝරස්සා” යන සූත්‍රයෙන් දීර්ඝකළ කල්හි සීතූදකංවාමොරූවාමූරූයනුවේ-ලුත්තෙ ඉති, ලුත්තෙයනු, කිං කුමටය; දසඉමෙයනතන්හිඅලුප්ත ස්වරයාකෙරෙන් පරවූ ඉකාරයහට එකාරා දෙශනොවන පිණිසයි. අතිප්පසඞ්ගබාධකස්ස, අනිෂ්ට ප්‍රසඞ්ගයවළක්නාවූ; ක්වචි සද්දස්ස, ක්වචි ශබ්දයාගෙ; අනුවත්තනතො,' වැටීමහෙතුකොටගෙණ; විකප්පවිධි, විකල්පය විධිය යනමොහු නනියතා, නියත නොවන්නාහුයි; තෙන, එහෙයින්; උපෙතො ඉති, උපෙතොයන; එවමාදිසු; මෙආදි තැන්හි, විකප්පො, විකල්පයද; තාරක්ඛිතාදිසු, තාරක්ඛිතං, යනාදි තන්හි; විධිච, කාරියද; නහොති, නොවේ; විඅකාසි—පෙ—සු ආගතං ඉති, සු ආගතංයන, ඉධමෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතා කාරිය කියනු ලැබේ) යුවණ්ණානංඉති, යුවණ්ණානං, යනුද; වෙතිච, වායනුද; වත්තතෙ, වැටේ;

**යවා සරෙ.**

සරෙ පරෙ ඉවණ්ණුවණ්ණානං යකාරවකාරා හොන්ති වා යථාක්කමං–අකාරස්ස දීඝෙ–ව්‍යාකාසි, “වනතරගාවාගමා”ති යාගමෙ–වියාකාසි ස්වාගතං, සාගතං, ක්වචීත්‍ෙවව–යානිධ.

තෙ අජ්ජ, තෙ අජ්ජ, සො අයං, සො අයං, ඉතීධ–යවා සරෙවෙ‘ති ච වත්තතෙ.

**එ ඔනං**

එඔනං යකාරවකාරා හොන්ති වා සරෙ පරෙ යථාක්කමං.

ත්‍යජ්ජ, තෙජ්ජ–“බ්‍යඤ්ජනෙ දීඝරස්සා” ති දීඝෙ–ස්වායං, සොයං.

ක්වචිත්‍ෙව—ධනම්මත්ථි-ගො එළකම්තිධ-සරෙ ‘ති වත්තතෙ.

---

යවාසරෙයනු, විකල්පයෙන් යකාරවකාරාදෙශ විධාන සූත්‍රයි, යවා යනු ප්‍රථමා බහු වචනාන්තපදය, සරෙ, යනු සප්තම්‍යෙක වචනාන්තපදයි—සරෙපරෙ, ස්වරයා පරකල්හි; ඉවණ්ණුවණ්ණානං, ඉවර්ණ උවර්ණයන්ට; යථාක්කමං, පිළිවෙළින්; වා, විකල්පයෙන්; යකාරවකාරාහොන්ති, යකාර වකාරා දෙශයෝවෙත්.

අකාරස්ස, අකාරයහට; දීඝෙ, බ්‍යඤ්ජනෙ දීඝරස්සා යන සූත්‍රයෙන් දීර්ඝකළ කල්හි; ව්‍යාකාසියනුවේ— වනතරගාවාගමා ඉති, වනතරගාවාගමා යන සූත්‍රයෙන්; යාගමෙ, යකාරයක් ආගම කළකල්හි වියාකාසි යනුවේ—ස්වාගතං, සාගතං යනුවේ; ක්වචි ඉති, ක්වචි යනු; එව, වැටෙයි; යානිධයන තැන්හි ස්වරයා පරකල්හි ඉකාරයහට යකාරාදෙශ නොවන පිණිසයි. තෙ අජ්ජ—පෙ—සො අයං ඉති, සො අයං, යන ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතාකාරිය කියනු ලැබේ)—යවා සරෙ ඉති, යවාසරෙ යනුද; වෙතිච, වායනුද; වත්තතෙ, වැටේ.

එඔනං, යනු විකල්පයෙන් යකාරවකාරාදෙශ විධාන සූත්‍රයි, එඔනං, යනු ෂෂ්ඨී බහුවචනාන්ත පදයි—සරෙපරෙ, ස්වරයා පරකල්හි; එඔනං, එකාර ඔකාරයන්ට; යථාක්කමං පිළිවෙළින්; වා, විකල්පයෙන්; යකාර වකාරාහොන්ති, යකාරවකාරාදෙශයෝවෙත්; ත්‍යජ්ජ තෙජ්ජ යනුවේ--බ්‍යඤ්ජනෙ දීඝරස්සාති, බ්‍යඤ්ජනෙ දීඝරස්සා යන සූත්‍රයෙන්, දීඝෙ, දීර්ඝකළකල්හි; ස්වායං, සොයං; යනුවේ—ක්වචිති, ක්වචියනු, එව, වැටේ; ධනම්මත්ථියන තැන්හි ස්වරයා පරකල්හි එකාරයහට යකාරාදෙශ නොවන පිණිසයි—ගො එළකං ඉති, ගො එළකං යන; ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතා කාර්‍ය්‍ය කියනුලැබේ) සරෙ ඉති, සරෙයනු; වත්තතෙ, වැටේ.

**ගොසසාවඞ්.**

සරෙ පරෙ ගොසස අවඞ් ආදෙසො හොති—සච "ටනුබන්ධානෙක වණ්ණාසබ්බසසා"ති සබ්බසසපපසඟෙ—අනතසෙස'ති වත්තමානෙ.

**ඞනු බන්ධො.**

ඞකාරොනුබන්ධො යසස සො නෙකවණ්ණොපි අනතසස හොතීති ඞකාරසෙසව හොති,-"සඞ්කෙතොන වයවොනු බන්ධො"ති වචනා ඞකාරසසාපපයොගො-පයොජනං "ඞනුබන්ධො"ති සඞ්කෙතො, ගවෙලකං.

ඉති එව, ඉති එවා "තීධ—

**විතිස්සෙවෙ වා.**

එවසද්දෙ පරෙ ඉතිසස වො හොති වා සච.

---

ගොසසාවඞ්, යනු අවඞ් යනාදෙශ විධාන සූත්‍රයි ගොසස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය අව ඞ් යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත පදයි-සරෙ පරෙ, ස්වරයා පරකල්හි; ගොසස, ගො ශබ්දයහට; අවඞ් ආදෙශොහොති, අවඞ්යනා දෙශවේ; සච, එ අව ඞ් යනා දෙශයද; ටනු බන්ධානෙ කවණ්ණාසබ්බසසාති, ටනු බන්ධානෙ කවණ්ණාසබ්බසස, යන පරිභාෂා සූත්‍රයෙන් සබ්බසසපසඟෙ, සියලුගො ශබ්දයාහට පතෙතත්හි;- අනතසෙසති, අන්තසසයනු, වත්තමානෙ වැටෙන්නෙහි.

ඞනුබන්ධො, යනු පරිභාෂාසූත්‍රයි, ප්‍රථමෛක වචනාන්තපදයි— ඞකාරො ඞකාරතෙම; අනුබන්ධො, උච්චාරිත ප්‍රධ්වංසිවූයේ, යසස, යමක්හටද; සො, හෙතෙම; අණෙකවණ්ණොපි, අනෙකාක්ෂරවූයේද; අනතසසහොතීති, අන්තයහට වේනුයි; ඞකාරසෙසව හොති, අන්ත ඞකාරයහටම අවඞ්යනාදෙශවේ—සංකෙතො න වයවොනු බන්ධො ඉති, සංකෙතො නවයවොනු බන්ධො යන; වචනා, පරිභාෂා සූත්‍ර යෙන්, ඞකාරසස, ඞකාරයාගෙ; අපපයොගො, අප්‍රයොගයවේ; පයො ජනං, ඞකාරයෙන් ප්‍රයොජනය, ඞනුබන්ධො යන පරිභාෂා සූත්‍රයෙහි, සංකෙතො, චිහනාඞය ප්‍රයොජනකොට ඇත්තේයි; ගවෙලකං යනු වේ. ඉති එව ඉති එව ඉති, ඉති එව ඉති එව යන ඉධ, මෙහි (සන්ධි වූචවනෙ, සංහිතාකාරිය කියනු ලැබේ.)

විතිස්සෙ වෙවා, යනු විකල්පයෙන් වකාරාදෙශ විධාන සූත්‍රයි, වො යනු ප්‍රථමෛක වචනාන්තපදය, ඉතිසස යනු ෂෂ්ඨ්‍යෙකවචනා න්තඅනුකරණ පදය එවෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය, වා, යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාත පදයි—එව සද්දෙපරෙ, එව ශබ්දයා පරකල්හි, ඉතිසස, ඉතිශබ්දයහට; වා, විකල්පයෙන්; වොහොති, වකාරදෙශවේ—සච, ඒවකාරාදෙශයද;

**ජටඨියන්තස්ස.**

ජට්ඨිනිද්දිට්ඨස්ස යං කාරියං තදන්තස්ස විඤ්ඤෙය්‍යන්ති ඉකාරස්සා දෙසො හොති=ධානිනමාමද්දිය දිස්සන්ති උච්චාරියන්ති'ති ආදෙසො; ඉච්චෙව, අඤ්ඤත්‍ර යාදෙසෙ-"තවග්ගවරණානං යෙ චවග්ගබයඤා"ති තකාරස්ස චො-"වග්ගලසෙහි තෙ"ති යස්ස ච චකාරෙ, ඉච්චෙව දු අඬියිකං, වි ඉත්වා, අජ්ජ අග්ගෙ, පාතු අහෙසුං, පා එච්, ඉධ ඉජ්ඣති, පරි අන්තං, අත්ත අත්ථමිතිධ-"මයදාසරෙ"ති වත්තතෙ.

**වනතරගා චාගමා.**

එතෙ මයද චාගමා හොන්ති වා සරෙ කව්වි, ආගමිනො අනියමෙ

සරෙයෙවාගමී හොති වනාදීනන්තු කපකා,
අඤ්ඤත්‍රාහි පදාදීනං යුත්තිවිධානමනප්පකං.

දුවඩියිකං, චිනිත්වා, අජ්ජතග්ගෙ, පාතුරහෙසුං "බ්‍යඤ්ජනෙ දීඝ රස්සා"ති රස්සෙ-පගෙව, ඉධමිජ්ඣති, පරියන්තං අත්තදත්ථං-චාහෙච-අත්තත්ථං.

ජ අභිඤ්ඤා, ජ අභිඤ්ඤා,'තිධ-වා සරෙ ආගමො'ති ච වත්තතෙ.

---

ජඨියන්තස්ස යනු පරිභාෂා සූත්‍රයි, ජඨීනිද්දිඨස්ස, ෂෂ්ඨී විභක්තීන් දක්වන ලද්දහුගෙ; යංකාරියං, යම් කාරියෙක් ඇද්ද; තං, ඒකාරිය; අන්තස්ස, අන්තයහට; විඤ්ඤෙය්‍යන්ති, දතයුතුනුයි; ඉකාරස්ස, ඉකාරයහට; ආදෙසො; චකාරා දෙශවේ—ධානිනං, සථානීහු; ආමද්දිය, මැඩ, දිස්සන්තියයි සේයි; උච්චාරියන්ති, කියනු ලැබේනුයි; ආදෙසො, ආදෙශනම්වේ-ඉච්චෙවයනුවේ-අඤ්ඤත්‍ර චකාරාදෙශ නොවූපක්ෂයෙහි යාදෙසෙ, ඉකාරයහට යවාසරෙ යන සූත්‍රයෙන් යකාරා දෙශ කළකල්හි තවග්ගවරණානං යෙ චවග්ග බයඤා ඉති, තවග්ගවරණානං යෙචවග්ගබයඤා යන සූත්‍රයෙන්; තස්ස, තකාරයහට චො, චකාරයෙක්ද, වග්ගලසෙහි තෙ ඉති, වග්ගලසෙහිතෙ, යනසූත්‍රයෙන් යස්ස, යකාරයහට; චකාරොච, චකාරයෙක්දවේ; ඉච්චෙවයනුවේ; දුඅඩියිකං—පෙ—අත්ත අත්ථං ඉති, අත්තඅත්ථං යන; ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතා කායයි කියනුලැබේ) මයදාසරෙ ඉති, මයදාසරෙයනු; වත්තතෙ, වැටේ.

වනතරගාචාගමා, යනු වනතරගමයදාගමවිධාන සූත්‍රයි—වනතරගා, යනු ප්‍රථමා බහු වචනාන්තපදය; ච, යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; ආගමායනු ප්‍රථමා බහුවචනාන්තපදයි—සරෙ, සවරයා පරකල්හි; එතෙ, මෙවනතරග යන මොහුද; මයදච, මයදය යනමොහුද; කව්වි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන් ආගමාහොන්ති, ආගමවෙත්; ආගමිනො, ආගම ලබන්නහු; අනියමෙපි,

**ඡා ළො.**

ඡ සද්දා පරස්ස සරස්ස ළකාරෙ ආගමො හොති වා–ඡළභිඤ්ඤා, ඡඅභිඤ්ඤා.

**සරසන්ධි.**

කඤ්ඤාඉව—කඤ්ඤෙව "තීධ—පුබ්බපරසරානං ලොපෙ සම්පත්තෙ—සරෙ ලොපොති ච වත්තතෙ.

**නමෙවා.**

පුබ්බපරසරා චෙපි වා ක්වචි න ලුප්‍යන්තෙ—කඤ්ඤාඉව, කඤ්ඤෙව කඤ්ඤාව.

**සරසන්ධි නිසෙධො.**

---

නියමයක් නැතිකල්හිදු—වනාදිනත්තු වනාදි ආගමයන්ට වනාති ඤාපකා පදාදීනං ක්වචි, යන සූත්‍ර ඤාපකය හෙතුකොටගෙණ; සරෙයෙව, පූර්වස්වරම; ආගම්හොති, ආගම ලබන්නේවේ; ති, එසේමැයි; අඤ්ඤථා, නොඑසේවීනම්; පදාදීනං, පදාදිධාතුන්ට; යුක්විධානං යුගාගමකිරීම; අනත්ථකං, නිරර්ථකවන්නේයි—ද්‍රුවතිකං යනාදියවේ-බ්‍යඤ්ජනෙ දීඝරස්සා ඉති, බ්‍යඤ්ජනෙ දීඝරස්සා යන සූත්‍රයෙන් පකාරස්ස, පකාරයහට; රස්සෙ, හ්‍රස්වකළකල්හි; පගෙව යනුවේ—ඉධම්ජ්ඣති පරියන්තං අත්තදත්ථං යනුවෙ—වා ඉති, වායනු එව, වැටෙයි; අත්තත්ථංයන තැන්හි දකාරාගම නොවන පිණිසයි—ඡ අභිඤ්ඤා ඡ අභිඤ්ඤා ඉති, ඡ අභිඤ්ඤා, ඡ අභිඤ්ඤා යන, ඉධ; මෙහි, (සන්ධි වුච්චතෙ, සංහිතා කාරියකියනු ලැබේ;) වා ඉති වායනුද සරෙ ඉති සරෙයනුද ආගමො ඉති, ආගමොයනුද; වත්තතෙ වැටේ.

ඡාළො, යනු විකල්පයෙන් ළකාරාගම විධානසූත්‍රයි ඡා, යනු පඨමෙක්‍යක වචනාන්ත අනුකරණපදය, ළො, යනු ප්‍රථමෛක වචනාන්ත පදයි—ඡසද්දා, ඡ ශබ්දයාකෙරෙන්; පරස්ස සරස්ස, පරවූ ස්වරය හට; ළකාරො, ළකාරතෙම; වා, විකල්පයෙන්; ආගමොහොති, ආගමවේ; ඡළභිඤ්ඤා, ඡ අභිඤ්ඤා යනුවේ;

සරසන්ධි, ස්වරසන්ධියයි.

---

කඤ්ඤාඉව කඤ්ඤාඉව ඉති, කඤ්ඤාඉව කඤ්ඤාඉව යන ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතාකාරිය කියනුලැබේ)—පුබ්බපරසරානං, පූර්වස්වර පරස්වරදෙදෙනහට; ලොපෙ සම්පත්තෙ, ලොප්ප්‍රාප්තකල්හි; සරෙ ඉති, සරොයනුද; ලොපො ඉති, ලොපොයනුද; වත්තතෙ, වැටේ.

නාවෙවායනු විකල්පයෙන් ප්‍රතිෂෙධ සූත්‍රයි; න යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; චෙයනු, ප්‍රථමා බහු වචනාන්ත පදය; වා,

තත්‍ර අභිරති, ඛන්තී පරමං, සම්මා අක්ඛාතො 'තීධ—

**බ්‍යඤ්ජනෙ දීඝරස්සා.**

රස්සදීඝානං ක්වචි දීඝරස්සා හොන්ති බ්‍යඤ්ජනෙ පරෙ—තත්‍රාභිරති ඛන්තීපරමං, 'සම්මදක්ඛාතො' ති දාගමෙ රස්සො-ක්වචිත්වෙව=ත්‍යජ්ජ-කථං යානිව අන්තලික්ඛෙ 'ති?—දීඝරස්සාති යොගවිභාගා.

විග්ගහො, තතිය ඣානං විබෙපො, ඉතීධ-බ්‍යඤ්ජනෙවෙ'ති වත්තතෙ

**සරම්හා වෙ.**

සරම්හා පරස්ස බ්‍යඤ්ජනස්ස ක්වචි වෙරූපානි හොන්ති—විග්ගහො.

---

යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්ත නිපාත පදයි; පුබ්බපරසරාවෙපි, පූර්වස්වර පරස්වරදෙදෙනම; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්ප යෙන්; නලුප්‍යන්තෙ, ලොප්කරනු නොලැබෙත්— කඤ්ඤා, ඉවක ඤ්ඤෙව; කඤ්ඤාව යනුවේ—සරසන්ධිනිසෙධො, ස්වරසංහිතා ප්‍රතිෂෙධයි.

තත්‍ර අභිරති—පෙ—සම්මා අක්ඛාතො ඉති, සම්මා අක්ඛාතො යන, ඉධ; මෙහි, (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනුලැබේ) බ්‍යඤ්ජනෙ දීඝරස්සා,යනු දීර්ඝහ්‍රස්වවිධාන සූත්‍රයි; බ්‍යඤ්ජනෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය, දීඝරස්සායනු ප්‍රථමා බහු වචනාන්තපදයි—බ්‍යඤ්ජනෙපරෙ, බ්‍යඤ්ජනයා පරකල්හි; රස්සදීඝානං, හ්‍රස්වය දීර්ඝය යන මොවුන්ට; ක්වචි, කිසිතැනෙක්හි; දීඝරස්සා, දීර්ඝයහ්‍රස්වය යනමොහු; හොන්ති, වෙත්; තත්‍රාභිරති ඛන්තී පරමං යනුවේ—සම්මදක්ඛාතොති සම්මදක්ඛාතො කියා; දාගමෙ, මදාදි සූත්‍රයෙන් දකාරයක් ආගම කළකල්හි; රස්සො, මකාරසථ අකාර හ්‍රස්වවේ—ක්වචිති, ක්වචි යනු; එව, වැටෙයි;ත්‍යජ්ජයනු, බ්‍යඤ්ජනයා පරකල්හි; හ්‍රස්වඅකාරයහට දීර්ඝ නොවන පිණිසයි.

යානිව අන්තලික්ඛෙ ඉති, යානිව අන්තලික්ඛෙ කියා; කථං, කෙසේසිද්ධවේද? දීඝරස්සා ඉති දීඝරස්සායන; යොගවිභාගා, සූත්‍රවිධාකරණයෙන් සිද්ධයි—විගහො, තතිය ඣානං, විබෙපො ඉති, විගහො තතිය ඣානං විබෙපොයන, ඉධමෙහි (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනුලැබේ;) බ්‍යඤ්ජනෙ ඉති, බ්‍යඤ්ජනෙ යනු; වත්තතෙ; වැටේ.

සරම්හාවෙයනු ද්විත්ව විධාන සූත්‍රයි—සරම්හා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; වේ යනු, ප්‍රථමා බහු වචනාන්ත පදයි; සරම්හා, ස්වරයාකෙරෙන්; පරස්ස, පරවූ; බ්‍යඤ්ජනස්ස, බ්‍යඤ්ජනයහට; ක්වචි, කිසිතැනෙක්හි, වෙරූපාහොන්ති, රූපයෝ දෙදෙනෙක්වෙත්; විග්ගහො යනුවේ.

**චතුත්ථ දුතියෙසෙව සං තතිය පඨමා.**

චතුත්ථදුතියෙසු පරෙසවසං චතුත්ථදුතියානං තබ්බගො තතිය පඨමා හොන්ති පච්චාසත්‍යාති පුබ්බඣකාරභකාරානං ජකාරකකාරා-තතියජ්ඣානං, විකෙඛපො-සරම්හා'තිකිං ?—තං චනං.

අකරම්හසෙතෙ, අකරම්හසෙතෙ, එසො අත්ථො, එසො අත්ථො, ඉතීධ වෙ'තිවත්තතෙ.

**එ ඔ න ම ව ණ්ණෙ.**

එ ඔ නං වණ්ණෙ ක්වචි අ හොති වා-අකරම්හසතෙ, අකරම්හ සෙතෙ-එසඅත්ථො, එසො අත්ථො වණ්ණෙතිකිං ?—සො.

**සරබ්‍යඤ්ජන සන්ධි.**

---

චතුත්ථදුතියෙසෙවසං තතිය පඨමා, යනු තෘතීය ප්‍රථමාක්‍ෂරාදෙශ විධාන සූත්‍රයි; චතුත්ථදුතියෙසු යනු සප්තමී බහුවචනාන්ත පදය; එසං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; තතිය පඨමා යනු ප්‍රථමා බහු වචනාන්ත පදයි—චතුත්ථ දුතියෙසු පරෙසු, චතුර්ථද්විතියාක්‍ෂරයන් පරකල්හි; එසං චතුත්ථ දුතියානං, මේ චතුර්ථද්විතීයාක්‍ෂරයන්ට; තබ්බ ගෙග, ඒවර්ගීයෙහිවූ; තතිය පඨමා, තෘතීය ප්‍රථමාක්‍ෂරාදෙශයෝ, පච්ච සත්‍යා සථානාසන්නවශයෙන්; හොන්තීති, වෙත්නුයි; පුබ්බඣකාර භකාරානං, පූර්වඣකාර භකාරයන්ට; ජකාරකකාරා, ජකාර කකාරා දෙශයෝවෙත්— තතියජ්ඣානං විකෙඛපොයනුවේ—සරම්හා ඉති, සරම්හා යනු කිං, කුමටය; තං චනං යන තැන්හි, ව්‍යඤ්ජනයා කෙරෙන්පරවූ ව්‍යඤ්ජනයහට විහිතනොවන පිණිසයි; අකරම්හසෙතෙ—පෙ—එසො අත්ථො ඉති, එසො අත්ථො යන; ඉධමෙහි; (සන්ධිවූවචනෙ, සංහිතා කාරිය කියනුලැබේ) වෙ ඉති, වා යනු වත්තතෙ, වැටේ.

එඔනමවණ්ණෙ, යනු විකල්පයෙන් අකාරාදෙශ විධාන සූත්‍රයි-එඔනං යනු ෂෂ්ඨී බහුවචනාන්ත නාමපදය, අ යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්ත රූඪිපදය, වණ්ණෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි—වණ්ණෙ, වර්ණයා පරකල්හි; එඔනං, එකාර ඔකාරයන්ට; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; අ හොති, අකාරාදෙශවේ; අකර ම්හසතෙ, යනාදීයවේ; වණ්ණෙ ඉති, වණ්ණෙයනු කිං, කුමටය; සො යන තැන්හි වර්ණයා පරනොවන විෂ්‍යෙහි ඔකාරයහට අකාරා දෙශනොවන පිණිසයි.

සරව්‍යඤ්ජනසන්ධි, ස්වරව්‍යඤ්ජන සන්ධියි.

---

අත් යනතං, තජ් යං, මද් යං, බුධ් යති, ධන් යං, සෙව් යො, පර්යෙසනා, පොක්ඛරණී යො, ඉතිධ—

**තවග්ගවරණානං යෙ චවග්ගබයඤ්ඤා.**

තවග්ගවරණනං චවග්ගබයඤ්ඤා හොන්ති යථාක්කමං යකාරෙ, "වග්ගලසෙහි තෙ" ති වග්ගා පරස්ස යස්ස පුබ්බරූපං-අච්චන්තං. තච්චං, මජ්ජං, බුජ්ඣති, ධඤ්ඤං සෙබ්බො පය්‍යෙසනා පොක්ඛරඤ්ඤො-ක්වචිත්තෙව මත්‍යා—යෙති වත්තතෙ වක්ඛමානෙසු තීසු, සක් යතෙ, රුච් යතෙ පට්යතෙ ලුප්යතෙ සල්යතෙ, දිස්යතෙ'තිධ.

**වග්ගලසෙහි තෙ.**

වග්ගලසෙහි පරස්ස යකාරස්ස ක්වචි තෙ වග්ගලසා හොන්ති සක්කාතෙ, රුච්චතෙ, පට්ටතෙ, සල්ලතෙ, දිස්සතෙ.

---

අත්යනතං තජ්යං මද්යං බුධ්යති ධන්යං සෙව්යො පර්යෙසනා පොක්ඛරණීයො යන; ඉධ මෙහි (සන්ධිවුච්චතෙ, සංහිතාකායෂී කිය නුලැබේ) තවග්ගවරණානං යෙච වග්ගබයඤ්ඤා, යනු චවර්ගීබයඤ්ඤයනා දෙශ විධාන සූත්‍රයි, තවග්ගවරණානං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; යෙ යනු සප්තම්‍යෙක වචනාන්ත පදය; චවග්ගබයඤ්ඤා යනු ප්‍රථමා බහු වචනාන්තපදයි—යකාරෙ, යකාරයා පරකල්හි, චවග්ගවරණානං, තවර්ගීය වරණය යන මොවුන්ට; යථාක්කමං, පනතීන්; චවග්ගබයඤ්ඤා හොන්ති-චවර්ගීය බයඤ්ඤය යනමොහු ආදෙශවෙත්—වග්ගලසෙහිතෙ ඉති, වග්ගලසෙහිතෙ යන සූත්‍රයෙන්; වග්ගා, වර්ගාක්ෂරයා කෙරෙන්; පරස්ස, පරවූ; යස්ස, යකාරයහට; පුබ්බරූපං, පූර්වරූපවේ අච්චන්තං—පෙ—පොක්ඛරඤ්ඤා යනුවේ.

ක්වචිති, ක්වචියනු කිං, කුමටය; මත්‍යායනතන්හි-යකාරයා පරකල්හි තවර්ගීයහට; චවර්ගාදෙශ නොවන පිණිසයි—වක්ඛමානෙසු තීසු, මතු කියනුලබන සූත්‍රදෙක්හි; යෙ ඉති, යෙ යනු වත්තතෙ වැටේ; සක්යතෙ—පෙ—දිස්යතෙ ඉති, දිස්යතෙ යන; ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතාකායෂී; කියනුලැබේ).

වග්ගලසෙහිතෙ, යනු වර්ගාක්ෂර ලකාර සකාරාදෙශ විධානසූත්‍රයි වග්ගලසෙහි යනු පඤ්චමී බහු වචනාන්තපදය; තෙ, යනු ප්‍රථමා බහු වචනාන්තපදයි—වග්ගලසෙහි වර්ගාක්ෂර ලකාර සකාරයන් කෙරෙන්; පරස්ස, පරවූ; යකාරස්ස, යකාරයහට; ක්වචි, කිසිතැනෙක්හි; තෙවග්ගලසා, එවර්ගාක්ෂර ලකාර සකාරාදෙශයෝ, හොන්ති, වෙත්—සක්කාතෙ—පෙ—දිස්සතෙ, යනුවේ.

ඛවිචෙව—ක්‍යාහං—මුහ් යතී 'ත්‍ිධ—

**හස්ස විපල්ලා සො.**

හස්ස විපල්ලාසො හොති යකාරෙ,—මුය්හති.
බහු ආබාධො, බහු ආබාධො'ත්‍ිධ–උස්ස වකාරෙ"හස්ස විපල්ලාසො" 'ති වත්තතෙ.

**වෙ වා.**

හස්ස විපල්ලාසො හොති වා වකාරෙ· බව්හාබාධො, බහ්වාබාධො.

**ව්‍යඤ්ජන සන්ධි.**

———o———

අක්ඛිරුජති, අක්ඛිරුජතී'ත්‍ිධ–වෙති වත්තතෙ යාව"මයදුසරෙ"ති.

**නිග්ගහීතං.**

නිග්ගහීතමාගමො හොති වා ඛචි=ධාතිනමාලිඛ්ඛිය ගච්ඡති පව ත්තතී'ති ආගමො—අක්ඛිං රුජති, අක්ඛි රුජති–"යාවච්ඡා"ති ආදෙ

---

ඛචිති, ඛචියනු; එව, වැටෙයි; ක්‍යාහං, යන තන්හි වර්ගාක්ෂරයා කෙරෙන් පරවූ යකාරයහට පූර්වරූපනොවන පිණිසයි.—මුහ්යතිති, මුහ්යති යන; ඉධ, මෙහි; (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනුලැබේ.)

හස්සවිපල්ලාසො, යනු හකාරවිපර්යාස විධානසූත්‍රයි. හස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය විපල්ලාසො, යනු ප්‍රථමෛක වචනාන්ත පදයි;—යකාරෙ, යකාරයා පරකල්හි; හස්ස, හකාරයහට; විපල්ලාසො හොති, විපරියාසවේ; මුය්හතියනුවේ— බහු ආබාධො, බහු ආබාධො ඉති, බහු ආබාධො බහු ආබාධො යන; ඉධ, මෙහි; (සන්ධිවුචචනෙ, සංහිතාකාරිය කියනුලැබේ;) උස්ස, උකාරයහට; වකාරෙ, යවා සරෙ, යන සූත්‍රයෙන් වකාරාදෙශකළ කල්හි; හස්ස විපල්ලාසො ඉති, හස්සවිපල්ලාසො යනු, වත්තතෙ, වැටේ.

වෙවා, යනු විකල්පයෙන් හකාර විපරියාස විධාන සූත්‍රයි. වෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය; වා යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; වකාරෙ, වකාරයා පරකල්හි; හස්ස, හකාරයාහට, වා, විකල්පයෙන්; විපල්ලාසොහොති, විපරියාසවේ; බව්හාබාධො; බහ්වාබාධො යනුවේ; අක්ඛිරුජති අක්ඛිරුජති ඉති, අක්ඛිරුජති අක්ඛිරුජතියන, ඉධ, මෙහි; (සන්ධිවුච්චනෙ, සංහිතාකාරිය කියනු ලැබේ;) මයදුසරෙ ඉති, මයදුසරෙ යන සූත්‍රය; යාව, යම්තාක්දු; තාව, ඒතාක්, වා ඉති, වායනු; වත්තතෙ, වැටේ.

ව්‍යඤ්ජනසන්ධි ව්‍යඤ්ජනසංහිතායි

———o———

නිග්ගහිතං, යනු විකල්පයෙන් නිග්ගහිතාගම විධානසූත්‍රයි. නිග්ගහිතං යනු ප්‍රථමෛක වචනාන්තපදයි–නිග්ගහිතං, නිග්ගහිතතෙම;

නිච්චං වවත්ථිත විභාසත්තා වාධිකාරස්ස—වාසද්දො හි අත්ථයෙ වත්තතෙ කත්ථචි විකප්පෙ කත්ථචි යථාවවත්ථිතරූප පරිග්ගහෙති—යදා පවත්තෙ තදා නිච්චමනිච්චමසන්තඤ්ච විධිං දීපෙති-එත්ථ පන ක්වචිසද්දස්සානු වත්තනතො තෙනෙවාසන්තවිධි සිද්ධො’ති වාසද්දෙ නිතරමයං-සං රම්භො, සං රම්භො, පුං ලිඟං, පුං ලිඟමිතීධ—නිග්ගහීතාධිකාරො ආ “මයදා සරෙති”.

**ලොපො.**

නිග්ගහීතස්ස ලොපො හොති වා ක්වචි, දීඝදිත්තානි. සාරම්භො, සංරම්භො-පුලලිඟං, පුංලිඟං-පටිසල්ලානො පාතුක්‍රාමො‘ති ආදිසු නිච්චං-පුප්ඵං අස්සා, පුප්ඵං අස්සා, කිං ඉති, කිං ඉතී ‘තීධ—

---

ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; ආගමොහොති, ආගමවේ. ඨානිනං, ස්ථානිහු; ආලිඞ්ගිය, වැලඳ; ගච්ඡතියයිසෙයි; පවත්තතීති පවතීනුයි, ආගමො, ආගම නම්වේ—අකඞ්ංරුජති, අකඞ්ිරුජති යනු වෙ; වාධිකාරස්ස, වා යන අනුවෘත්තයා තමා; වවත්ථිත විභාසත්තා, වවත්ථිත විභාසාවාච්වව හෙයින්; යාවඡිධ ඉති, යාවඡිධයන; ආදෙ, මේ ආදිතැන්හි; නිච්චං, අවිකල්පයෙන් නිග්ගහීතා ගමවේ; හි, එසේමැයි; වාසද්දො, වාශබ්දයනෙම; කත්ථචි, කිසිතැනෙක්හි; විකප්පෙ, විකල්පාර්ථයෙහිද; කත්ථචි, කිසිතැනෙක්හි; යථාවවත්ථිත රූප පරිග්ගහෙති, ශිෂ්ටප්‍රයොගානුසාරයෙන් පවත්නා රූපයන් පිරිසිඳගැන්මෙහිදයන, අත්ථයෙ, අර්ථදෙක්හි; වත්තතෙ, වැටේ; යදා, යම් කලෙක්හි; පවත්තෙ, ශිෂ්ටප්‍රයොගානුසාරයෙන් පවත්නා රූපයන්ගෙ පිරිසිඳ ගැන්මය යනමේ පශ්චිමාර්ථයෙහි වැටේද; තදා, එකල්හි; නිච්චං, නිත්‍යවිධියද; අනිච්චං, අනිත්‍යවිධියද; අසන්තඤ්ච විධිං, අසත්විධියද; දීපෙති, ප්‍රකාශකෙරේ; එත්ථපන, මෙසං හිතා කාණ්ඩයෙහි වනාහි; ක්වචි සද්දස්ස, පරො ක්වචි, යන සූත්‍රයෙහිකියනලද ක්වචි ශබ්දයාගේ; අනුවත්තනතො, වැටීම හෙතුකොටගෙණ; තෙනෙව, එ ක්වචි ශබ්දයා විසින්ම; අසන්තවිධි, අසන්තවිධිතෙම; සිද්ධොති, පජ්ජිජ්‍ෂ්ඨයං, යනාදිතන්හි සිඬනුයි; වාසද්දෙන, අනුවෘත්තවාශබ්දයෙන්; ඉතරමයං, අන්‍යවූ නිත්‍යානිත්‍යවිධිදෙක සිඬයි; සංරම්භො සංරම්භොපුංලිඟං පුංලිඟං යන; ඉධ, මෙහි; (සඤ්ඤිවුච්චතෙ, සංහිතාකාරිය කියනු ලැබේ) ආමයදාසරේ ‍ෆ්‍යුත්, මයදාසරෙ යන සූත්‍රය දක්වා, නිග්ගහීතාධිකාරො, නිග්ගහීතයාගෙ යෙදීමවේ—

ලොපො, යනු නිග්ගහීතලොප විධානසූත්‍රයි. ලොපො යනු ප්‍රථමෙක වචනාන්තපදයි. නිග්ගහීතස්ස, නිග්ගහීතයහට; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; ලොපොහොති, ලොප්වේ; දීඝවිත්තානි, දීඝිය, විඝය යන මොහුවෙන්; සාරම්භො සංරම්භො යනාදියවේ

**පර සරසස.**

නිග්ගහීතම්හා පරස්ස සරස්ස ලොපො හොති වා ක්‍වචි.

**සංයොගාදි ලොපො.**

අනන්තරා බ්‍යඤ්ජනා සංයොගො—අත්‍ර යො ආදිභූතාවයවො තස්ස වා ක්‍වචි ලොපො හොති 'ති සස්සාදිස්ස ලොපො—පුප්ඵංසා, "මයදා සරෙ" ති නිග්ගහීතස්ස මකාරො-පුප්ඵමස්සා, "වග්ගෙ වග්ගන්තො" ති නො නිග්ගහීතස්ස කින්ති, කිම්ති.

තං ඛණං, තං ඛණං, ධම්මං චරෙ, ධම්මං චරෙ, නං ඩහති නං ඩහති, තං දනං, තං දනං, තං එලං, තං එලම්තීධ—

**වග්ගෙවග්ගන්තො.**

නිග්ගහීතස්ස ඛො වග්ගෙ වග්ගන්තො වා හොති පච්චාසත්‍යා—තඞ්ඛණං, තංඛණං-ධම්මඤ්චරෙ, ධම්මංචරෙ-නණ්ඩහති, තංඩහති-

---

පටිසල්ලානො පාතුකාමො ඉති; පටිසල්ලානො පාතුකාමො යන; ආදිසු, මෙ ආදිතැන්හි; නිච්චං, අවිකල්පයෙන් නිග්ගහිතලොප්වේ—පුප්ඵං, අස්සා—පෙ—කිං ඉති, කිං යන; ඉධ, මෙහි; (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනුලැබේ)

පරසරස්ස, යනු විකල්පයෙන් පරස්වරලොප විධානසූත්‍රයි, පර සරස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; නිග්ගහිතම්හා, නිග්ගහිතය කෙරෙන්; පරස්ස සරස්ස, පරවූස්වරයහට; ක්‍වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; ලොපොහොති, ලොප්වේ.

සංයොගාදිලොපො, යනු සංයොගාදිලොපවිධානසූත්‍රයි, සංයොගාදියනු ප්‍රථමෙක වචනාන්තපදය; ලොපොයනු ප්‍රථමෙක වචනාන්තපදයි; අනන්තරා, ස්වරයක්හු විසින් ව්‍යවහිතවූ; බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනයෝ සංයොගො, සංයොගනම්වෙත්. අත්‍ර, මෙසංයොග විෂයෙහිවූ; ආදිභූතො, ආදියෙහිවූ; යො අවයවො, යම් අවයවයෙක් ඇද්ද; තස්ස, ඕහට; ක්‍වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; ලොපොහොතීති, ලොප්වේනුයි; ආදිස්ස සස්ස, ආදිසකාරයහට; ලොපො, ලොප්වේ; පුප්ඵංසායනුවේ. මයදා සරෙ ඉති, මයදාසරෙ යන සූත්‍රයෙන් නිග්ගහිතස්ස, නිග්ගහිතයහට; මකාරො, මකාරයෙක්වේ; පුප්ඵමස්සා යනුවේ වග්ගෙ වග්ගන්තොඉති, වග්ගෙවග්ගන්තො යන සූත්‍රයෙන්; නිග්ගහිතස්ස නිග්ගහිතයහට, නො, නකාරා දෙශවේ; කින්ති, කිම්තියනුවේ; තංඛණං—පෙ—තං එලංඉති, තං එලං යන; ඉධ, මෙහි; (සන්ධිවූවචනෙ, සංහිතාකාරිය කියනුලැබේ.)

වග්ගෙ වග්ගන්තො යනු, විකල්පයෙන් වර්ගාන්තාදෙශ විධාන සූත්‍රයි, වග්ගෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය, වග්ගන්තො යනු

තඤ්ඤාණං, තංඤාණං—තම්ඵලං, තංඵලං-ගන්ත්වා සම්මතොති’ ආදිසු නිච්චං-ආනන්තරිකං යමාහු, ආනන්තරිකං යමාහු, පච්චත්තං එව, පච්චත්තං, එව, තං හි, තං හි, ඉතීධ—

**යෙවහිසුඤ්ඤො.**

යඑවහිසද්දෙසු නිග්ගහීතස්ස ඤ්ඤො වා හොති-“වග්ගලසෙහි තෙ’ ති යස්ස ඤ්ඤකාරො-ආනන්තරිකඤ්ඤමාහු, ආනන්තරිකං යමාහු, ඤ්ඤස්ස විතෙන-පච්චත්තඤ්ඤෙව, පච්චත්තංඑව—තඤ්ඤි, තංහි-එව සද්දසහචරියා ය ඉති යසද්දස්සෙව ගහණං—සංයතො, සංයතො’තීධ.

**යෙ සංස්ස.**

සංසද්දස්සයං නිග්ගහීතං තස්ස වා ඤ්ඤො හොති යකාරෙ—සඤ්ඤතො, සංයතො-ඉධයකාරමත්තෙනාපි ගය්හතෙ පුනබ්බචනා.

තං එව, තං එව, තං ඉදං, තං ඉදං, තං ඉමිනා, තං ඉමිනාතීධ.—

---

ප්‍රථමෛක වචනාන්තපදයි; වග්ගෙ, වර්ගාක්ෂරයා පරකල්හි; නිග්ගහිතස්සබො, නිග්ගහිතයහට වනාහි; පච්චාසත්‍යා, සථානාසන්න වශයෙන්; වා, විකල්පයෙන්; වග්ගන්තොහොති, වර්ගාන්ත දෙශවේ; තඤ්ඤාණං—පෙ—තම්ඵලං, යනුවේ; ගන්ත්වා සම්මතො ඉති, ගන්ත්වා සම්මතො යන ආදිසු, මෙ ආදිනැන්හි; නිච්චං, අවිකල්පයෙන් වර්ගාන්තාදෙශවේ; ආනන්තරිකංයමාහු—පෙ—තංහිඉති, තංහි තංහි යන ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතාකාරිය කියනුලැබේ;)

යෙවහිසුඤ්ඤො, යනු විකල්පයෙන් ඤ්ඤකාරාදෙශ විධාන සූත්‍රයි, යෙවහිසු යනු සප්තමී බහුවචනාන්ත පදය ඤ්ඤො යනු ප්‍රථමෛක වචනාන්තපදයි; ය එවහිසු, ය ශබ්ද එව ශබ්ද හි ශබ්ද යන මොවුන් පරකල්හි; නිග්ගහිතස්ස, නිග්ගහිතයහට; වා, විකල්පයෙන්; ඤ්ඤොහොති, ඤ්ඤකාරාදෙශවේ; වග්ගලසෙහිතෙ ඉති, වග්ගලසෙහිතෙ යන සූත්‍රයෙන්; යස්ස, යකාරයහට; ඤ්ඤකාරො, ඤ්ඤකාරයෙක්වේ;—ආනන්තරිකඤ්ඤමාහු, ආනන්තරිකංයමාහු යනුවේ; ඤ්ඤස්ස, ඤ්ඤකාරයහට; විතෙන, විකල්පකල්හි; පච්චත්තඤ්ඤෙව, පච්චත්තං එව තඤ්ඤි තංහියනුවේ; එව සද්දසහචරියා, එව ශබ්දයා හා සහචාරිත්වය හෙතුකොටගෙන; ය ඉති, ය යනු; යසද්දස්සෙව, සර්වනාමිකවූ යශබ්දයාගේම; ගහණං, ග්‍රහණයයි; සංයතො සංයතො ඉති, සංයතො, සංයතො යන ඉධ, මෙහි; (සන්ධිවුච්චතෙ, සංහිතාකාරිය කියනු ලැබේ)

යෙසංස්ස, යනු විකල්පයෙන් ඤ්ඤකාරාදෙශ විධානසූත්‍රයි යෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය; සංස්සයනු, ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදයි; යකාරෙ, යකාරයා පරකල්හි; සංසද්දස්ස, සංශබ්දයා සම්බ

**මයදා සරෙ.**

නිග්ගහීතස්ස මයදා හොන්ති වා සරෙ ක්වචි–තමෙව, තංඑව–තයිදං’ තංඉදං–තදමිනා, තං ඉමිනා එත්ථ “තදමිනාදීනි” තිනිපාතනා ඉකාරස්ස අකාරො—ලක්ඛණන්තරෙනාවිහිතාදෙසලොපාගමවිපල්ලාසා සබ්බත්ථ ඉමිනාව දට්ඨබ්බා–තෙන නිජකො නියකො, ‘තිආදි සිද්ධං–බුද්ධම් සරණමිච්චාදිසු යොගවිභාගා.

**නිග්ගහීත සන්ධි.**

---

අථ නාමානි වුච්චන්තෙ.

තානි විවිධානි සලිඞ්ගාලිඞ්ගවසෙන–තත්ථ සලිඞ්ගෙසු තාව අකාරන්තො පුල්ලිඞ්ගො බුද්ධසද්දො, තතො විභත්තියො පරා යොජීයන්තෙ–බුද්ධ ඉති ඨිතෙ.

---

කිවූ; යංනිග්ගහීතං, යම් නිග්ගහීතයෙක් ඇද්ද; තස්ස, ඕහට; වා, විකල්පයෙන්; ඤෙදුහොති, ඤකාරාදෙශවේ; සඤ්ඤතො, සංයතො, යනු වේ; පුනබ්බචනා, නැවත සූත්‍රයක් හදළහෙයින්; ඉධ, මේ සූත්‍රයෙහි; යකාරමත්තොව, යකාර මාත්‍රයක්ම; ගය්හතෙ, ගන්නාලැබේ; තං, එව—පෙ—තං ඉමිනා ඉති, තං ඉමිනා යන ඉධ මෙහි (සන්ධිවුච්චතෙ සංහිතාකාරිය කියනුලැබේ)

මයදාසරෙ, යනු විකල්පයෙන් මයද යනාදෙශ විධානසූත්‍රයි, මයදා යනු ප්‍රථමා බහු වචනාන්තපදය; සරෙයනු සප්තම්‍යෙක වච නාන්තපදයි; සරෙ, ස්වරයාපරකල්හි; නිග්ගහීතස්ස, නිග්ගහීතය හට; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; මයදාහොන්ති, මයද යනාදෙශයෝ වෙත්; තමෙව—පෙ—තං ඉමිනා යනුවේ; එත්ථ, මේ තදමිනා යනතන්හි; තදමිනාදීනීති, තදමිනාදිනි යන; නිපාතනා, සූත්‍රනිපාතනයෙන්; ඉකාරස්ස, ඉකාරයහට; අකාරො, අකාර යෙක්ආදෙශවෙ; ලක්ඛණන්තරෙන, අන්‍යසූත්‍රයකින්; අවිහිත, නොකරණලද; ආදෙස, ආදෙශය; ලොප, ලොපය; ආගම, ආගමය; විප ල්ලාසා, විපරියාසය යනමොහු; සබ්බත්ථ, හැමතැන්හි; ඉමිනාව, මේතදමිනාදීනි යන සූත්‍රනිපාතනයෙන්ම; දට්ඨබ්බා, දතයුත්තාහුයි; තෙන, එහෙයින්; නිජකොනියකො ඉති, නීජකො නියකො යන; ආදි, මේ ආදිය; සිද්ධං, පරිනිෂ්පන්නයි; බුද්ධම් සරණම් ඉති, බුද්ධම්සර ණම් යන, ආදිසු, මේ ආදි තැන්හි; යොග විභාගා, මයදා යන සූත්‍ර යෙන් සිද්ධයි.

නිග්ගහීත සන්ධි, නිග්ගහීත සංහිතායි

---

අථ, ඉක්බිත්තෙන්; නාමානි, බුද්ධාදිනාමයෝ; වුච්චන්තෙ, කියනුලැබෙත්; තානි, එබුද්ධාදි නාමයෝ; සලිඞ්ගාලිඞ්ගවසෙන, සලිඞ්ග

**වෙ වෙ කානෙකෙසු නාමස්මා සියො අංයො නාභි සනං ස්මාභි සනං ස්මිංසු.**

එතෙසං වෙ වෙ හොන්ති එකානෙකත්ථෙසු වත්තමානතො නාම ස්මානි යථාක්කමං එකම්හි වත්තබ්බෙ එකවචනානං බහුම්හි වත්තබ්බෙ බහුවචනානං චානියමෙනප්පසඞ්ගෙ-නාමස්මා 'තිඅධිකාරො.

**පඨමාත්ථමත්තෙ.**

සකත්ථදබ්බලිඞ්ගානි සඞ්ඛ්‍යාකම්මාදිපඤ්චකං
නාමත්ථො තස්ස සාමඤ්ඤමත්ථමත්තං පවුච්චතෙ.

---

නාමය අලිඞ්ගනාමයයන මොවුන්ගේ වශයෙන්; විධා, විප්‍රකාරවෙත්; තත්‍ථ, ඒවිප්‍රකාරවූ නාමයන් අතුරෙහි; තාව, පළමුකොට; සලිඞ්ගෙසු, සලිඞ්ගනාමයන් කෙරෙහි; අකාරන්තතො, අකාරන්තවූ; පුල්ලිඞ්ගා, පුල්ලිඞ්ගවූ; බුද්ධසද්දා, බුද්ධ ශබ්දයාකෙරෙන්; සත්තවිභත්තියො, සප්ත විභක්තීහු; පරා, පරවූවාහු; යොජියනෙත, යොදනුලැබෙත්; බුද්ධ ඉති, බුද්ධකියා; ඨිතෙ, ශබ්දප්‍රකෘතිය සිටිකල්හි–

වෙ වෙ කානෙකෙසු නාමස්මා සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු, යනුස්‍යාදි විභක්ති විධාන සූත්‍රයි, වෙ වෙ, යනු ප්‍රථමා බහුවචනාන්තපදය; එකානෙකෙසු යනු සප්තමී බහුවචනාන්තපදය, නාමස්මායනු පඤ්චම්‍යෙක වචනාන්තපදය, සියො අංයො නාභි සනංස්මාභිසනංස්මිංසු, යනු ස්‍යාදිලුප්ත ප්‍රථමා බහුවචනාන්තරූඪි පදයි; එකානෙකත්ථෙසු, එකානෙකාර්‍ථ දෙක්හි; වත්තමානතො, වැටෙන්නාවූ; නාමස්මා, නාමයාකෙරෙන්; එතෙසං, මෙස්‍යාදි සප්ත විකයන් සම්බන්ධිවූ; වෙ වෙ, දෙදෙනෙක් දෙදෙනෙක්; යථාක්කමං, පනාතීන්; හොන්තීති, වෙත්නුයි; එකම්හි වත්තබ්බෙ, ඒකාර්‍ථයක් කියයුතු කල්හි; එකවචනානං, එක වචනයන්ගේද; බහුම්හි වත්තබ්බෙ, බහවර්‍ථයක් කියයුතුකල්හි; බහුවචනානඤ්ච, බහුවචන යන්ගේද; අනියමෙන, සාමාන්‍යයෙන්; පසඞ්ගෙ, පැමිණීමක් ඇති කල්හි; නාමස්මාඉති, නාමස්මායනු, අධිකාරො, මතු මතු සූත්‍රහා සම්බන්ධකරණු ලැබේ–

පඨමාත්ථමත්තෙ, යනු ප්‍රථමා විභක්ති නියම සූත්‍රයි. පඨමා යනු ප්‍රථමෛක වචනාන්තපදය; අත්ථමත්තෙයනු සප්තම්‍යෙක වචනාන්ත පදයි; සකත්ථ, ජාතිගුණක්‍රියා ලක්ෂණවූ ස්වාර්‍ථය හෙවත් විශෙෂණය; දබ්බ, තන්නිශ්‍රිතවූ ද්‍රව්‍යයහෙවත් විශෙෂ්‍යය; ලිඞ්ගානි, ස්ත්‍රීපුන්නපුංසකලිඞ්ගය; සංඛ්‍යා, එකචාදි සංඛ්‍යාය; කම්මාදි, කර්‍මාදිෂට්කාරකය යන, පඤ්චකං, පස; නාමත්ථො, නාමයාගෙ අර්‍ථනම; තස්ස, එනාමාර්‍ථයාගේ;

නාමස්සාභිධෙය්‍යමත්තෙ පඨමාවිභත්ති හොති'ති වත්තිච්ඡාවසා පඨමායෙකවචන බහුවචනානි.

සියොඉති පඨමා, සි සඉකාරස්සානුබන්ධත්තාපපයොගො—පයොජනං "කිමංසිසු''ති සඞ්කෙතො—තථා අං වචනස්සාකාරස්ස-සි-අතො'ති වත්තතෙ-තස්ස නාමවිසෙසනත්තා "විධිබ්බිසෙසනන්තස්සා''ති තදන්තාතො විධි.

**සිසෙසා.**

අකාරන්තතො නාමස්මා පරස්ස සිස්ස ඔ හොති-පුබ්බසරලොපො බුද්ධො තිට්ඨති-යො.

---

සාමඤ්ඤං, සාමාන්‍යය හෙවත් කර්‍මකර්තෘ ආදීන්ට සාධාරණාව සත්‍ථාව, අත්‍ථමත්තං, අර්‍ථමාත්‍රයයි; පවුච්චතෙ, කියනුලැබේ; නාමස්ස, නාමයාගෙ; අභිධෙය්‍යමත්තෙ, අර්‍ථසාමාන්‍යයක් කියයුතු කල්හි හෙවත් අනපෙක්‍ෂිතවූ විභක්තිවිශෙෂඇති අර්‍ථයක් විවක්‍ෂිතකල්හි; පඨමාවිභත්තිහොතීති, ප්‍රථමාවිභක්ති වේනුයි; වත්තිච්ඡාවසා, වක්තෘ විවක්‍ෂා වශයෙන්; පඨමාය, ප්‍රථමාවිභක්ති සම්බන්‍ධිවූ; එකවචන බහු වචනානි, එකවචන බහුවචනයෝවෙති; සියො ඉති, සිය යොය යනු, පඨමා, ප්‍රථමාවිභක්තියි; සිස්ස, සිවිභක්ති සම්බන්ධවූ; ඉකාරස්ස, ඉකාරයාතමා, අනුබන්ධත්තා, පසුවකාරිය වශයෙන් බඳනාලද හෙයින්; අප්පයොගො, අප්‍රයොගවේ—පයොජනං, ඉකාරයෙන් ප්‍රයොජනය; කිමං සිසු ඉති, කිමං සිසු යන සූත්‍රයෙහි; සංකෙතො, සලකුණි; අං වචනස්ස, අං වචනයා සම්බන්‍ධිවූ; අකාරස්ස, අකාරයාගේ ප්‍රයොගයහා අප්‍රයොගයද, තථා, එසේමැයි; සි, සිවිභක්තිවේ—අතො ඉති, අතොයනු වත්තතෙ, වැටේ; තස්ස, ඒ අතොයන්නාහුගෙ, නාම විසෙසනත්තා, නාමයහට විශෙෂණබව හෙයින්; විධිබ්බිසෙනන්තස්සාති, විධිබ්බිසෙසනන්තස්සයන පරිභාෂා සූත්‍ර සාමර්‍ථ්‍යයෙන්; තදන්තතො, එවිශෙෂණයා අන්තකොට ඇති නාමයා කෙරෙන්; පරස්ස, පරයාහට; විධි කාය්‍ර්‍යවේ.

සිසෙසා යනු ඔකාරාදෙශ විධානසූත්‍රයි-සිස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය ඔ, යනු ප්‍රථමෛක වචනාන්ත රූපපදයි—අකාරන්තතො නාමස්මා, අකාරාන්ත නාමයාකෙරෙන්; පරස්ස, පරවූ; සිස්ස, සිවිභක්තිහට; ඔහොති, ඔකාරයෙක් ආදෙශවේ; පුබ්බසරලොපො, පූර්‍වස්වරලොප්වේ; බුද්ධො තිට්ඨති යනුවේ; බුද්ධො, සර්‍වඥතෙම; තිට්ඨති, සිටී; යො, යො විභක්තිවේ;

**අතො යොනං ටාටෙ.**

අකාරන්තතො නාමස්මා පරෙසං පඨමාදුතියායොනං ටාටෙ හොන්ති යථාක්කමං–ටකාරානුබන්ධත්තා "ටනුබන්ධානෙකවණ්ණා සබ්බස්සා"ති සබ්බාදෙසො–බුද්ධා තිට්ඨන්ති,'පඨමාත්ථමත්තෙ'ති වත්තතෙ.

**ආමන්තණෙ.**

සද්දෙනාභිමුඛීකාරො විජ්ජමානස්ස වත්ථුනො
ආමන්තණං විධාතබ්බෙ නත්ථි රාජා භවේතිතං.

ආමන්තණාධිකෙ අත්ථමත්තෙ පඨමා විභත්ති හොතී'ති එකස්මිං එකවචනං සි.

**ගොස්‍යාලපනෙ.**

ආලපනෙ සි ගසඤ්ඤො හොති–ලොපො'ති වත්තතෙ

---

අතො යොනං ටාටෙ, යනු ටාටෙ යනාදෙශ විධානසූත්‍රයි; අතො යනු පඤ්චම්‍යෙක වචනාන්ත නිපාතපදය; යොනං යනු ෂෂ්ඨී බහුවචනාන්ත පදය; ටාටෙ යනු ප්‍රථමා බහුවචනාන්ත පදයි; අකාරන්තතො නාමස්මා, අකාරාන්ත නාමයාකෙරෙන්; පරෙසං, පරවූ; පඨමාදුතියායොනං, ප්‍රථමා ද්විතියා යො විභක්තීන්ට; යථාක්කමං, පනතීන්; ටාටෙහොන්ති, ටාටෙ යනාදෙශයෝවෙත්; ටකාරානුබන්ධත්තා, ටකාරානුබන්ධකාරිය හෙයින්; ටනුබන්ධා නෙකවණ්ණා සබ්බස්සඉති, ටනුබන්ධා නෙකවණ්ණා සබ්බස්ස යන පරිභාෂා සූත්‍රයෙන්; සබ්බාදෙසො, සියළු යො විභක්තිමකාටා යනාදෙශවේ; බුද්ධාතිට්ඨන්ති යනුවේ; බුද්ධා සර්වඥවරයෝ තුමූ; තිට්ඨන්ති, සිටිත්; පඨමාත්ථමත්තෙ ඉති, පඨමාත්ථමත්තෙ, යනු වත්තතෙ, වැටේ;

ආමන්තණෙ, යනු ආමන්ත්‍රණ ප්‍රථමා විභක්ති නියම සූත්‍රයි, ආමන්තණෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි—විජ්ජමානස්ස, විද්‍යමානවූ; වත්ථුනො, දෙවදත්තාදිවස්තුහුගේ; සද්දෙන, නම්න්; අභිමුඛීකාරෙ, අනභිමුඛයාගේ අභිමුඛක්රීම; ආමන්තණං, ආමන්ත්‍රණනාම; තං, එආමන්ත්‍රණය; රාජාභවෙති, තෝ, රජ.වෙවයි; විධාතබ්බෙ, විධානකටයුතුතෙනහි; නත්ථි, නැති; ආමන්තණාධිකෙ, ආමන්ත්‍රණයක් අධිකකොටඇති; අත්ථමත්තෙ, අර්ථසාමාන්‍යයක් කියයුතුකල්හි; පඨමාවිභත්තිහොතීති, ප්‍රථමා විභක්තිවේතුයි; එකස්මිං, එකාර්ථයක් කියයුතු කල්හි; එකවචනං, එකවචනවූ; සි, සිවිභක්තිවේ;

ගොස්‍යාලපනෙ, යනු ගසංඥා විධානසූත්‍රයි ගො, යනු ප්‍රථමෙකවචනාන්තපදය; සියනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; ආලපනෙ, යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; ආලපනෙ, ආමන්ත්‍රණ විෂයෙහි කරණලද; සි, සිවිභක්තිතොම; ගසඤ්ඤොහොති, ගසංඥ ඇත්තේවේ—ලොපොඉති, ලොපොයනු වත්තතෙ, වැටේ—

**ගසීනං.**

නාමස්මා ගසීනං ලොපො හොති-හොබුද්ධමංපාලය-ගෙ'තිවත්තතෙ.

**අයූනං වා දීඝො.**

අඉඋ ඉච්චෙසං වා දීඝො හොති ගෙපරෙ ඨිතෙ'තිදිසෙ-බුද්ධා, කෙචි දීඝං දූරාලපනෙ යෙවිච්ඡන්ති සම්පාලපනෙපි දස්සනතො තං න ගහෙතබ්බං-යොමහි,—බුද්ධා මං පාලෙථ.

**කම්මෙ දුතියා.**

කත්තුක්‍රියාභිසම්බන්ධං කාරකං කම්මමුච්චතෙ,
නිබ්බත්ති විකතිප්පත්ති භෙදා තං ත්විධං භවෙ

අස්මිං දුතියා විභත්තිහොති-අංයො ඉති දුතියා-අං-බුද්ධංපණමාමි, යොසසටෙ-බුද්ධෙ.

---

ගසීනං, යනු ගසංඥ සිවිභක්ති ලොප විධාන සූත්‍රයි, ගසීනං, යනු ෂෂ්ඨී බහුවචනාන්තපදයි- නාමස්මා, නාමයාකෙරෙන් පරවූ; ගසීනං, ගයසිය යනමොවුන්ට; ලොපොහොති, ලොප්වේ; හො බුද්ධ, පින්වත්වූ සර්වඥය; මංපාලය, මාරක්ෂාකර; ගෙ ඉති, ගෙයනු; වත්තතෙ, වැටේ—

අයූනං වාදීඝො, යනු විකල්පයෙන් දීර්ඝ විධානසූත්‍රයි; අයූනං යනු ෂෂ්ඨීබහු වචනාන්තපදය; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත පදය, දීඝොයනු ප්‍රථමෛක වචනාන්තපදයි; ගෙපරෙ, ගසංඥයා පරකල්හි; ඨිතෙග, ලිඞ්ගත්‍රයෙහි වැටෙන්නාවූ; අඉඋ ඉති, අඉඋ යන; එතෙසං, මොවුන්ට; වා, විකල්පයෙන්; දීඝොහොතීති, දීර්ඝවේ නුයි; දීසෙ, දීර්ඝකළකල්හි; බුද්ධායනුවේ ~ කෙචි, සාර සඞ්ග්‍රහකාරාදිවූ සමහර ආචාරිකෙනෙක්, දීඝං, දීර්ඝය; දූරාලපනෙ යේව, දූරස්ථයාගේ ආමන්ත්‍රණ විෂයෙහිම; ඉච්ඡන්ති, කැමතිවෙති; සම්පාලපනෙපි, සමීපස්ථයාගේ ආමන්ත්‍රණ විෂයෙහිද; දස්සනතො, පැනෙනහෙයින්; තං, එය; නගහෙතබ්බං, නොගත යුත්තේයි. ~ යොම්හි යො විභක්තිකළකල්හි; බුද්ධා, පින්වත් සර්වඥවරයෙනි; මං, මා; පාලෙථ, රක්ෂාකරව් ~

කම්මෙදුතියා, යනු ද්විතීයා විභක්ති නියමසූත්‍රයි; කම්මෙයනු සප්තම්‍යෙක වචනාන්තපදය; දුතියායනු ප්‍රථමෛකවචනාන්තපදයි, කත්තු, දෙවදත්තාදි කර්තෘහුගේ; ක්‍රියා, ගමනපචනාදි ක්‍රියායෙන්; අභිසම්බන්ධ, විශෙෂයෙන් සම්බන්ධකරණලද; කාරකං, කාරකයතෙම; කම්මං, කර්මකාරකයයි වුච්චතෙ, කියනුලැබේ; තං ඒකර්මකාරකය තෙම; නිබ්බත්ති, නිර්වෘත්තිකර්මය; විකති, විකෘතිකර්මය; පත්ති, ප්‍රාප්තිකර්මය යන; භෙදා, ප්‍රභෙදහෙයින්; තිවිධමභවෙ, තුන්වැදෑරුම්වේ; තස්මිං, ඒකර්මකාරයක් විවක්ෂිතකල්හි; දුතියා විභත්තිහොති, ද්විතීයා

**කත්තුකරණෙසු තතියා.**

ක්‍රියං යො කුරුතෙ මුඛ්‍යො ස කත්තා යොජිතො න වා
කරණං තං විසෙසෙන යං ක්‍රියාසිද්ධිහෙතුකං

තෙසු කාරකෙසු තතියා විභත්ති හොති - නාහි ඉති තතියා — නා — නාස්සා'ති වත්තතෙ.

**අතෙන**

අකාරන්තතො නාමස්මා පරස්ස නාවචනස්ස එනාදෙසො හොති - බුද්ධෙන දෙසිතො ධම්මො — හි —

**සුහිස්වෙස්ස.**

අකාරන්තස්ස සුහිස්වෙහොති - බුද්ධෙහි - වෙ'හි වත්තතෙ.

---

විභක්තිවේ; අංයො ඉති, අංයයොයයනු; දුතියා, ද්විතීයා විභක්තියි; අං, අංවිභක්තිවේ; බුද්ධං, සර්‍වඥයා; පණමාමි, වඳිමි෴ යොස්ස, යො විභක්තිහට; ටෙ, ටෙයනාදෙශවේ; බුද්ධෙ, සර්‍වඥවරයන්; පණමාමි, වඳිමි෴

කත්තුකරණෙසු තතියා, යනු තෘතීයා විභක්තිනියම සූත්‍රයි; කත්තුකරණෙසු යනු සප්තමී බහුවචනාන්තපදය; තතියා යනු ප්‍රථමෙක වචනාන්තපදයි; යොජිතො. යඥදත්තාදි කිසිවක්හු විසින් මෙහෙයනලද්දවූහෝ; නවා, නොමෙහෙයන ලද්දවූහෝ; මුඛ්‍යො, ස්වප්‍රධානවූ; යො, යමෙක්තෙම; ක්‍රියං, ගමන පචනාදී ක්‍රියාව; කුරුතෙ, කෙරේද; සො, හෙතෙම; කත්තා, කර්‍තෘ නම; යං, යමෙක්තෙමා විසෙසෙන, සෙසුකාරකයන්ට වඩා විශෙෂයෙන්; ක්‍රියා සිද්ධිහෙතුකං, ක්‍රියාසිද්ධියට කාරණද; තං, ඒ; කරණං, කරණකාරකනම්වේ; තෙසු; ඒකර්තෘකාරකකරණ කාරකදෙක්හි; තතියා විභත්තිහොති, තෘතීය, විභක්තිවේ; නාහිඉති, නායහියයනු; තතියා, තෘතීයාවිභක්තියි; නා, නාවිභක්තිවේ; නාස්සඉති, නාස්සයනු වත්තතෙ, වැටේ;

අතෙන, යනු එන යනාදෙශවිධානසූත්‍රයි; අතොයනු පඤ්චම්‍යෙක වචනාන්තනිපාතපදය; එන යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්තපදයි; අකාරන්තතො නාමස්මා, අකාරාන්ත නාමයාකෙරෙන්; පරස්ස, පරවූ; නා වචනස්ස, නාවිභක්තිහට; එනාදෙසොහොති, එනයනාදෙශවේ; බුද්ධෙන, සර්‍වඥයා විසින්; ධම්මො, ධර්‍මයතෙම; දෙසිතො, දෙසන ලදී; හි, හි විභක්තිවේ;

සුහිස්වෙස්ස, යනු එකාරාදෙශ විධානසූත්‍රයි; සුහිසුයනු සප්තමී බහුවචනාන්තපදය; අස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; එයනු ප්‍රථමෙක වචනාන්තපදයි; සුහිසු, සුයහිය යනමොවුන් පරකල්හි; අකාරන්තස්ස, අකාරාන්ත නාමයහට; එහොති, එකාරාදෙශවේ; බුද්ධෙහි යනුවේ; බුද්ධෙහි, සර්‍වඥවරයන් විසින්; ධම්මො, ධර්‍මයතෙම;

**ස්මාහිස්මිංනං ම්හාභිම්හි.**

නාමස්මා පරෙසං ස්මාහිස්මිංනං ම්හාභිම්හි වා හොන්ති යථාක්කමං—හිස්ස භියාදෙසො-බුද්ධෙභි, කරණෙ—බුද්ධෙන ලොකො සුචරති, බුද්ධෙහි, බුද්ධෙභි, වා.

**චතුත්ථී සම්පදානෙ.**

අනුමන්තානිරාකත්තුජ්ඣෙසකානං වසා තිධා
දදාති කම්මනා යුත්තං සම්පදානමුදීරිතං.

තස්මිං සම්පදානකාරකෙ චතුත්ථී සියා—සනං ඉති චතුත්ථී-ස.

**සුඤ් සස්ස.**

නාමස්මා පරස්ස සස්ස සුඤ් හොති—සච-ජඞීයා'ති වත්තමානෙ

දෙසිතො, දෙශනාකරණලදී; වා ඉති, වායනු; වත්තතෙ, වැටේ—ස්මා—ස්මාවිභක්තිවේ;

ස්මාහිස්මිංනංම්හාභිම්හියනු විකල්පයෙන් ම්හායභියම්හිය යනා දෙශ විධානසූත්‍රයි; ස්මාහිස්මිංනංයනු ෂෂ්ඨීබහුවචනාන්ත පදය; ම්හාභිම්හි, යනු ලුප්ත ප්‍රථමා බහුවචනාන්තපදයි; නාමස්මා, නාමයාකෙරෙන්; පරෙසං, පරවූ; ස්මාහිස්මිංනං, ස්මායහියස්මිංය යනමො වුන්ට; යථාක්කමං, පනාතින්; වා විකල්පයෙන්; ම්හාභිම්හි, ම්හායභි යම්හිය යන ආදෙශයෝ; හොන්තීති වෙත්නුයි; හිස්ස, හිවිභක්තිහට; භියාදෙසො, භියනාදෙශවේ; බුද්ධෙභියනුවේ; කරණෙ, කරණකාරක යෙහි; උදාහරණකියනුලැබේ; බුද්ධෙන, සර්වඥයා කරණකොටගෙන; ලොකො, ලෝවැසිතෙම; සුචරති, මනාවහැසිරේ-බුද්ධෙහි බුද්ධෙභිවා, බුද්ධෙහි බුද්ධෙභි කියාහෝවේ; බුද්ධෙහි බුද්ධෙභි, සර්වඥයන් කරණ කොටගෙන ලොකො, ලෝවැසිතෙම; සුචරති, මනාවහැසිරේ.

චතුත්ථිසම්පදානෙ, යනු චතුර්ථීවිභක්තිනියම සූත්‍රයි; චතුත්ථියනු ප්‍රථමෛක වචනාන්තපදය; සම්පදානෙ යනු සප්තම්‍යෙක වචනාන්ත පදයි; දදාති, දදයනධාතුහුගේ; කම්මනා, ක්‍රියායෙන්; යුත්තං, යුක්තවූ; සම්පදානං සම්ප්‍රදානකාරකයතෙම; අනුමන්තු, අනුමන්තෘය; අනිරාකත්තු, අනරාකත්‍රීය; අජ්ඣෙසකානංවසා, අධ්‍යෙසකය යන මොවුන්ගේ වශයෙන්; තිධා, තුන්පරිද්දකින්; උදීරිතං, කියනලදී; තස්මිංසම්පදානකාරකෙ, ඒසම්ප්‍රදානකාරකයක් කියයුතුකල්හි; චතුත්ථි, චතුර්ථීවිභක්තිතොමෝ; සියා, වන්නීය; සනං ඉති, සයනංයයනු චතුත්ථි, චතුර්ථීවිභක්තියි; ස, සවිභක්තිවේ;

සුඤ්සස්සයනු, සුඤ්ඤාගමවිධානසූත්‍රයි; සුඤ්යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; සස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; නාමස්මා, නාමයාකෙරෙන්; පරස්ස, පරවූ; සස්ස, සවිභක්තිහට; සුඤ්හොති, සුඤ්ඤාගමවේ; සච, ඒ සුඤ්ඤාගමයද; ජඞීයාඉති, ජඞීයායනු, වත්තමානෙ, වැටෙන්නෙහි;—

**ඤකානුබන්ධාද්‍යන්තා.**

ඡට්ඨිනිද්දිට්ඨස්ස ඤානුබන්ධකානුබන්ධාද්‍යන්තා හොන්ති'ති ආදිභූතො හොති—උකාරො උච්චාරණත්ථො-ඤකාරො එසෙව සඞ්කෙතත්ථො- බුද්ධස්ස පුප්ඵං දෙහි,—අතො වා බහුලම්ති ච වත්තතෙ.

**සස්සාය චතුත්ථියා.**

අකාරන්තතො පරස්ස සස්ස චතුත්ථියා ආයො හොති වා බහුලං— බුද්ධාය, යෙභුය්‍යෙන තාදත්ථෙ යෙවායමායො ද්දිස්සතී'ති ඉතොපරං නොදාහරීයතෙ—නං—දීඝො'තිවත්තතෙ.

**සුනංහිසු.**

එසු නාමස්ස දීඝො හොති-බුද්ධානං.

---

ඤකානුබන්ධාද්‍යන්තායනු පරිභාෂාසූත්‍රයි; ඤකානුබන්ධා යනු, ප්‍රථමා බහුවචනාන්තපදය; ආද්‍යන්තායනු ප්‍රථමා බහුවචනාන්ත පදයි; ඡට්ඨිනිද්දිට්ඨස්ස, ෂෂ්ඨීවිභක්තීන් දක්වන ලද්දහුගේ; ඤානුබන්ධ කානුබන්ධා, ඤකාරානුබන්ධ කකාරානුබන්ධ කාර්‍ය්‍යයෝ; අද්‍යන්තා, ආද්‍යවයව අන්තාවයවවූවාහු; හොන්තීති වෙත්නුයි; ආදිභූතො හොති, ඤකාරානුබන්ධකාරියහෙයින් ආද්‍යවයවවූයේවේ; උකාරො, උකාරයතෙම; උච්චාරණත්ථො, සුඛොච්චාරණය ප්‍රයොජනකොට ඇත්තේයි; ඤකාරො, ඤකාරයතෙම; එසෙව, මේ පරිභාෂාසූත්‍රයෙහිම; සංකෙතත්ථො, චිහ්නය ප්‍රයොජනකොට ඇත්තේයි; බුද්ධස්ස, සර්වඥයාහට; පුප්ඵං, මල්; දෙහි, දෙව * අතො ඉති, අතොයනුද වාඉති, වායනුද; බහුලංඉතිච, බහුලංයනුද; වත්තතෙ, වැටේ;

සස්සායචතුත්ථියා, යනු විකල්පයෙන් ආයයනාදෙශවිධානසූත්‍රයි; සස්සයනු, ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ආයයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; චතුත්ථියා යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; අකාරන්තතො, අකාරාන්තනාමයා කෙරෙන්; පරස්ස, පරවූ; චතුත්ථියා, චතුර්ථීවිභක්ති සම්බන්ධවූ; සස්ස, සවිභක්තිහට; බහුලං, ඉෂ්ටපරිද් දෙන්; වා, විකල්පයෙන්; ආයොහොති, ආයයනාදෙශවේ; බුද්ධාය යනුවේ; බුද්ධාය, සර්වඥයාහට; පුප්ඵං, මල්; දෙහි, දෙව; අයං ආයො, මේ ආයයනාදෙශයතෙම; යෙභුය්‍යෙන, බොහෝසේ; තාදත්ථෙයෙව, තදර්ථවිෂයෙහිම; ද්දිස්සතීති, දක්නා ලැබේනුයි; ඉතොපරං, මෙයින් මත්තෙහි; නොදාහරීයතෙ, උදාහරණනොකරනුලැබේ; නං, නංවිභක්තිවේ; දීඝොඉති, දීඝොයනු; වත්තතෙ, වැටේ;

සුනංහිසු, යනු දීර්ඝවිධානසූත්‍රයි; සුනංහිසු යනු සප්තමී බහුවචනාන්තපදයි; එසු, මේසුයහියනංය යනමොවුන් පරකල්හි; නාමස්ස,

---

* දේ යනු හැම.

**පඤ්චම්‍යාවධිස්මා.**

සීමාභූතො පදත්‍ථානං යො චලො නිච්චලො'ථ වා
අච්චුතො පුබ්බකා රූපා තමාහුරවධිංබුධා.

එතස්මා කාරකා පඤ්චමිවිභත්ති හොති-ස්මා හි ඉති පඤ්චමී-ස්මා-අතො ටාටෙ වෙති ච වත්තතෙ.

**ස්මාස්මින්නං.**

අකාරන්තතො නාමස්මා පරෙසං ස්මාස්මින්නං ටාටෙ වා හොන්ති යථාක්කමං.

බුද්ධා පභා නිච්ඡරති, බුද්ධම්හා, බුද්ධස්මාවා—හි—බුද්ධෙහි, බුද්ධෙභි.

**ඡට්ඨී සම්බන්ධෙ.**

ක්‍රියාකාරකසඤ්ජාතො අස්සෙදම්භාවහෙතුකො
සම්බන්ධො'ති පවුත්තො සො සම්බන්ධිවයතිසයිතො

---

නාමයහට; දිස්සොහොති, දිසීවේ; බුද්ධානංයනුවේ; බුද්ධානං, සර්වඥයන්ට; පුප්ඵං, මල්; දෙහිදෙව;

පඤ්චම්‍යවධිස්මා, යනු පඤ්චමි විභක්ති නියමසූත්‍රයි; පඤ්චමියනු ප්‍රථමෛක වචනාන්තපදය; අවධිස්මායනු පඤ්චම්‍යෙක වචනාන්ත පදයි; පදත්‍ථානං, ගමන පතනාදි ක්‍රියානිමිත්තවෙන්වන්නාවූ පදාර්‍ථයන්ට; සීමාභූතො, හිම්වූ; චලොවා, චලවූහෝ හෙවත් ජඞ්ගමවූහෝ; අථවා, නොහොත්; නිච්චලොවා, නිශ්චලවූහෝ හෙවත් ස්ථාවරවූහෝ; යො, යම් පදාර්‍ථයක්තෙම; පුබ්බකාරූපා, පූර්‍වස්වරූපයෙන්; අච්චුතො, පහනොවීද; තං, එය; බුධා, ප්‍රාඥයෝ; අවධිං, අවධිකාරකයයි; ආහු, කියත්; එතස්මාකාරකා, මේ අවධිකාරකයාකෙරෙන්; පඤ්චමිවිභත්තිහොති, පඤ්චමිවිභක්තිවේ; ස්මාහිඉති, ස්මායහියයනු; පඤ්චමි, පඤ්චමිවිභක්තියි; ස්මා, ස්මාවිභක්තිවේ; අතොඉති, අතොයනුද; ටාටෙඉති, ටාටෙයනුද; වාඉතිච, වායනුද; වත්තතෙ, වැටේ

ස්මාස්මින්නංයනු විකල්පයෙන් ටාටෙයනාදෙශ විධානසූත්‍රයි; ස්මාස්මින්නං යනු ෂෂ්ඨිබහුවචනාන්තපදයි; අකාරන්තතොනාමස්මා, අකාරාන්තනාමයාකෙරෙන්; පරෙසං, පරවූ; ස්මාස්මින්නං, ස්මාය ස්මිංය යනාමොවුන්ට; යථාක්කමං, පනතීන්; වා, විකල්පයෙන්; ටාටෙ හොන්ති, ටාටෙයනාදෙශයෝවෙත්; බුද්ධා, සර්වඥයාකෙරෙන්; පභා, ප්‍රභාතොමෝ; නිච්ඡරති, නික්මේ; බුද්ධම්හාබුද්ධස්මාවා, බුද්ධම්හා බුද්ධස්මකියාහෝවේ; බුද්ධම්හාබුද්ධස්මා, සර්වඥයාකෙරෙන්; පභා, ප්‍රභාතොමෝ; නිච්ඡරති, නික්මේ; හි, හිවිභක්තිවේ; බුද්ධෙහි බුද්ධෙභි; සර්වඥවරයන්කෙරෙන්; පභා, ප්‍රභාතොමෝ; නිච්ඡරති, නික්මේ;

ඡට්ඨීසම්බන්ධෙ, යනු ෂෂ්ඨිවිභක්තිනියමසූත්‍රයි; ඡට්ඨීයනු ප්‍රථමෛක වචනාන්තපදය; සම්බන්ධෙයනු සප්තම්‍යෙකවචනාන්තපදයි; ක්‍රියා

සම්බන්ධීනතාවිසෙසෙපි ඡට්ඨී භෙදකතො සියා
තතො හි ජාතා සම්බන්ධං වදෙය්‍ය න පනඤ්ඤතො.

සම්බන්ධෙ ඡට්ඨී විභත්ති හොති—ස නං ඉති ඡට්ඨී-ස-බුද්ධස්ස විහාරො—නං—බුද්ධානං.

**සත්තම්‍යාධාරෙ.**

කිරියා කත්තුකම්මණං ආධාරියති යෙන සො
ආධාරො චතුධා වුත්තො ව්‍යාපකාදිප්පභෙදතො

ආධාරකාරකෙ සත්තමී විභත්ති හොති—

ස්මිං සු ඉති සත්තමී-ස්මිං-බුද්ධෙ පසන්නො-බුද්ධම්හි, බුද්ධස්මිං, වා-සු, බුද්ධෙසු.

---

කාරකසඤ්ජාතො, ක්‍රියාකාරකදෙකින් නිෂ්පන්නවූ; අසෙසදම්භාව හෙතුකො, මොහුගේ මේය යන බුද්ධිධ්වනි දෙදෙනාගේ වීමට කාරණවූ; සම්බන්ධිවය නිස්සිතො, රාජපුරුෂ සම්බන්ධීන් දෙදෙනා ආශ්‍රය කළාවූ; යො, යමෙක්ඇද්ද; සො, හෙතෙම; සම්බන්ධොති සම්බන්ධ යයි; පවුත්තො, කියනලදී; සම්බන්ධීනතා, සම්බන්ධිභාවයාගේ; අවිසෙසෙපි, විශෙෂයක් නැතිකල්හිදු; හෙවත් උභයසාධාරණ කල්හිදු; ඡට්ඨී, ෂෂ්ඨී විභක්තිතොමෝ; භෙදකතො, විශෙෂණයා කෙරෙන්ම; සියා, වන්නේය; හි, යම්හෙයකින්; තතො, ඒවිශෙෂණයාකෙරෙන්; ජාතා, වූවාවූ ෂෂ්ඨීවිභක්තිය; සම්බන්ධං, සම්බන්ධය; වදෙය්‍ය, කියන්නේද; එහෙයින්, අඤ්ඤතොපන, අනික් විශෙෂ්‍යයාකෙරෙන්; න, ෂෂ්ඨී විභක්තිනොවේ; සම්බන්ධෙ, සම්බන්ධයක් කිවමනාකල්හි; ඡට්ඨී විභත්තිහොති, ෂෂ්ඨීවිභක්තියවේ; සනංඉති, සයනංයයනු; ඡට්ඨී, ෂෂ්ඨී විභක්තියි; බුද්ධස්ස, සර්වඥයාගේ; විහාරො, ගෙයයි; නං, නං විභක්තිවේ; බුද්ධානංකියාවේ; බුද්ධානං, සර්වඥවරයන්ගේ; විහාරො, ගෙයයි.

සත්තම්‍යාධාරෙ, යනු සප්තමී විභක්තිනියම සූත්‍රයි; සත්තමියනු ප්‍රථමෛක වචනාන්තපදය; ආධාරෙයනු සප්තම්‍යෙක වචනාන්ත පදයි; කත්තුකම්මණං, කර්තෲසංඥවූහෝ, කර්මසංඥවූහෝ; ක්‍රියා, ගමන පචනාදික්‍රියාතොමෝ; යෙන, යමක්හු; විසින්; ආධාරීයති, දරනු ලැබේද; සො ආධාරො, ඒ ආධාරකාරකයතෙම; ව්‍යාපකාදිප්ප භෙදතො, ව්‍යාපකාදි ප්‍රභෙදයෙන්හෙයින්; හෙවත් ව්‍යාපකඖපශ්ලේෂික සාමීපිකවෛෂයික ප්‍රභෙදහෙයින්; චතුධා සතරපරිද්දකින්; වුත්තො. කියනලදී; ආධාරකාරකෙ, ආධාරකාරකයෙහි; සත්තමී විභත්තිහොති, සප්තමී විභක්තිවේ; ස්මිංසුඉති, ස්මිංයසුයයනු; සත්තමී, සප්තමී විභක්තියි; ස්මිං, ස්මිංවිභක්තිවේ; බුද්ධෙ, බුද්ධෙයනුවේ; බුද්ධෙ, සර්වඥයා කෙරෙහි; පසන්නො, ප්‍රසන්නයි;-බුද්ධ, සර්වඥය; බුද්ධො, සර්වඥතෙම;

බුද්ධො සබ්බඤ්ඤූයී භවති හි භජතං බුද්ධ බුද්ධං න තං කිං
දින්නං බුද්ධෙන ලොකෙ සිවපදමපි තෙ යන්ති බුද්ධෙන යස්මා
අස්මා බුද්ධස්ස පීතිං පරහිතවිධයං දෙති බුද්ධානපෙතො
මඤ්ඤෙ බුද්ධස්ස නිච්චං ඝටයති මතිමා කොනු භත්තිං න බුද්ධෙ.

එවමඤ්ඤෙසම්පි ඝටපටාදිනමාකාරන්තානං පුල්ලිඞ්ගානං රූපනයො ක්‍රියාභිසම්බන්ධො ච–විසෙසම්පන වක්ඛාම–ඉතො පරං ඡඨියා චතුත්ථිසමත්තා පඤ්චමී බහුවචනස්ස ච තතියාසමත්තා න තා දස්සීයන්ති—ගුම්බසි—අතො සිස්සා'ති ච වත්තතෙ.

**ක්වචෙ වා.**

අකාරන්තතො නාමස්මා පරස්ස සිස්ස එ හොති වා ක්වචි—ගුම්බෙ, ගුම්බො සෙසං බුද්ධසමං–එවං වත්තබ්බෙ, වත්තබ්බො ඉච්චාදි.

---

බුද්ධං, සර්වඥයා; භජතං, සෙවුනාවූ ජනයන්ට; සබ්බඤ්ඤුයී භවති, සර්වාර්ථයන්දෙන සුළුවූයේ වේ හෙවත් සියළු වැඩදෙන සුළුවූයේවේ; හි, එසේමැයි; තෙ, ඒසර්වඥයා, සෙවුනාවූජනයෝ යස්මා, යම්හෙයකින්; බුද්ධෙන, සර්වඥයා කරණකොටගෙන; සිවපදමපි, අමෘතමහා නිර්වාණ පදයටපවා; යන්ති, පැමිනෙත්ද; එහෙයින්; බුද්ධෙන, සර්වඥයාවිසින්; ලොකෙ; සකලලොකයෙහි; තංකිං, ඒකවරනම් අභිවෘද්ධියක්; නදින්නං, නොදෙනලදද; දෙනලදමැයි; අස්මා, එහෙයින්; බුද්ධස්ස, සර්වඥයාගේ; අයංපරහිතවිධි, මේ පරහිතකරණයතෙම; නිච්චං, අනවරතයෙන්; බුද්ධා, සර්වඥයාකෙරෙන්; අනපෙතො පහනුවූයේ; බුද්ධස්ස, සර්වඥයාහට; පීතිං, ප්‍රීතියක්; දෙතිමඤ්ඤෙ, දෙතියිහඟිම්; තස්මා, එහෙයින්; මතිමා, නුවනැත්තාවූ; කො, කවරෙක්; බුද්ධෙ, සර්වඥයාකෙරෙහි; භත්ති, ආදරය; නඝටයති, නොකරන්නේද කරන්නේමැයි—ඝටපටාදීනං, ඝටපටාදිවූ; අකාරන්තානං, අකාරාන්තවූ; පුල්ලිඞ්ගානං, පුල්ලිඟුවූ; අඤ්ඤෙසම්පි, මෙයින් පිටත්සෙසු ශබ්දයන්ගේද; රූපනයො, රූපක්‍රමයද; ක්‍රියාභිසම්බන්ධොච, ක්‍රියාභි සම්බන්ධයද; එවං, මෙසේමැයි; විසෙසම්පන, වෙසෙසවනාහි, පවක්ඛාම, කියමු; ඉතොපරං, මෙයින්මත්තෙහි; ඡඨියා, ෂෂ්ඨී විභක්තියගේ; චතුත්ථිසමත්තා, චතුර්ථීවිභක්තියහා සමබව හෙයින්ද; පඤ්චමී බහුවචනස්ස, පඤ්චමී බහුවචනයත්තමා; තතියාසමත්තා, තෘතීයාවිභක්තිය හා සමබව හෙයින්ද; තා, ඒෂෂ්ඨීපඤ්චමී විභක්තීහු; නදස්සීයන්ති, නොදක්වනුලැබෙත්; ගුම්බ, ගුම්බශබ්දයවේ; ඔහු කෙරෙන් පරව; සි, සිවිභක්තිවේ; අතො ඉතිච, අතොයනුද සිස්සඉතිච, සිස්සයනුද; වත්තතෙ, වැටේ;

ක්වචෙවා, යනු විකල්පයෙන් එකාරාදෙශ විධානසූත්‍රයි; ක්වචියනු සප්තම්‍යෙක වචනාන්තපදය; එයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත

යොසස ටෝ'ති ච වත්තතෙ.

**එකච්චාදීහතො.**

අකාරන්තෙහි එකච්චාදීහි යොනං ටෙ හොති-එකෙච්ච, (හො) එකච්චෙ, එකච්චෙ-එවං පඨමසද්දස්ස-නාසස සා වෙ'ති ච වත්තතෙ.

**කොධාදීහි.**

එහි නාසස සා හොති වා—කොධසා, කොධෙන, අත්‍ථසා, අත්‍ථෙනෙච්චාදි—වෙති වත්තතෙ.

**මනාදීහි ස්මිංසනාස්මානං සිසොඔසාසා.**

මනාදීහි ස්මිමාදීනං සිසොඔසාසා හොන්ති වා යථාක්කමං-මනොමනං-මනසා, මනෙන-මනසො, මනසස-මනසා, මනා, මනම්හා, මනස්මා-මනසි, මනෙ, මනම්හි, මනස්මිං.

---

පදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; අකාරන්තතොනාමස්මා, අකාරාන්ත නාමයාකෙරෙන්; පරසස, පරවූ; සිසස, සිවිභක්තිහට; කචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; එහොති, එකාරාදෙශවේ; ගුමෙබ, ගුමෙබායනුවේ; ගුමෙබගුමෙබා, වනලැහැබතෙම; තිඨති, සිටී; සෙසං, සෙසු නොකීරූපක්‍රමය; බුඩසමං, බුඩශබ්දයාගේ රූපක්‍රමයහා සමයි; වත්තබෙවත්තබොඉති, වත්ත බෙවත්තබො යන; ආදි, මේ ආදිය; එවං, මෙසේමැයි; යොසසඉති, යොසසයනුද; ටෙඉතිච, ටෙයනුද; වත්තතෙ, වැටේ;

එකච්චාදීහතො, යනු ටෙයනාදෙශ විධානසූත්‍රයි; එකච්චාදීහි යනු පඤ්චමීබහුවචනාන්තපදය; අතොයනු පඤ්චමී බහුවචනාන්ත නිපාතපදයි; අකාරන්තෙහි, අකාරාන්තවූ; එකච්චාදීහි, එකච්චාදීන් කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයා යොවිභක්තීන්ට; ටෙහොති, ටෙයනාදෙශවේ; එකච්චෙ, හො එකච්චෙ එකච්චෙයනුවේ; පඨමසද්දස්ස, පඨමශබ්දයාගේ රූපක්‍රමයද; එවං, මෙසේමැයි; නාසසසා ඉති, නාසසසායනුද; වෙතිච, වායනුද; වත්තතෙ, වැටේ;

කොධාදීහියනු විකල්පයෙන් සායනාදෙශ විධාන සූත්‍රයි; කොධාදීහියනු පඤ්චමී බහුවචනාන්තපදයි; එහි, මේකොධාදීන්කෙරෙන් පරවූ, නාසස, නාවිභක්තිහට; වා, විකල්පයෙන්; සාහොති, සායනාදෙශවේ; කොධසා කොධෙන අත්‍ථසා අත්‍ථෙන ඉති, කොධසා කොධෙන අත්‍ථසා අත්‍ථෙනයන; ආදි, මේ ආදියවේ; වෙති, වායනු; වත්තතෙ, වැටේ.

මනාදීහිස්මිංසනාස්මානං සිසොඔසාසා, යනු සිසොඔසාසායනාදෙශ විධානසූත්‍රයි; මනාදීහියනු පඤ්චමී බහුවචනාන්තපදය; ස්මිංසනාස්මානං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; සිසොඔසාසායනු ප්‍රථමා

නම තප තෙජ උර සිරප්පභුතයො මනාදයො.

ගච්ඡන්තසි—සිස්ස වේ'ති ච වත්තතෙ-පරතො භියෙ‍්‍යා නානුවත්තයිස්සාම වුත්තියායෙවානුවුත්තස්ස ගම්‍යමානත්තා.

**න්තස්සං.**

සිම්හි න්තප්පච්චයස්ස අං හොති වා-"ගසීන' න්ති සිලොපෙ-ගච්ඡං-අස්සද්දත්‍ර ගච්ඡන්තො.

න්තන්තූනං න්තො යොම්හි පඨමෙ.

පඨමෙ යොම්හි න්තන්තූනං සවිභත්තීනං න්තො ඉච්චාදෙසො වා හොති—බහුලාධිකාරා පුමෙයෙව-ගච්ඡන්තො, ගච්ඡන්තා.

---

බහුවචනාන්තපදයි; මනාදිහි, මනශබ්දාදීන්කෙරෙන්පරවූ; ස්මිංආදීනං, ස්මිංවිභක්තිආදීන්ට; යථාක්කමං, පනාතීන්; වා, විකල්පයෙන්; සිසොඔසාසාහොන්ති, සිසොඔසාසායනාදෙශයෝ වෙත්; මනොමනං—පෙ—මනෙමනසිමනස්මිං යනුවේ; තම, තමශබ්දය; තප, තපශබ්දය; තෙජ, තෙජශබ්දය; උර, උරශබ්දය; සිර, සිරශබ්දයයන; පභුතයො, මේ ආදිශබ්දයෝ; මනාදයො, මනාදිහු නම්වෙත්; ගච්ඡන්ත, ගච්ඡන්ත ශබ්දය; (ඔහුකෙරෙන් පරව) සි, සිවිභක්තීවේ; සිස්සඉතිච, සිස්සයනුද; වෙතිච, වායනුද; වත්තතෙ, වැටේ; පරතො, මත්තෙහි, භියො‍්‍යා, බොහෝසේ; නානුවත්තයිස්සාම, අනුවර්තනය නොකරමු; කුමක්හෙයින්දයත්, වුත්තියායෙව, සූත්‍රාර්ථයෙන්ම; අනුවුත්තස්ස, අනුවර්තියාතමා, ගම්‍යමානත්තා, හැඟෙනුලබනබව හෙයිනි;

න්තස්සං, යනු විකල්පයෙන් අං යනාදෙශ විධාන සූත්‍රයි; න්තස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; අං යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදයි; සිම්හි, සිවිභක්තිපරකල්හි; න්තප්පච්චයස්ස, න්තප්‍රත්‍යයාහට; වා, විකල්පයෙන්; අංහොති, අංයනාදෙශවේ; ගසීනන්ති, ගසීනං යන සූත්‍රයෙන්; සිලොපෙ, සිවිභක්තිහට ලොප්කළකල්හි; ගච්ඡං යනුවේ; අස්සද්දත්‍ර, අංයනාදෙශ නුවූපක්ෂයෙහි; ගච්ඡන්තොයනුවේ;

න්තන්තූනංන්තොයොම්හි පඨමෙ, යනු විකල්පයෙන් න්තොය නාදෙශ විධානසූත්‍රයි; න්තන්තූනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; න්තොයනු ප්‍රථමෛක වචනාන්තපදය; යොම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; පඨමෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; පඨමෙයොම්හි; ප්‍රථමායොවිභක්තිපරකල්හි; සවිභත්තීනං, විභක්ති සහිතවූ; න්තන්තූනං, න්තයන්තුය යන මොවුන්ට; න්තොඉති, න්තො යන; ආදෙසො, මේ ආදෙශයතෙම; වාහොති, විකල්පයෙන්වේ; බහුලාධිකාරා, බහුලාධිකාරය හෙතුකොටගෙන; පුමෙයෙව, පුල්ලිංගයෙහිම න්තොයනාදෙශවේ; ගච්ඡන්තො ගච්ඡන්තායනුවේ;

**ටටාඅං ගෙ**

ගෙ පරෙ න්තන්තූනං සවිභත්තීනං ටටාඅං ඉච්චාදෙසා හොන්ති බහුලං—(හො) ගච්ඡ, ගච්ඡා, ගච්ඡං, ගච්ඡන්තො, ගච්ඡන්තා.

**න්තස්ස ච ට වංසෙ.**

අංසෙසු න්තප්පච්චයස්ස ට හොති වා න්තුස්ස ච—වවත්ථිතවිභාසායං—ගච්ඡං, ගච්ඡන්තං.

**තොතාතිතා සස්මාස්මිංනාසු.**

සාදිසු න්තන්තූනං සවිභත්තීනං තොතාතිතා හොන්ති වා යථාක්කමං—ගච්ඡතා, ගච්ඡන්තෙන-ගච්ඡතො, ගච්ඡස්ස, ගච්ඡන්තස්ස.

**තං නංම්හි.**

නංම්හි න්තන්තූනං සවිභත්තීනං තං වා හොති—ගච්ඡතං, ගච්ඡන්තානං-ගච්ඡතා, ගච්ඡන්තා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා, ගච්ඡති,

---

ටටාඅංගෙ, යනු ටටා අංයනාදෙශ විධානසූත්‍රයි; ටටාඅං යනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; ගෙයනු සප්තම්‍යෙකවචනාන්ත පදයි; ගෙපරෙ, ගසංඥයාපරකල්හි; සවිභත්තීනං, විභක්තිසහිතවූ; න්තන්තූනං, න්තයන්තුය යනමොවුන්ට; ටටාඅංඉති, ටටාඅංයන; ආදෙශා, මේආදෙශයෝ; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; හොන්ති, වෙත්; ගච්ඡ, ගච්ඡා, ගච්ඡං—පෙ—ගච්ඡන්තායනුවේ.

න්තස්සචටවංසෙ, යනු විකල්පයෙන් ටකාරාදෙශ විධානසූත්‍රයි; න්තස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ටයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; වායනුලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය, අංසෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; අංසෙසු, අංවිභක්ති සවිභක්ති පරකල්හි; න්තප්පච්චයස්ස, අන්තප්‍රත්‍යයහටද; න්තුස්සච, න්තුප්‍රත්‍යයහටද; වා, විකල්පයෙන්; ටහොති, ටකාරාදෙශවේ; අයං, මේවාශබ්දයතෙම; වවත්ථිතවිභාසා, ව්‍යවස්ථිතවිභාෂාවාචියි; ගච්ඡං, ගච්ඡන්තං, ගච්ඡන්තෙ යනුවේ;

තොතාතිතාසස්මිංනාසු, යනුතොතාතිතායනාදෙශ විධාන සූත්‍රයි; තොතාතිතායනු ප්‍රථමාබහුවචනාන්ත පදය; සස්මාස්මිංනාසු යනු සප්තමීබහුවචනාන්ත පදයි; සාදීසු, සවිභක්තිආදීන් පරකල්හි; සවිභත්තීනං, විභක්ති සහිතවූ; න්තන්තූනං, න්තයන්තුය යන මොවුන්ට; යථාක්කමං, පන්තීන්; වා, විකල්පයෙන්; තොතාතිතාහොන්ති, තොතාතිතායනා දෙශයෝවෙත්; ගච්ඡතා යනාදියවේ;

තංනංම්හි, යනු විකල්පයෙන් තංයනාදෙශවිධානසූත්‍රයි; තංයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; නංම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදයි; නංම්හි, නංවිභක්ති පරකල්හි; සවිභත්තීනං, විභක්තිසහි

ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං-එවං තපන්ත ජපන්තා දයො-භවන්තසි.

**භූතො.**

භූධාතුතො න්තස්ස අං හොති සිම්හි නිච්චංපුනබ්බිධානා-භවං.

**භවතො වා භොන්තො ගයොනාසෙ.**

භවන්තසද්දස්ස හොන්තාදෙසො වා හොති ගයොනාසෙ- හොන්තො, හොන්තා, භවන්තො, භවන්තා-එවමාලපනෙපි-ගෙ පත-(හො) හොන්ත, හොන්තා, භව, භවා, භවං—භවං, භවන්තං, හොන්තෙ, භවන්තෙ—හොතා, හොන්තෙන, භවතා, භවන්තෙන-හොතො, හොන්තස්ස, භවතො, භවස්ස, භවන්තස්ස.

**සතොසබ් හෙ.**

සන්තසද්දස්ස සබ් භවති හකාරෙ—සබ්භි.

---

නවූ; න්තන්තූනං, න්තයන්තූය යන මොවුන්ට; වා, විකල්පයෙන්; තංහොති, තංයනාදෙශවේ; ගච්ඡතං—පෙ—ගච්ඡන්තස්මිං යනුවේ;

තපන්තජපන්තාදයො, තපන්තජපන්තාදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; භවන්ත, භවන්ත ශබ්දය; ඔහු කෙරෙන් පරව; සි, සිවිභක්තිවේ; භූතො, යනු නිත්‍යයෙන් අංයනාදෙශවිධාන සූත්‍රයි; භූතො යනුපඤ්චම්‍යෙක වචනාන්තපදයි; සිම්හි, සිවිභක්තිපරකල්හී; භූධාතුතො, භූධාතුහු කෙරෙන් පරවූ; අන්තපච්චයස්ස, අන්ත ප්‍රත්‍යය හට; පුනබ්බිධානා, නැවත සූත්‍රයක් හදළහෙයින්; නිච්චං, අවිකල්පයෙන්; අංහොති, අංයනාදෙශවේ; භවංයනුවේ .

භවතොවා හොන්තො, ගයොනාසෙ, යනු හොන්තයනාදෙශ විධානසූත්‍රයි; භවතොයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; වායනුලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; හොන්තොයනු ප්‍රථමෛක වචනාන්ත පදය; ගයොනාසෙ, යනුසප්තම්‍යෙක වචනාන්තපදයි; ගයොනාසෙ, ගයයොයනායසෙය යන මොවුන් පරකල්හි; භවන්තසද්දස්ස, භවන්තශබ්දයහට; වා, විකල්පයෙන්; හොන්තාදෙශොහොති, හොන්ත යනාදෙශවේ; හොන්තො හොන්තාභවන්තො භවන්තායනුවේ; ආලපනෙපි, ආමන්ත්‍රණ විෂයෙහිද; එවං, මෙසේමැයි; හොහොන්ත—පෙ— භවන්තස්ස යනුවේ;

සතොසබ්භෙ, යනුසබ්යනාදෙශ විධානසූත්‍රයි; සතොයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; සබ්යනුලුප්ත ප්‍රථමෛක වචනාන්ත පදය; භෙයනුසප්තම්‍යෙක වචනාන්තපදයි; හකාරෙ, හකාරය පර කල්හී; සන්තසද්දස්ස, සන්තශබ්දයහට; සබ්භාවති, සබ්යනාදෙශවේ; සබ්භි, යනුවේ.

**මහන්තාරහන්තානං ටා වා.**

සිම්හි මහන්තාරහන්තානං න්තස්ස ටා වා හොති—මහා, මහං මහන්තො-අරහා, අරහං, අරහන්තො-භවන්තාදීනං සෙසං ගච්ඡන්තසමං-අස්ම සි.

**රාජාදියුවාදීහා.**

රාජාදිහි යුවාදිහි ච පරස්ස සිස්ස ආ හොති—අස්මා.

**යොනමානො.**

රාජාදිහි යුවාදීහි ච යොනමානොවා හොති-අස්මානො, අස්මා—(හො) අස්ම, අස්මා අස්මානො, අස්මා.

**වාම්හානඞ.**

රාජාදීනං යුවාදිනං චානඞ හොති වාම්හි අස්මානං, අස්මිං, අස්මානො, අස්මෙ.

---

මහන්තාරහන්තානංටාවා, යනු විකල්පයෙන්ටායනාදෙශවිධාන සූත්‍රයි; මහන්තාරහන්තානං යනු ෂෂ්ඨීබහුවචනාන්ත පදය; ටායනු ලුප්තප්‍රථමෛක වචනාන්ත පදය; වායනුලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; සිම්හි, සිවිභක්ති පරකල්හි; මහන්තාරහන්තානං, මහන්ත අරහන්තශබ්දයන් සම්බන්ධීවූ; න්තස්ස, න්තප්‍රත්‍යයහට; වා, විකල්පයෙන් ටාහොති, ටායනාදෙශවේ; මහා—පෙ—අරහන්තො යනුවේ; භවන්තාදි, භවන්තාදි ශබ්දයන්ගේ; සෙසං, සෙසු නොකී රූපක්‍රමය; ගච්ඡන්තසමං, ගච්ඡන්තශබ්දය හා සමයි; අස්ම, අස්ම ශබ්දය, (ඔහු කෙරෙන් පරව) සි, සිවිභක්තිවේ;

රාජාදියුවාදීහා, යනු ආකාරාදෙශ විධානසූත්‍රයි; රාජාදියුවාදීතො යනු පඤ්චමීබහුවචනාන්ත නිපාතපදය; ආයනුලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; රාජාදිහිච, රාජාදීන් කෙරෙන්ද; යුවාදීහිච, යුව ශබ්දාදීන් කෙරෙන්ද; පරස්ස, පරවූ; සිස්ස, සිවිභක්තීහට; ආහොති, ආකාරාදෙශවේ; අස්මා යනුවේ;

යොනමානො, යනු විකල්පයෙන් ආනොයනාදෙශ විධාන සූත්‍රයි; යොනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; ආනො යනු ප්‍රථමෛක වචනාන්තපදයි; රාජාදිහිච, රාජාදීන්කෙරෙන්ද; යුවාදිහිච, යුවශබ්දාදීන්කෙරෙන්ද; පරවූ, යොනං, ප්‍රථමාද්විතීයා යොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; ආනොහොති, ආනොයනාදෙශවේ; අස්මානො අස්මායනුවේ; භො අස්ම අස්මා අස්මානො අස්මායනුවේ;

වාම්හානඞ, යනු ආනඞයනාදෙශ විධානසූත්‍රයි; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; අම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදය; ආනඞ යනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; අම්හි, අං

**නාසෙ'සනො.**

කම්මාදිතො නා වචනස්ස එනො වා හොති–අස්මෙන, අස්මනා.

**කම්මාදිතො**

කම්මාදිතො ස්මිනො නි හොති වා–අස්මනි, අස්මෙ අස්මම්හි, අස්මස්මිං-සෙසං බ්‍රහ්මසද්දසමං-මුද්ධ ගාණ්ඩිවධන්ව අනිම ලඝිමාදයො අස්මසමා—එවං රාජා කාලද්ධානවාචී අද්ධාච පඨමාදුතියාසු අත්තාතුමා නො තතියාසත්තම්‍යෙකවචනෙසුච.

**රාජස්සි නාම්හි**

රාජස්සි වා හොති නාම්හි—රාජිනා—අඤ්ඤත්‍ර—

---

විභක්තිපරකල්හි; රාජාදීනං, රාජාදින්ටද; යුවාදීනං, යුවාදින්ටද; වා, විකල්පයෙන්; ආනඞ්හොති, ආනඞ්යනාදෙශවේ; අස්මානං —පෙ—අස්මෙ.

නාසෙ'සනො, යනු විකල්පයෙන් එනයනාදෙශ විධාන සූත්‍රයි; නාස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; එනො යනු ප්‍රථමෛක වච නාන්තපදයි; කම්මාදිතො, කම්මාදින් කෙරෙන් පරවූ; නාවචනස්ස, නාවිභක්තිහට; වා, විකල්පයෙන්; එනොහොති, එනයනාදෙශ වේ; අස්මෙන, අස්මනා යනුවේ;

කම්මාදිතො, යනු විකල්පයෙන් නියනාදෙශ විධාන සූත්‍රයි; කම්මාදිතො යනු පඤ්චමී බහුවචනාන්ත නිපාතපදය; කම්මාදිතො, කම්මාදින්කෙරෙන් පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; නිහොති, නියනාදෙශවේ; අස්මනි—පෙ—අස්මසු යනුවේ; සෙසං, සෙසුනොකිරූපක්‍රමය; බ්‍රහ්මසද්දසමං, බ්‍රහ්මශබ්දයාගේ රූපක්‍රම යහා සමයි; මුද්ධ, මුද්ධශබ්දය; ගාණ්ඩිවධන්ව, ගාණ්ඩිවධන්වශබ්දය; අනිම, අනිමශබ්දය; ලඝිමාදයො, ලඝිමශබ්දය යනමේ ආදිශබ්දයෝ අස්මසමා, අස්මශබ්දයහා සමයෝයි; පඨමාදුතියාසු, ප්‍රථමාවිතියා යො විභක්තිපරකල්හි; රාජා, රාජශබ්දයද; කාලද්ධවාචී; කාලවාචී වූද මාර්ගවාචිවූද; අද්ධාච, අද්ධශබ්දයද; තතියාසත්තම්‍යෙකවචනෙසු, තෘතීයා සප්තමී එකවචනයන් පරකල්හි; අත්ත අතුමානොච, අත්ත ආතුම ශබ්දයෝද; එවං, මෙසේමැයි;

රාජස්සිනාම්හි, යනු ඉකාරාදෙශ විධානසූත්‍රයි; රාජස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත අනුකරණපදය; ඉයනු ලුප්තප්‍රථමෛක වච නාන්තපදය; නාම්හියනු සප්තම්‍යෙකවචනාන්තපදයි; නාම්හි, නා විභක්ති පරකල්හි; රාජස්ස, රාජශබ්දයහට; වා, විකල්පයෙන්; ඉහොති, ඉකාරාදෙශවේ; රාජිනායනුවේ; අඤ්ඤත්‍ර, ඉකාරාදෙශනුවූ පක්ෂයෙහි;

**නාස්මාසු රඤ්ඤා**

නාස්මාසු රාජස්ස සවිභත්තිස්ස රඤ්ඤා හොති—රඤ්ඤා.

**සුනංහිසූ.**

රාජස්ස ඌ හොති වා සුනංහිසු-රාජූහි, රාජේහි, රාජූහි, රාජේහි.

**රඤ්ඤො රඤ්ඤස්ස රාජිනො සෙ.**

සෙ රාජස්ස සවිභත්තිස්ස එතෙ ආදෙසා හොන්ති-රඤ්ඤො, රඤ්ඤස්ස, රාජිනො, රාජූනං.

**රාජස්ස රඤ්ඤං.**

නංම්හි රාජසද්දස්ස සවිභත්තිස්ස රඤ්ඤං හොති වා-රඤ්ඤං, රාජූනං—රඤ්ඤා.

**ස්මිංම්හි රඤ්ඤෙරාජිනි.**

ස්මිංම්හි රාජස්ස සවිභත්තිස්ස රඤ්ඤෙරාජිනි හොන්ති—රඤ්ඤෙ, රාජිනි, රාජූසු, රාජේසු.

---

නාස්මාසුරඤ්ඤා, යනු රඤ්ඤායනාදෙශවිධානසූත්‍රයි; නාස්මාසු යනු සප්තම්බහුවචනාන්තපදය; රඤ්ඤායනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; නාස්මාසු, නායස්මාය යන මොවුන් පරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; රාජස්ස, රාජශබ්දයහට; රඤ්ඤාහොති, රඤ්ඤායනාදෙශවේ; රඤ්ඤායනුවේ;

සුනංහිසූ, යනු ඌකාරාදෙශ විධානසූත්‍රයි; සුනංහිසුයනු සප්තමි බහුවචනාන්තපදය; ඌයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදයි; සුනංහිසු, සුයනංයහිය යනමොවුන් පරකල්හි; රාජස්ස, රාජශබ්දයහට; වා, විකල්පයෙන්; ඌහොති, ඌකාරා දෙශවේ; රාජූහි, රාජූහියනුවේ;

රඤ්ඤොරඤ්ඤස්සරාජිනොසෙ, යනු රඤ්ඤොරඤ්ඤස්සරාජිනො යනාදෙශවිධානසූත්‍රයි; රඤ්ඤොරඤ්ඤස්ස රාජිනොයනුලුප්ත ප්‍රථමා බහුවචනාන්තපදය; සෙ යනු සප්තමෛ්‍යක වචනාන්තපදයි; සෙ, සවිභක්ති පරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; රාජස්ස, රාජශබ්දයහට; එතෙ ආදෙශාහොන්ති. මේරඤ්ඤො රඤ්ඤස්ස රාජිනො යනාදෙශයෝවෙත්; රඤ්ඤොරඤ්ඤස්ස රාජිනොයනුවේ; රාජූනං යනුවේ.

රාජස්සරඤ්ඤං, යනු රඤ්ඤං යනාදෙශ විධානසූත්‍රයි; රාජස්ස යනු ෂෂ්ඨ්‍යෛකවචනාන්තපදය; රඤ්ඤං යනු ලුප්ත ප්‍රථමෛක වච නාන්තපදයි; නංම්හි, නං විභක්ති පරකල්හි; සවිභත්තිස්ස, විභක්ති සහිතවූ; රාජසද්දස්ස, රාජශබ්දයහට; වා, විකල්පයෙන්; රඤ්ඤං හොති, රඤ්ඤංයනාදෙශවේ; රඤ්ඤංරාජූනං යනුවේ;

ස්මිංම්හිරඤ්ඤෙරාජිනි, යනු රඤ්ඤෙරාජිනියනාදෙශ විධාන සූත්‍රයි; ස්මිංම්හියනු සප්තමෛ්‍යක වචනාන්තපදය; රඤ්ඤෙරාජිනි

"සමාසෙ වා"ති රාජස්ස නාසස්මාස්මිංසු යං වුත්තං තං වා හොති- යථා-කාසිරඤ්ඤො, කාසිරාජෙන—කාසිරඤ්ඤා, කාසිරඤ්ඤස්ස, කාසිරාජිනො, කාසිරාජස්ස—කාසිරඤ්ඤො, කාසිරාජා, කාසිරාජම්හා කාසිරාජස්මා-කාසිරඤ්ඤෙ, කාසිරාජිනි, කාසිරාජෙ, කාසිරාජම්හි, කාසිරාජස්මිං—අධනො නාම්හි.

**පුමකම්මථාමද්ධානං වා සස්මාසුච.**

පුමාදීනමු හොති වා සස්මාසු නාම්හි චෙති උනෙන-අද්ධුනා-අඤ්ඤත්‍ර කම්මාදිතනා වා එනෙ-අධෙන-අධනා-සෙ උකාරෙ ච.

**ඉසුවණ්ණාජ්ඣලා නාමස්සෙතෙ.**

නාමස්සෙත වත්තමානා ඉවණ්ණුවණ්ණා ඣලසඤ්ඤා හොන්ති යථාක්කමං.

---

යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; ස්මිංම්හි, ස්මිංවිභක්තිපරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; රාජස්ස, රාජශබ්දයහට; රඤ්ඤරාජිනි හොන්ති, රඤ්ඤරාජිනි යනාදෙශයෝවෙත්; රඤ්ඤරාජිනි යනු වේ; රාජ්ජසුරාජෙසුයනුවේ; නාසස්මාස්මිංසු; නායසයස්මායස්මිංයෙ යන මොවුන් පරකල්හි; රාජස්ස, රාජශබ්දයහට; යංවුත්තං, යම් කාරියෙක් නිත්‍යයෙන් කියනලදද; තං, ඒකාරිය; සමාසෙවා ඉති, සමාසෙවා යන සූත්‍රයෙන්; වාහොති, විකල්පයෙන්වේ; යථා, හේ මෙසේයි; කාසිරඤ්ඤො—පෙ—කාසිරාජස්මිං යනුවේ; අධනො, අධ ශබ්දයාකෙරෙන්; නාම්හි, නාවිභක්තිපරකල්හි.

පුමකම්මථාමද්ධානංවා සස්මාසුච, සනු විකල්පයෙන් උකාරාදෙශවිධානසූත්‍රයි; පුමකම්මථාමද්ධානං යනු ෂෂ්ඨීබහු වචනාන්ත පදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; සස්මාසුයනු සප්තමී බහුවචනාන්තපදය; චයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි, සස්මාසු, සයස්මාය යනාමොවුන් පරකල්හිද; නාම්හිච, නාවිභක්ති පරකල්හිද පුමාදීනං, පුමාදීන්ට; වා, විකල්පයෙන්; උහොතීති, උකාරාදෙශවේනුයි; උනෙන, උනවකළකල්හි; අද්ධුනායනුවේ; අඤ්ඤත්‍ර, උකාරාදෙශනුවූපක්ෂයෙහි; කම්මාදිතනා, කම්මාදිබව්හෙයින්; වා, විකල්පයෙන්; එනෙ, එනයනාදෙශ කළකල්හි; අධෙන, අද්ධුනා යනුවේ; සෙ, සවිභක්තිද; උකාරෙච, උකාරයක්දකළකල්හි

ඉසුවණ්ණාජ්ඣලා නාමස්සෙතෙ, යනු ඣසංඥලසංඥවිධාන සූත්‍රයි; ඉසුවණ්ණායනු ප්‍රථමා බහුවචනාන්තපදය; ඣලායනු ප්‍රථමා බහුවචනාන්තපදය; නාමස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදය; අනෙතයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; නාමස්ස, නාමයාගේ;

**ඣලා සස්ස නො.**

ඣලතො සස්ස නො වා හොති–අග්ගිනො, අග්ගිස්ස, අඩස්ස.

**නා ස්මාස්ස.**

ඣලතො ස්මාස්ස නා හොති වා–අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා, අඩා, අඩම්හා, අඩස්මා–අඩිනි, අඩෙ, අඩම්හි, අඩස්මිං–අත්තසද්දතොහිම්හි

**සුහිසු නක්.**

අත්තආතුමානං සුහිසු වා නක් හොති–කකාරො අන්තාවයවත්ථො. අත්තනෙහි, අත්තනෙහි, අතෙනහි, අතෙනසි.

**නොත්තාතුමා.**

අත්තආතුමෙහි සස්ස නො හොති වා–අත්තනො, අත්තස්ස.

---

අතෙත, කෙළවර; වත්තමානා, වැටෙන්නාවූ; ඉවණ්ණුවණ්ණො, ඉවණ්ණ උවණ්ණයෝ දෙදෙන; යථාක්කමං, පතිළීන්; ඣලසඤ්ඤා හො ත්ති, ඣසංඥලසංඥ ඇත්තාහුවෙති.

ඣලාසස්සනො, යනු නොයනාදෙශ විධානසූත්‍රයි; ඣලායනු පඤමේ‍යක වචනාන්තපදය; සස්සයනු ෂෂෙඨ්‍යකවචනාන්තපදය; නොයනු ප්‍රථමෙකවචනාන්තපදයි; ඣලතො, ඣසංඥල සංඥනා මයාකෙරෙන් පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන්; නො හොති, නොයනාදෙශවේ; අග්ගිනො, අග්ගිස්ස අඩස්සයනුවේ;

නාස්මාස්ස, යනු විකල්පයෙන් නායනාදෙශ විධානසූත්‍රයි; නා යනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදය; ස්මාස්සයනු ෂෂ්ඨ්‍යක වච නාන්තපදයි; ඣලතො, ඣසංඥලසංඥනාමයා කෙරෙන් පරවූ; ස්මා ස්ස, ස්මාවිභක්තිහට; වා, විකල්පයෙන්; නාහොති, නායනාදෙශවේ; අග්ගිනා—පෙ—අඩස්මිංයනුවේ; අත්තසද්දතො, අත්තශබ්දයා කෙ රෙන්; හිම්හි, හිවිභක්තිකලකල්හි;

සුහිසුනක්, යනු නක් ආගම විධානසූත්‍රයි; සුහිසුයනු සප්තමි බහුවචනාන්තපදය; නක්යනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදයි; සුහිසු, සුයහිය යනමොවුන් පරකල්හි; අත්තආතුමානං, අත්ත ආතුම ශබ්දයන්ට; වා, විකල්පයෙන්; නක්හොති, නක්ආගමවේ; කකා රො, කකාරයතෙම; අන්තාවයවත්ථො, අන්තයහට අවයවවීම ප්‍රයො ජනකොට ඇත්තේයි; අත්තනෙහි—පෙ—අතෙනහියනුවේ;

නොත්තාතුමා, යනු විකල්පයෙන් නොයනාදෙශ විධානසූත්‍රයි; නොයනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදය; අත්ත ආතුමා යනු පඤ මේ‍යකවචනාන්තපදයි; අත්තආතුමෙහි, අත්තආතුම ශබ්දයන් කෙ රෙන් පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන් නොහෙති,

**ස්මාස්ස නා බ්‍රහ්මා ච.**

බ්‍රහ්මා අත්තආතුමෙහි ච පරස්ස ස්මාස්ස නා හොති—අත්තනා—අත්තනෙසු, අනෙතසු—ආතුමා අත්තාව—බ්‍රහ්ම, ගෙ.

**ඝබ්‍රහ්මාදිතෙ.**

ඝසඤ්ඤතො බ්‍රහ්ම කත්තු ඉසි සඛාදීහි ච ගසෙස වා හොති—බ්‍රහ්මෙ, බ්‍රහ්ම, බ්‍රහ්මා.

**නාම්හි.**

බ්‍රහ්මස්සු හොති නාම්හි-බ්‍රහ්මුනා.

**බ්‍රහ්මස්සු වා.**

බ්‍රහ්මස්සු වා හොති සනංසු-බ්‍රහ්මුනො, බ්‍රහ්මුස්ස, බ්‍රහ්මස්ස, බ්‍රහ්මුනං, බ්‍රහ්මානං-බ්‍රහ්මුනා-"අම්බාදීහි"ති ස්මිනො නි හොති වා-බ්‍රහ්මනි, බ්‍රහ්මෙ, බ්‍රහ්මම්හි, බ්‍රහ්මස්මිං-සෙසං අත්තසමං.

සඛා—රාජාදිත්තා සිස්ස ආ.

---

නායනාදෙශවේ; අත්තනො අත්තස්සයනුවේ; ස්මාස්සනාබ්‍රහ්මාච, යනු නායනාදෙශ විධානසූත්‍රයි; ස්මාස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්ත පදය; නායනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; බ්‍රහ්මා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදය චයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාත පදයි; බ්‍රහ්මා, බ්‍රහ්මශබ්දයා කෙරෙන්ද; අත්තආතුමෙහිච, අත්තආතුමශබ්දයන්කෙරෙන්ද; පරස්ස, පරවූ; ස්මාස්ස, ස්මාවිභක්තිහට; නා හොති, නායනාදෙශවේ; අත්තනෙසුඅත්තනෙසු යනුවේ; ආතුමා, ආතුම ශබ්දයනෙම; අත්තාව, අත්තශබ්දයාමෙනි;-බ්‍රහ්මා, බ්‍රහ්මශබ්දය; (බහුලයොරෙන්) ගෙ, ගපරකල්හි; ඝබ්‍රහ්මාදිතෙ, යනු විකල්පයෙන් එකාරාදෙශවිධානසූත්‍රයි; ඝබ්‍රහ්මාදිතෙ, යනු පඤ්චමී බහුවචනාන්ත නිපාතපදය; එයනු ප්‍රථමෛක වචනාන්තපදයි; ඝසඤ්ඤතො, ඝසංඥයා කෙරෙන්ද; බ්‍රහ්මකත්තු ඉසිසඛාදීහිච; බ්‍රහ්මකත්තුඉසිසඛාදීන් කෙරෙන්ද පරවූ; ගස්ස, ගසංඥයහට; වා, විකල්පයෙන්; එහොති, එකාරාදෙශවේ; බ්‍රහ්මෙබ්‍රහ්මබ්‍රහ්මායනුවේ;

නාම්හි, යනු උකාරාදෙශවිධාන සූත්‍රයි; නාම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදය; නාම්හි, නාවිභක්ති පරකල්හි; බ්‍රහ්මස්ස, බ්‍රහ්මශබ්දයහට; උහොති, උකාරාදෙශවේ; බ්‍රහ්මුනායනුවේ;

බ්‍රහ්මස්සුවා යනු විකල්පයෙන් උකාරාදෙශ විධානසූත්‍රයි; බ්‍රහ්මස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; උයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; සනංසු, සයනංය යන මොවුන් පරකල්හි; බ්‍රහ්මස්ස, බ්‍රහ්මශබ්දයහට; වා, විකල්පයෙන්; උහොති, උකාරාදෙශවේ; බ්‍රහ්මුනො—පෙ—බ්‍රහ්මුනා යනුවේ; අම්බවාදීහිඉති, අම්බවාදීහි යන සූත්‍රයෙන්; ස්මිනො, ස්මිං

**ආයොනො ච සබ්බා.**

සබ්බතො යොනමායො නො හොන්ති වා ආනො ච-සබ්බායො, සබ්බානො.

**නොනාසෙසව්.**

සබ්බස්ස ඉ හොති නොනාසෙසු-සබ්බිනො-අසඤ්ඤත්‍ර—

**යොස්වංහිසු වාරඬ්.**

සබ්බස්ස වා ආරඬ් හොති යොස්වංහිසු සමානංසු ච.

**ආරඬ්සමා**

ආරඬාදෙසතො පරෙසං යොනං ටො හොති-සබ්බාරෙ-ආරඬාදෙ සාභාවෙ—සබ්බා—එවමාලපනෙ—ගෙතු—සබ්බෙ, සබ්බ, සබ්බා—අංහි—සබ්බානං, සබ්බාරං, සබ්බං, සබ්බායො, සබ්බානො, සබ්බිනො.

---

විභත්තිහට; වා, විකල්පයෙන්; නිහොති, නියනා දෙශවේ; බ්‍රහමනි—පෙ—බ්‍රහමඤ්ඤිං යනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; අඤ්ඤසමං, අඤ්ඤශබ්දයාභා සමයි; සබ්බායනුවේ; රාජාදිනතා, රාජාදිබවහෙයින්; සිස්ස, සිවිභත්තිහට; ආ, ආකාරාදෙශවේ;

ආයොනොචසබ්බා, යනු විකල්පයෙන් ආයො නොයනාදෙශවිධානසූත්‍රයි; ආයොනොයනු ලුප්ත ප්‍රථමා බහුවචනාන්ත පදය; චයනු ලුප්ත ප්‍රථමෙක වචනාන්ත නිපාතපදය; සබ්බායනු පඤ්චමේ‍යකවචනාන්තපදයි; සබ්බතො, සබ්බශබ්දයාකෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා විතීයා යොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; ආයොනොහොන්ති, අයොනොයනා දෙශයෝ වෙත්; ආනොච, ආනොයනාදෙශදවේ; සබ්බායො සබ්බානොයනුවේ.

නොනාසෙසව්, යනු විකල්පයෙන් ඉකාරා දෙශවිධාන සූත්‍රයි; නොනාසෙසුයනු සප්තමී බහුවචනාන්තපදය; ඉයනු ලුප්ත ප්‍රථමෙකවචනාන්ත පදයි; නොනාසෙසු; නොයනාය සය යන මොවුන් පරකල්හී; සබ්බස්ස, සබ්බශබ්දයහට; වා, විකල්පයෙන්; ඉහොති, ඉකාරාදෙශවේ; සබ්බිනොයනුවේ; අඤ්ඤත්‍ර, ඉකාරාදෙශනුවූ පක්‍ෂයෙහි.

යොස්වංහිසුවාරඬ්, යනු විකල්පයෙන් ආරඬ්යනාදෙශ විධාන සූත්‍රයි; යොස්වංහිසු යනු සප්තමී බහුවචනාන්තපදය ච යනු ලුප්තප්‍රථමෙක වචනාන්ත නිපාතපදය; ආරඬ්යනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදයි; යොස්වංහිසුව, යොයස්‍ය අංයහිය යනමොවුන්පරකල්හිද; සබ්බස්ස, සබ්බශබ්දයහට; වා, විකල්පයෙන්; ආරඬ් හොති, ආරඬ්යනාදෙශවේ;

ආරඬ්සමා, යනු ටො යනාදෙශවිධානසූත්‍රයි; ආරඬ්සමායනු පඤ්චමේ‍යකවචනාන්ත පදය; ආරඬාදෙසතො, ආරඬ්යනාදෙශයා කෙරෙන්; පරෙසං, පරවූ; යොනං, ප්‍රථමා විතීයා යොවිභක්තීන්ට; ටො

**ටොටෙ වා.**

ආරත්තාදෙසම්හා යොනං ටොටෙ වා හොන්ති යථාක්කමන්ති ටෙ–පක්ඛෙ–“ආරත්තස්මා”ති ටො-සත්ථාරෙ, සත්ථාරො, සත්ථෙ—සත්ථිනා, සත්ථාරෙහි, සත්ථෙහි, සත්ථාරෙභි, සත්ථෙභි · සත්ථිනො, සත්ථිස්ස, සත්ථාරානං.

**ස්මානංසු වා.**

සත්ථස්ස වා ඉ හොති ස්මානංසු–සත්ථීනං, සත්ථානං.

**ටා නාස්මානං**

ආරත්තාදෙසම්හා නාස්මානං ටා හොති–සත්ථාරා–බහුලාධිකාරා සත්ථාරස්මා–සත්ථිනා, සත්ථිම්හා, සත්ථිස්මා, සත්ථා, සත්ථම්හා, සත්ථස්මා.

**ටෙ ස්මිනො.**

සත්ථතො ස්මිනො ටෙ හොති නිච්චං–සත්ථෙ, සත්ථාරෙසු, සත්ථෙසු–“ධම්මො වාඤ්ඤඤතො”ති රාජාදිසු පාඨා දළ්හධම්මාදයො වා අස්මිසමා. සුවා.

---

හොති, ටොයනාදෙශවේ; සත්ථාරොයනුවේ; ආරත්තාභාවෙ, ආරත්තයනාදෙශනුවූ පක්ෂයෙහි; සත්ථායනුවේ; ආලපනෙ, ආමන්ත්‍රණ විෂයෙහිද; එවං, මෙසේමැයි; ගෙතු, ගපරකල්හි වනානි; සත්ථෙසත්ථසත්ථායනුවේ; අංමෙග් අංවිභක්තිපරකල්හි; සත්ථානං—පෙ—සත්ථිනොයනුවේ; ටොටෙ වායනු විකල්පයෙන් ටොටෙයනාදෙශ විධානසූත්‍රයි; ටොටෙයනු ලුප්ත ප්‍රථමාබහුවචනාන්ත පදය; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි ආරත්තාදෙසම්හා, ආරත්තයනාදෙශයාකෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයායොවිභක්තීන්ට; යථාක්කමං, පනාතින්; වා, විකල්පයෙන්; ටොටෙහොන්තීති, ටොටෙයනාදෙශයෝ වෙත්නුයි; ටෙ, ටෙයනාදෙශ කළකල්හි; පක්ඛෙ, එක්පක්ෂයෙක්හි; ආරත්තස්මාති, ආරත්තස්මායන සූත්‍රයෙන්; ටො, ටොයනාදෙශවේ; සත්ථාරෙ—පෙ—සත්ථාරානං යනුවේ

ස්මානංසුවා, යනු විකල්පයෙන් ඉකාරාදෙශ විධාන සූත්‍රයි; ස්මානංසු යනු සප්තමීබහුවචනාන්තපදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; ස්මානංසු, ස්මායනංය යනා මොවුන් පරකල්හි; සත්ථස්ස, සත්ථශබ්දයහට; වා, විකල්පයෙන්; ඉහොති, ඉකාරාදෙශවේ; සත්ථිනා, සත්ථිනංයනුවේ;

ටානාස්මානං යනු ටායනාදෙශ විධානසූත්‍රයි; ටායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදය; නාස්මානං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදයි; ආරත්තාදෙසම්හා, ආරත්තයනාදෙශයාකෙරෙන් පරවූ; නාස්මානං, නාය ස්මාය යනමොවුන්ට; ටාහොති, ටා යනාදෙශවේ; සත්ථාරායනුවේ; බහුලාධිකාරා, බහුලාධිකාරය හෙතුකොටගෙන; සත්ථාරස්මායනුවේ; සත්ථිනා—පෙ—සත්ථස්මායනුවේ;

ටෙ ස්මිනො, යනු ටෙයනාදෙශ විධානසූත්‍රයි; ටෙයනු ප්‍රථමෛක වචනාන්තපදය; ස්මිනොයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; සත්ථතො,

**යොනං නොනෙ වා.**

යුවාදීහි යොනං නොනෙ වා හොන්ති යථාක්කමං

**නොනානෙස්වා**

එසු යුවාදීනමා හොති-යුවානො, යුවා-යුවානං, යුවං, යුවානෙ, යුවෙ-යුවානා.

**යුවාදීනං සුහිස්වානඞ**

සුහිසු යුවාදීනමානඞහොති-යුවානෙහි, යුවානෙභි.

**යුවා සස්සිනො**

යුවා සස්ස වා ඉනො හොති—යුවිනො, යුවස්ස.

---

සබ්බශබ්දයාකෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; නිච්චං, අවිකල්පයෙන්; ටෙහොති, ටෙයනාදෙශවේ; සබ්බෙසබ්බාරෙසු සබ්බෙසුයනුවේ; ධම්මොවාසුස්සුදජේඉති, ධම්මොවාසුස්සුදජේකියා; රාජාදීසු, රාජාදීන් කෙරෙහි; පාඨා, හඳුලහෙයින්; දළ්හධම්මාදයො, දළ්හධම්මාදි ශබ්දයෝ; වා, විකල්පයෙන්; අස්මසමා, අස්මශබ්දයහා සමයෝයි; යුවා යනුවේ.

යොනංනොනෙවා, යනු විකල්පයෙන් නොනෙයනාදෙශවිධානසූත්‍රයි; යොනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; නොනෙයනු ලුප්ත ප්‍රථමා බහුවචනාන්තපදය; වා යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; යුවාදීහි, යුවශබ්දාදීන් කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයායොවිභක්තීන්ට; යථාක්කමං, පනාතීන්; වා, විකල්පයෙන්; නොනෙහොන්ති, නොනෙයනාදෙශයෝවෙත්;

නොනානෙස්වා, යනු ආකාරාදෙශවිධාන සූත්‍රයි; නොනානෙසු යනු සප්තමී බහුවචනාන්තපදය; ආයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත පදයි; එසු, මේ නොයනායනෙය යනමොවුන් පරකල්හි; යුවාදීනං යුවාදීන්ට; ආහොති, ආකාරාදෙශවේ; යුවානො—පෙ—යුවෙයනුවේ යුවානා යනුවේ;

යුවාදීනංසුහිස්වානඞ, යනු ආනඞයනාදෙශ විධානසූත්‍රයි; යුවාදීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; සුහිසුයනු සප්තමී බහුවචනාන්තපදය; ආනඞයනු ප්‍රථමෛක වචනාන්තපදයි; සුහිසු, සුයහිය යන මොවුන් පරකල්හි; යුවාදීනං, යුවශබ්දාදීන්ට; ආනඞහොති, ආනඞයනාදෙශවේ; යුවානෙහි, යුවානෙභියනුවේ;

යුවාසස්සිනො, යනු ඉනොයනාදෙශ විධානසූත්‍රයි; යුවායනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; සස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ඉනොයනු ප්‍රථමෛක වචනාන්තපදයි; යුවා, යුවශබ්දයාකෙරෙන් පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන් ඉනොහොති, ඉනොයනාදෙශවේ; යුවිනොයුවස්සයනුවේ; .

**ස්මාස්මින්නං නානෙ**

යුවාදීහි ස්මාස්මින්නං නානෙ හොන්ති යථාක්කමං–යුවානා–යුවානෙ, යුවානෙසු–රූපසිද්ධියං පනස්ස අඤ්ඤථා රූපනයො දස්සිතො නසො ගහෙතබ්බො අමූලත්තා—නහි තත්ථාගමාදිමූලමත්ථි—එවමිදිසමඤ්ඤම්පි–මඝවපුමවත්තහසද්දා යුවසද්දසමා–අයන්තු විසෙසො.

**ගස්සං.**

පුමසද්දතො ගස්ස අං වා හොති–පුමං, පුම, පුමා.

**නාම්හි.**

නාම්හි පුමස්ස වා ආ හොති–පුමානා–අඤ්ඤත්‍ර–වා උනෙන=පුමුනා පුමෙන–පුමුනො, පුමුස්ස, පුමස්ස–පුමුනා, පුමානා–"පුමා"ති ස්මිනො නෙ වා හොති–පුමානෙ, පුමෙ, පුමම්හි, පුමස්මිං.

---

ස්මාස්මින්නංනානෙ, යනු නානෙයනාදෙශ විධානසූත්‍රයි; ස්මාස්මින්නංයනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; නානෙයනු ප්‍රථමා බහුවචනාන්තපදයි; යුවාදීහි, යුවශබ්දාදීන් කෙරෙන්පරවූ; ස්මාස්මින්නං, ස්මායස්මිංය යනමොවුන්ට; යථාක්කමං, පතනීන්; නානෙහොන්ති, නානෙයනාදෙශයෝවෙත්; යුවානා යුවානෙ යුවානෙසු යනුවේ; රූපසිද්ධියම්පන රූපසිද්ධිප්‍රකරණයෙහි වනාහි; අස්ස, මේයුවශබ්දයාගේ; රූපනයො, රූපක්‍රමයතෙම; අඤ්ඤථා, අන්පරිද්දෙකින්; දස්සිතො, දක්වනලද; සො, ඒ රූපක්‍රමයතෙම; නගහෙතබ්බො, නොගතයුත්තේයි; කුමක්හෙයින්දයත්? අමූලත්තා, මූලක්නැතිහෙයිනි; තත්ථ, ඒ රූපක්‍රමයෙහි; ආගමාදීමූලං, ආගමාදි මූලයෙක්; නහිඅත්ථි, නොම ඇති; ඊදිසං, මෙබඳුවූ; අඤ්ඤම්පි, සෙසු ප්‍රයොගද; එවං, මෙසේමැයි; මඝවපුමවත්තහසද්දා, මඝවපුමවත්තහ ශබ්දයෝ; යුවසද්දසමා, යුවශබ්දයාහාසමයෝයි; අයන්තු, මේ මතුකියන්නේ වනාහි; විසෙසො, වෙනසයි;

ගස්සං යනු විකල්පයෙන් අංයනාදෙශ විධාන සූත්‍රයි; ගස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; අංයනු ප්‍රථමෛක වචනාන්තපදයි; පුමසද්දතො, පුම්ශබ්දයා කෙරෙන් පරවූ; ගස්ස, ගසංඥයහට; වා, විකල්පයෙන්; අංහොති, අංයනාදෙශවේ; පුමං, පුම, පුමායනුවේ.

නාම්හි, යනු ආකාරාදෙශ විධානසූත්‍රයි; නාම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදය; නාම්හි, නාවිභක්තිපරකල්හි, පුමස්ස, පුමශබ්දයහට; වා, විකල්පයෙන්; ආහොති, ආකාරාදෙශවේ; අඤ්ඤත්‍ර, අ කාරාදෙශනුවූ පක්ෂයෙහි; වා, විකල්පයෙන්: උනෙන, පුමාද් සූත්‍රයෙන් උනිකලකල්හි; පුමානා පුමුනා පුමෙනයනුවේ; පුමානො – පෙ — පුමුනායනුවේ; පුමා ඉති, පුමායන සූත්‍රයෙන්; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; නෙහොති, නෙයනාදෙශවේ; පුමානෙපුමෙ පුමම්හි පුමස්මිං යනුවේ;

**සුම්හා ච.**

පුමස්ස සුම්හි යං වුත්තං තං ආ ච වා හොතීති ආනඞ් ආ ච හොති– පුමානෙසු පුමාසු පුමෙසු.

**වත්තහා සනංනං නොනානං.**

වත්තහා සනංනං නොනානං හොන්ති යථාක්කමං–වත්තහානො වත්තහානානං.

අකාරන්තං.

සා, සි

**ඒකවචනයොස්වඝොනං.**

ඒකවචනෙ යොසු ච ඝකාරන්තවජ්ජිතානං නාමානං රස්සො හොති තිලිඞ්ගෙ'ති රස්සෙ සම්පත්තෙ–"සිස්මිංනානපුංසකස්සා"ති අනපුංසකස්ස සිම්හි තුන හොති–සා–යුවාදීනන්ති* "යොනමානො"ති නිච්චමානො–සානො—තථා නොත්තාභාව පක්ඛෙ.†

---

සුම්හාච යනු ආනඞ්යනාදෙශහා ආකාරාදෙශ විධානසූත්‍රයි; සුම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; ආයනු ප්‍රථමෛක වචනාන්තපදය; චයනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තනිපාතපදයි; සුම්හ් සුවිභක්තිපරකල්හි පුමස්ස, පුමශබ්දයහට; යංවුත්තං, යුවාදීනං සුහිස්වානඞ්,යි යම්කාරියෙක් යටකියනලද්ද; තං, ඒකාරියද; ආච, ආකාරාදෙශද; වාහොතීති, විකල්පයෙන් වේනුයි; ආනඞ් ආචහොති, ආනඞ්යනාදෙශද අකාරා දෙශදවේ; පුමානෙසු පුමාසු පුමෙසු යනුවේ;

වත්තහාසනංනංනොනානං, යනු නොනානං යනාදෙශවිධානසූත්‍රයි; වත්තහා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; සනංනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; නොනානං යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදයි; වත්තහා, වත්තහශබ්දයා කෙරෙන්පරවූ; සනංනං, සංය නංය යනමොවුන්ට; යථාක්කමං, පනතීන්; නොනානංහොන්ති නොනානං යනාදෙශයෝවෙත්; වත්තහානො වත්තහානානං යනුවේ.

අකාරන්තං අකාරන්තයි

---

සා, ශබ්දය; සි, (ඔහුයොරෙන් පරව) සිවිභක්තිවේ;

ඒකවචනයොස්වඝොනං, යනු හ්‍රස්වවිධානසූත්‍රයි; ඒකවචනයොසුයනු සප්තමී බහුවචනාන්තපදය; අඝොනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදයි; ඒකවචනෙ, ඒකවචනයා පරකල්හිද; යොසුච, යො විභ

---

* යුවාදීනං සිස්ස ආ–සානො, නොත්තාභාවපක්ඛෙයො නාමානොතිවාධිකාරස්ස වජ්ජිත විභාසත්තා නිච්චමානොයි යන පාඨය සමහර පොත්වල පෙණේ—මෙය සන්නයහා නොයෙදේ

† තථානොත්තාභාව පක්ඛෙයනුද කාලාන්තරජනිවිරුද්ධපාඨයකැයි හැඟේ, තතොඑත්තාභාවො පක්ඛෙයි වියයුතුයි.

**සාස්සංසෙ චානඞ්.**

සාසද්දස්ස ආනඞ් හොති අංසෙ ගෙ ච-(භො) සාන, සානා, සානො සානං, සානෙ, සානො—සෙසං යුවසද්දසමං—සෙතු-සානස්ස—සුවා යුවාව-"එකවචනයොස්වඝොනං"ති රස්සත්තංව විසෙසො-ගෙතු

**ගෙවා.**

අඝොනං ගෙ වා රස්සො හොති තිලිඞ්ගෙ-(භො) සුව, සුවා.

ආකාරන්තං.

---

ක්තිපරකල්හිද; තිලිඞ්ග, ලිඞ්ගත්‍රයෙහි වැටෙන්නාවූ; ඝඔකාරන්ත වජ්ජිතානං නාමානං, ඝසංඥඔකාරාන්ත වර්ජිතකොට ඇතිනාම යන්ට; රස්සොහොතීති, හ්‍රස්වවෙතුයි; රස්ස සම්පන්නෙන, හ්‍රස්ව පැමිණිකල්හි; සිස්මිනනාත්‍රපුංසකස්සාති, සිස්මිනනාත්‍රපුංසකස්ස යන සූත්‍රයෙන්; සිංහිතු, සිවිභක්ති පරකල්හිවනාහි; අනපුංසකස්ස, නපුංසකලිඟුයෙහි නොවැටෙන්නාවූ නාමයහට; නහොති, හ්‍රස්වනොවේ; සායනුවේ; යුවාදින්තා, යුවාදිබවහෙයින්; යොනමානො ඉති, යොනමානො යන සූත්‍රයෙන්; නිච්චං, අවිකල්පයෙන්; ආනො, ආනො යනාදෙශවේ;* සානොයතුවේ; නොතත්‍රාභාවෙ, නොයනාදෙශ නුවූ පක්‍ෂයෙහිද; තථා, එසේමැයි;

සාස්සංසෙචානඞ්, යනු ආනඞ් යනාදෙශ විධානසූත්‍රයි; සාස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; අංසෙයනු සප්තම්‍යෙක වචනාන්ත පදය; චයනු ලුප්තප්‍රථමෙක වචනාන්තනිපාතපදය; ආනඞ්යනු ප්‍රථමෙක වචනාන්තපදයි; අංසෙ, අංවිභක්ති සවිභක්ති පරකල්හිද ගෙච, ගපරකල්හිද; සාසද්දස්ස, සාශබ්දයහට; ආනඞ්හොති, ආනඞ් යනාදෙශවේ; භොසානසානාසානො යනුවේ; සානංසානෙසානො යනුවේ සෙසං, සෙසුනොකී රූපක්‍රමය; යුවසද්දසමං, යුවශබ්දයාහා සමයි; සෙතු, සවිභක්ති පරකල්හිවනාහි; සානස්සයනුවෙ; සුවා, සුවාශබ්දයතෙම, යුවාඉව, යුවශබ්දයාමෙනි; එකවචනයොස්ව ඝොනනති, එකවචනයොස්වඝොනං යන සූත්‍රයෙන්; රස්සත්තංව, හ්‍රස්ව බවම; විසෙසො, වෙනසි; ගෙතු, ගපරකල්හී වනාහි

ගෙවා, යනු විකල්පයෙන් හ්‍රස්වවිධාන සූත්‍රයි; ගෙයනු සප්ත ම්‍යෙක වචනාන්තපදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාත පදයි; ගෙ, ගසංඥයාපරකල්හි; තිලිඞ්ග, ලිඞ්ගත්‍රයෙහි වැටෙන්නාවූ අඝොනං, ඔකාරාන්තඝසඥ වර්ජිතකොට ඇති නාමයහට; රස්සො හොති, හ්‍රස්වවේ; භොසුවසුවායනුවේ;

ආකාරන්තං, ආකාරාන්තයි

---

* වාධිකාරස්ස, වාධිකාරයතමා වවත්ථිත විභාසත්තාව්‍යවස්ථිත විභාෂාබව හෙයිනි යනු යෙදුනානම් සුගමනොවේද?

මුනි.

**යොසුඣිස්ස පුමෙ.**

ඣසඤ්ඤස්ස ඉස්ස යොසු වා ට හොති පුල්ලිඞ්ගෙ-මුනයො-අතො'ති සාමඤ්ඤනිද්දෙසා අතො යොනං ටාටෙ සම්පත්තාපි අවිධාන සාමත්ථියා න හොන්ති—අඤ්ඤත්‍ර—

**ලොපො.**

ඣලතො යොනං ලොපො හොතී'ති යො ලොපෙ.

**යොලොපනිසු දීඝො.**

යොනං ලොපො නිසු ච දීඝො හොති—මුනී-(හො) මුනි, මුනයො මුනී—මුනිං මුනයො මුනී=මුනිනා මුනීහි මුනීභි-යොලොප නිසු වීම ත්තුවනත්තුනම්ච්චාදි ඤාපකා ඉකාරූකාරානං "සුනංහිසූ"ති දීඝස්සා නිච්චත්තා මුනිහිච්චාදීපි හොති—මුනිනො, මුනිස්ස මුනීනං, මුනිනා මුනිම්හා මුනිස්මා, මුනිම්හි මුනිස්මිං මුනීසු-එවං කවිකපිගිරි ආදයො—අග්ගිඉසීනං අයං විසෙසො.

---

මුනියනුවේ; යොසුඣිස්සපුමෙ, යනු ටකාරාදෙශ විධානසූත්‍රයි; යොසු යනු සප්තමී බහුවචනාන්තපදය; ඣිස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; පුමෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; යොසු, ප්‍රථමා ද්විතීයායො විභක්තීන් පරකල්හී; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; ඣසඤ්ඤස්ස, ඣසංඥවූ; ඉස්ස, ඉකාරයහට; වා, විකල්පයෙන්; ටහොති, ටකාරාදෙශවේ; මුනයොයනුවේ; අතොති, අතොකියා; සාමඤ්ඤනිද්දෙසා, සාමාන්‍යනිර්දේශය හෙතුකොටගෙන; අතො, අකාරාන්තනාමයා කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමාද්විතීයා යොවිභක්තීන්ට; ටාටෙ, ටාටෙයනාදෙශයෝ; සම්පත්තාපි, පැමිණියාහුද; අවිධාන සාමත්ථියා, * අකාරකළ සාමර්ථ්‍යයෙන්; නහොන්ති, නොවෙත්; අඤ්ඤත්‍ර, ටකාරාදෙශනුවූ පක්ෂයෙහි;

ලොපො, යනු යොවිභක්ති ලොපවිධානසූත්‍රයි; ලොපොයනු ප්‍රථමෛක වචනාන්තපදය; ඣලතො, ඣසංඥල සංඥනාමයන් කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයායොවිභක්තීන්ට; ලොපොහොතිති, ලොප්වෙනුයි; යොලොපෙ, යොහට ලොප්කළකල්හී; යොලොපනිසුදීඝො, යනු දීර්ඝවිධානසූත්‍රයි; යොලොපනිසු යනු සප්තමී බහුවචනාන්තපදය; දීඝොයනු ප්‍රථමා බහුවචනාන්තපදයි; යොනං, යොවිභක්තීන්ට, ලොපෙ, ලොප්ද; නිසුච, නියනාදෙශද කළකල්හී; දීඝොහොති, නාමයහට දීර්ඝවේ; මුනියනුවේ; හොමුනි මුනී —පෙ—

---

* අකාරකළ සාමර්ථ්‍යයෙන් යන අර්ථය ටීකාකාරයෝ නොපිළිගන්නු මේ පරීක්ෂාකළයුතු.

**සිස්සාග්ගිතො නි.**

අග්ගිස්මා සිස්ස නි හොති වා—අග්ගිනි, අග්ගි, අග්ගයො, අග්ගි.

**ටෙ සිස්සිසිස්මා.**

ඉසිස්මා සිස්ස ටෙ වා හොති-ඉසෙ, ඉසි-බ්‍රහ්මාදිත්තා ගස්සෙ වා-(හො) ඉසෙ ඉසි ඉසි.

**දුතියස්සයොස්ස.**

ඉසිස්මා පරස්ස දුතියා යොස්ස ටෙ වා හොති-ඉසෙ, ඉසයො, ඉසි, සෙසං මුනිසද්දසමං-ආදිසද්දතො ස්මිම්හි—

---

මුනිහිමුනීහියනුවේ; යොලොපනිසුවීමනතුවනතූනං ඉති, යොලොපනිසුවීමනතු වනතූනං යන ආදිසූපකා, මේආදි සූත්‍රසූපකයහෙතු කොටගෙන; සුනංහිසු, සුයනංයහිය යන මොවුන් පරකල්හි; ඉකාරූකාරානං, ඉකාර උකාර දෙදෙනහට; දීඝස්ස, දීඝීයාගේ; අනිච්චත්තා, නිත්‍යනොවනබව් හෙයින්; මුනිහි ඉති, මුනිහියන ආදිහොති, මේආදියවේ; මුනිනො—පෙ—මුනිසුයනුවේ; කවිකපිගිරි ආදයො, කවිකපිගිරිආදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; අග්ගිඉසීනං, අග්ගිඉසි ශබ්දයන්ගේ; අයං, මේමතුකියන්නේ විසෙසො, වෙනසයි—සිස්සාග්ගිතොනි, යනු විකල්පයෙන් නියනාදෙශ විධානසූත්‍රයි; සිස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; අග්ගිතො යනු පඤ්චම්‍යෙකවචනාන්තපදය; නියනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදයි; අග්ගිස්මා, අග්ගිශබ්දයාකෙරෙන්පරවූ; සිස්ස, සිවචනයහට; නිහොති, නියනාදෙශවේ; අග්ගිනි අග්ගියනුවේ.

ටෙසිස්සිසිස්මා, යනු විකල්පයෙන් ටෙයනා දෙශවිධානසූත්‍රයි; ටෙයනු ලුප්තප්‍රථමෙකවචනාන්තනාමිකපදය; සිස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ඉසිස්මායනු පඤ්චම්‍යෙක වචනාන්තපදයි; ඉසිස්මා ඉසිශබ්දයාකෙරෙන් පරවූ; සිස්ස, සිවිභක්තිහට; වා, විකල්පයෙන්; ටෙහොති, ටෙයනාදෙශවෙ; ඉසෙ ඉසියනුවේ; බ්‍රහ්මාදිත්තා, බ්‍රහ්මාදිබව හෙයින්; ගස්ස, ගසංඥයහට; වා, විකල්පයෙන්; එ, එකාරාදෙශවේ; හො ඉසෙ ඉසි ඉසියනුවේ;

දුතියස්සයොස්ස, යනු විකල්පයෙන් ටෙයනාදෙශ විධානසූත්‍රයි; දුතියස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; යොස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; ඉසිස්මා, ඉසිශබ්දයාකෙරෙන්; පරස්ස, පරවූ; දුතියායොස්ස, ද්විතීයායොවිභක්තිහට වා, විකල්පයෙන්; ටෙහොති, ටෙය නාදෙශවේ; ඉසෙ ඉසයො ඉසියනුවේ; සෙසං, සෙසුනොකී රූප ක්‍රමය; මුනිසද්දසමං, මුනිශබ්දයහාසමයි; ආදිසද්දතො, ආදිශබ්දයාකෙරෙන් ස්මිංහි, ස්මිංවිභක්ති කළකල්හි;

**රත්‍යාදීහි වො සම්හිනො.**

රත්‍යාදීහි සම්හිනො වො හොති වා–ආදෙ, ආදිම්හි, ආදිස්මිං. සමාසෙ ඉකාරන්තතො යොස්මිංසු විසෙසො.

**ඉතොක්ඛක්ඛත්‍ථෙ පුමෙ.**

අක්ඛක්ඛපදත්‍ථෙ වත්තමානා ඉකාරන්තතො නාමස්මා යොනං නො නෙ වා හොන්ති යථාක්කමං පුල්ලිඞ්ගෙ–අරියවුත්තිනො, අරියවුත්ත යො, අරියවුත්ති–එවමාලපනෙ–අරියවුත්තිනෙ, අරියවුත්තයො අරිය වුත්ති.

**නෙ සම්හිනො ක්වචි.**

අක්ඛක්ඛපදත්‍ථෙ වත්තමානා ඉකාරන්තතො නාමස්මා සම්හිනො නෙ හොති වා ක්වචි—අරියවුත්තිනෙ, අරියවුත්තිම්හි, අරියවුත්තිස්මිං, "ක්වචි"ති වුත්තත්තා යථාදස්සනං න සබ්බත්‍ථ නෙ ආදෙසො.

ඉකාරන්තං.

---

රත්‍යාදීහි වො සම්හිනො, යනු විකල්පයෙන් වොයනාදෙශවිධාන සූත්‍රයි, රත්‍යාදීහියනු පඤ්චමී බහුවචනාන්තපදය; වොයනු ලුප්ත ප්‍රථමෙකවචනාන්තපදය; සම්හිනො යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදයි; රත්‍යාදීහි, * රත්ති ශබ්ද ආදීශබ්දයන් කෙරෙන් පරවූ; සම්හි නො, සම්හිංවිභක්තිහට; වා, විකල්පයෙන් වොහොති, වොයනාදෙශ වේ; ආදෙ අදීම්හි ආදිස්මිංයනුවේ; සමාසෙ, සමාසවිෂයෙහිවූ; ඉකා රන්තතො, ඉකාරන්තනාමයාකෙරෙන්; යොස්මිංසු, යොයස්මිංයයන මොවුන් පරකල්හි; විසෙසො, වෙනසි;

ඉතොක්ඛක්ඛත්‍ථෙ පුමෙ, යනු විකල්පයෙන් නොනෙ යනාදෙශ විධාන සූත්‍රයි; ඉතොයනු පඤ්චම්‍යෙකවචනාන්තනිපාත පදය; අක්ඛක්ඛ ත්‍ථෙයනු සප්තම්‍යෙක වචනාන්තපදය; පුමෙයනු සප්තම්‍යෙක වච නාන්තපදයි; අක්ඛක්ඛපදත්‍ථෙ, අන්‍යපදාර්‍ථයෙහි; වත්තමානා, වැටෙන් නාවූ; ඉකාරන්තතො නාමස්මා, ඉකාරාන්තනාමයාකෙරෙන්පරවූ; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහිවූ; යොනං, යොවිභක්තීන්ට; යථාක්කමං. පිළිවෙළින්; නොනෙ, නොනෙයනාදෙශයෝ; වාහොන්ති, විකල්ප යෙන්වෙත්; අරියවුත්තිනො අරියවුත්තයො අරියවුත්තීයනුවේ; ආල පනෙ, ආමන්ත්‍රණයෙහිද; එවං, මෙසේමැයි; අරියවුත්තිනෙ, අරිය වුත්තයො අරියවුත්තීයනුවේ;

නෙසම්හිනොක්වචියනු විකල්පයෙන් නෙයනාදෙශවිධාන සූත්‍රයි, නෙයනු ලුප්ත ප්‍රථමෙකවචනාන්තපදය; සම්හිනොයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ක්වචියනු ලුප්තසප්තම්‍යෙක වචනාන්තනිපාතපදයි;

---

* රත්තිශබ්දාදීන් කෙරෙන්—පොත්

දධි, සිලොපො, අනපුංසකත්තා න රස්සො.

**යොනං නොනෙ පුමෙ.**

ඛ්‍යාසඤ්ඤීතො යොනං නොනෙ වා හොන්ති යථාක්කමං පුල්ලිඞ්ගෙ දධිනො.

**ජන්තුහෙත්වීඝපෙහි වා.**

ජන්තුහෙතුහි ඊකාරන්තෙහි ඝපසඤ්ඤෙහි ච පරෙසං යොනං වා ලොපො හොති-දධී, දධියො—එවමාලපනෙ-හෙතු—දධී, දධී.

**නං ඣිතො.**

ඣිසඤ්ඤීතො අංවචනස්ස නං වා හො—දධිනං, දධිං, දධිනෙ.

---

අඤ්ඤපදත්ථෙ, අන්‍යපදාර්ථයෙහි වැටෙන්නාවූ; ඉකාරන්තතො නාම ස්මිං, ඉකාරාන්ත නාමයාකෙරෙන් පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; නෙ හොති, නෙයනාදෙශ වේ; අරියවුත්තිනෙ අරියවුත්තිම්හි අරියවුත්ති ස්මිං යනුවේ; ක්වචීති, ක්වචිත්‍යා; වුත්තත්තා, කියනලද හෙයින්; යථාදස්සනං, ප්‍රයොගදුටු පරිද්දෙන්; නෙ ආදෙසො, නෙ ආදෙශයවේ; සබ්බත්‍ථ, හැමතන්හි, න, නොවේ.

ඉකාරන්තං, ඉකාරාන්තයි.

---

දණ්ඩීයනුවේ; සිලොපෙ, සිහටලොප්කළ කල්හි; අනපුංසකත්තා, නපුංසකලිඞ්ගනොවන හෙයින්; නරස්සො, හ්‍රස්වනොවේ;

යොනංනොනෙපුමෙ, යනු විකල්පයෙන් නොනෙයනාදෙශ විධාන සූත්‍රයි; යොනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; නොනෙ යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදය; පුමෙයනු සප්තම්‍යෙකවචනාන්ත පදයි; ඣිසඤ්ඤීතො, ඣිසංඥ ඊකාරාන්ත නාමයාකෙරෙන් පරවූ; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; යොනං, ප්‍රථමා විතීයා යො විභක්තීන්ට; යථාක්කමං, පනාපීන්; වා, විකල්පයෙන්; නොනෙ හොන්ති, නොනෙයනාදෙශයෝවෙත්; දණ්ඩිනොයනුවේ;

ජන්තුහෙත්වීඝපෙහිවා, යනු විකල්පයෙන් යොවිභක්ති ලොප විධානසූත්‍රයි; ජන්තුහෙත්වීඝපෙහි යනු පඤ්චමීබහුවචනාන්ත පදය; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; ජන්තුහෙතුහි, ජන්තුහෙතු ශබ්දයන් කෙරෙන්ද; ඊකාරන්තෙහි, ඊකාරාන්තනාම යන් කෙරෙන්ද; ඝපසඤ්ඤෙහිච, ඝසංඥපසංඥ ශබ්දයන් කෙරෙන්ද; පරෙසං, පරවූ; යොනං, ප්‍රථමාවිතීයායොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; ලොපොහොති, ලොප්වේ; දණ්ඩිදණ්ඩියො යනුවෙ *ආලපනෙ, ආමන්ත්‍රණයෙහිද; එවං, මෙසේමැයි;

---

* මේ දණ්ඩියො යනරූපය කාලාන්තරජාත අශුද්ධ පදයකැයිහැඟේ

**නො.**

ඣිතො යොනං නො වා හොති පුල්ලිඞ්ගෙති දුතියා යොස්ස නො, දණ්ඩිනො, දණ්ඩී, දණ්ඩියො-දණ්ඩිනා, දණ්ඩීහි, දණ්ඩීභි-දණ්ඩිනො, දණ්ඩිස්ස, දණ්ඩීනං-දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මිං.

**ස්මිංනො නි.**

ඣිතො ස්මිංවචනස්ස නි හොති වා-දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩියම්හි, දණ්ඩිසු-එවං සඞ්ඛි ගණ්ඨි ගාමනිප්පභුතයො.

ඊකාරන්තං.

භික්ඛු.

**ලා යොනං වො පුමෙ,**

ලතො යොනං වො හොති වා පුල්ලිඞ්ගෙ.

---

නංඣිතො, යනු විකල්පයෙන් නංයනාදෙශ විධාන සූත්‍රයි; නං යනු ප්‍රථමෙක වචනාන්තපදය; ඣිතොයනු පඤ්චම්‍යෙක වචනාන්ත නිපාතපදයි; ඣසඤ්ඤිතො, ඣසංඥ ඊකාරාන්ත නාමයා කෙරෙන් පරවූ; අං වචනස්ස, අංවිභක්තිහට; වා, විකල්පයෙන්; නංහොති, නංයනාදෙශවේ; දණ්ඩිනං දණ්ඩිං දණ්ඩිනෙ යනුවේ;

නො, යනු විකල්පයෙන් නොයනාදෙශ විධානසූත්‍රයි; නොයනු ප්‍රථමෙකවචනාන්තපදය; ඣිතො, ඣසංඥඊකාරාන්තනාමයා කෙරෙන් පරවූ; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; යොනං, ප්‍රථමා විතීයායොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; නොහොති, නොයනා දෙශවේනුයි; දුතියායොස්ස, වීතීයායොවිභක්තිහට; නො, නොයනා දෙශවේ; දණ්ඩීදණ්ඩිනොයනුවේ; දණ්ඩිනා—පෙ—දණ්ඩිස්මිංයනුවේ

ස්මිංනො නි යනු විකල්පයෙන් නියනාදෙශ විධානසූත්‍රයි; ස්මිංනො යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; නියනු ලුප්ත ප්‍රථමෙක වචනාන්තපදයි; ඣිතො, ඣසංඥඊකාරාන්ත නාමයාකෙරෙන් පරවූ; ස්මිංවචනස්ස, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; නිහොති, නියනා දෙශවේ; දණ්ඩිනි—පෙ—දණ්ඩිසු යනුවේ; සඞ්ඛිගණ්ඨිගාමනී, සඞ්ඛි ගණ්ඨිගමනියනු; පභුතයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි;

ඊකාරන්තං, ඊකාරාන්තයි.

---

භික්ඛුයනුවේ; ලායොනංවොපුමෙ, යනු විකල්පයෙන් වොයනා දෙශවිධානසූත්‍රයි; ලායනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; යොනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; වොයනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදය; පුමෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; ලතො, ලසංඥයා කෙරෙන්පරවූ; යොනං, ප්‍රථමා විතීයා යොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; වොහොති, වොයනා දෙශවේ.

**වෙවොසු ලුස්ස.**

ලසඤ්ඤස්ස උස්ස වෙවොසු ට හොති—භික්ඛවො—අඤ්ඤත්‍ර—යො ලොපෙ දීඝො—භික්ඛූ (හො) භික්ඛු.

**පුමාලපනෙ වෙවො.**

ලසඤ්ඤතො උතො යොස්සාලපනෙ වෙවො හොන්ති වා පුල්ලිඞ්ගෙ-භික්ඛවෙ,-භික්ඛවො, භික්ඛූ-භික්ඛුං, භික්ඛවො, භික්ඛූ-භික්ඛුනා, භික්ඛුභි, භික්ඛූහි—භික්ඛුනො, භික්ඛුස්ස, භික්ඛූනං—භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා-භික්ඛුම්හි, භික්ඛුස්මිං, භික්ඛූසු—එවංසෙතු කෙතු භානු ආදයො—ජන්තුහෙතුනං යොස්වයමෙභෙදෙ—ජන්ත්වාදිනා වා යොස්ස ලොපෙ-ජන්තු.

**ජන්ත්වාදිතො නො ච**

ජන්ත්වාදිතො යොනං නො හොති වො ච වා පුල්ලිඞ්ගෙ—ජන්තුනො, ජන්තවො, ජන්තුයො—එවං දුතියායොම්හි—(හො) ජන්තු,

---

වෙවොසුලුස්ස, යනු ටකාරාදෙශ විධානසූත්‍රයි; වෙවොසු යනු සප්තමි බහුවචනාන්තපදය; ලුස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; වෙවොසු, වෙවොයනාදෙශයන් පරකල්හි; ලසඤ්ඤස්සඋස්ස, ලසංඥ උකාරයහට; ටහොති, ටකාරාදෙශවේ; භික්ඛවොයනුවේ; අඤ්ඤත්‍ර, වොයනාදෙශනුවූ පක්ෂයෙහි; යොලොපෙ, යොවිභක්තිහට ලොප් කළකල්හි; දීඝො, දීර්ඝවේ; භික්ඛූයනුවේ; හොභික්ඛුභික්ඛූ යනුවේ;

පුමාලපනෙවෙවො යනු විකල්පයෙන් වෙවොයනාදෙශ විධාන සූත්‍රයි; පුමෙයනු සප්තම්‍යෙක වචනාන්තපදය; ආලපනෙයනු සප්තම්‍යෙක වචනාන්තපදය; වෙවොයනු ප්‍රථමා බහුවචනාන්තපදයි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; ලසඤ්ඤතො, ලසංඥවූ; උතො, උකාරාන්තනාමයාකෙරෙන් පරවූ; ආලපනෙ, ආමන්ත්‍රණ විෂයෙහි කරණලද; යොස්ස, යොවිභක්තිහට; වා, විකල්පයෙන්; වෙවොහොන්ති, වෙවොයනාදෙශයෝවෙත්; භික්ඛවෙ—පෙ—භික්ඛූසුයනුවේ; සෙතුකෙතු භානු ආදයො, සෙතුකෙතු භානු ආදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; යොසු, යො විභක්තීන්පරකල්හි; ජන්තුහෙතුනං, ජන්තුහෙතුශබ්දයන්ගේ; අයං, මේ මතුකියන්නේ; විසෙසො, වෙනසයි; ජන්ත්වාදිනා, ජන්ත්වාදි සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; යොලොපෙ, යොහටලොප්කළකල්හි ජන්තුයනුවේ.

ජන්ත්වාදිතො නොච, යනු විකල්පයෙන් නොවොයනාදෙශ විධානසූත්‍රයි; ජන්ත්වාදිතො යනු පඤ්චමි බහුවචනාන්ත නිපාතපදය; නොයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදය; චයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ;

ජන්තු,ජන්තුනො ජන්තවො-"පුමාලපනෙ වෙවො"තිවා වෙ වොච; ජන්තවෙ, ජන්තවො, ජන්තුයො-හෙතු, හෙතවො, හෙතු, හෙතුයො-"යොම්හි වා ක්වචි"ති යොසු ලසඤ්ඤස්ස උස්ස වා ටා දෙසො; හෙතයො, හෙතුයො—(හො) හෙතු, හෙතූ, හෙතවෙ, හේතවො, හෙතයො, හෙතුයො—හෙතුං, හෙතු, හෙතවො, හෙතයො, හෙතුයො. බහුසද්දා නම්හි.

**බහුකතිනනං.**

නම්හි බහුනො කතිස්ස ච නුක් හොතිතිලිඞ්ගෙ-බහුන්නං-සෙසං, භික්ඛුසමං; බහු, බහවො, බහූ-(හො) බහු, බහූ, බහවෙ, බහවො, බහූ, බහුං, බහවො, බහූ—බහුනා, බහූහි, බහූභි-බහුනො, බහුස්ස, බහුන්නං-බහුනා, බහුම්හා, බහුස්මා-බහුම්හි, බහුස්මිං, බහුසු-වත්තුසි.

**ලත්තුපිතාදීනමා සිම්හි.**

ලත්තුප්පච්චයන්තානං පිතු මාතු භාතු ධීතු දුහිතු ජාමාතු නත්තු හොතු පොතූනං ච හොති සිම්හි—වත්තා.

---

ජන්ත්වාදිතො, ජන්ත්වාදීන් කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමාද්විතීයා යොවිභක්තීන්ට; නො, නොයනාදෙශවේ; වොච, වොයනාදෙශද වේ; ජන්තුනොජන්තවොජන්තුයො යනුවේ; ද්විතියායොම්හි, ද්විතීයායොවිභක්ති පරකල්හිද; එවං, මෙසේමැයි; හොජන්තු—පෙ—ජන්තවොයනුවේ; පුමාලපනෙවෙවොති පුමාලපනෙවෙවොයන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්වෙවොච, වෙවොයනාදෙශදවේ; ජන්තවෙ, ජන්තවො ජන්තුයො යනුවේ; හෙතුහෙතවොයනුවේ; යොම්හිවාක්වචිති, යොම්හිවාක්වචි යන සූත්‍රයෙන්; යොසු, යොවිභක්තිපර කල්හි; ලසඤ්ඤස්සඋස්ස, ලසංඥවූ උකාරයහට; වා, විකල්පයෙන්; ටාදෙසෙ, ටකාරාදෙශ කළකල්හි; හෙතයො හෙතුයො යනුවේ; හොහෙතු—පෙ—හෙතුයො යනුවේ; බහුසද්දා, බහුශබ්දයාකෙරෙන්; නංම්හි, නංවිභක්තිකළකල්හි.

බහුකතිනනං, යනු නුක්ආගම විධානසූත්‍රයි; බහුකතිනනංයනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; නංම්හි, නංවිභක්ති පරකල්හි; තිලිඞ්ගෙ, ලිඞ්ගත්‍රයෙහි වැටෙන්නාවූ; බහුනො, බහුශබ්දයාහටද; කතිස්සච, කතිශබ්දයාහටද; නුක්හොති, නුක්ආගමවේ; බහුන්නංයනුවේ; සෙසං, සෙසුනෝකිරූපක්‍රමය; භික්ඛුසමං, භික්ඛුශබ්දයාහා සමයි; වත්තු, වත්තුශබ්දය (බහුකෙරෙන් පරව) සි, සිවිභක්තිවේ.

ලත්තුපිතාදීනමාසිම්හි, යනු ආකාරාදෙශ විධානසූත්‍රයි; ලත්තුපිතාදීනං, යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; ආයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදය; සිම්හියනු සප්තම්‍යෙකවචනාන්තපදය; සිම්හි, සිවිභක්ති

**ලතුපිතාදීනමසෙ.**

ලතුප්පච්චයන්තානං පිතාදීනං චාරඞ් හොති සතොඤ්ඤත්‍ර—"ආරඞ්ස්මා"ති ටො—වත්තාරො.

**ගෙ අ ච.**

ලතුපිතාදීනං අ හොති ගෙ ආ ච-(භො) වත්ත, වත්තා, වත්තාරො, වත්තාරං, වත්තාරෙ, වත්තාරො—නාවචනස්ස "ටානාස්මාන"ත්ති ටා-වත්තාරා.

**සුහිස්වාරඞ්.**

සුහිසු ලතුපිතාදීනමාරඞ් වා හොති—වත්තාරෙහි, වත්තාරෙභි, වත්තූහි, වත්තූභි.

**සලොපො.**

ලතුපිතාදිහි සස්ස ලොපො වා හොති-වත්තු, වත්තුනො, වත්තුස්ස.

---

පරකල්හි; ලතුප්පච්චයන්තානං, ලතුප්‍රත්‍යයාන්තයන්ටද; පිතු, පිතු ශබ්දය; මාතු, මාතුශබ්දය; ජාමාතු, ජාමාතුශබ්දය; නත්තු, නත්තු ශබ්දය; හොතු, හොතුශබ්දය; පොතුනඤ්ච, පොතුශබ්දය යන මොවුන්ටද; ආහොති, ආකාරාදෙශවේ; වත්තායනුවේ.

ලතුපිතාදීනමසෙ, යනු ආරඞ්යනාදෙශ විධානසූත්‍රයි; ලතුපිතාදීනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; අසෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; සතොඤ්ඤත්‍ර, සවිභක්තියෙන් පිටත්තන්හි; ලතුප්පච්චයන්තානං, ලතුප්‍රත්‍යයාන්තයන්ටද; පිතාදීනඤ්ච, පිතුශබ්දාදීන්ටද; ආරඞ්හොති, ආරඞ්යනාදෙශවේ; ආරඞ්ස්මාති, ආරඞ්ස්මායන සූත්‍රයෙන්; ටො, ටොයනාදෙශවේ; වත්තාරො යනුවේ.

ගෙ ආච, යනු අකාර ආකාරාදෙශ විධානසූත්‍රයි; ගෙයනු සප්තම්‍යෙක වචනාන්තපදය; ආයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදය; චයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; ගෙ, ගපරකල්හි; ලතුපිතාදීනං, ලතුප්‍රත්‍යයාන්ත ශබ්දහා පිතුශබ්දාදීන්ට; අහොති, අකාරාදෙශවේ; ආච, ආකාරාදෙශදවේ; භොවත්තවත්තා—පෙ—වත්තාරෙ යනුවේ; නාවචනස්ස, නාවිභක්තිහට; ටානාස්මානං ඉති, ටානාස්මානංයන සූත්‍රයෙන්; ටා, ටායනාදෙශවේ; වත්තාරායනුවේ;

සුහිස්වාරඞ්,යනු විකල්පයෙන් ආරඞ්යනාදෙශවිධානසූත්‍රයි; සුහිසුයනු සප්තමී බහුවචනාන්තපදය; ආරඞ්යනු ප්‍රථමෛක වචනාන්තපදයි; සුහිසු, සුයහිය යනමොවුන් පරකල්හි; ලතුපිතාදීනං, ලතුප්‍රත්‍යයාන්තපිතු ශබ්දාදීන්ට; වා, විකල්පයෙන්; ආරඞ්හොති, ආරඞ්යනාදෙශවේ; වත්තාරෙහි—පෙ—වත්තූභි යනුවේ.

සලොපොයනු විකල්පයෙන් සලොපවිධාන සූත්‍රයි; සයනු ප්‍රථමෛකවචනාන්තපදය; ලොපොයනු ප්‍රථමෛක වචනාන්තපදයි;*

---

* සලොපො, යනු ප්‍රථමෛකවචනාන්තපදය යනු බොහෝපොත්හි

**නංම්හි වා.**

නංම්හි ලතුපිතාදීනමාරඞ් වා හොති–වත්තාරානං–අඤ්ඤත්‍ර.

**ආ**

නංම්හි ලතුපිතාදීනමා වා හොති–වත්තානං, වත්තූනං—
ස්මාස්ස ටා—වත්තාරා.

**ටි ස්මිනො.**

ආරඞාදෙසම්හා ස්මිනො ටි හොති.

**රස්සාරඞ්.**

ස්මිංම්හි ආරෙ රස්සො හොති—වත්තරි, වත්තාරෙසු, වත්තුසු—
එවං භත්තු හොත්තු ආදයො–සත්ථුසද්දස්ස පන නාම්හි බහුලාධිකාරා වා ආරඞාදෙසෙ—සත්ථාරා, සත්ථුනා—පිතා.

---

ලතුපිතාදිහි ලතුපිතාදීන් කෙරෙන්පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන්; ලොපොහොති, ලොප්වේ; වත්තු වත්තුනො වත්තුස්ස යනුවේ.

නංම්හිවායනු විකල්පයෙන් ආරඞ්යනාදෙශවිධානසූත්‍රයි; නංම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදය; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; නංම්හි, නංවිභක්තිපරකල්හි; ලතුපිතාදිනං, ලතුප්‍රත්‍යයාන්තපිතුශබ්දදීන්ට; වා, විකල්පයෙන්; ආරඞ්හොති, ආරඞ්යනාදෙශවේ; වත්තාරානං යනුවේ; අඤ්ඤත්‍ර, ආරඞ්යනාදෙශ නුවූ පක්ෂයෙහි.

ආ, යනු විකල්පයෙන් ආකාරාදෙශ විධානසූත්‍රයි; ආයනු ප්‍රථමෛක වචනාන්තපදය; නංම්හි, නං විභක්තිපරකල්හි; ලතුපිතාදිනං, ලතුපිතාදීන්ට; වා, විකල්පයෙන්; ආහොති, ආකාරාදෙශ වේ; වත්තානං වත්තූනං යනුවේ; ස්මාස්ස, ස්මාවිභක්තිහට; ටා, ටායනාදෙශවේ; වත්තාරායනුවේ.

ටිස්මිනො, යනු ටියනාදෙශවිධානසූත්‍රයි; ටියනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; ස්මිනොයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; ආරඞාදෙසම්හා, ආරඞ්යනාදෙශයාකෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; ටිහොති, ටියනාදෙශවේ.

රස්සාරඞ්, යනු ආරඞ්හ්‍රස්ව විධානසූත්‍රයි; රස්සොයනු ප්‍රථමෛක වචනාන්තපදය; ආරඞ්යනු ප්‍රථමෛක වචනාන්තපදයි; ස්මිංම්හි, ස්මිංවිභක්තිපරකල්හි; ආරඞ්, ආරඞ්යනාදෙශයතෙම; රස්සොහොති, හ්‍රස්වවේ; වත්තරි වත්තාරෙසු වත්තුසුයනුවේ; භත්තුහොත්තුආදයො

**පිතාදීනමනත්වාදීනං.**

නත්වාදිවජ්ජිතානං පිතාදීනමාරෝ රස්සෝ හොති සබ්බාසු විභත්තිසු-පිතරෝ ඉච්චාදි වත්තුසමං—රස්සොව විසෙසො-නත්වාදීනන්තු රස්සාභාවා නත්තාරෝ ඉච්චාදි-ගුණවන්තුසි.

**න්තුස්ස.**

සිම්හි න්තුස්ස ටා හොති—ගුණවා—න්තුච්චත්වාදි සම්බන්ධීයෙව ගය්හතෙ න්තුවන්තුමන්ත්වාවන්තුතවන්තුසම්බන්ධී'ති වචනතො න ජන්තුතන්ත්වාදීනං—යො—න්තන්තූනමාදිතො වා නො—ගුණවන්තො අඤ්ඤත්‍ර.

---

හන්තුහොන්තුයනමේ ආදි ශබ්දයෝ; එවං, මෙසේමැයි; සන්තුසද්දස්ස, සන්තුශබ්දයහටවනාහි; නාම්හි, නාවිභක්තිපරකල්හි; බහුලාධිකාරා, බහුලාධිකාරයහෙතුකොටගෙන, වා, විකල්පයෙන්; ආරඞාදෙසෙ, ආරඞයනාදෙශකළකල්හි; සන්තාරාසන්තුනායනුවේ. පිනායනුවේ;

පිතාදීනමනත්වාදීනං, යනු ආරඞ්‍ර්‍රස්වවිධානසූත්‍රයි; පිතාදීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; අනත්වාදීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදයි; සබ්බාසුවිභත්තිසු, සියලු විභක්තින් පරකල්හි; නත්වාදිවජ්ජිතානං, නත්වාදීන්වර්ජනකොටඇති; පිතාදීනං, පිතුශබ්දාදීන්ගේ; ආරඞ, ආරඞයනාදෙශයනෙම; රස්සෝහොති, හ්‍රස්වවේ; පිතරෝ ඉති, පිතරෝයන; ආදි, මේ ආදිය; වත්තුසමං, වත්තුශබ්දයහාසමයි; රස්සොව, හ්‍රස්වකිරීමම; විසෙසො, වෙනසි; නත්වාදීනන්තු, නත්වාදීන්ටවනාහි; රස්සාභාවා, හ්‍රස්වනොවීම හෙතුකොටගෙන; නත්තාරෝඉති, නත්තාරෝයන; ආදි, මේආදියවේ; ගුණවන්තු, ගුණවන්තු ශබ්දය; (ඔහුකෙරෙන් පරව) සි, සිවිභක්තිවේ.

න්තුස්සයනු ටායනාදෙශවිධානසූත්‍රයි; න්තුස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; සිම්හි, සිවිභක්තිපරකල්හි; න්තුස්ස, න්තුප්‍රත්‍යයද; න්තුවන්තුමන්ත්වාවන්තු තවන්තු සම්බන්ධීති, න්තුවන්තුමන්ත්වාවන්තු තවන්තුසම්බන්ධියි කියා වචනතො, හඳුළහෙයින්; වන්ත්වාදිසම්බන්ධී, වන්ත්වාදිප්‍රත්‍යයන් සම්බන්ධවූයේම; ගය්හතෙ, න්තුයයි ගන්නාලැබේ; ජන්තුතන්ත්වාදීනං, ජන්තුතන්ත්වාදීන් සම්බන්ධවූයේ; න, න්තුයයි නොගන්නාලැබේ; යො, යොවිභක්තිවේ; න්තන්තූනමාදිතා, න්තන්තූනං යනාදි සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; නො, නොයනාදෙශවේ; ගුණවන්තො යනුවේ; අඤ්ඤත්‍ර, නො යනාදෙශනුවූ පක්ෂයෙහි.

**ය්වාදො න්තුස්ස.**

ය්වාදිසු න්තුස්ස අ හොති–අකාරන්තත්තා ටා ගුණවන්තා–න වෙත්ථ අවිධානසාමත්ථියා අප්පත්ති අවිධානස්ස චරිතත්ථතාය ගුණවන්තස්සාති—(හො) ගුණව, ගුණවා, ගුණවං, ගුණවන්තො, ගුණවන්තා–ගුණවං, ගුණවන්තං, ගුණවන්තෙ–ගුණවතා, ගුණවන්තෙන, ගුණවන්තෙහි, ගුණවන්තෙභි–ගුණවතො, ගුණවස්ස, ගුණවන්තස්ස, ගුණවතං, ගුණවන්තානං–ගුණවතා, ගුණවන්තා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා–ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං, ගුණවන්තෙසු–එවං මඝවන්තු භගවන්තු පභූතයො.

**හිමවතො වා ඔ.**

හිමවතො සිම්හි න්තුස්ස ඔ වා හොති, හිමවන්තො, හිමවා–සෙසං ගුණවාව.

උකාරන්තං.

---

වෙස්සභූ, වෙස්සභුවො, වෙස්සභූ–(හො) වෙස්සභූ, වෙස්සභුවෙ, වෙස්සභුවො, වෙස්සභූ–සෙසං භික්ඛුසද්දසමං–එවං සයම්භූ පරාභූ

---

ය්වාදොන්තුස්ස, යනු අකාරාදෙශ විධානසූත්‍රයි; ය්වාදොයනු සප්තම්‍යෙකවචනාන්තපදය; න්තුස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදයි; ය්වාදිසු, යොවිභක්ති ආදීන් පරකල්හි; න්තුස්ස, න්තුප්‍රත්‍යයහට; අහොති, අකාරාදෙශවේ; අකාරන්තත්තා, අකාරාන්තබවහෙයින්; ටා, ප්‍රථමායොවිභක්තිහට ටායනාදෙශවේ; ගුණවන්තායනුවේ; ඉහ, මේ ගුණවන්තායනතන්හි; අවිධාන සාමත්ථියා, අකාරකළ සාමර්ථ්‍යයෙන්; ගුණවන්තස්ස ඉති, ගුණවන්තස්සකියා; චරිතත්ථතාය, චරිතාර්ථබව හෙයින්; අවිධානස්ස, අවිධානයාගේ; අප්පත්ති, අප්‍රාප්තිතොමෝ; නවි, නැති; හොගුණව ගුණවා—පෙ—ගුණවන්තෙසු යනුවේ; මඝවන්තු භගවන්තු, මඝවන්තුභගවන්තුයන; පභූතයො මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි.

හිමවතොවාඔ, යනු ඔකාරාදෙශ විධානසූත්‍රයි; හිමවතොයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; වායනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; ඔයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත රූපීපදයි; සිම්හි, සිවිභක්තිපරකළ්හි; හිමවතො, හිමවන්තුශබ්දයා සම්බන්ධිවූ; න්තුස්ස, න්තුප්‍රත්‍යයහට, වා, විකල්පයෙන්; ඔහොති, ඔකාරාදෙශවේ; හිමවන්තො හිමවායනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; ගුණවා ඉව, ගුණවන්තුශබ්දයාගේ රූපක්‍රමයමෙනි.

උකාරන්තං, උකාරාන්තයි.

---

වෙස්සභූ—පෙ—වෙස්සභූයනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; භික්ඛුසද්දසමං, භික්ඛුශබ්දයහාසමයි; සයම්භූ, සයම්භූශබ්දය; පරාභූ,

අභිභූආදයො-ගොත්‍රභූ සහභූ සද්දෙහි පන යොනං "ජන්ත්වාදිතො නො චෙ"ති නො වො වා-ගොත්‍රභුනො, ගොත්‍රභුවො, ගොත්‍රභූ—සහභුනො, සහභුවො, සහභූ-සබ්බඤ්ඤූසද්දස්සයොස්වෙව විසෙසො.

**කුතො.**

කූපච්චයන්තතො යොනං නො වා හොති පුල්ලිඞ්ගෙ-සබ්බඤ්ඤූ නො—අඤ්ඤත්‍ර ලොපො ච—"ලා යොනං වො පුමෙ"ති න වො "කුතො"ති ජන්ත්වාදිහි පුථක්කරණා-සබ්බඤ්ඤු-එවං විඤ්ඤූ-විද්දූ වෙදගූ පාරගූ ආදයො කූපච්චයන්තා.

ඌකාරන්තං.

ගො.

**ගොස්සාගසිහිනංසු ගාවගවා.**

ගසිහිනංවජ්ජිතාසු විභත්තීසු ගොසද්දස්ස ගාවගවා හොන්ති.

---

පරාභූශබ්දය; යන ආදයො, මේ ආදිශබ්දයෝ; එවං, මෙසේමැයි; ගොත්‍රභූසහභූසද්දෙහිපන, ගොත්‍රභූසහභූශබ්දයන් කෙරෙන්වනාහි; පරස්ස, පරවූ; යොනං, යොවිභක්තීන්ට; ජන්ත්වාදීතොනොච ඉති, ජන්ත්වාදිතොනොචයන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; නොවො, නොවො යනාදෙශයෝවෙත්; ගොත්‍රභුනො—පෙ—සහභූ යනුවේ; සබ්බඤ්ඤූසද්දස්ස, සබ්බඤ්ඤූශබ්දයහට; යොස්වෙව, යොවිභක්ති පරකල්හිම; විසෙසො, වෙනසි.

කුතොයනු විකල්පයෙන් නොයනාදෙශවිධානසූත්‍රයි; කුතො යනු පඤ්චම්‍යෙක වචනාන්තනිපාතපදය; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ කූපච්චයන්තතො, කූප්‍රත්‍යයාන්තයාකෙරෙන්පරවූ; යොනං, යොවිභක්තීන්ට, වා, විකල්පයෙන්; නොහොති, නොයනාදෙශවේ; ලායොනංවොපුමෙඉති, ලායොනංවොපුමෙයන සූත්‍රයෙන්; වෙවො, වෙවොයනාදෙශයතෙම; න, නොවේ; කුමක්හෙයින්දයත්? කුතොති, කුතොකියා ජන්ත්වාදීහි, ජන්ත්වාදීන්කෙරෙන්; පුථක්කරණා, වෙන්කොටසූත්‍රයක් හදළහෙයින්; සබ්බඤ්ඤූයනුවේ; විඤ්ඤූ වෙදගූපාරගූයන; ආදයො, මේ ආදිශබ්දයෝ; එවං, මෙසේමැයි. කූපච්චයන්තා, කූප්‍රත්‍යයාන්තයෝයි; ඌකාරන්තං, ඌකාරාන්තයි.

ගොයනුවේ;

ගොස්සාගසිහිනංසු ගාවගවායනු ගාවගවායනාදෙශවිධානසූත්‍රයි ගොස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; අගසිහිනංසු යනු සප්තමී බහුවචනාන්තපදය; ගාවගවා යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදයි; ගසිහිනංවජ්ජිතාසු, ගයසියහියනංය යන මොවුන්වර්ජිතකොටඇති; විභත්තීසු, විභක්තීන්පරකල්හි; ගොසද්දස්ස, ගොශබ්දයහට; ගාවගවාහොන්ති, ගාවගවායනාදෙශයෝවෙත්;

**උභගොහි ටො.**

උභගොහි යොනං ටො හොති–ගාවො, ගවො,–(භො) ගො, ගාවො, ගවො.

**ගාවුංම්හි.**

අංවචනෙගොස්ස ගාවු වා හොති–ගාවුං, ගාවං, ගවං, ගාවො, ගවො.

**නාස්සා.**

ගොතො නාස්ස ආ හොති වා—ගාවා, ගාවෙන, ගවා, ගවෙන ගොභි, ගොහි.

**ගවං සෙන.**

ගොස්ස සෙ වා ගවං ගොහි සහ සෙන–ගවං, ගාවස්ස, ගවස්ස.

**ගුන්නං ච නංනා.**

නංවචනෙන සහ ගොස්ස ගුන්නං හොති ගවං ච වා–ගුන්නං ගවං, ගොනං—ගාවා, ගාවම්හා, ගාවස්මා, ගවා, ගවම්හා, ගවාස්මා—ගාවෙ, ගාවම්හි, ගාවස්මිං, ගවෙ, ගවම්හි, ගවස්මිං.

---

උභගොහිටො, යනු ටොයනාදෙශවිධානසූත්‍රයි; උභගොහියනු පඤ්චම්බහුවචනාන්තපදය; ටොයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදයි; උභගොහි, උභශබ්දගොශබ්දයන් කෙරෙන් පරවූ; යොනං, යොවිභක්තීන්ට; ටොහොති, ටොයනාදෙශවේ; ගාවො ගවො, භොගාවො ගවොයනුවේ.

ගාවුංම්හි, යනු විකල්පයෙන් ගාවුයනාදෙශ විධානසූත්‍රයි; ගාවු යනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදය; අංම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදයි; අංවචනතො, අංවචනයා පරකල්හී; ගොස්ස, ගොශබ්දයහට; වා, විකල්පයෙන්; ගාවුහොති, ගාවුයනාදෙශවේ; ගාවුං ගාවං ගවං ගාවො ගවොයනුවේ.

නාස්සායනු විකල්පයෙන් ආකාරාදෙශ විධානසූත්‍රයි; නාස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; ආයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත පදයි; ගොතො, ගොශබ්දයාකෙරෙන් පරවූ; නාස්ස, නාවිභක්තිහට; වා, විකල්පයෙන්; ආහොති, ආකාරාදෙශවේ; ගාවාගාවෙනගවා ගවෙන ගොභිගොහියනුවේ.

ගවංසෙන යනු ගවං යනාදෙශවිධානසූත්‍රයි; ගවංයනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තපදය; සෙනයනු තෘතීයෛකවචනාන්තපදයි; සෙ, සවිභක්තිපරකල්හි; නෙනසහ, එම සවිභක්තිහා එක්ව; ගොස්ස ගොශබ්දයහට; වා, විකල්පයෙන්; ගවංහොති, ගවංයනාදෙශවේ; ගවංගාවස්සගවස්ස යනුවේ.

ගුන්නඤ්චනංනා, යනු විකල්පයෙන් ගුන්නංයනාදෙශ විධාන සූත්‍රයි; ගුන්නංයනු ප්‍රථමෛකවචනාන්තපදය; චයනු ලුප්ත ප්‍රථ

**සුමහි වා.**

ගොස්ස සුම්හි ගාවගවා හොන්ති වා-ගාවෙසු, ගවෙසු, ගොසු.

ඔකාරන්තං—පුල්ලිඞ්ගං.

කඤ්ඤා.

—o—

**ඝා.**

ඉත්ථියං වත්තමානස්ස නාමස්සන්ත වත්තමානො ආකාරො ඝස ඤ්ඤො හොති-ජන්තවාදිනා වා යොලොපො-කඤ්ඤා, කඤ්ඤායො—"සබ්‍රහ්මාදිතෙ"ති ගස්සෙවා-කඤ්ඤෙ, කඤ්ඤා-යොම්හි- කඤ්ඤා, කඤ්ඤායො.

**ඝො ස්සංස්සාස්සායංතිංසු.**

ස්සමාදිසු ඝො රස්සො හොති-කඤ්ඤං, කඤ්ඤා, කඤ්ඤායො—

**ඝපතො'කස්මිං නාදීනං යයා.**

ඝපතො නාදිනමෙකස්මිං යයා හොන්ති යථාක්කමං-කඤ්ඤාය, කඤ්ඤාහි, කඤ්ඤාභි-කඤ්ඤාය, කඤ්ඤානං,—ස්මිංම්හි—

---

මෙකච්චනාන්ත නිපාතපදය; නන්නායනු නෑතියෙක වචනාන්ත පදයි; නංවචනෙනසහ, නංවිභක්තිහා එක්ව; ගොස්ස, ගොශබ්දය හට; වා, විකල්පයෙන්; ගුනනංහොති; ගුනනංයනාදෙශවේ; ගවඤ, ගවංයනා දෙශදවේ; ගුනනං—පෙ—ගවස්මිංයනුවෙ.

සුම්හිවා, යනු විකල්පයෙන් ගාවගවයනාදෙශ විධාන සූත්‍රයි; සුම්හ්යනු සප්තම්‍යෙකවචනාන්තපදය; වා යනු ලුප්තප්‍රථමෛක වච නාන්තනිපාතපදයි; සුම්හි, සුවිභක්තිපරකල්හි; ගොස්ස, ගොශබ් දයහට; වා, විකල්පයෙන්; ගාවගවාහොන්ති, ගාවගවයනාදෙශයෝ වෙත්; ගාවෙසු ගවෙසු ගොසුයනුවේ.

ඔකාරන්තං, ඔකාරාන්තයි; පුල්ලිඞ්ගං, පුලිංගයි.

---

කඤ්ඤා, කඤ්ඤායනුවේ;

ඝා, යනු ඝසංඥ විධානසූත්‍රයි; ඝයනු ලුප්තප්‍රථමෛක වචනා න්තපදය; ආයනු ප්‍රථමෛකවචනාන්තපදයි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; වත්තමානස්ස, වැටෙන්නාවූ; නාමස්ස, නාමයගේ; අන්ත, කෙළ වර; වත්තම නො, වැටෙන්නාවූ; ආකාරො, ආකාරය තෙම; ඝස ඤ්ඤොහොති, ඝසංඥඇත්තේවේ; ජන්තවාදිනා, ජන්තවාදිසූත්‍රයෙන්; වා, විකල්පයෙන්; යොලොපෙ, යොහට ලොප්කළකල්හි; කඤ්ඤා, කඤ්ඤායොයනුවේ; බ්‍රහ්මාදිතෙඉති, බ්‍රහ්මාදිතෙ යන සූත්‍රයෙන්; ගස්ස, ගසංඥයහට; වා, විකල්පයෙන්; එ, එයනාදෙශවේ; කඤ්ඤෙ කඤ්ඤායනුවේ; යොම්හි, යොවිභක්ති පරකල්හි; කඤ්ඤා, කඤ්ඤා යොයනුවේ.

ඝපතෙකස්මිංනාදීනංයයා යනු යයා යනාදෙශවිධාන සූත්‍රයි; ඝපතො යනු පචම්‍යෙක වචනාන්තනිපාතපදය; එකස්මිං යනුසප්ත

**ඝං.**

ඝපතො ඝ්මිනො යං වා හොති–කඤ්ඤායං, කඤ්ඤාය, කඤ්ඤාසු. එවං සද්ධා සුද්ධා සිඛා ආදයො–"නාම්මාදීහි"ති අම්මා අන්නා අම්බාහි ගස්ස එකාරාභාවෙ.

**රස්සො වා**

අම්මාදීනං ගෙ රස්සො වා හොති–අම්ම, අම්මා ඉච්චාදි—සෙසං කඤ්ඤාව-සභාපරිසාහි ස්මිනො"තිං සභාපරිසායා"ති තිං වා හොති "ඝොස්ස" මිච්චාදිනා රස්ස-සභතිං—අඤ්ඤත්‍ර-සභායං, සභාය-පරිසතිං, පරිසායං, පරිසාය.

ආකාරන්තං.

---

මේ‍යක වචනාන්තපදය; නාදීනංයනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; යයා යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; ඝපතො, ඝසංඥපසංඥනාම යන් කෙරෙන් පරවූ; එකස්මිං, එකාර්ථයෙහිකරණලද; නාදීනං, නාවිභක්ත්‍යාදීන්ට; යථාක්කමං, පනාපිළිවෙලින්; යයාහොන්ති, යයා යනා දෙශයෝවෙත්; කඤ්ඤාය—පෙ—කඤ්ඤානං යනුවේ; ස්මිංමහි, ස්මිං විභක්ති පරකල්හි.

යං, යනු විකල්පයෙන් යං යනාදෙශවිධානසූත්‍රයි; යං යනු ප්‍රථමෙකවචනාන්තපදය; ඝපතො, ඝසංඥපසංඥනාමයන් කෙරෙන් පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; යංහොති, යං යනාදෙශවේ; කඤ්ඤායං කඤ්ඤාය කඤ්ඤාසු යනුවේ; සද්ධාසුද්ධා සිඛායන, ආදයො, මේආදිශබ්දයෝද; එවං, මෙසේමැයි; නාම්මාදීහි ඉති, නාම්මාදීහි යන සූත්‍රයෙන්; අම්මාඅන්නාඅම්බාදීහි; අම්මාඅන්නා අම්බාදිශබ්දයන් කෙරෙන්පරවූ; ගස්ස, ගසංඥයහට; එකාරාභාවෙ, එකාරාදෙශයන්ගේ නොවීමක් ඇතිකල්හි.

රස්සොවායනු විකල්පයෙන් හ්‍රස්වවිධානසූත්‍රයි; රස්සොයනු ප්‍රථමෙකවචනාන්තපදය; වායනු ප්‍රථමෙක වචනාන්තනිපාත පදයි; ගෙ, ගසංඥයාපරකල්හි; අම්මාදීනං, අම්මාදිශබ්දයන්ට; වා, විකල්පයෙන්; රස්සොහොති, හ්‍රස්වවේ; අම්ම අම්මා ඉති, අම්මඅම්මායන, ආදි, මේආදියවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; කඤ්ඤාව, කඤ්ඤා ශබ්දයාමෙනි; සභාපරිසාහි, සභාපරිසා ශබ්දයන් කෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; තිංසභාපරිසායඉති, තිංසභාපරිසාය යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; තිංහොති, තිංයනාදෙශවේ; ඝොස්සං ඉති, ඝොස්සංයන; ආදිනා, මේආදිසූත්‍රයෙන්;රස්ස, හ්‍රස්වකලකල්හි; සභතිංයනුවේ; අඤ්ඤත්‍ර, තිංයනාදෙශනුවූ පක්ෂයෙහි; සභායං—පෙ—පරිසායං යනුවේ.

ආකාරන්තං, ආකාරන්තයි.

මති—යොම්හි—

**ඉත්ථියං.**

ඉත්ථියං වත්තමානස්ස නාමස්සන්තෙ වත්තමානා ඉවණ්ණුවණ්ණා පසඤ්ඤා හොන්ති.

**යෙ පස්සිවණ්ණස්ස**

පසඤ්ඤස්ස ඉවණ්ණස්ස ලොපො වා හොති යකාරෙ-වවත්ථිතවිභාසායං-මත්‍යො-අඤ්ඤත්‍ර-ජන්ත්වාදිනා වා යොලොපෙ-මතී, මතියො-(හො) මති, මත්‍යො, මතී, මතියො-මතිං, මත්‍යො, මතී, මතියො "ඝප" ඉච්චාදිනා යාදෙසෙ, මත්‍යා, මතියා, මතිහි, මතීභි-මත්‍යා, මතියා, මතීනං-ස්මිංහි-මත්‍යං, මතියං, මත්‍යා, මතියා, මතීසු-එවං කිත්ති කන්ති නන්තිප්පභුතයො-රත්තියා ස්මිනො"රත්‍යාදීහි ටොස්මිනො"ති ටො වා-රත්‍යො-අඤ්ඤත්‍ර=රත්‍යං, රත්තියං, රත්‍යා, රත්තියා—සෙසං මතියා සමං.

---

මති යනුවේ; යොම්හි, යොවිභක්තිකළකල්හි;

ඉත්ථියං යනු පසංඥවිධානසූත්‍රයි; පො යනු ප්‍රථමෛක වචනාන්තපදය; ඉත්ථියංයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; වත්තමානස්ස, වැටෙන්නාවූ; නාමස්ස, නාමයාගේ; අන්තෙ, කෙළවර; වත්තමානා, වැටෙන්නාවූ; ඉවණ්ණුවණ්ණා, ඉවර්ණඋවර්ණදෙදෙන; පසඤ්ඤාහොන්ති, පසංඥ ඇත්තාහුවෙත්.

යෙපස්සිවණ්ණස්ස යනු විකල්පයෙන් පසංඥ ඉවර්ණලොප විධාන සූත්‍රයි; යෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය; පස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ඉවණ්ණස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; යකාරෙ, යකාරයාපරකල්හි; පසඤ්ඤස්ස, පසංඥවූ; ඉවණ්ණස්ස, ඉවර්ණයහට; වා, විකල්පයෙන්; ලොපො, ලොප්වේ; අයං, මේ වාශබ්දයතෙම; වවත්ථිතවිභාසා, ව්‍යවස්ථිතවිභාෂාවාචියි; මත්‍යො යනුවේ; අඤ්ඤත්‍ර, පසංඥඉවර්ණලොප්නුවූ පක්ෂයෙහි; ජන්ත්වාදිනා, ජන්ත්වාදිසූත්‍රයෙන්; වා, විකල්පයෙන්; යොලොපෙ, යොහටලොප් කළකල්හි; මතී මතියො යනුවේ; හොමති—පෙ—මතියොයනුවේ; ඝප ඉති, ඝපයන; ආදිනා, මේආදිසූත්‍රයෙන්; යාදෙසෙ, යාකාරාදෙශ කළකල්හි; මත්‍යා—පෙ—මතීනංයනුවේ; ස්මිංම්හි, ස්මිංවිභක්ති පරකල්හි; මත්‍යං—පෙ—මතීසුයනුවේ; කිත්ති, කිත්තිශබ්දය; කන්ති, කන්තිශබ්දය; නන්ති, නන්තිශබ්දයයන; පභුතයො, මේආදිශබ්දයෝද; එවං, මෙසේමැයි; රත්තියා, රත්තීශබ්දයා කෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; රත්‍යාදීහිටො ස්මිනො ඉති, රත්‍යාදීහිටො ස්මිනො යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; ටො, ටොයනාදෙශවේ;

ඉකාරන්තරං.

දසී, දසෙයා, දසි, දසියො(හො) දසි, දසී, දසෙයා, දසි, දසියො

**යං පිතො.**

පසඤ්ඤිතො අංවචනස්ස යං වා හොති—දස්‍යං දසියං, දසිං, දසෙයා, දසි, දසියො—දස්‍යා, දසියා, දසීහි, දසීහි—දස්‍යා, දසියා, දසීනං—දස්‍යං, දසියං, දස්‍යා, දසියා, දසිසු—එවමොසධි පොක්ඛරණී ආදයො—නදිසද්දා යොසු—

**නජ්ජා යොස්වාම්.**

යොසු නදිසද්දස්ස ආම් වා හොති, සච—

**මනුබන්ධො සරානමන්තා පරෙ.**

මකාරෙනුබන්ධො යස්ස සො සරානමන්තා සරා පරො හොතී'ති ඊකාරා පරො—"යවා සරෙ"ති යකාරෙ දස්ස චවග්ගො යස්ස පුබ්බරූපං—නජ්ජායො—අඤ්ඤත්‍ර—වා පලොපයොලොපෙසු—නජ්ජො, නදි, නදියො ඉච්චාදි.

---

රතෙතායනුවේ; අඤ්ඤත්‍ර, ටොයනාදෙශනුවූ පක්‍ෂයෙහි; රත්‍යං රත්තියංරත්‍යා රත්තියායනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; මත්‍යාසමං, මති ශබ්දයහාසමයි.

ඉකාරන්තං, ඉකාරාන්තයි.

දසී—පෙ—දසියො.

යංපිතොයනු විකල්පයෙන් යං යනාදෙශවිධානසූත්‍රයි; යංයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; පිතොයනු පඤ්චම්‍යෙකවචනාන්ත පදයි; පසඤ්ඤිතො, පසංඥඊකාරාන්ත නාමයාකෙරෙන් පරවූ; අංවචනස්ස, අංවිභක්තිහට; වා, විකල්පයෙන්; යංහොති, යංයනාදෙශවේ; දස්‍යං—පෙ—දසීසු යනුවේ; ඔසධී, ඔසධීශබ්දය; පොක්ඛරණී, පොක්ඛරණීශබ්දය යන; ආදයො, මේ ආදිශබ්දයෝ; එවං, මෙසේමැයි; නදිසද්ද, නදීශබ්දයාකෙරෙන්; යොසු, යොවිභක්ති කළකල්හි.

නජ්ජායොස්වාම් යනු විකල්පයෙන් ආම් ආගම විධානසූත්‍රයි, නජ්ජායනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; යොසුයනු සප්තමී බහුවචනාන්තපදය; ආම්යනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; යොසු, යොවිභක්ති පරකල්හි; නදිසද්දස්ස, නදීශබ්දයහට; වා, විකල්පයෙන්; අම්හොති, ආම් ආගමවේ; සච, ඒ ආගමයද.

මනුබන්ධොසරානමන්තාපරො යනු පරිභාෂාසූත්‍රයි; මනුබන්ධො යනු ප්‍රථමෛකවචනාන්තපදය; සරානං යනු ෂෂ්ඨීබහුවචනාන්ත පදය; අන්තායනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; පරොයනු ප්‍රථමෛකවචනාන්තපදයි; මකාරො, මකාරනෙම; අනුබන්ධො, උච්චාරිත

ඊකාරන්තං.

යාගු, යාගූ, යාගුයො—(හො)යාගු, යාගූ, යාගුයො—යාගුං, යාගූ, යාගුයො—යාගුයා, යාගුභි, යාගුහි—යාගුයා, යාගූනං—යාගුයං, යාගුයා, යාගුසු—එවං ධෙනු සස්සු පියඞ්ගුපභුතයො—මාතු ධීතු දුහිතු සද්දා පිතුසද්දසමා—සලොපාභාවපක්ඛෙ යාදෙසෙ මාතුසද්දස්ස පන "යෙ පස්සා"ති යොගවිභාගා වා පලොපො—මත්‍යා, මාතුයා.

උකාරන්තං.

වධූ, වධූ, වධුයො—(හො) වධු වධූ, වධුයො—වධුං, වධූ, වධුයො—වධුයා, වධූභි, වධූහි—වධුයා, වධූනං—වධුයං, වධුයා, වධූසු—එවං ජම්බූ වාමොරූ සරභූ ආදයො.

ඌකාරන්තං.

---

ප්‍රධ්වංසීවූයේ; යස්ස, යම්විධියකටද; සො, හෙතෙම; සරානං, ස්වර යන් අතුරෙහි; අන්තාසරා, අන්තස්වරයා කෙරෙන්; පරොහොතීති, පරවූයේවේනුයි; ඊකාරාපරො, ඊකාරයා කෙරෙන්පරවවෙයි; යවා සරෙඉති, යවාසරෙයන සූත්‍රයෙන්; යකාරෙ, යකාරාදෙශකළකල්හි; දස්ස, දකාරයහට; චවග්ගො, චවර්ගාදෙශවේ; යස්ස, යකාරයහට; පුබ්බරූපං, පූර්වරූපවේ; නජ්ජායනුවේ; අසඞ්ඛ්‍යත්‍ර, ආගම නුවූපක්ෂ යෙහි; වා, විකල්පයෙන්; පලොපයොලොපෙසු; පසංඥයොවිභක්ති ලොප්කළ කල්හි; නජ්ජො නදි නදියො ඉති, නජ්ජො නදී නදියො යන; ආදි, මේආදියවේ.

ඊකාරන්තං, ඊකාරාන්තයි.

යාගු—පෙ—යාගුසුයනුවේ; ධෙනු, ධෙනුශබ්දය; සස්සු, සස්සු ශබ්දය; පියඞ්ගු, පියඞ්ගුශබ්දය යන; පභුතයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි; මාතු, මාතුශබ්දය; ධීතු, ධීතුශබ්දය; දුහිතු, දුහිතු ශබ්දය: ආදයොපි, මේආදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; පිතුසද්ද සමං, පිතුශබ්දයාහා සමයෝයි; සලොපා භාවපක්ඛෙ, සවිභක්තිහට; ලොප්නුවූපක්ෂයෙහි; යාදෙසෙ, යකාරාදෙශකළකල්හි; මාතුසද්දස්ස මාතුශබ්දයහට වනාහි; යෙපස්සඉති, යෙපස්සයන, යොගවිභාගා, සූත්‍රවිධාකරණයෙන්; වා, විකල්පයෙන්; පලොපො, පසංඥයහට ලොප්වේ; මත්‍යා, මාතුයා යනුවේ.

උකාරන්තං, උකාරාන්තයි.

වධූ වධූ—පෙ—වධූසුයනුවේ; ජම්බූ, ජම්බූශබ්දය; වාමොරූ, වාමොරූශබ්දය; සරභූ, සරභූශබ්දයයන; ආදයො, මේ ආදිශබ්ද යෝද; එවං, මෙසේමැයි.

ඌකාරන්තං, ඌකාරාන්තයි.

ගො ඉච්චාදි පුමෙන සමං.

ඉත්ථිලිඞ්ගං.

චිත්තසි.

**අං නපුංසකෙ.**

අකාරන්තතො නාමස්මා සිස්ස අං හොති නපුංසකලිඞ්ගෙ-චිත්තං-යොම්හි.

**යොනංනි.**

අකාරන්තතො නාමස්මා යොනං නී හොන්ති නපුංසකෙ'ති නි ආදෙසො.

**නීනං වා.**

අකාරන්තතො නාමස්මා නීනං ටාටෙ වා හොන්ති යථාක්කමං-චිත්තා, අසඞ්ඛ්‍යත්‍ර-"යොලොපනීසු දීඝො"තිදීඝෙ-චිත්තානි- (හො) චිත්ත, චිත්තා, චිත්තා, චිත්තානි-චිත්තං, චිත්තෙන, චිත්තානි-චිත්තෙහි නෙච්චාදි බුද්ධසද්දසමං-එවං පානදානපපභූතයො-එකච්චාදීනං තු පඨමානිම්හි විසෙසො.

---

ගො ඉති, ගොයන, ආදි, මේආදිය; පුමෙනසමං, පුලලිඟුවහාසමයි; ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඟුයි;

චිත්ත, චිත්තශබ්දය; ඔහුකෙරෙන්පරව; සි, සිවිභක්තිවේ.

අංනපුංසකෙ, යනු අං යනාදෙශවිධානසූත්‍රයි; අං යනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදය; නපුංසකෙයනු සප්තම්‍යෙක වචනාන්ත පදයි; නපුංසකලිඞ්ගෙ, නපුංසකලිඟුයෙහිවැටෙන්නාවූ; අකාරන්ත තොනාමස්මා, අකාරාන්තනාමයා කෙරෙන්පරවූ; සිස්ස, සිවිභක්ති ටිට; අංහොති, අංයනාදෙශවේ; චිත්තංයනුවේ; යොම්හි, යොවිභක්ති පරකල්හි.

යොනංනි, යනු නියනාදෙශවිධානසූත්‍රයි; යොනංයනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; නියනු ප්‍රථමෛකවචනාන්තපදයි; නපුංසකෙ, නපුංසක ලිඟුයෙහි වැටෙන්නාවූ; අකාරන්තතොනාමස්මා, අකාරා න්තනාමයා කෙරෙන්පරවූ; යොනං, ප්‍රථමා විතීයායොවිභක්තීන්ට; නිහොතීති, යම්හෙයකින් නියනාදෙශවේද එහෙයින්; මෙහි ප්‍රථමා විතීයායො විභක්තීන්ට; නිආදෙසො, මේ සූත්‍රයෙන් නියනාදෙශවේ.

නීනංවා, යනු විකල්පයෙන් ටාටෙයනාදෙශ විධාන සූත්‍රයි; නීනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; වායනු ප්‍රථමෛක වචනාන්ත නිපාත පදයි; අකාරන්තතො නාමස්මා, අකාරාන්තනාමයාකෙරෙන් පරවූ; නීනං, ප්‍රථමා විතීයා නියනාදෙශයන්ට; යථාක්කමං, පන් තීන්; වා, විකල්පයෙන්; ටාටෙහොන්ති, ටාටෙයනා දෙශයෝවෙන්; චිත්තායනුවේ; අසඞ්ඛ්‍යත්‍ර, ටායනාදෙශ නුවූ පක්ෂයෙහි; යොලොප

**න නිස්ස වා.**

එකවචාදිහි පරස්ස නිස්ස වා න හොති-එකවචානි, පඨමානි— පදාදීහි නාස්සිංසු.

**නාස්ස සා.**

පදාදිහි නාස්ස සා හොති වා-පදසා, පදෙන-බිලසා, බිලෙන-

**පදාදීහි සි.**

එහි ස්මිනො සි හොති වා- පදසි, පදෙ, පදම්හි, පදස්මිං-කම්ම සද්දතො නාස්ස "නාසෙසතො"ති එනො වා—කම්මෙන—අඤ්ඤත්‍ර පුමාදිනා වා උනෙන-කම්මුනා, කම්මනා—ඉමිනාව සඤ්ඤාසු උනනං-තස්ස ලසඤ්ඤයං-සස්මානං යථායොගං නොනා නිච්චං—වවත්ථිත විභාසායං—කම්මුනො, කම්මස්ස-කම්මුනා, කම්මා, කම්මම්හා, කම්ම

---

නීසුදීඝොඉති, යොලොපනීසු දීඝොයන සූත්‍රයෙන්; දීඝෙ, දිඝීකළ කල්හි; විත්තානියනුවේ; හොවිත්තවිත්තා—පෙ—විත්තානියනුවේ; චිතෙත තඉති, චිතෙතන යන, ආදි, මේආදිය, බුඩසමං, බුඩශබ්දයහා සමයි; පාන, පානශබ්දය; දූත, දූතශබ්දයයන; පභුතයො, මේආදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; එකවචාදිනං, එකවචාදින්ට වනාහි; පඨමානිම්හි, ප්‍රථමා නියනාදෙශයාපරකල්හි; විසෙසො, වෙනසි.

නනිස්සවා යනු වායනාදෙශවිධානසූත්‍රයි; නයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාතපදය; නිස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්ත පදය; වායනු ප්‍රථමෛකවචනාන්තපදයි; එකවචාදිහි, එකවචාදින් කෙරෙන්; පරස්ස, පරවූ; නිස්ස, නියනාදෙශයහට; වානහොති, වා යනාදෙශනොවේ; පදාදිහි, පදාදින්කෙරෙන්; නාසස්සිංසු, නායසය ස්මිංය යන මොවුන් පරකල්හි.

නාස්සසා යනු විකල්පයෙන් සායනාදෙශවිධාන සූත්‍රයි; නාස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; සායනු ප්‍රථමෛකවචනාන්තපදයි; පදාදිහි, පදාදින්කෙරෙන් පරවූ; නාස්ස, නාවිභක්තිහට, වා, විකල්පයෙන්; සාහොති, සායනාදෙශවේ; පදසා, පදෙන; බිලසා, බිලෙන යනුවේ.

පදාදිහිසි යනු විකල්පයෙන් සියනාදෙශ විධාන සූත්‍රයි; පදාදීහි යනු පඤ්චමිබහුවචනාන්තපදය, සියනු ප්‍රථමෛකවචනාන්තපදයි; එහි, මේපදාදින් කෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; සිහොති, සියනාදෙශවේ; පදසි පදෙ පදම්හි පදස්මිං යනුවේ—කම්මසද්දතො, කම්මශබ්දයා කෙරෙන් පරවූ; නාස්ස, නාවිභක්තිහට; නාසෙසතොති, "නාසෙසතො" යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; එනො, එනයනාදෙශවේ; කම්මෙන යනුවේ; අඤ්ඤත්‍ර,

සබ්බා-"කම්මාදිතො"ති ස්මිනො වා නිමහි-කම්මනි, කම්මෙ, කම්ම මහි, කම්මස්මිං-සෙසං චිත්තසමං-චම්ම වෙස්ම භස්මාදයො කම්මසමා උත්තතොඤඤත්‍ර- ගච්ඡන්තසි-"න්තස්සං"ති වා අංමහි සිලොපො-ගච්ඡං-අඤඤත්‍ර සිස්ස අං-ගච්ඡන්තං, ගච්ඡන්තා ගච්ඡන්තානි-(හො) ගච්ඡ, ගච්ඡා, ගච්ඡං, ගච්ඡන්තා, ගච්ඡන්තානි-ගච්ඡං, ගච්ඡන්තං, ගච්ඡතෙත, ගච්ඡන්තානි-නාදීසු පුල්ලිඞ්ගසමං-එවං' යජන්ත වජ න්තාදයො.

අකාරන්තං.

අට්ඨි

ඣලා වා.

ඣලතො යොනං නි හොති වා නපුංසකලිඞ්ගෙ-අට්ඨීනි-යොලොප

---

එනයනාදෙශ නුවූ පක්ෂයෙහි; පුමාදිනා, පුමාදිසූත්‍රයෙන්; වා, විකල්පයෙන්; උතෙත, උත්වකළකල්හි; කම්මුනා කම්මනා යනුවේ; ඉමිනාව, මේ පුමාදි සූත්‍රයෙන්ම; සස්මාසු, සයස්මාය යනමොවුන් පර කල්හි; උත්තං, උත්වවේ; තස්ස, ඒ උකාරයහට; ලසඤඤායං; ලසංඥ කළකල්හි; සස්මානං, සයස්මාය යනමොවුන්ට; යථායොගං, යෙදෙන්පරිද්දෙන්; නිච්චං, අවිකල්පයෙන්; නොනා, නොනායනාදෙශ යෝවේත්; වවත්ථිත විභාසායං, අයං, මේසූත්‍රයතෙම; වවත්ථිතවිභාසා, ව්‍යවස්ථිතවිභාෂාවාවියි-කම්මුනො—පෙ—කම්මස්මා යනුවේ. කම්මාදිතො ඉති, කම්මාදිතො යන සූත්‍රයෙන්; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්පයෙන්; නිමහි, නියනාදෙශකළකල්හි; කම්මනි—පෙ—කම්මස්මිං යනුවේ; සෙසං, සෙසු නොකී රූපක්‍රමය; චිත්තසමං, චිත්තශබ්දයහා සමයි; උත්තතොඤඤත්‍ර, උත්වයෙන් පිටත්තන්හි; චම්ම, චම්මශබ්දය; වෙස්ම, වෙස්මශබ්දය; භස්මාදයො, භස්මශබ්දය යනමේ ආදි ශබ්දයෝ; කම්මසමා, කම්මශබ්දයහා සමයෝයි; ගච්ඡන්ත, ගච්ඡන්තශබ්දය; (ඔහුකෙරෙන්පරව) සි, සිවිභක්තිවේ; න්තස්සං ඉති, න්තස්සංයන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; අංමහි, අංයනාදෙශකළකල්හි; සිලොපො, සිහටලොප්වේ; ගච්ඡංයනුවේ; අඤඤත්‍ර, අංයනාදෙශ නුවූපක්ෂයෙහි; සිස්ස, සිවිභක්තිහට; අං, (අංනපුංසකෙ යන සූත්‍රයෙන්) අං යනාදෙශවේ — ගච්ඡන්තං — පෙ — ගච්ඡන්තානි යනුවේ; නාදීසු, නාවිභක්තිආදීන් පරකල්හි; පුල්ලිඞ්ගසමං, පුල්ලිඞ්ගහාසමයි; යජන්තවජන්තාදයො, යජන්තවජන්තාදි ශබ්දයෝද; එවං, මෙසේමැයි.

අකාරන්තං, අකාරාන්තයි.

අඬියනුවේ;

---

ඣලාවා යනු විකල්පයෙන් නියනාදෙශවිධානසූත්‍රයි; ඣලා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; වායනු ලුප්ත ප්‍රථමෙක වචනාන්ත

දීඝෙසු-අට්ඨී —(හො) අට්ඨී, අට්ඨී, අට්ඨීනි, අට්ඨි-අට්ඨිං, අට්ඨීනි, අට්ඨි-තතියාදිසු මුනිසද්දසමං-එවමච්ඡි අක්ඛි දධි සප්පි ආදයො.

ඊකාරන්තං.

දණ්ඩි-"එකවචනෙ"ච්චාදිනා රස්සො-සිලොපො-දණ්ඩිනි, දණ්ඩි-(හො) දණ්ඩී, දණ්ඩී, දණ්ඩීනි, දණ්ඩි, දණ්ඩීනං, දණ්ඩිං, දණ්ඩීනි, දණ්ඩි-සෙසං පුල්ලිඞ්ගසමං-එවං සුඛකාරි සීඝයායී ආදයො.

උකාරන්තං.

චක්ඛු, චක්ඛූනි, චක්ඛු-අට්ඨිසද්දසමං-එවමායු මධු මත්ථු ධනු චිත්තගුප්පභුතයො—ආයුසාති කොධාදීනන්තා නාස්ස සා වා-අම්බුසද්දා ස්මිනො "අම්බ්වාදීහි"ති වා නි ආදෙසෙ-අම්බූනි, අම්බුම්හි, අම්බුස්මිං.

ගුණවන්තුසි.

---

නිපාතපදයි; නපුංසකලිඞ්ගෙ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; ඣලනො, ඣසංඥලසංඥනාමයන් කෙරෙන්පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයායොවිභක්තීන්ට; වා, විකල්පයෙන්; නිහොති, නියනාදෙශවේ; අට්ඨීනි යනුවේ; යොලොපදීඝෙසු, යොලොපයදීර්ඝයයන මොවුන්කළ කල්හි; අට්ඨීයනුවේ; හො අට්ඨී අට්ඨී—පෙ—අට්ඨීයනුවේ; තතියාදිසු, තෘතීයාදීන් පරකල්හි; මුනිසද්දසමං, මුනිශබ්දයහා සමයි; අච්ඡි, අච්ඡිශබ්දය; අක්ඛි, අක්ඛිශබ්දය; දධි, දධිශබ්දය; සප්පි, සප්පිශබ්දය යන; ආදයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි.

ඊකාරන්තං, ඊකාරාන්තයි.

දණ්ඩියනුවේ; එකවචනෙ ඉච්චාදිනා, 'එකවචනෙ' යනාදි සූත්‍රයෙන්; රස්සො, හ්‍රස්වවේ; සිලොපො, සිවිභක්තිහට ලොප්වේ—දණ්ඩිනි—පෙ—දණ්ඩියනුවේ; සෙසං, සෙසුනොකිරූපක්‍රමය; පුල්ලිඞ්ගසමං, පුල්ලිඞ්ගහාසමයි; සුඛකාරි සීඝයායි, සුඛකාරි සීඝයායී යන; ආදයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි.

උකාරන්තං, උකාරාන්තයි.

චක්ඛු චක්ඛූනි චක්ඛු යනුවේ-අට්ඨිසද්දසමං, අට්ඨිශබ්දයාහාසමයි; ආයු, ආයුශබ්දය; මධු, මධුශබ්දය; මත්ථු, මත්ථුශබ්දය; ධනු, ධනුශබ්දය; චිත්තගු, චිත්තගු ශබ්දයයන; පභුතයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි; ආයුසාඉති, ආයුසායි කියා;' කොධාදීනන්තා, කොධාදිබවහෙයින්; නාස්ස, නාවිභක්තිහට; වා, විකල්පයෙන්; සා, සායනාදෙශවේ; අම්බුසද්දා, අම්බුශබ්දයා කෙරෙන් පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; අම්බ්වාදීහි ඉති, අම්බ්වාදීහි යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; නිආදෙසෙ, නියනාදෙශකළකල්හි;—අම්බූනි අම්බු

**අංඞංනපුංසකෙ.**

න්තුස්ස අංඞං හොන්ති සිම්හි නපුංසකෙ-ගුණවං, ගුණවන්තං යොම්හි—"යවාදෙන්තුස්සා"ති අකාරෙ "යොනංනි" ති නි නස්ස වාටාදෙසෙ—ගුණවන්තා, ගුණවන්තානිච්චාදි- ගච්ඡන්තසමං-එවං යසවන්තු ධනවන්තු ගොමන්තාවාදයො.

උකාරන්තං.

ගොත්‍රභු, ගොත්‍රභූනි, ගොත්‍රභු-(හො)ගොත්‍රභු, ගොත්‍රභූනි, ගොත්‍රභු ගොත්‍රභුං, ගොත්‍රභූනි, ගොත්‍රභු-ගොත්‍රභුනා ඉච්චාදි පුල්ලිඞ්ගෙ වෙස්සභූසද්දසමං-එවං අභිභු සයම්භු ධම්මඤ්ඤූ ආදයො.

ඌකාරන්තං=නපුංසකලිඞ්ගං.

අථ සබ්බාදිනං රූපනයො නිද්දිසීයතෙ-සබ්බ කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම පුබ්බ පරාපර දක්ඛිණුත්තරාධ

---

මහි, අම්බු ස්මිංයනුවේ; ගුණවන්තු, ගුණවන්තුශබ්දය; (ඔහුකෙරෙන් පරව) සි, සිවිභක්තිවේ.

අංඞංනපුංසකෙ යනු අංඞං යනාදෙශවිධාන සූත්‍රයි; අංඞං යනු ප්‍රථමා බහුවචනාන්තපදය; නපුංසකෙයනු සප්තම්‍යෙකවචනාන්ත පදයි; සිම්හි, සිවිභක්තිපරකල්හි; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; න්තුස්ස, න්තුප්‍රත්‍යයහට; අංඞංහොන්ති, අංඞංයනාදෙශයෝවෙත්; ගුණවංගුණවන්තංයනුවේ; යොම්හි, යොවිභක්ති පරකල්හි; යවාදෙන්තුස්ස ඉති, යවාදෙන්තුස්ස යන සූත්‍රයෙන්; අකාරෙ, (න්තුප්‍රත්‍යයහට) අකාරකළකල්හි; යොනංනි ඉති, යොනංනියන සූත්‍රයෙන්; නි, නියනාදෙශද; නස්ස, ඒනියනාදෙශයහට; වා, විකල්පයෙන්; ටාදෙසෙ, ටායනාදෙශද කළකල්හි; ගුණවන්තා, ගුණවන්තානි ඉති, ගුණවන්තා ගුණවන්තානි යන; ආදි, මේ ආදියවේ; ගච්ඡන්තසමං, ගච්ඡන්තශබ්දයාහාසමයි; යසවන්තු, යසවන්තු ශබ්දය; ධනවන්තු, ධනවන්තුශබ්දය; ගොමන්තු, ගොමන්තු ශබ්දය යන; ආදයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි.

උකාරන්තං, උකාරාන්තයි.

ගොත්‍රභු ගොත්‍රභූනි—පෙ—ගොත්‍රභුයනුවේ; ගොත්‍රභුනාඉති, ගොත්‍රභුනා යන; ආදි, මේආදියවේ; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි; වෙස්සභූසද්දසමං, වෙස්සභූශබ්දයාහාසමයි; අභිභුසයම්භුධම්මඤ්ඤූයන; ආදයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි. ඌකාරන්තං, ඌකාරාන්තයි.

නපුංසකලිඞ්ගං, නපුංසකලිඞ්ගයි.

අථ, ඉක්බිත්තෙන්; සබ්බාදිනං, සර්වාදින්ගේ; රූපනයො, රූපක්‍රමයනෙම; නිද්දිසීයතෙ, දක්වනුලැබේ; ඔහුකවරහයත්? සබ්බ,

රානි වවත්ථායම සඤ්ඤායං–ය ත්‍ය ත එත ඉම අමු කිං එකතුම්හ අම්හ ඉච්චෙතෙ සබ්බාදයො—සබ්බො.

**යොනමෙට්.**

අකාරන්තෙනහි සබ්බාදීහි යොනමෙට් හොති–සබ්බෙ–එවමාලපන දුතියායොසු.

**සබ්බාදීනං නංම්හි ච.**

අකාරන්තානං සබ්බාදීනං එ හොති නංම්හි සුහිසු ච.

---

නිරවශෙෂපර්‍යායාර්ථඇති සබ්බ ශබ්දය; කතරකතම, කවරපුච්ඡනාර්ථවාචිවූ කතරකතමශබ්දයෝ දෙදෙන; උභය, විඅවයව සමුදායවාචිවූ උභයශබ්දය; ඉතර, උක්තප්‍රතියෝගාදිවූ ඉතරශබ්දය; අඤ්ඤ, අධිකෘතාපරවචනඇති අඤ්ඤ ශබ්දය; අඤ්ඤතර අඤ්ඤතම, අනියමාර්ථවාචිවූ අඤ්ඤතර අඤ්ඤතම ශබ්දයෝ දෙදේනය.

පුබ්බපරාපරදක්ඛිණුත්තරාධරානි වවත්ථාය' මසඤ්ඤායං යනු ගණසූත්‍රයි; පුබ්බපරාපර දක්ඛිණුත්තරාධරානි යනු ප්‍රථමා බහුවචනාන්තපදය; වවත්ථායං අසඤ්ඤායං යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; පුබ්බ, (පූර්වාසාදි ව්‍යවස්ථාවචනවූ) පුබ්බශබ්දය; පර, පරශබ්දය; අපර, අපරශබ්දය; දක්ඛිණ, දක්ඛිණ ශබ්දය; උත්තර, උත්තරශබ්දය; අධරානි; අධරශබ්දය යනමොහුද; අසඤ්ඤායං, සංඥාවෙන් පිටත් තන්හි, වවත්ථායං, දිග්දෙශකාලාවධි නියමයක් ගම්‍යමානකල්හි; සබ්බාදිසු පඨියනෙත, සබ්බාදීන්කෙරෙහි හදාරණුලැබෙත්; ය, (අනියමාර්ථවාචිවූ) යශබ්දය; ත්‍යත, (පරාඞ්මුඛාර්ථවාචිවූ) ත්‍යශබ්ද තශබ්දයෝදෙදෙනය; එත, (සමීපාර්ථවාචිවූ) එතශබ්දය; ඉම, (අත්‍යන්තසමීපාර්ථවාචිවූ) ඉමශබ්දය; අමු, (දූරාර්ථවාචිවූ) අමුශබ්දය; කිං, (ප්‍රශ්නාර්ථවාචිවූ) කිංශබ්දය, එක, (සඞ්ඛ්‍යාතුල්‍යාසහායාන්‍යවාචිවූ) එකශබ්දය; තුම්හ අම්හ ඉති, (පරාත්මනිර්දේශවාචිවූ) තුම්හ අම්හශබ්දයෝ දෙදෙනය යන; එතෙ, මොහු (සූවිසිදෙන); සබ්බාදයො, සර්වාදිහු නම්වෙත්; සබ්බොයනුවේ.

යොනමෙට් යනු එට්යනාදෙශවිධානසූත්‍රයි; යොනංයනු ෂෂ්ඨී බහුවචනාන්තපදය, එට් යනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදයි; අකාරන්තෙනහි, අකාරාන්තවූ; සබ්බාදීහි, සර්වාදීන්කෙරෙන්පරවූ; යොනං, ප්‍රථමාද්විතීයා යොවිභක්තින්ට; එට්හොති, එට්යනාදෙශවේ—සබ්බෙ යනුවේ; ආලපන දුතියායොසු, ආලපනද්විතීයා යෝවිභක්තින් පරකල්හිද; එවං, මෙසේමැයි.

සබ්බාදීනං නංම්හිච යනු එකාරාදෙශවිධාන සූත්‍රයි; සබ්බාදීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය, නංම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය; ච යනු සමුච්චයාර්ථවාචිවූ ලුප්තප්‍රථමෛකවචනාන්තනිපාතපදයි;

**සංසානං.**

සබ්බාදිතො නංවචනස්ස සංසානං හොන්ති-සබ්බෙසං, සබ්බෙසානං-සෙසං බුද්ධසමං-ඉත්ථියං "ඉත්ථියමත්වා"ති ආප්පච්චයො සරලොපෙ ච කතෙ අකාරස්ස ඝසඤ්ඤායං කඤ්ඤාසද්දස්සෙව රූපනයො, අයන්තු විසෙසො.

**ඝපා සස්ස ස්සා වා.**

සබ්බාදීනං ඝපතො සස්ස ස්සා වා හොති-"ඝොස්ස"මිච්චාදිනා රස්සෙ-සබ්බස්සා, සබ්බාය-නංම්හි-සබ්බාසං, සබ්බාසානං.

**ස්මිනො ස්සං.**

සබ්බාදීනං ඝපතො ස්මිනො ස්සං වා හොති-සබ්බස්සං, සබ්බායං සබ්බාය-නපුංසකෙ-සබ්බං-යොසස නිම්හි-

---

නංම්හි, නංවිභක්ති පරකල්හිද; සුහිසුච, සුයහිය යනමොවුන් පර කල්හිද; අකාරන්තානං, අකාරාන්තවූ; සබ්බාදීනං, සර්වාදීන්ට; එ හොති, එකාරාදෙශවේ.

සංසානං යනු සංසානං යනාදෙශවිධානසූත්‍රයි; සංසානං යනු ලුප්තප්‍රථමාබහුවචනාන්තපදයි; සබ්බාදිතො, සර්වාදීන්කෙරෙන්පරවූ; නංවචනස්ස, නංවිභක්තිහට; සංසානංහොන්ති, සංසානංයනාදෙශයෝවේත්—සබ්බෙසං සබ්බෙසානං යනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; බුද්ධසමං, බුද්ධශබ්දයාහාසමයි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; උදාහරණකියනුලැබේ; ඉත්ථියමත්වාඉති, ඉත්ථියමත්වා යන සූත්‍රයෙන්; ආප්පච්චයො, (ස්ත්‍රීලිඞ්ගයෙහිවැටෙන්නාවූ අකාරාන්තයාකෙරෙන්) ආප්‍රත්‍යයවේ; සරලොපෙචකතෙ, පූර්වස්වරයාලොප් කළකල්හි; ආකාරස්ස, ආකාරයහට; ඝසඤ්ඤායං, ඝසංඥකළකල්හි; රූපනයො, (සබ්බාශබ්දයාගේ) රූපක්‍රමයතෙම; කඤ්ඤාසද්දස්සෙව, කඤ්ඤාශබ්දයාගේ මෙනි; අයන්තු, මේ මතුකියන්නේවනාහි; විසෙසො, වෙනසි.

ඝපා සස්ස ස්සා වා යනු විකල්පයෙන් ස්සා යනාදෙශ විධාන සූත්‍රයි; ඝපා යනු පඤ්චම්‍යෙකවචනාන්තපදය; සස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; ස්සා යනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදය; වා යනු ලුප්තප්‍රථමෛකවචනාන්ත නිපාතපදයි; සබ්බාදීනං, සර්වාදීන්සම්බන්ධිවූ; ඝපතො, ඝසංඥපසංඥයන් කෙරෙන් පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන්; ස්සාහොන්, ස්සායනාදෙශවේ; ඝොස්සං ඉති, ඝොස්සං යන; ආදිනා, මේ ආදිසූත්‍රයෙන්; රස්සෙ, (ඝසංඥ ආකාරයහට) හ්‍රස්වකළකල්හි; සබ්බස්සා සබ්බාය යනුවේ; නංම්හි, නං විභක්ති පරකල්හි; සබ්බාසං සබ්බාසානං යනුවේ.

ස්මිනො ස්සං යනු විකල්පයෙන් ස්සං යනාදෙශවිධාන සූත්‍රයි. ස්මිනො යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; ස්සං යනු ප්‍රථමෛකවචනා

**සබ්බාදීහි.**

සබ්බාදීහි පරස්ස නිස්ස ටා න හොති-සබ්බානි-(හො)සබ්බ, සබ්බා, සබ්බානි—සබ්බං, සබ්බෙ, සබ්බානි—නාදිසු පුමෙව—කතරාදයො තයො තීසු ලිඞ්ගෙසු සබ්බසමා—එවං ඉතර අඤ්ඤසද්දා—ස්සාස්සංසු විසෙසො.

**ස්සංස්සාස්සායෙස්විතරෙකඤ්ඤෙතිමානමි.**

ස්සමාදිසු ඉතරඑකඅඤ්ඤඑතඉම ඉච්චෙසං ඉ හොති-ඉතරිස්සා, ඉතරිස්සං—අඤ්ඤිස්සා, අඤ්ඤිස්සං—අඤ්ඤතරඅඤ්ඤතමසද්දා ලිඞ්ගත්තයෙ සබ්බසමා-පුබ්බා-යො.

**පුබ්බාදීහි ඡහි.**

---

නන්තපදයි; සබ්බාදීනං, සර්වාදීන් සම්බන්ධිවූ; ස්සපතො, ස්සංඥ පසංඥ නාමයන් කෙරෙන්පරවූ; ස්මිනො, ස්මිංවිභක්තිහට; වා, විකල්ප යෙන්; ස්සංහොති, ස්සංයනාදෙශවේ; සබ්බස්සං සබ්බායං සබ්බාය යනු වේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; (උදාහරණකියනුලැබේ); සබ්බං යනුවේ. යොස්ස, යොවිභක්තිහට; නිමහි, නියනාදෙශකළ කල්හි.

සබ්බාදීහි යනු ටායනාදෙශ ප්‍රතිෂෙධසූත්‍රයි; සබ්බාදීහියනු පඤ්චමී බහුවචනාන්තපදයි; සබ්බාදීහි, සර්වාදීන් කෙරෙන්; පරස්ස, පරවූ; නිස්ස, ප්‍රථමානියනාදෙශයහට; ටා නහොති, ටායනාදෙශ නොවේ; සබ්බානි යනුවේ; හො සබ්බ සබ්බා සබ්බානි යනුවේ; සබ්බං සබ්බෙ සබ්බානි යනුවේ; නාදිසු, නාවිභක්ති ආදීන්පරකල්හි; පුමෙව, පුල්ලිඞ්ගයෙහිමෙනි; කතරාදයො, කතරාදි ශබ්දයෝ තුන්දෙන; හෙවත් කතරකතම උභය යන ශබ්දයෝ තුන්දෙන; තීසු ලිඞ්ගෙසු, ලිඞ්ගත්‍රයෙහි, සබ්බසමා, සබ්බශබ්දයා හා සමයෝයි; ඉතර අඤ්ඤසද්දා, ඉතර අඤ්ඤශබ්දයෝ දෙදෙනද; එවං, මෙසේමැයි; ස්සාස්සංසු, ස්සා ස්සං යන මොවුන් පරකල්හි; විසෙසො, වෙනස කියනුලැබේ.

ස්සං ස්සා ස්සායෙස්විතරෙකඤ්ඤෙතිමානමි යනු ඉකාරාදෙශ විධානසූත්‍රයි; ස්සංස්සාස්සා යෙසු යනු සප්තමී බහුවචනාන්තපදය; ඉතරෙකඤ්ඤෙතිමානං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; ඉ යනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තපදයි; ස්සමාදිසු, ස්සංයනාදීන්පරකල්හි; ඉතර එකඅඤ්ඤ එතඉම ඉති, ඉතර එක අඤ්ඤ එත ඉම යන; එතෙසං, මොවුන්ට; ඉහොති, ඉකාරාදෙශවේ; ඉතරිස්සා ඉතරිස්සං අඤ්ඤිස්සා අඤ්ඤිස්සං යනුවේ; අඤ්ඤතර අඤ්ඤතමසද්දා, අඤ්ඤතර අඤ්ඤතම ශබ්දයෝ දෙදෙන; ලිඞ්ගත්තයෙ, තුන්ලිඞ්ගයෙහිම; සබ්බසමා, සබ්බ ශබ්දයා හා සමාන රූපඇත්තාහුයි; පුබ්බා යනුවේ; යො, යොවිභක්තිවේ.

පුබ්බාදීහි ඡහි යනු එව්යනාදෙශ විධානසූත්‍රයි; පුබ්බාදීහි යනු පඤ්චමී බහුවචනාන්තපදය; ඡහි යනු පඤ්චමී බහුවචනාන්තපදයි;

එතෙහි ඡහි සවිසයෙ එට් වා හොතී'ති යොසෙසට්-පුබ්බෙ, පුබ්බා-(හො) පුබ්බ, පුබ්බා, පුබ්බෙ, පුබ්බා, පුබ්බං, පුබ්බෙ, පුබ්බා-සෙසං සබ්බ ලිඞ්ගෙ සබ්බසමං-එවං පරාදයො පඨ-යො, යා, යම්ච්චාදි සබ්බයමං-යාදිනමාලපනෙ රූපං න සම්භවති-ත්‍යසි.

**ත්‍යතෙතානං තස්ස සො.**

ත්‍යතෙතානමනපුංසකානං තස්ස සො හොති සිම්හි, ස්‍යො, ස්‍යා ත්‍යම්ච්චාදි, සො.

**න තස්ස නො සබ්බාසු.**

තසද්දස්ස තස්ස නො වා හොති සබ්බාසු විභත්තිසු-නෙ, තෙ, නං තං, නෙ, තෙ, නෙන, තෙන, නෙහි, තෙහි, නෙභි, තෙභි.

---

එතෙහි ඡහි, මේ පූර්වාදි සදෙනාකෙරෙන් පරව; සවිසයෙ, සවකීයවූ පුල්ලිඞ්ගවිෂයෙහි; වා, විකල්පයෙන්; යොසස, යොවිභක්තිහට; එට් හොති ඉති, එට්යනාදෙශවේනුයි; එට්, එට්යනාදෙශවේ; පුබ්බෙ පුබ්බායනුවේ; හො, පුබ්බ—පෙ—පුබ්බෙ යනුවේ; සෙසං, සෙසුනොකී රූපක්‍රමය; සබ්බලිඞ්ගෙසු, සියලු ලිඞ්ගයෙහි, සබ්බසමං, සබ්බශබ්දයාහා සමයි; පරාදයො පඨ, පරාදි ශබ්දයෝ පස්දෙනද; එවං, මෙසේ මැයි; යො යා යං ඉති, යො යා යං යන; ආදි, මේආදිය; සබ්බසමං සබ්බශබ්දයාහාසමයි; යාදීනං, යශබ්දාදීන්ට; ආලපනෙ, ආමන්ත්‍රණ විෂයෙහි; රූපං, විභක්තිරූපය; නසම්භවති, නොලැබේ; ත්‍ය, ත්‍ය ශබ්දය; (ඔහුකෙරෙන්පරව) සි, සිවිභක්තිවේ.

ත්‍ය තෙතානං තස්ස සො යනු සකාරාදෙශ විධානසූත්‍රයි; ත්‍යතෙ තානං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; තස්ස යනු කායීනි නිර්දේශ ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; සො යනු කාය්‍යී නිර්දේශ ප්‍රථමෛක වච නාන්තපදයි; සිම්හි, සිවිභක්තිපරකල්හි; අනපුංසකානං, නපුංසක ලිඞ්ගයෙහි; නොවැටෙන්නාවූ; ත්‍යතෙතානං, ත්‍යශබ්ද තශබ්ද එත් ශබ්ද යන මොවුන් සම්බන්ධවූ; තස්ස, (නිඃසවරවූ) තකාරයහට; සො හොති, සකාරාදෙශවේ; ස්‍යො ස්‍යා ත්‍යං ඉති, ස්‍යො ස්‍යා ත්‍යං යනු; ආදි, මේ ආදියවේ; සො යනුවේ.

තතස්ස නො සබ්බාසු යනු විකල්පයෙන් නකාරාදෙශ විධාන සූත්‍රයි; තතස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; නොයනු ප්‍රථමෛක වචනාන්තපදය; සබ්බාසු යනු සප්තමි බහුවචනාන්තපදයි; සබ්බාසු විභත්තිසු, සියලු විභක්තීන් පරකල්හි; තසද්දස්ස, තශබ්දයා සම්බ න්ධවූ; තස්ස, (නිඃසවරවූ ව්‍යඤ්ජනමාත්‍රවූ) තකාරයහට; වා, විකල්ප යෙන්; නො හොති, නකාරාදෙශවේ; නේනෙයනුවේ; නං තං—පෙ—නෙහි යනුවේ.

**ට සස්මාසම්ංස්සාසස්ංස්සාසංමහාම්හිස්විමස්ස ච.**

සාදීසවිමස්ස තසද්දතකාරස්ස ට වා හොති, පුබ්බසර ලොපෙ, අස්ස, නස්ස, තස්ස, නෙසං, නෙසානං, තෙසං, තෙසානං—අම්හා, අස්මා, නම්හා, නස්මා, තම්හා, තස්මා, අම්හි, අස්මිං, නම්හි, නස්මිං, තම්හි, තස්මිං, නෙසු, තෙසු–ඉත්ථියං–සා, නා, නායො, තා, තායො–නං, තං, නා, නායො, තා, තායො—නාම්හි කතෙ—

**ස්සා වා තෙතිමාමූහි.**

සපසඞ්ඛ්‍යාහි තා එතා ඉමා අමූහි නාදිනමෙකස්මිං ස්සා වා හොති–වා ට දෙසෙ—අස්සා, නස්සා, නාය.

**තායවා.**

ස්සංස්සාස්සායෙසු තස්ස වා ඉ හොති–තිස්සා, තස්සා, තාය-නාහි, නාහි, තාහි, තාහි–සස්ස වා ස්සාමහි, අස්සා, නස්සා, තිස්සා, තස්සා, ස්සාදෙසාභාවපක්ඛෙ.

---

ට සස්මා ස්මිං ස්සාය ස්සං ස්සාසං මහා මහි සවිමස්සච යනු විකල්පයෙන් ටකාරාදෙශ විධානසූත්‍රයි; ටයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත පදය; ස—පෙ—මහිසු යනු සප්තමී බහුවචනාන්තපදය; ඉමස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; චයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; සාදීසු, සවිභක්තිආදීන් පරකල්හි; ඉමස්ස, ඉමශබ්දය හටද; තසද්දතකාරස්සච, තශබ්දයාසම්බන්ධවූ (කෙවල) තකාරය හටද; වා, විකල්පයෙන්; ටොහොති, ටකාරාදෙශවේ; පුබ්බසරලොපෙ, පූර්වස්වරයාලොප්කළකල්හි; අස්ස නස්ස—පෙ—නෙසු තෙසු යනුවේ; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; (උදාහරණකියනුලැබේ); සා—පෙ—නා නායො තා තායො යනුවේ; නාම්හිකතෙ, නාවිභක්තිකළකල්හි.

ස්සා වා තෙති මාමූහි යනු විකල්පයෙන් ස්සා යනාදෙශ විධාන සූත්‍රයි; ස්සායනු ප්‍රථමෛක වචනාන්තපදය; වා යනු ලුප්තප්‍රථමෛකවචනාන්ත නිපාතපදය; තෙතිමාමූහි යනු පඤ්චමීබහුවචනාන්ත පදයි; සපසඞ්ඛ්‍යාහි, සසංඥාසංඥවූ; තාඑතාඉමා අමූහි, තා එතා ඉමා අමු ශබ්දයන්කෙරෙන්පරවූ; එකස්මිං, එකවචනයෙහි (කරණලද); නාදිනං, නාවිභක්ති ආදීන්ට; වා, විකල්පයෙන්; ස්සාහොති, ස්සා යනාදෙශවේ; වා, විකල්පයෙන්; ටාදෙසෙ, ටසස්මාස්මිං යනාදි සූත්‍රයෙන් ටකාරාදෙශ කළකල්හි; අස්සා නස්සා නාය යනුවේ.

තාය වා යනු විකල්පයෙන් ඉකාරාදෙශවිධානසූත්‍රයි; තාය යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; වා යනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදයි; ස්සං ස්සා ස්සා යෙසු, ස්සං ස්සා ස්සාය යන මොවුන් පරකල්හි; තස්සා, තාශබ්දයහට; වා, විකල්පයෙන්; ඉහොති, ඉකාර

**තෙතිමාතො සස්ස ස්සාය.**

තා එතා ඉමාතො සස්ස ස්සායො හොති වා, අස්සාය, නස්සාය, තිස්සාය, තස්සාය-ඊහි මුත්තපක්ඛෙ—නාය තාය නංවචනස්ස සමාදෙසෙ තකාරස්ස ච වා ටාදෙසෙ සුනංහිසු ති දීඝෙ ච කතෙ-ආසං, නාසං, නාසානං, තාසං, තාසානං—සත්තමියං-අස්සං, අස්සා, නස්සං නස්සා, නායං, නාය, තිස්සං, තිස්සා, තස්සං, තස්සා, තායං, තාය, නාසු, තාසු-නපුංසකෙ-නං, තං, නානි, තානි, නං, තං, නෙ, නානි, තෙ, තානි—නාදීසු පුමෙව-එවමෙතසද්දස්ස තීසු ලිඞ්ගෙසු-ටනාදෙසාභාවොච විසෙසො, ඉමසී-

**සිම්හි නපුංසකස්සායං.**

ඉමසද්දස්සානපුංසකස්සායං හොති සිම්හි-අයං, ඉමෙ, ඉමං, ඉමෙ; නා.

---

දෙශවේ; තිස්සා නස්සා නාය, නාහි නාභි තාහි තාභි යනුවේ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන්; ස්සාම්හි, ස්සායනාදෙශකළකල්හි; අස්සා නස්සා තිස්සා තස්සා යනුවේ; ස්සාදෙසාභාවපක්ඛෙ, ස්සායනාදෙශනුවූ පක්ෂයෙහි.

තෙතිමාතොසස්සස්සාය යනු විකල්පයෙන් ස්සාය යනාදෙශ විධානසූත්‍රයි; තෙතිමාතො යනු පඤ්චමී බහුවචනාන්තනිපාතපදය; සස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ස්සාය යනු ප්‍රථමෛක වචනාන්තපදයි; තාඑතා ඉමාතො, තා එතා ඉමාශබ්දයන් කෙරෙන්පරවූ; සස්ස, සවිභක්තිහට; වා, විකල්පයෙන්; ස්සායොහොති, ස්සාය යනාදෙශවේ; අස්සාය නස්සාය තිස්සාය තස්සාය යනුවේ; ඊහි, ස්සා ස්සාය යනාදෙශයන් දෙදෙනාවිසින්; මුත්තපක්ඛෙ, හරණලද පක්ෂයෙහි; නාය තායයනුවේ; නංවචනස්ස, නංවචනයහට; සමාදෙසෙ, සංයනාදෙශද; තකාරස්ස, තකාරයහට; ටාදෙසෙච කතෙ, ටකාරාදෙශදකළ කල්හි; සුනංහිසුඉති, සුනංහිසු යන සූත්‍රයෙන්; දීඝෙචකතෙ, දීර්ඝදකළ කල්හි; ආසං නාසං නාසානං තාසං තාසානං යනුවේ; සත්තමියං, සප්තමි විභක්තිපරකල්හි; අස්ස නස්ස—පෙ—නාසු තාසු යනුවේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; (උදාහරණකියනුලැබේ) නං තං නානි තානි, නං තං නෙ නානි තෙ තානියනුවේ; නාදීසු, නාවිභක්ති ආදීන් පරකල්හි; පුමෙව, පුල්ලිඞ්ගයෙහිමෙනි; එතසද්දස්ස, එතශබ්දයාගේ රූපක්‍රමයතෙම; තීසුලිඞ්ගෙසු, ලිඞ්ගත්‍රයෙහි; එවං, මෙසේමැයි; ටනාදෙසාභාවොච, ටකාරනකාරාදෙශයන්ගේ නොවීමම; විසෙසො, වෙනසි; ඉම, ඉමශබ්දය; (බහුකෙරෙන් පරව); සි, සිවිභක්තිවේ.

සිම්හි නපුංසකස්සායං යනු අයංයනාදෙශ විධානසූත්‍රයි; සිම්හි යනුසප්තම්‍යෙකවචනාන්තපදය; අනපුංසකස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; අයං යනු ප්‍රථමෛකවචනාන්තපදයි; සිම්හි, සිවිභක්ති

**නාම්හනිමි.**

ඉමසද්දස්සානිත්ථියං නාම්හි අනඉමිච්චාදෙසා හොන්ති-අනෙන, ඉමිනා—හි-

**ඉමස්සානිත්ථියං ටෙ.**

ඉමසද්දස්සානිත්ථියං ටෙ හොති වා සුනංහිසු, එහි, එභි, ඉමෙහි, ඉමෙභි-ස-ටසස්මාස්මිං මිච්චාදිනා සබ්බස්සිමස්ස වා ටාදෙසෙ-අස්ස, ඉමස්ස, එසං එසානං, ඉමෙසං, ඉමෙසානං, අම්හා, අස්මා, ඉමම්හා, ඉමස්මා-අම්හි, අස්මිං, ඉමම්හි, ඉමස්මිං, එසු, ඉමෙසු—ඉත්ථියං, අයං, ඉමා ඉමායො-ඉමං, ඉමා, ඉමායො-නා, ස්සා වා තෙතිමාමූහි නිස්සා වා, ටාදෙසෙ ස්සමිච්චාදිනා ඉ ආ දෙසෙ ච, අස්සා, ඉමිස්සා—අඤ්ඤත්‍ර-ඉමාය, ඉමාහි, ඉමාභි-ස, අස්ස, ඉමිස්සා, අස්සාය, ඉමිස්සාය ඉමාය, නංවචනස්ස සමාදෙසෙ ඉමස්ස ච ටාදෙසෙ සුනංහිසූ ති දීඝෙච කතෙ, ආසං, ඉමාසං, සානමාදෙසෙ-ඉමාසානං, සත්තමියං—අස්සං, ඉමිස්සං, අස්සාය, ඉමිස්සාය, ඉමායං, ඉමාය, ඉමාසු, නපුංසකෙ·

---

පරකල්හි; අනපුංසකස්ස, නපුංසකලිඟුනොවන්නාවූ; ඉමස්ස, ඉම ශබ්දයහට; අයංහොති, අයංයනාදෙශවේ; අයං ඉමෙ ඉමං ඉමේ යනු වේ; නා, නාවිභක්තිවේ.

නාම්හනිමි යනු අන ඉමි යනාදෙශවිධානසූත්‍රයි; නාම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය; අනිමියනු ලුප්ත ප්‍රථමාබහුවචනාන්ත පදයි; නාම්හි, නාවිභක්තිපරකල්හි; අනිත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි නොවැටෙන්නාවූ; ඉමස්ස, ඉමශබ්දයහට; වා, විකල්පයෙන්; අන ඉමි ඉති, අන ඉමි යන; ආදෙසා, මේ ආදෙශයෝ; හොන්ති, වෙත්; අනෙන ඉමිනා යනුවේ; හි, හිවිභක්තිවේ.

ඉමස්සානිත්ථියං ටෙ යනු ටෙ යනාදෙශවිධානසූත්‍රයි; ඉමස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; අනිත්ථියං යනු සප්තම්‍යෙකවචනාන්තපදය; ටෙ යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තපදයි; සුනංහිසු, සුය නංය හිය යන මොවුන් පරකල්හි; අනිත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි නොවැටෙන්නාවූ; ඉමස්ස, ඉමශබ්දයහට; වා, විකල්පයෙන්; ටෙහොත්, ටෙ යනාදෙශවේ; එහි එභි ඉමෙහි ඉමෙභි යනුවේ; සු, සුවිභක්තිවේ; ටස ස්මා ස්මිං ඉති, ටසස්මා ස්මිං යන; ආදිනා, මේ ආදිසූත්‍රයෙන්; සබ්බස්සිමස්ස, සියලු ඉමශබ්දයහට; වා, විකල්පයෙන්; ටාදෙසෙ, ටකාරාදෙශකළකල්හි; අස්ස ඉමස්ස—පෙ—එසුඉමෙසුයනුවේ; ඉත්ථියං, ස්ත්‍රීලිඟුයෙහි; අයං ඉමා ඉමායො ඉමං ඉමා ඉමා යො, යනුවේ; නා, නාවිභක්තිවේ; ස්සාවාතෙතිමාමූහි ඉති, ස්සාවාතෙතිමාමූහි යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; ස්සා, ස්සායනාදෙශවේ; ටාදෙසෙ, ඉම

**ඉමස්සිදං වා.**

අංසිසු සහ නෙති ඉමස්සිදං වා හොති නපුංසකෙ-ඉදං, ඉමං, ඉමා, ඉමානි-ඉදං, ඉමං, ඉමෙ, ඉමානි-තතියාදිසු පුල්ලිඞ්ගසමං-අමුසි.

**මස්සාමුස්ස.**

අනපුංසකස්සාමුස්ස මකාරස්ස සො හොති සිම්හි, අසු, යො-

**ලොපො මුස්මා.**

අමුසද්දතො යොනං ලොපො වා හොති පුල්ලිඞ්ගෙ'ති නිච්චංයො ලොපෙ දීසො-අමූ-අමුං, අමූ-අමුනා, අමූහි, අමූහි.

---

ශබ්දයහට ටකාරාදෙශද; ස්සං ඉති, ස්සං යන, ආදිනා, මේ ආදි සූත්‍රයෙන්; ඉආදෙසෙච, ඉකාරාදෙශද කළකල්හි; අස්සා ඉමිස්සා යනුවේ; අඤ්ඤත්‍ර, ස්සායනාදෙශනුවූපක්‍ෂයෙහි; ඉමාය ඉමාහි ඉමාහි යනුවේ; ස, සවිභක්තිවේ; අස්සා ඉමිස්සා අස්සාය ඉමිස්සාය ඉමාය යනුවේ; නංවචනස්ස, නංවචනයහට; සමාදෙසෙ, සංයනාදෙශද; ඉමස්ස, ඉම ශබ්දයහට; ටාදෙසෙ, ටකාරාදෙශද; සුනංහිසු ඉති, සුනංහිසු යන සූත්‍රයෙන්; දීසෙචකතෙ, දීර්ඝදකළකල්හි; ආසං ඉමාසං යනුවේ; සානමාදෙසෙ, සානං යනාදෙශකළකල්හි; ඉමාසානං යනුවේ; සත්තමියං, සප්තම්විභක්ති පරකල්හි, අස්සං—පෙ—ඉමාසු යනුවේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි (උදාහරණ කියනුලැබේ)

ඉමස්සිදංවා යනු විකල්පයෙන් ඉදං යනාදෙශවිධාන සූත්‍රයි; ඉමස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය, ඉදං යනු ප්‍රථමෛකවචනාන්තපදය; වා යනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; අංසිසු, අංවිභක්ති සිවිභක්තීන් පරකල්හි; නෙති සහ, ඔවුන් සමග; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහිවැටෙන්නාවූ; ඉමස්ස, ඉමශබ්දයහට; වා, විකල්පයෙන්; ඉදංහොති, ඉදංයනාදෙශවේ; ඉදං ඉමං ඉමා ඉමානි, ඉදං ඉමං ඉමෙ ඉමානි යනුවේ; තතියාදිසු, තෘතීයාදීන් පරකල්හි; පුල්ලිඞ්ගසමං, පුල්ලිඞ්ගහාසමයි; අමු, අමුශබ්දය; (ඔහුකෙරෙන් පරව); සි, සිවිභක්තිවේ.

මස්සාමුස්ස යනු සකාරාදෙශවිධානසූත්‍රයි; මස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; අමුස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; සිම්හි සිවිභක්තිපරකල්හි; අනපුංසකස්ස, නපුංසකලිඞ්ගයෙහි නොවැටෙන්නාවූ; අමුස්ස, අමුශබ්දයා සම්බන්ධිවූ; මකාරස්ස, මකාරයහට; සො හොති, සකාරාදෙශවේ; අසු යනුවේ; යො, යොවිභක්තිවේ.

ලොපොමුස්මා යනු යොවිභක්තිලොපවිධානසූත්‍රයි; ලොපොයනු ප්‍රථමෛක වචනාන්තපදය; අමුස්මායනු පඤ්චම්‍යෙකවචනාන්තපදයි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; අමුසද්දතො, අමුශබ්දයා කෙ

**නතො ස්‍සස.**

අමුස්මා සස්‍ස නො න හොති–අමුස්‍ස, අමූසං, අමූසානං, අමුනා, අමුම්හා, අමුස්මා, අමුම්හි, අමුස්මිං, අමූසු, ඉත්‍ථියං–අසු, අමූ, අමුයො– අමුං, අමූ, අමුයො, නා, “ස්සාවා තෙතිමාමූහි”ති ස්සා වා, අමුස්සා අමුයා, අමූහි, අමූහි, අමුස්සා, අමුයා, අමූසං, අමූසානං–සත්තමියං, අමුස්සා, අමුස්සං, අමුයං, අමුයා, අමූසු, නපුංසකෙ.

**අමුස්සාදුං.**

අංසිසු සහ නෙහි අමුස්ස අදුං හොති වා නපුංසකෙ, අදුං, අඤ්ඤත්‍ර සිලොපෙ–අමු, අමූනි, අමූ, අදුං, අමුං, අමූනි, අමූ–සෙසං පුමෙව, කිංසි,

**කිස්ස කො සබ්බාසු.**

---

රෙන්පරවූ; යොනං, යොවිභක්තින්ට; ලොපොහොතීති, ලොප්වේ නුයි; නිච්චං, අවිකල්පයෙන්; යොලොපෙ, යොහටලොප්කළකල්හි; දීඝො, දීඝීවේ; අමූයනුවේ; අමුං අමූ, අමුනා අමූහි අමූහි යනුවෙ.

නනොසස්ස යනු නොයනාදෙශ ප්‍රතිෂෙධසූත්‍රයි; නයනු ප්‍රථමෙකවචනාන්තනිපාතපදය; නොයනු ප්‍රථමෙකවචනාන්තපදය, සස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදයි; අමුස්මා, අමුශබ්දයා කෙරෙන් පරවූ; සස්ස, සවිභක්තිහට; නොනහොති, නොයනා දෙශනොවෙ; අමුස්ස—පෙ—අමූසුයනුවේ; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; (උදාහරණ කියනු ලැබේ) අසු අමූ අමුයො, අමුං අමූ අමුයො යනුවේ; නා, නාවිභක්ති වේ; ස්සාවා තෙතිමාමූහි ඉති, ස්සා වා තෙතිමාමූහි යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; ස්සා, ස්සා යනාදෙශවේ; අමුස්සා—පෙ—අමූසානං යනුවේ; සත්තමියං, සප්තමි විභක්ති කළකල්හි; අමුස්සා අමුස්සං අමුයං අයුයා අමූසු යනුවේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; (උදාහරණ කියනු ලැබේ);

අමුස්සාදුං යනු විකල්පයෙන් අදුං යනාදෙශවිධාන සූත්‍රයි; අමුස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය, අදුං යනු ප්‍රථමෙකවචනාන්තපදයි; අංසිසු, අංවිභක්ති සිවිභක්තීන් පරකල්හි; නෙහි සහ, ඔවුන්හා එක්ව; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; අමුස්ස, අමුශබ්දයහට; වා, විකල්පයෙන්; අදුංහොති, අදුංයනාදෙශවෙ; අදුංයනුවේ–අඤ්ඤත්‍ර, අදුං යනාදෙශ නුවූපක්‍ෂයෙහි; සිලොපෙ, සිහට ලොප්කළකල්හි; අමු අමූනි අමූ, අදුං අමුං අමූනි අමූ යනුමේ; සෙසං, සෙසුනොකී රූපක්‍රමය; පුමෙව, පුල්ලිඞ්ගයෙහිමෙනි, කිං, කිංශබ්දය; (ඔහුකෙරෙන්පරව) සි, සිවිභක්තිවේ;

කිස්ස කො සබ්බාසු යනු කකාරාදෙශවිධානසූත්‍රයි; කිස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; කොයනු ප්‍රථමෙක වචනාන්තපදය;

සබ්බාසු විභත්තීසු කිස්ස කො හොති, සිසෙසා, කො, කෙ, කං, කෙ, කෙන, කෙහි, කෙභි.

**කි සස්මිංසු වා නිත්ථියං.**

අනිත්ථියං කිස්ස කි වා හොති සස්මිංසු, කිස්ස, කස්ස, කෙසං, කෙසානං, කම්හා, කස්මා, කිම්හි, කිස්මිං, කම්හි, කස්මිං, කෙසු, ඉත්ථියං කආදෙසෙ අකාරන්තත්තා ආපච්චයො, කා, කා, කායො ඉච්චාදි සබ්බාව—නපුංසකෙ.

**කිමංසිසු සහ නපුංසකෙ.**

අංසිසු සහ තෙහි කිංසද්දස්ස කිං හොති නපුංසකෙ, කිං, කානි, කිං, කෙ, කානි, කෙනෙච්චාදි පුමෙව, එකසද්දො සඞ්ඛ්‍යාතුල්‍යත්ථො සහායවචනො, අත්‍ර සඞ්ඛ්‍යාසද්දො සඞ්ඛෙය්‍යවාචී, යදා සඞ්ඛෙය්‍යවාචී තදෙකවචනන්තො අඤ්ඤත්‍ර බහුවචනන්තොපි, එකො එකා එකම්ච්චාදි, සබ්බසමං තිලිඞ්ගෙසු—ස්සාස්සංසු පන, ස්සමාදිනා ඉමෙහි එකිස්සා එකිස්සං, තුම්හ අම්හසද්දා අලිඞ්ගා, තථා උභ කති විසද්දා පඤ්චාදයො අඨාරසන්තා ච, තුම්හසි අම්හසි.

---

සබ්බාසු යන සප්තමී බහුවචනාන්තපදයි; සබ්බාසුවිභත්තීසු, සියලු විභක්තීන් පරකල්හි; කිස්ස, කිංශබ්දය්හට; කොහොති, කකාරාදෙශවේ; සිසෙසා, සිවිභක්තිහට; ඔ, ඔකාරාදෙශවේ; කො කෙ, කං කෙ, කෙන කෙහි කෙභි යනුවේ.

කි සස්මිංසු වා නිත්ථියං යනු විකල්පයෙන් කියනාදෙශවිධාන සූත්‍රයි; කියනු ප්‍රථමෙක වචනාන්තපදය; සස්මිංසු යනු සප්තමී බහුවචනාන්තපදය; වායනු ප්‍රථමෙක වචනාන්ත නිපාතපදය; අනිත්ථියං යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; සස්මිංසු, සයස්මිංය යනමොවුන් පරකල්හි; අනිත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි නොවැටෙන්නාවූ; කිස්ස, කිං ශබ්දයහට; වා, විකල්පයෙන්; කිහොති, කියනාදෙශවේ; කිස්ස—පෙ—කෙසු යනුවේ; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; (උදාහරණ කියනු ලැබේ. කආදෙසෙ, කකාරාදෙශ කළකල්හි; අකාරන්තත්තා, අකාරාන්තබව හෙයින්; ආපච්චයො, ආප්‍රත්‍යයවේ; කාකායො ඉති, කාකායොයන; ආදි, මේආදිය; සබ්බාව, සබ්බශබ්දයාමෙනි; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි (උදාහරණකියනුලැබේ.)

කිමංසිසු සහ නපුංසකෙ යනු කිං යනාදෙශ විධානසූත්‍රයි; කිං යනු ප්‍රථමෙකවචනාන්තපදය; අංසිසු යන සප්තමී බහුවචනාන්ත පදය; සහ යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්තනිපාතපදය; නපුංසකෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි—අංසිසු, අංවිභක්ති සිවිභක්තීන් පරකල්හි; තෙහි සහ ඔවුන්හාඑක්ව; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; කිංසද්දස්ස, කිංශබ්දයහට; කිංහොති, කිංයනාදෙශවේ;

**තුම්හස්ස තුවං ත්වමම්හි ච.**

අංම්හි සිම්හි ච තුම්හස්ස සවිභත්තිස්ස තුවං ත්වං හොන්ති, තුවං ත්වං.

**සිම්හ'හං.**

සිම්හි අම්හස්ස සවිභත්තිස්ස අහං හොති, අහං, යො-තුම්හෙ.

---

කිං කාති, කිං සො කාති යනුවේ; කෙන ඉති, කෙන යන; ආදි, මේ ආදිය; පුමෙව, පුල්ලිඟුයෙහි මෙනි; එකසද්දො, එකශබ්දයතෙම; සඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාය; තුල්‍ය, සදෘශය; අඤ්ඤ, අනිකෙක, අසහාය, හුදකලාය යන මොවුන්; වචනො, කියන්නේයි; අත්‍ර, මෙහි; සඞ්ඛ්‍යාසද්දො, සඞ්ඛ්‍යාශබ්දයතෙම; සඞ්ඛෙය්‍යවාචි, (අභෙදොපචාරයෙන්) ගණිනින් පරිච්ඡින්න වස්තුව කියන්නේයි; යදා, යම්කලෙක්හි; සඞ්ඛෙය්‍යවාචි, ගණනින් පරිච්ඡින්නවස්තුව කියාද; තදා, එකල්හි; එකවචනන්තො, එකවචනාන්තය; අඤ්ඤත්‍ර, සෙසුතන්හි; හෙවත් තුල්‍යඤ්ඤසහායවාචිකල්හි; බහුවචනන්තොපි, බහුවචනාන්තදවේ; එකො එකා එකං ඉති, එකො එකා එකං යන; ආදි, මේආදිය; තිලිඞ්ග, ලිඞ්ගත්‍රයෙහි; සබ්බසමං, සබ්බශබ්දයාහාසමයි—ස්සා ස්සංසු පන, ස්සා ස්සං යනාදෙශයන් පරකල්හි වනාහි; ස්සමාදිනා, ස්සං යනාදී සූත්‍රයෙන්; ඉම්හි, ඉකාරාදෙශකළකල්හි; එකිස්සා එකිස්සංයනුවේ; තුම්හඅම්හසද්දා, තුම්හඅම්හශබ්දයෝ; අලිඞ්ගා, ලිඟුරහිතයෝයි; උභකති සද්දා උභශබ්දකතිශබ්දදෙදෙනාද; පඤ්චාදයො, පඤ්චශබ්දය ආදිකොට ඇති; අට්ඨාරසන්තාච, අට්ඨාරසශබ්දයා අන්තකොට ඇති ශබ්දයෝද; තථා, එසේම ලිඟුරහිතයෝයි; තුම්හ, තුම්හශබ්දය; (ඔහුකෙරෙන් පරව) සි, සිවිභක්තිවේ; අම්හ, අම්හශබ්දය; (ඔහුකෙරෙන් පරව) සි, සිවිභක්තිවේ.

තුම්හස්සතුවං ත්වමම්හිච, යනු තුවංත්වං යනාදෙශවිධානසූත්‍රයි; තුම්හස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; තුවංත්වං යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදය, අංම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; ච, යනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; අංම්හි, අංවිභක්ති පරකල්හිද; සිම්හි, සිවිභක්ති පරකල්හිද; සවිභත්තිස්ස, විභක්ති සහිතවූ; තුම්හස්ස, තුම්හශබ්දයහට; තුවං ත්වං හොන්ති, තුවං ත්වං යනාදෙශයෝවෙත්; තුවං ත්වං යනුවේ.

සිම්හහං, යනු අහං යනාදෙශ විධානසූත්‍රයි; සිම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; අහං යනු ප්‍රථමෛකවචනාන්තපදයි; සිම්හි, සිවිභක්තිපරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; අම්හස්ස, අම්හශබ්දයහට; අහං හොති, අහං යනාදෙශවේ; අහං යනුවේ; යො, යොවිභක්තිවේ; තුම්හෙ යනුවේ.

**මයමස්මාමහස්ස.**

යොස්වම්හස්ස සවිභත්තිස්ස මයමස්මා වා හොන්ති යථාක්කමං, මයං, අස්මා, අම්හෙ, අං, තුවං, ත්වං.

**අංමහි තං මං තවං මමං.**

අංම්හි තුම්හඅම්හ සද්දානං සවිභත්තීනං තං මං තවං මමං හොන්ති යථාක්කමං–තං, තවං, මං, මමං.

**දුතියෙ යොම්හි වා.**

තුම්හඅම්හසද්දානං සවිභත්තීනං පච්චේකං ඛං ඛාකං වා හොන්ති දුතියෙ යොම්හි-තුම්හං, තුම්හාකං තුම්හෙ, අම්හං, අම්හාකං, අස්මා, අම්හෙ.

**නාස්මාසු තයා මයා.**

නාස්මාසු තුම්හඅම්හසද්දානං සවිභත්තීනං තයා මයා හොන්ති යථාක්කමං.

---

මයමස්මාමහස්ස, යනු විකල්පයෙන් මයං අස්මාය නාදෙශවිධාන සූත්‍රයි; මයමස්මායනු ලුප්ත ප්‍රථමාබහුවචනාන්තපදය; අම්හස්ස යනු ෂෂ්ඨ්‍යක වචනාන්තපදයි; යොසු, යොවිභක්තිපරකල්හි; සවිභත්ති ස්ස, විභක්තිසහිතවූ; අම්හස්ස, අම්හශබ්දයහට; යථාක්කමං, පනතීන්; වා, විල්පකයෙන්; මයමස්මාහොන්ති, මයං අස්මා යනාදෙශයෝ වෙත්; මයං අස්මා අම්හෙ යනුවේ; අං, අංවිභක්තිවේ; තුවං ත්වංයනුවේ.

අංම්හි තං මං තවං මමං, යනු තං මං තවං මමං යනාදෙශවිධාන සූත්‍රයි; අංම්හියනු සප්තම්‍යෙක වචනාන්තපදය, තං මං තවං මමංයනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදයි; අංම්හි, අං විභක්ති පරකල්හි; සවි භත්තිනං, විභක්තිසහිතවූ; තුම්හ අම්හසද්දානං, තුම්හ අම්හශබ්ද යන්ට; යථාක්කමං, පනතීන්; තං මං තවං මමං හොන්ති, තං මං තවං මමං යනාදෙශයෝ වෙත්; තං තවං මං මමං යනුවේ.

දුතියෙ යොම්හි වා යනු විකල්පයෙන් ඛං ඛා කං යනාදෙශ විධානසූත්‍රයි; දුතියෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය; යොම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; වා යනු ප්‍රථමෙක වචානන්තනිපාත පදයි; දුතියෙයොම්හි, දුතියා යොවිභක්තිපරකල්හි; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තුම්හඅම්හසද්දානං, තුම්හ අම්හශබ්දයන්ට; පච්චේ කං, (ශබ්දක්‍රමයෙන්නොව) වෙන වෙනම; වා, විකල්පයෙන්; ඛං ඛාකංහොන්ති, ඛංඛාකං යනාදෙශයෝවෙත්; තුම්හං—පෙ—අස්මා අම්හෙ යනුවේ.

නාස්මාසු තයාමයා යනු තයාමයා යනාදෙශ විධාන සූත්‍රයි; නාස්මාසු යනු සප්තමී බහුවචනාන්තපදය; තයා මයා යනු ලුප්ත

**තයා තයීනං ත්ව වා තස්ස.**

තුම්හස්ස තයාතයීනං තකාරස්ස ත්ව හොන්ති වා-ත්වයා, තයා, මයා, තුම්හෙහි, තුම්හෙභි, අම්හෙහි, අම්හෙභි.

**තව මම තුය්හං මය්හං සෙ.**

සෙ තුම්හඅම්හසද්දානං සවිභත්තීනං තව මම තුය්හං මය්හං හොන්ති යථාක්කමං—තව තුය්හං මම මය්හං.

**නංසෙ ස්ව ස්මාකං මමං.**

නංසෙස්වම්හස්ස සවිභත්තිස්ස අස්මාකං මමං හොන්ති යථාක්කමං-මමං.

---

ප්‍රථමා බහුවචනාන්තපදයි; නාස්මාසු, නායස්මාය යනමොවුන්පර කල්හි; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තුම්හඅම්හසද්දානං, තුම්හ අම්හශබ්දයන්ට; යථාක්කමං, පනාතීන්; තයාමයාහොන්ති, තයාමයා යනාදෙශයෝවෙත්.

තයාතයීනං ත්ව වා තස්සයනු විකල්පයෙන් ත්වයනාදෙශවිධාන සූත්‍රයි; තයාතයිනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය, ත්ව යනු ප්‍රථමෛක වචනාන්තපදය; වා යනු ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; තස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; තයාතයිනං, තයාතයීන් සම්බන්ධවූ; තුම්හස්ස, තුම්හශබ්දයාගේ; තකාරස්ස, තකාරයහට; වා, විකල්පයෙන්; ත්වහොති, ත්වයනාදෙශවේ; ත්වයා තයා මයා යනුවේ; තුම්හෙහි තුම්හෙභි අම්හෙහි අම්හෙභි යනුවේ.

තව මම තුය්හං මය්හං සෙ යනු තව මම තුය්හං මය්හං යනාදෙශවිධානසූත්‍රයි; තව මම තුය්හං මය්හං යනු ප්‍රථමා බහුවචනාන්ත පදය; සෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; සෙ, සවිභක්තිපර කල්හි; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තුම්හ අම්හසද්දානං, තුම්හ අම්හශබ්දයන්ට; යථාක්කමං, පනාතීන්, තවමම තුය්හං මය්හං හොන්ති, තව මම තුය්හං මය්හං, යනාදෙශයෝවෙත්; තව තුය්හං මම මය්හං යනුවේ.

නංසෙස්වස්මාකං මමං යනු අස්මාකං මමං යනාදෙශවිධාන සූත්‍රයි; නං සෙසු යනු සප්තමී බහුවචනාන්තපදය; අස්මාකං මමං යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදයි; නංසෙසු, නංවිභක්ති සවිභක්තීන් පරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; අම්හස්ස, අම්හශබ්දයහට; යථාක්කමං, පනාතීන්, අස්මාකං මමං හොන්ති, අස්මාකං මමං යනාදෙශයෝවෙත්; මමං යනුවේ.

**අං ආකං නංම්හි.**

නංම්හි තුම්හඅම්හසද්දානං සවිභත්තීනං අං ආකං හොන්ති පච්චෙකං—තුම්හං තුම්හාකං අම්හං අම්හාකං අස්මාකං.

**ස්මාම්හි ත්වම්හා.**

ස්මාම්හි තුම්හස්ස සවිභත්තිස්ස ත්වම්හා හොති වා—ත්වම්හා ත්වයා තයා මයා.

**ස්මිම්හි තුම්හාම්හානං තයි මයි.**

ස්මිම්හි තුම්හ අම්හසද්දානං සවිභත්තීනං තයි මයි හොන්ති යථාක්කමං—ත්වයි තයි මයි, තුම්හෙසු.

**සුම්හාම්හස්සාස්මා.**

අම්හස්ස අස්මා හොති වා සුම්හි—අස්මාසු අම්හෙසු.

“අපාදාදෙ පදතෙකවාක්‍යෙ”ති අධිකාරො.

---

අං ආකං නංම්හි යනු අංආකං යනාදෙශවිධානසූත්‍රයි; අංආකං යනු ලුප්ත ප්‍රථමා බහුවචනාන්තපදය, නංම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; නංම්හි, නං විභක්ති පරකල්හි; සවිභත්තීනං, විභක්ති සහිතවූ; තුම්හ අම්හසද්දානං, තුම්හ අම්හ ශබ්දයන්ට; පච්චෙකං, (ශබ්ද ක්‍රමයෙන්නොව) වෙනවෙනම; අංආකංහොන්ති, අංආකං යනාදෙශයෝවෙත්; තුම්හං තුම්හාකං අම්හාකං අස්මාකං යනුවෙ.

ස්මාම්හි ත්වම්හා යනු විකල්පයෙන් ත්වම්හා යනාදෙශවිධාන සූත්‍රයි; ස්මාම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය; ත්වම්හා යනු ප්‍රථමෛක වචනාන්තපදයි; ස්මාම්හි, ස්මාවිභක්තිපරකල්හි; සවිභත්තිනං, විභක්තිසහිතවූ; තුම්හස්ස, තුම්හශබ්දයහට; වා, විකල්පයෙන්; ත්වම්හා හොති, ත්වම්හා යනාදෙශවේ; ත්වම්හා, ත්වයාතයාමයා යනුවේ.

ස්මිම්හි තුම්හාම්හානං තයිමයි යනු තයි මයි යනාදෙශවිධාන සූත්‍රයි; ස්මිම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය, තුම්හාම්හානං යනු ෂෂ්ඨිබහුවචනාන්තපදය; තයිමයි යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; ස්මිම්හි, ස්මිංවිභක්තිපරකල්හි; සවිභත්තිනං, විභක්තිසහිතවූ; තුම්හ අම්හසද්දානං, තුම්හඅම්හශබ්දයන්ට; යථාක්කමං, පනතීන්; තයි මයි හොන්ති, තයි මයි යනාදෙශයෝවෙත්; ත්වයි තයි මයි යනුවේ; තුම්හෙසු යනුවේ.

සුම්හාම්හස්සාස්මා යනු විකල්පයෙන් අස්මා යනාදෙශ විධාන සූත්‍රයි; සුම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය; අම්හස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය, අස්මා යනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; සුම්හි, සුවිභක්තිපරකල්හි; අම්හස්ස, අම්හශබ්දයහට; වා, විකල්පයෙන්; අස්මාහොති, අස්මායනාදෙශවේ; අස්මාසු අම්හෙසු යනුවේ; අපදාදෙ පදතෙකවාක්‍යෙ ඉති, අපාදාදෙ පදතෙකවාක්‍යෙ යනු; අධිකාරො, (බහුසුවා යන සූත්‍රයදක්වා සියලුපෙදෙන් පරාදෙශයෙහි) සම්බන්ධකරනුලැබේ.

**යොනං හිස්වපවම්‍යා වො නො.**

අපඨමියා යොනං හිසුචපාදෙදෙ වත්තමානානං පදස්මා පරෙස මෙකවාක්‍යෙ ඨිතානං තුම්හඅම්හසද්දනං සවිභත්තීනං වො නො හොන්ති වා යථාක්කමං—තිඨථ වො, තිඨථ තුම්හෙ, තිඨාම නො, තිඨාම මයං-පස්සති වො, පස්සති තුම්හෙ, පස්සති නො, පස්සති අම්හෙ-දීයතෙ වො, දියතෙ තුම්හං, දියතෙ නො, දීයතෙ අම්හං-ධනං වො, ධනං තුම්හං, ධනං නො, ධනං අම්හං-කතං වො, කතං තුම්හෙහි, කතං නො, කතං අම්හෙහි.

**තෙ මෙ නා සෙ.**

නාම්හි සෙ ච අපාදදෙ වත්තමානානං පදස්මා පරෙසං එකවාක්‍ය ඨිතානං තුම්හඅම්හසද්දනං සවිභත්තීනං තෙ මෙ වා හොන්ති

---

යොනං හිසුචපඨම්‍යාවොනො යනු විකල්පයෙන් වො නො යනාදෙශ විධානසූත්‍රයි; යොනංහිසු යනු සප්තමී බහුවචනාන්තපදය; අපඨම්‍යා යනු සප්තමෙ‍්‍යක වචනාන්තපදය; වොනො යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; අපඨමියා, පඨම්විභක්තින් පිටත්නන්හි; යොනංහිසු, යොයනංය (තෘතීයා) හිවිභක්තිය යන මොවුන් පරකල්හි; අපාදදෙ වත්තමානානං, ගාථාපදදියෙහි නොවැටෙන්නාවූ; පදස්මාපරෙසං, පෙදෙන්පරවූ; එකවාක්‍යෙඨිතානං, එකවාක්‍යයෙහි සිටියාවූ; සවිභත්තීනං, විභක්තිසහිතවූ; තුම්හඅම්හසද්දනං, තුම්හ අම්හශබ්දයන්ට; යථාක්කමං, පනාතින්; වා, විකල්පයෙන්; වො නො හොන්ති වො නො යනාදෙශයෝවෙත්; වො, නොපි; තිඨථ, සිටිව්; තුම්හෙ, තොපි, තිඨථ, සිටිව්; නො, අපි, තිඨාම, සිටිමු; මයං, අපි; තිඨාම, සිටිමු; වො, තොප; පස්සති, දකී; තුම්හෙ, තොප; පස්සති, දකී; නො, අප; පස්සති, දකී; අම්හෙ, අප; පස්සති, දකී; වො, තොපට; දීයතෙ, දෙනුලැබේ; තුම්හං, තොපට; දීයතෙ, දෙනුලැබේ; නො, අපට; දියතෙ, දෙනුලැබේ; අම්හං, අපට; දීයතෙ, දෙනුලැබේ; වො, තොපගේ; ධනං, ධනයයි; තුම්හං, තොපගේ; ධනං, ධනයයි; නො, අපගේ; ධනං, ධනයයි; අම්හං, අපගේ; ධනං, ධනයයි; වො, තොපවිසින්; කතං, කරණලදී; තුම්හෙහි, තොපවිසින්; කතං, කරණලදී; නො, අපවිසින්; කතං, කරණලදී; අම්හෙහි, අපවිසින්; කතං, කරණලදී; යනුවේ.

තෙ මෙ නාසෙ යනු විකල්පයෙන් තෙ මෙ යනාදෙශවිධාන සූත්‍රයි; තෙ මෙ යනු ප්‍රථමා බහුවචනාන්තපදය, නාසෙ යනු සප්තමෙ‍්‍යකවචනාන්තපදයි; නාම්හි, නාවිභක්තිපරකල්හිද; සෙච, සවිභක්තිපරකල්හිද—පෙ—යථාක්කමං, පනාතින්; වා, විකල්පයෙන්;

යථාක්කමං—කතං තෙ, කතං තයා, කතං මෙ, කතං මයා-දීයතෙ තෙ, දීයතෙ තව, දීයතෙ මෙ, දීයතෙ මම-ධනං තෙ, ධනං තව, ධනං මෙ, ධනං මම.

**න චවාහාහෙවයොගෙ.**

චවාහඅහඑවෙහි යොගෙ තුම්හඅම්හසද්දානමාදෙසා න හොන්ති, ගච්ඡාම තුම්හෙ ච මයංච-පස්සති තුම්හෙ ච, අම්හෙ ච-කතං තුම්හෙහි ච, අම්හෙහි ච-දීයතෙ තුම්හං ච, අම්හං ච-ධනං තුම්හං ච, අම්හං ච-කතං තයා ච, මයා ච-දීයතෙ තව ච, මම ච-ධනං තවච, මම ච-වාදියොගෙප්‍යෙවං ඤෙය්‍යං-උභ කති සද්දා බහුවචනන්තා- "උභ ගොහි ටො"ති යොනං ටො-උභො, උභො-

---

තෙ මෙ හොන්ති, තෙමෙ යනාදෙශයෝවෙත්; කතංතෙ, කතං තයා —පෙ—ධනං මෙ, ධනං මම යනුවේ; තෙ, තා විසින්; කතං, කරණ ලදී; තයා, තාවිසින්; කතං, කරණලදී; මෙ, මාවිසින්; කතං, කර ණලදී; මයා, මාවිසින්; කතං, කරණලදී; තෙ, තට; දීයතෙ, දෙනු ලැබේ; තව, තට දියතෙ; දෙනුලැබේ; මම, මට; දීයතෙ, දෙනු ලැබේ; තෙ, තාගේ; ධනං, ධනයයි; තව, තාගේ; ධනං, ධනයයි; මෙ, මාගේ; ධනං, ධනයයි; මම, මාගේ; ධනං, ධනයයි.

න චවාහාහෙවයොගෙ යනු පෙදෙන් පරාදෙශප්‍රතිෂෙධ සූත්‍රයි; නයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාතපදය, චවාහාහෙව යොගෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; චවාහ අහඑවෙහි, චවාහ අහ එවශබ්දයන්හා; යෙදීමක්ඇතිකල්හි; තුම්හඅම්හසද්දානං, තුම්හ අම්හ ශබ්දයන්ට; ආදෙසා, වොනොනෙමෙ යන පෙදෙන්පරා දෙශයෝ; නහොන්ති, නොවෙත්; ගච්ඡාම තුම්හෙච මයඤ්ච—පෙ—ධනං තවච මමච යනුවේ; තුම්හෙච, නොපිද; මයඤ්ච, අපිද; ගච්ඡාම, යමු; තුම්හෙච, නොපද; අම්හෙච, අපද; පස්සති, දකී; තුම්හෙහිච, නොප විසින්ද; අම්හෙහිච, අපවිසින්ද; කතං, කරණලදී; තුම්හංච, නොපටද; අම්හංච, අපටද; දීයතෙ, දෙනුලැබේ; තුම්හංච, නොපගේද; අම්හංච, අපගේද; ධනං, ධනයයි; තයාච, තාවිසින්ද; මයාච, මාවිසින්ද; කතං, කරණලදී; තවච, තටද; මමච, මටද; දීයතෙ, දෙනු ලැබේ; තවච, තාගේද; මමච, මාගේද; ධනං, ධනයයි; වාදියොගෙපි, වාදීන්හා-යෙදීමක් ඇතිකල්හිදු; එවංඤෙය්‍යං, මෙසේ දතයුත්තේයි; උභකතිසද්දා, උභශබ්දකතිශබ්දයෝ දෙදෙන; බහුවචනන්තා, බහුවචනාන්තයෝයි; උභගොහි ටොති, උභගොහිටො යනසූත්‍රයෙන්; යොනං, යොවිභක්තීන්ට; ටො, ටොයනාදෙශවේ; උභො, උභො යනුවේ.

**සුහිසු භසෙසා.**

උභස්ස සුහිසොවා හොති-උභොහි උභොහි-

**උභිනනං.**

උභා නංවචනස්ස ඉනනං හොති-උභිනනං, උභොසු.

**පි කතිම්හා.**

කතිම්හා යොනං පි හොති-කති,කති, කතීහි කතීහි, කතිනනං කතීසු.

---

අථ සඞ්ඛ්‍යාසද්දා වුච්චනෙත.

එකාදයො අඩ්ඨාරසනතා සඞ්ඛ්‍යවචනා—වීසතිආදයොපන සඞ්ඛ්‍යානවචනාච-එකසද්දො සඞ්ඛ්‍යාදීසු වුතෙතාව— චාදීනමඩ්ඨාරස නතානං බහුවචනනතනතා එකවචනාභාවො-විසද්දා යොම්හි.

---

සුහිසුභසෙසා යනු ඔකාරාදෙශවිධානසූත්‍රයි; සුහිසු යනු සපතමී බහුවචනානතපදය, උභස්ස යනු ෂෂ්ඨ්‍යකවචනානතපදය, ඔ යනු ලුපතප්‍රථමෛක වචනානතපදයි; සුහිසු, සුයහිය යනමොවුන් පර කල්හි; උභස්ස, උභශබ්දයහට; ඔහොති, ඔකාරාදෙශවේ; උභොහි උභොහි යනුවේ.

උභිනනං යනු ඉනනං යනාදෙශවිධානසූත්‍රයි; උභා යනු පඤ්චම්‍යෙක වචනානතපදය, ඉනනං යනු ප්‍රථමෛක වචනානතපදයි; උභා, උභශබ්දයා කෙරෙන්පරවූ; නං වචනස්ස, නංවිභක්තිහට; ඉනනං හොති, ඉනනං යනාදෙශවේ; උභිනනං යනුවේ.

පිකතිම්හා යනු පියනාදෙශවිධානසූත්‍රයි; පියනුලුපතප්‍රථමෛක වචනානතපදය, කතිම්හා යනු පඤ්චම්‍යෙකවචනානතපදයි; කතිම්හා, කතිශබ්දයා කෙරෙන් පරවූ; යොනං, යොවිභක්තීන්ට; පිහොති, පියනාදෙශවේ; කති කති, කතීහි කතීහි;කතිනනං, කතීසු යනුවේ.

---

අථ සඞ්ඛ්‍යාසද්දා වුච්චනෙත-අථ, ඉක්බිත්තෙන්; සඞ්ඛ්‍යාසද්දා, සඞ්ඛ්‍යාවාචිශබ්දයෝ; වුච්චනෙත, කියනුලැබෙත්; එකාදයො, එක ශබ්දයා ආදිකොටඇති; අඩ්ඨාරසනතා, අඩ්ඨාරසශබ්දයා අනතකොට ඇති ශබ්දයෝ; සඞ්ඛ්‍යවචනා, ගණනින් පරිච්ඡෙදනවස්තුවකියන් නාහුයි; විසතිආදයොපන, විසත්‍යාදිහුවනාහි; සඞ්ඛ්‍යානවචනාච, සඞ්ඛ්‍යානවාචිදවෙත්; එකසද්දො, එකශබ්දයතෙම; සඞ්ඛ්‍යාදීසු, සඞ්ඛ්‍යා දීන්කෙරෙහි; වුතෙතාව, කියනලද්දේමැයි; චාදීනං, චිශබ්දයා ආදි කොටඇති; අඩ්ඨාරසනතානං, අඩ්ඨාරසශබ්දයා අනතකොටඇති ශබ්ද යන්ගේ; බහුවචනනතනතා, බහුවචනානතබව හෙයින්; එකවචනා භාවො, එකවචනයාගේ නොවීමවේ; විසද්දා, විශබ්දයාකෙරෙන්; යොම්හි, යොවිභක්තිපරකල්හි.

**යොම්හි ද්වින්නං දුවෙ ද්වෙ.**

යොම්හි ද්විස්ස සවිභත්තිස්ස දුවෙ ද්වෙ හොන්ති පච්චෙකං-දුවෙ ද්වෙ, ද්විහි ද්විහි.

**දුවින්නං නංම්හි වා.**

නංම්හි ද්විස්ස සවිභත්තිස්ස දුවින්නං හොති වා-දුවින්නං-අඤ්ඤත්‍ර.

**නංම්හි නුක් ද්වාදීනං සත්තරසන්නං.**

ද්වාදීනං සත්තරසන්නං සඞ්ඛ්‍යානං නුක් හොති නංම්හි විභත්තිම්හි උකාරො උච්චාරණත්ථො-කකාරො අන්තාවයවත්ථො-තෙන නංම්හි න දීඝො-ද්විනුන්නං, ද්වීසු-තිසද්ද, යොම්හි.

---

යොම්හිද්වින්නං දුවෙ ද්වෙ යනු දුවෙ ද්වෙ යනාදෙශ විධානසූත්‍රයි; යොම්හි යනු සප්තම්‍යෙක වචනාන්තපදය, ද්වින්නං යනු ෂෂ්ඨී බහු වචනාන්තපදය; දුවෙ ද්වෙ යනු ප්‍රථමාබහුවචනාන්තපදයි; යොම්හි, යොවිභක්තිපරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; ද්විස්ස, ද්විශබ්ද යාහට; පච්චෙකං, (විභක්තික්‍රමයෙක්නොව) වෙනවෙනම; දුවෙ ද්වෙ හොන්ති, දුවෙ ද්වෙ යනාදෙශයෝවෙත්; දුවෙ ද්වෙ, ද්විහි ද්විහි යනුවේ.

දුවින්නං නංම්හිවා යනු විකල්පයෙන් දුවින්නංයනාදෙශවිධාන සූත්‍රයි; දුවින්නං යනු ප්‍රථමෙකවචනාන්තපදය, නංම්හි යනු සප්ත ම්‍යෙකවචනාන්තපදය; වායනු ලුප්තප්‍රථමෙක වචනාන්ත නිපාත පදයි; නංම්හි, නංවිභක්තිපරකල්හි; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; ද්විස්ස, ද්විශබ්දයහට; වා, විකල්පයෙන්; දුවින්නං හොති, දුවින්නං යනාදෙශවේ; දුවින්නං යනුවෙ, අඤ්ඤත්‍ර, දුවින්නං යනාදෙශ නුවූ පක්ෂයෙහි.

නංම්හි නුක්ද්වාදීනං සත්තරසන්නංයනු නුක්ආගම විධානසූත්‍රයි; නංම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය, නුක්යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්තපදය, ද්වාදීනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදය; සත්තර සන්නං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදයි; නංම්හි විභත්තිම්හි, නංවිභ ක්තිපරකල්හි; ද්වාදීනං, ද්විශබ්දය ආදිකොට ඇති; සත්තරසන්නං සඞ්ඛ්‍යානං, සතළොස් සඞ්ඛ්‍යාවාචිශබ්දයන්ට; නුක්හොති, නුක්ආග මවේ; උකාරො, උකාරතෙම; උච්චාරණත්ථො, සුඛොච්චාරණය ඇත් තේය; කකාරො, කකාරතෙම; අන්තාවයවත්ථො, අන්තයටඅවයවවීම ප්‍රයොජනකොට ඇත්තේයි; තෙන, එහෙයින්; කකාරයා අන්තාව යව ප්‍රයොජනකොට ඇත්හෙයින්; නංම්හි, නංවිභක්ති පරකල්හි; නදීඝො, දීඝීනොවේ; ද්විනුන්නං ද්වීසු යනුවේ; තිසද්ද, තිශබ්දයාගෙ රෙන්; යොම්හි, යොවිභක්ති පරකල්හි.

**පුමෙ තයො චත්තාරො.**

යොම්හි සවිභත්තීනං තිචතුන්නං තයො චත්තාරො හොන්ති යථාක්කමං පුල්ලිඞ්ගෙ-තයො, තයො, තීහි තීහි.

**ණ්ණං ණ්ණන්නං තිතො ඣා.**

ඣසඤ්ඤිතො තිතො නංවචනස්ස ණ්ණං ණ්ණන්නං හොන්ති- තිණ්ණං තිණ්ණන්නං, තීසු-ඉත්ථියං.

**තිස්සො චතස්සො යොම්හි සවිභත්තීනං.**

විභත්තිසහිතානං තිචතුන්නං යොම්හි තිස්සො චතස්සො හොන්ති ඉත්ථියං යථාක්කමං—තිස්සො, තිස්සො, තීහි තීහි.

**නංම්හි තිචතුන්නමිත්ථියං තිස්සචතස්සා.**

---

පුමෙ තයො චත්තාරො යනු තයො චත්තාරො යනාදෙශවිධාන සූත්‍රයි; පුමෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය; තයො චත්තාරො යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; යොම්හි, යොවිභක්තිපරකල්හි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; සවිභත්තීනං, විභක්තිසහිතාවූ; තිචතුන්නං, තිශබ්දචතුශබ්දයන්ට; යථාක්කමං, පනාතීන්; තයොචත්තාරො හොන්ති, තයොචත්තාරො යනාදෙශයෝවෙත්; තයො තයො, තීහි තීහි යනුවෙ.

ණ්ණං ණ්ණන්නං තිතො ඣා යනු ණ්ණං ණ්ණන්නං යනාදෙශ විධානසූත්‍රයි; ණ්ණංණ්ණන්නං යනු ප්‍රථමා බහුවචනාන්තපදය; තිතොයනු පඤ්චම්‍යෙක වචනාන්තනිපාතපදය; ඣා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදයි; ඣසඤ්ඤිතො, ඣසංඥවූ; තිතො, තිශබ්දයාකෙරෙන් පරවූ; නංවචනස්ස, නංවිභක්තිහට; ණ්ණං ණ්ණන්නං හොන්ති, ණ්ණංණ්ණන්නං යනාදෙශයෝවෙත්; තිණ්ණං තිණ්ණන්නං යනුවේ; තීසු යනුවේ; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; (උදාහරණකියනුලැබේ)

තිස්සොචතස්සො යොම්හි සවිභත්තීනං යනු තිස්සො චතස්සො යනාදෙශවිධානසූත්‍රයි; තිස්සො චතස්සො යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදය; යොම්හියනු සප්තම්‍යෙකවචනාන්තපදය; සවිභත්තීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදයි; යොම්හි, යොවිභක්තිපරකල්හි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන්නාවූ; විභත්තිසහිතානං, විභක්තිසහිතාවූ; තිචතුන්නං, තිශබ්දචතුශබ්දයන්ට; යථාක්කමං, පනාතීන්; තිස්සොචතස්සො හොන්ති, තිස්සොචතස්සො යනාදෙශයෝවෙත්; තිස්සො, තිස්සො යනුවේ; තීහි තීහි යනුවේ.

නංම්හි තිචතුන්නමිත්ථියං තිස්ස චතස්සා යනු තිස්සචතස්සායනාදෙශවිධානසූත්‍රයි; නංම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදය; තිචතුන්නං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; ඉත්ථියං යනු සප්තම්‍යෙකවච

නංම්හි තිචතුන්නං තිස්ස චතස්සා හොන්තිත්ථියං යථාක්කමං—තිස්සන්නං, තීසු-නපුංසකෙ.

**තිණි චත්තාරි නපුංසකෙ.**

යොම්හි සවිභත්තීනං තිචතුන්නං යථාක්කමං තිණි චත්තාරි හොන්ති නපුංසකෙ—තිණි තිණි-සෙසං පුල්ලිඞ්ගසමං-චතු යො.

**චතුරො වා චතුස්ස.**

චතුසද්දස්ස සවිභත්තිස්ස යොම්හි චතුරො වා හොති පුල්ලිඞ්ගෙ—චතුරො, චතුරො—අඤ්ඤත්‍ර-චත්තාරො, චත්තාරො-චතූහි චතුබ්භි, චතුන්නං, චතූසු-ඉත්ථියං—චතස්සො, චතස්සො, චතූහි චතුබ්භි, චතස්සන්නං, චතූසු—නපුංසකෙ—චත්තාරි, චත්තාරි—සෙසං පුමෙව—පඤ්ච යො.

---

නාන්තපදය; තිස්සචතස්සා යනු ලුප්තප්‍රථමා බහුවචනාන්තපදයි; නංම්හි, නංවිභක්ති පරකල්හි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන්නාවූ; තිචතුන්නං, තිශබ්දචතුශබ්දයන්ට; යථාක්කමං, පිළිවෙළින්; තිස්ස චතස්සා හොන්ති, තිස්සචතස්ස යනාදෙශයෝවෙත්; තිස්සන්නං තීසු යනුවේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; (උදාහරණ කියනුලැබේ)

තිණිචත්තාරි නපුංසකෙ යනු තිණිචත්තාරි යනාදෙශවිධාන සූත්‍රයි; තිණිචත්තාරි යනු ප්‍රථමා බහුවචනාන්තපදය; නපුංසකෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; යොම්හි, යොවිභක්ති පරකල්හි; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වැටෙන්නාවූ; සවිභත්තීනං, විභක්ති සහිතවූ; තිචතුන්නං, තිශබ්දචතුශබ්දයන්ට; යථාක්කමං, පිළිවෙළින්; තිණිචත්තාරි හොන්ති, තිණිචත්තාරියනාදෙශයෝවෙත්; තිණිතිණි යනුවේ; සෙසං, සෙසු නොකීරූපක්‍රමය; පුල්ලිඞ්ගසමං, පුල්ලිඞ්ගහා සමයි; චතු, චතුශබ්දය; ඔහුකෙරෙන් පරව; යො, යොවිභක්තිවේ.

චතුරො වා චතුස්ස යනු විකල්පයෙන් චතුරො යනාදෙශවිධාන සූත්‍රයි; චතුරො යනු ප්‍රථමෛකවචනාන්තපදය, වා යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාතපදය; චතුස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදයි; යොම්හි, යොවිභක්තිපරකල්හි; පුල්ලිඞ්ගෙ, පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ; සවිභත්තිස්ස, විභක්තිසහිතවූ; චතුසද්දස්ස, චතුශබ්දය හට; වා, විකල්පයෙන්; චතුරොහොති, චතුරොයනාදෙශවේ; චතුරො චතුරො යනුවේ; අඤ්ඤත්‍ර, චතුරො යනාදෙශ නූවූපක්ෂයෙහි; චත්තාරො චත්තාරො යනුවේ; චතූහි චතුබ්භි, චතුන්නං, චතූසුයනුවේ ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; (උදාහරණ කියනුලැබේ) චතස්සො—පෙ—චතූසු යනුවේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; (උදාහරණ කියනුලැබේ චත්තාරි, චත්තාරියනුවේ; සෙසං, සෙසුනොකීරූපක්‍රමය; පුමෙව, පුල්ලිඞ්ගයෙහිමෙනි; පඤ්ච, පඤ්චශබ්දය; ඔහුකෙරෙන් පරව; යො, යොවිභක්තිවේ.

**ට පඤ්චාදීහි චුද්දසහි.**

පඤ්චාදීහි චුද්දසහි සඞ්ඛ්‍යාහි යොනං ට හොති-පඤ්ච, පඤ්ච.

**පඤ්චාදීනං චුද්දසන්නම.**

පඤ්චාදීනං චුද්දසන්නං සුනංහිස්ව හොති-එත්තාපවාදෙයං පඤ්චහි පඤ්චහි, පඤ්චන්නං පඤ්චසු-එවං ඡාදයො අට්ඨාරසන්තා-එකො ච දසචාති චත්ථසමාසෙ එකෙන අධිකා දසාති තතියාසමාසෙ වා කතෙ "එකත්ථතාය"ති විභත්තිලොපො—එවමුපරි ච.

**එකට්ඨානමා.**

එකඅට්ඨානං ආ හොති දසෙ පරෙ.

**ර සඞ්ඛ්‍යාතො වා.**

---

ට පඤ්චාදීහි චුද්දසහි යනු ටකාරාදෙශවිධානසූත්‍රයි; ටයනු ප්‍රථමෛකවචනාන්තපදය; පඤ්චාදීහි යනු පඤ්චම්බහුවචනාන්තපදය; චුද්දසහි යනු පඤ්චම්බහුවචනාන්තපදයි; පඤ්චාදිනං, පඤ්චශබ්දය ආදිකොට ඇති; චුද්දසහිසඞ්ඛ්‍යාහි, තුදුසසඞ්ඛ්‍යාවාචීශබ්දයන් කෙරෙන් පරවූ; යොනං, ප්‍රථමා ද්විතීයා යොවිභක්තීන්ට; ටහොති, ටකාරාදෙශවේ; පඤ්ච පඤ්ච යනුවේ.

පඤ්චාදිනං චුද්දසන්නම යනු අකාරාදෙශවිධානසූත්‍රයි; පඤ්චාදීනං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; චුද්දසන්නං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; අයනු ලුප්තප්‍රථමා එකවචනාන්තපදයි; සුනංහිසු, සුයනංයහිය යන මොවුන් පරකල්හි; පඤ්චාදීනං, පඤ්චශබ්දයාආදිකොට ඇති; චුද්දසන්නං, චුද්දසසඞ්ඛ්‍යාවාචීශබ්දයන්ට; අහොති, අකාරාදෙශවේ; අයං, මේ අකාරවිධානසූත්‍රය; එත්තාපවාදෙ, (සුහිස්වෙසෙ යන) එත්ව යට බාධකයි; පඤ්චහි පඤ්චහි, පඤ්චන්නං, පඤ්චසුයනුවේ; ඡාදයො, ඡශබ්දයා ආදිකොටඇති; අට්ඨාරසන්තා, අට්ඨාරසශබ්දයා අන්තකොටඇති ශබ්දයෝද; එවං, මෙසේමැයි; එකොචදසචාති, එකොචදසචකියා; චත්ථසමාසෙ, චාර්ථසමාසහෝ; එකෙන අධිකාදසාති, එකෙන අධිකා දසයි කියා; තතියාසමාසෙවා කතෙ, තෘතීයා අමාදිසමාසහෝ කළකල්හි; එකත්ථතායං ඉති, එකත්ථතායං යන සූත්‍රයෙන්; විභත්ති ලොපො, විභක්තිහට ලොප්වේ; උපරිච, මත්තෙහිද; එව , මෙසේමැයි.

එකට්ඨානමා යනු ආකාරාදෙශවිධානසූත්‍රයි; "එකට්ඨානං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදය; ආයනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදයි; දසෙපරෙ, දසශබ්දයාපරකල්හි; එකඅට්ඨානං, එකඅට්ඨශබ්දයන්ට; ආහොති, ආකාරාදෙශවේ.

රසඞ්ඛ්‍යාතොවා යනු විකල්පයෙන් රකාරාදෙශවිධාන සූත්‍රයි; රයනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තපදය; සඞ්ඛ්‍යාතො යනු පඤ්චම්‍යෙක

සඞ්ඛ්‍යාතො පරස්ස දසස්ස ර හොති විභාසා-සච "පඤ්චමියං පරස්ස"ති අනුවත්තමානෙ "ආදිස්සා"ති දකාරස්සෙව හොති-එකාරස, එකාදස.

**ආ සඞ්ඛ්‍යායාසතාදො'නඤ්ඤත්ථෙ.**

සඞ්ඛ්‍යායමුත්තරපදෙ ද්විස්ස ආ හොතසතාදො'නඤ්ඤත්ථෙ—ද්වාදස.

**බා චත්තාළීසාදො.**

ද්විස්ස බා වා හොත චත්තාළීසාදො'නඤ්ඤත්ථෙ—බාරස.

**තිස්සෙ.**

සඞ්ඛ්‍යායමුත්තරපදෙ තිස්ස එ හොතසතාදො'නඤ්ඤත්ථෙ.

---

වචනාන්ත නිපාතපදය, වා යනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාත පදයි; සඞ්ඛ්‍යාතො සඞ්ඛ්‍යාවාචිශබ්දයන් කෙරෙන්; පරස්ස, පරවූ; දසස්ස, දසශබ්දයහට; විභාසා, විකල්පයෙන්; රහොති, රකාරාදෙශවේ; සච, ඒරකාරාදෙශද; පඤ්චමියං පරස්සඉති, පඤ්චමියංපරස්ස යනු; අනුවත්තමානෙ, වැටෙන්නෙහි; ආදිස්සඉති, ආදිස්ස යන පරිභාෂා සූත්‍රයෙන්; දකාරස්සෙව හොති, ආදිදකාරයහටම (රකාරාදෙශවේ) එකාරස එකාදස යනුවේ.

ආසඞ්ඛ්‍යායා සතාදො නඤ්ඤත්ථෙ යනු ආකාරාදෙශවිධානසූත්‍රයි; ආ යනු ලුප්තප්‍රථමෛක වචනාන්තපදය; සඞ්ඛ්‍යායං යනු සප්තම්‍යෙකවචනාන්තපදය; අසතාදො යනු සප්තම්‍යෙක වචනාන්තනිපාත පදය; අනඤ්ඤත්ථෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; අසතාදො, සතාදියෙහි නොවැටෙන්නාවූ; අනඤ්ඤත්ථෙ, අන්‍යාර්ථසමාසයෙහි; නොකරණලද; සඞ්ඛ්‍යායං, සඞ්ඛ්‍යාවාචිශබ්දයා; උත්තරපදෙ, උත්තර පදකල්හි; ද්විස්ස, ද්විශබ්දයහට; ආහොති, ආකාරාදෙශවේ; ද්වාදස යනුවේ.

බාචත්තාළීසාදො යනු බායනාදෙශවිධාන සූත්‍රයි; බායනු ප්‍රථමෛකවචනාන්තපදය; අචත්තාළීසාදො යනු සප්තම්‍යෙකවචනාන්ත පදයි; අචත්තාළීසාදො, චත්තාළීසාදියෙහි නොවැටෙන්නාවූ; අනඤ්ඤත්ථෙ, අන්‍යාර්ථසමාසයෙහි නොකරණලද; ද්විස්ස, ද්විශබ්දයහට; වා, විකල්පයෙන්; බාහොති, බායනාදෙශවේ; බාරසයනුවේ.

තිස්ස යනු එකාරාදෙශවිධානසූත්‍රයි; තිස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; එයනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තපදයි; අසතාදො, සතාදියෙහි නොවැටෙන්නාවූ; අනඤ්ඤත්ථෙ, අන්‍යාර්ථසමාසයෙහි නොවූ; සඞ්ඛ්‍යායං, සඞ්ඛ්‍යාවාචිශබ්දය; උත්තරපදෙ, පරපදකල්හි; තිස්ස, ත්‍රිශබ්දයහට; එහොති, එකාරාදෙශවේ.

**ඡතීහි ළො ච.**

ඡතීහි පරස්ස දසස්ස ළො හොති රො ච—තෙළස-තෙරස.

**චතුස්ස චු චො දසෙ.**

චතුස්ස චුචො හොන්ති වා දසසද්දෙ පරෙ-චතෙන-චුද්දස චොද්දස චතුද්දස.

**වීසතිදසෙසු පඤ්චස්ස පණ්ණුපණ්ණා.**

වීසතිදසෙසු පරෙසු පඤ්චස්ස පණ්ණුපණ්ණා හොන්ති වා යථාක්කමං-පණ්ණරස පඤ්චදස.

**ඡස්ස සො.**

ඡස්ස සො ඉච්චයමාදෙසො හොති දසසද්දෙ පරෙ-සොළස සොරස, සත්තරස සත්තදස, අට්ඨාරස අට්ඨාදස-එකෙන ඌනා වීසතීති විසෙසනසමාසගබ්භ තතියාසමාසො.

---

ඡතීහිළොච යනු ළකාරාදෙශවිධානසූත්‍රයි; ඡතීහි යනු පඤ්චමී බහුවචනාන්තපදය; ළො යනු ප්‍රථමෛකවචනාන්තපදය; චයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදයි; ඡතීහි, ඡශබ්ද තිශබ්දයන්කෙරෙන්; පරස්ස, පරවූ; දසස්ස, දසශබ්දයාහට; ළොහොතිරොච, ළකාරාදෙශද රකාරාදෙශදවේ; තෙළස තෙරසයනුවේ.

චතුස්සචුචොදසෙ යනු චුචො යනාදෙශවිධානසූත්‍රයි; චතුස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; චුචොයනු, ප්‍රථමා බහුවචනාන්තපදය; දසෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; දසසද්දෙපරෙ, දසශබ්දයාපරකල්හි; චතුස්ස, චතුශබ්දයහට; වා, විකල්පයෙන්; චුචො හොන්ති, චුචොයනාදෙශයෝවෙත්; චතෙන, චනුකළකල්හි; චුද්දස චොද්දස චතුද්දස යනුවේ.

විසතිදසෙසු පඤ්චස්ස පණ්ණුපණ්ණා යනු විකල්පයෙන් පණ්ණු පණ්ණා යනාදෙශවිධානසූත්‍රයි; වීසතිදසෙසු යනු සප්තම්බහුවචනාන්තපදය; පඤ්චස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය, පණ්ණුපණ්ණා යනු ප්‍රථමා බහුවචනාන්තපදයි; විසතිදසෙසු, විසතිශබ්ද දසශබ්දයන් පරකල්හි; පඤ්චස්ස, පඤ්චශබ්දයාහට; යථාක්කමං, පනතීන්; වා, විකල්පයෙන්; පණ්ණුපණ්ණා හොන්ති, පණ්ණුපණ්ණා යනාදෙශයෝ වෙත්; පණ්ණරසපඤ්චදස යනුවේ.

ඡස්සසො යනු සොයනාදෙශවිධානසූත්‍රයි; ඡස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපරිත්‍යක්තාර්ථ අනුකරණපදය; සො යනු ප්‍රථමෛකවචනාන්තපදයි; දසසද්දෙපරෙ, දසශබ්දයාපරකල්හි; ඡස්ස, ඡශබ්දයාහට; සොඉති, සොයන; අයංආදෙසො හොති, මේ ආදෙශවේ; සොළස සොරස යනුවේ; සත්තරස සත්තදසයනුවේ; අට්ඨාරස අට්ඨාදස යනු

## ඉත්ථියමභාසිතපුම්ත්ථි පුමෙවෙකත්ථෙ.

ඉත්ථියං වත්තමානෙ එකත්ථෙ සමානාධිකරණෙ උත්තරපදෙ පරෙ භාසිතපුම්ත්ථි පුමෙව හොතීති පුම්භාවො ආප්පච්චයො නිවත්තනෙ— එකූනවීසති-ඉත්ථිලිඞ්ගෙකවචනන්තා-වීසතිආදයො හි ආනවුතියා එකවචනන්තා ඉත්ථිලිඞ්ගා-(හො) එකූනවීසති එකූනවීසති මිච්චාදි- එවංවීසති එකවීසති චාවීසති බාවීසති තෙවීසතිප්පභූතයො. වීසතියං පඤ්චස්ස වා පණ්ණුආදෙසෙ—පණ්ණුවීසති, පඤ්චවීසති-එකෙන ඌනා තිංසති තිංසා වා එකූනතිංසති එකූනතිංසා—මතිකඤ්ඤකඤ්ඤසමා-එවං තිංසති තිංසාප්පභූතයො—තිංසාසද්දස්ස පන සිලොපෙ-දීඝරස්සාති යොගවිභාගා රස්සෙ-තිංස-නිග්ගහීතාගමෙ ච තිංසන්තිපි හොති— එවමුපරි ච යථාසම්භවං—චත්තිංසතිආදීනං රස්සචින්තාති—චත්තාළීසාය සිම්හි-චත්තාළීසා චත්තාළීස චත්තාළීසං වා, එවං චත්තාරීසා චත්තාරීස චත්තාරීසං.

---

වේ; එකෙන ඌනාවීසති ඉති, එකෙන ඌනා වීසතිකියා; විසෙසන සමාසගබ්භෙන, විශෙෂණ සමාසගණීකොටඇති; තතියාසමාසෙ කතෙ; තෘතීයා අමාදිසමාස කළකල්හි.

ඉත්ථියං භාසිතපුම්ත්ථි පුමෙවෙකත්ථෙ යනු පුංවත් විධානසූත්‍රයි; ඉත්ථියං යනු සප්තම්‍යෙකවචනාන්තපදය; භාසිතපුමා යනු ප්‍රථමෛක වචනාන්තපදය; ඉත්ථි යනු ප්‍රථමෛක වචනාන්තපදය; පුමෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය, ඉවයනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදය; එකත්ථෙයනුසප්තම්‍යෙක වචනාන්තපදයි; ඉත්ථියංවත්තමානෙ, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන්නාවූ; එකත්ථෙයයිසේය; සමානාධිකරණෙ, සමානවූ අභිඇති; උත්තරපදෙ පරෙ, උත්තරපදයාපරකල්හි; භාසිතපුමා, කියනලද පුල්ලිඞ්ගඇති; ඉත්ථි, ස්ත්‍රීවාචකවූ ශබ්දරූපය තෙම; පුමෙව හොතීති, පුල්ලිඞ්ගයෙහිමෙන්වේනුයි; පුම්භාවා, පුංවත් කිරීමහෙතුකොටගෙණ; ආප්පච්චයො, ආ ප්‍රත්‍යයතෙම; නිවත්තතෙ, වළකී; එකූනවීසතියනුවේ; ඉත්ථිලිඞ්ගෙකවචනන්තා, ස්ත්‍රීලිඞ්ගයහ එකවචනාන්තයි; හි, එසේමය; වීසති ආදයො, වීසති ආදිශබ්දයෝ; ආනවුතියා (ගණහමානසීමාවසයෙන්) නවුතිශබ්දය දක්වා; එකවචනන්තා, එකවචනාන්තයහ; ඉත්ථිලිඞ්ගා, ස්ත්‍රීලිඞ්ගයෝයි; හො එකූන වීසති ඉති, හොඑකූන වීසතියන; ආදි, මේ ආදියවේ; වීසති—පෙ— තෙවීසතියන; පභූතයො, මේආදි ශබ්දයෝද; එවං, මෙසේමැයි; වීසතියං, වීසතිශබ්දයාපරකල්හි; පඤ්චස්ස, පඤ්චශබ්දයහට; වා, විකල්පයෙන්; පණ්ණුආදෙසෙ, පණ්ණුයනාදෙශ කළකල්හි; පණ්ණුවීසති පඤ්චවීසති යනුවේ; එකෙන ඌනා තිංසති, එකෙන ඌනාතිංසතියන

**ඉිස්සාච.**

අසනාදෙ'නඤ්ඤඤපේ චත්තාළීසාදෙ ඉිස්ස එ හොති වා ආ ච-චෙ චත්තාළීස මාචත්තාළීස ඉිචත්තාළීස-එවං චෙචත්තාරීස මාචත්තා රීස ඉිච්චත්තාරීස, චෙචත්තාළීසති මාචත්තාළීසති ඉිචත්තාළීසති.

**චත්තාළීයාඥ වා.**

අසනාදෙ 'නඤ්ඤඤපේ චත්තාළීසාදෙ තිස්ස වා හොති-තෙචත්තා

---

වාක්‍යයෙහි හෝ; එකෙනඌනා තිංසාවා, එකෙන ඌනා තිංසා යන වාක්‍යයෙහි හෝ; (විශෙෂණසමාසගර්භකොට ඇති තෘතියා සමාසකළ කල්හි) එකූනතිංසති එකූනතිංසා යනුවේ; මතිකඤ්ඤඤසමා, මති ශබ්දකඤ්ඤඤශබ්දයන් දෙදෙනහා සමයෝයි; තිංසති තිංසා යන; පඤ්චතයො, මේ ආදිශබ්දයෝද; එවං, මෙසේමැයි; තිංසාසද්දස්ස පන, තිංසාශබ්දයහට වනාහි; සිලොපෙ, සිහටලොප්කළකල්හි; බ්‍යඤ්ජනෙ දීඝරස්සා යන සූත්‍රයෙහි දීඝරස්සා යන යොගවිභාගා, සූත්‍රවිධා කරණයෙන්; රස්සෙ, හ්‍රස්වකළකල්හි; තිංසය නුවේ; නිග්ගහීතාග මෙච; නිග්ගහිතාගමද; හ්‍රස්වදකළකල්හි; තිංසංතිපි හොති, තිංසං කියාදවේ; උපරිච; මත්තෙහිද; යථාසම්භවං, සම්භවවූ පරිද්දෙන්; එවං, රූපභෙදය මෙසේමැයි; චත්තිංසතිආදිනං, චත්තිංසත්ආදීන්ට; රස්සචිත්තානි, හ්‍රස්වයචින්වය යනමොහුවෙත්; චත්තාළීසාය සිම්හි; චත්තාළීසාස, චත්තාළීය ශබ්දයාකෙරෙහි; සිම්හි, සිවිභක්තිකළ කල්හි; චත්තාළීසාචත්තාළීස චත්තාළීසංවා, චත්තාළීසා චත්තාළීස චත්තාළීසං කියාහෝ වේ; චත්තාරිසා චත්තාරීස චත්තාරීසං යනුද; එවං, මෙසේමැයි.

ඉිස්සාච යනු විකල්පයෙන් එකාර ආකාරාදෙශවිධානසූත්‍රයි; ඉිස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය, ආයනු ප්‍රථමෛක වචනාන්ත පදය; චයනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; අසනාදෙ, සනාදිනුවූ; අනඤ්ඤඤපේ, අන්‍යාර්ථසමාසනුවූ; චත්තාළීසාදෙ, චත්තාළීසාශබ්දයාපරකල්හි; ඉිස්ස, ඉිශබ්දයහට; වා, විකල්පයෙන්; එහොති එකාරාදෙශවෙයි; ආච, ආකාරාදෙශදවේ; චෙචත්තාළීස මාචත්තාළීස ඉිච්චත්තාළීස යනුවේ; චෙචත්තාරීස මාචත්තාර්ස ඉිචත්තාරීස යනුද; එවං, මෙසේමැයි; චෙචත්තාළීසති මාචත්තාළීසති ඉිත්තාළීසති යනුවේ.

චත්තාළීසාදේවා යනු විකල්පයෙන් එකාරාදෙශවිධාන සූත්‍රයි; චත්තාළීසාදෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය; වායනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; අසනාදෙ සනාදියෙහි නොවැටෙන්නාවූ; අනඤ්ඤඤපේ, අන්‍යාර්ථසමාසයෙහි නොකරණලද; චත්තාළීසාදෙ, චත්තාළීසාශබ්දයාපරකල්හි; තිස්ස, තිශබ්දයහට; වා, විකල්ප

ළීස තිචත්තාළීස තෙචත්තාළීසති තිචත්තාළීසති-තෙචත්තාරීස තිචත්තාරීස-වෙපඤ්ඤාස වාපඤ්ඤාස විපඤ්ඤාස වෙපණ්ණාස වාපණ්ණාස, විපණ්ණණ්ණාස තෙපඤ්ඤාස තිපඤ්ඤාස තෙපණ්ණාස තිපණ්ණාස, වෙසට්ඨි වාසට්ඨි විසට්ඨි, තෙසට්ඨි තිසට්ඨි, වෙසත්තති වාසත්තති විසත්තති වෙසත්තරි වාසත්තරි විසත්තරි, තෙසත්තති තිසත්තති තෙසත්තරි තිසත්තරි, වෙඅසීති වාඅසීති වියාසීති—යාගමො—තෙඅසීති තියාසීති, වෙනවුති වානවුති විනවුති, තෙනවුති තිනවුති-සතං නපුංසක මෙකවචනන්තං-එවං සහස්සාදයො-කොටි පකොටි කොටිප්පකොටි අක්ඛොභිණියො ඉත්ථිලිඞ්ගෙකවචනන්තා-වග්ගභෙදෙ තු සඞ්ඛ්‍යාසම්පි සඞ්ඛ්‍යානං බහුවචනඤ්ච හොතෙව-යථා-වෙ වීසතියො, තිසෙසා වීසතියො ඉච්චාදි-දස දසකං සතං නාම, දසසතං සහස්සං, දසසහස්සං නහුතං, දසනහුතං ලක්ඛං, සතසහස්සන්තිපි වුච්චති-ලක්ඛසතං කොටි, කොටිලක්ඛසතං පකොටි, පකොටිලක්ඛසතං කොටිප්පකොටි-එවං නහුතං නින්නහුතං අක්ඛොභිණී බින්දු

---

යෙන්; එහොති, එකාරාදෙශවේ; තෙචත්තාළීස තිචත්තාළීස තෙචත්තාළීසති තිචත්තාළීසති තෙචත්තාරීස තිචත්තාරීස යනුවේ; වෙපඤ්ඤාස වාපඤ්ඤාස යනාදියවේ; යාගමෙ, වනතරගාවාගමා යන සූත්‍රයෙන් යකාරයෙක් ආගම කළකල්හි; තියාසීති යනුවේ; සතං, සතශබ්දතෙම්; නපුංසකං, නපුංසකලිඞ්ගය; එකවචනන්තං, එකවචනාන්තයි; සහස්සාදයො, සහස්සාදිශබ්දයෝද; එවං, මෙසේමැයි; කොටි, කොටිශබ්දය; පකොටි, ප්‍රකොටි ශබ්දය; කොටිප්පකොටි, කොටිප්‍රකොටිශබ්දය; අක්ඛොභිණියො, අක්ෂෞභිණීශබ්දය; යනමොහු; ඉත්ථිලිඞ්ගෙකවචනන්තා, ස්ත්‍රීලිඞ්ගඑකවචනාන්තයෝයි; වග්ගභෙදෙතු, රාශිභෙදයක් කිවමනාකල්හි වනාහි; හෙවත් කීපරසක් කිවමනාකල්හි; සඞ්ඛ්‍යාසම්පිසඞ්ඛ්‍යානං, සියලු සඞ්ඛ්‍යවාචීශබ්දයන්ට; බහුවචනඤ්චහොතෙව, බහුවචනාන්තදවේමැයි; වෙවීසතියො තිසෙසා වීසතියො ඉති, වෙවීසතියො තිසෙසාවීසතියො යන; ආදියථා, මේ ආදියමෙනි; දසදසකං, දසකදසයෙක්; සතංනාම, සියයෙක්නම්වේ; දසසතං, දසසියයෙක්; සහස්සං, දහසෙක්නම්වේ; දසසහස්සං, දස දහසෙක්; නහුතං, නහුතයෙක් නම්වේ; දසනහුතං, දසනහුතයෙක්; ලක්ඛං, ලක්ෂයෙක්නම්වේ; සතසහස්සන්තිපි වුච්චති, සියක් දහසෙකැයිද කියනුලැබේ; ලක්ඛසතං, ලක්ෂසියයෙක්; කොටි, කොටිනම්වේ; කොටිලක්ඛසතං, කොටිලක්ෂසියයෙක්; පකොටි, ප්‍රකොටියෙක්නම්වේ; පකොටිලක්ඛසතං, ප්‍රකොටි ලක්ෂසියයෙක්; කොටිප්පකොටි, කොටිප්‍රකොටියෙක්නම්වේ; එවං, මෙසේම; නහුතං, නහුතයෙක; නින්නහුතං, නින්නහුතයෙක—පෙ—අසඞ්ඛ්‍යෙය්‍යන්ති,

අබ්බුදං නිරබ්බුදං අහහං අබබං අටටං සොගන්ධිකං උප්පලං කුමුදං පුණ්ඩරිකං පදුමං කථානං මහාකථානං අසඞ්ඛ්‍යෙය්‍යන්ති යථාක්කමං සතලක්ඛගුණං වෙදිතබ්බං.

---

අථාසඞ්ඛ්‍යමුච්චතෙ.

තං දුවිධං පාදිචාදිභෙදෙන–තත්‍ථ–ප පරා අප සං අනු අව ඔ නි දු වි අධි අපි අති සු උ අභි පති පරි උප ආ–ඉමෙ වීසති පාදයො–චාදයො පන–ච වා හ අහ එව එවමිච්චාදයො–ඉමෙ චෙපි ලිඞ්ගසඞ්ඛ්‍යා රහිතා, එතෙහි පන යථාසම්භවං විහිතානං විභත්තීනං.

**අසඞ්ඛ්‍යෙහි සබ්බාසං.**

අවිජ්ජමානසඞ්ඛ්‍යෙහි පරාසං සබ්බාසං විභත්තීනං ලොපො හොති ති ලොපො ච.

---

අසඞ්ඛ්‍යෙයයෙකැයි; යථාක්කමං, පනාතීන්; සතලක්ඛගුණං, ශතලක්ෂගුණවූයේ; වෙදිතබ්බං, දතයුත්තේයි; මෙහි දසදසයෙක් සියයෙක් වෙයි, දසසියයෙක් දහසෙක්වෙයි යනාදින් ලක්ෂයදක්වා දසගුණ වෙයි; සියක්ලක්ෂය කොටියෙක්වෙයි යනාදින් අසඞ්ඛ්‍යෙය දක්වා ශතගුණවෙයිකියා දතයුතු.

---

අථ, ඉක්බිත්තෙන්; අසඞ්ඛ්‍යං, අසඞ්ඛ්‍යය; උච්චතෙ, කියනුලැබේ; තං, ඒඅසඞ්ඛ්‍යයතෙම; පාදිචාදිභෙදෙන, ප්‍රාදිචාදිභෙදහෙයින්; දුවිධංහොති, ද්විප්‍රකාරවේ; තත්‍ථ, ඒ ද්විප්‍රකාරවූඅසඞ්ඛ්‍යයන් අතුරෙන්; ප, පශබ්දය, පරා, පරාශබ්දය—පෙ—ආ, ආශබ්දයයන; ඉමෙවීසති, මොහුවිසිදෙන; පාදයො, ප්‍රාදිහුනම්වෙත්; චාදයො පන, චාදිහු වනාහි; ච, චශබ්දය; වා, වාශබ්දය; හ, හශබ්දය; අහ, අහශබ්දය; එව, එවශබ්දය; එවංඉති, එවං ශබ්දයයන; ආදයො, මේ ආදිශබ්දයෝයි; ඉමෙචෙපි, මේ ප්‍රාදිචාදිදෙදෙනද; ලිඞ්ගසඞ්ඛ්‍යාරහිතා; ලිඞ්ගසඞ්ඛ්‍යාරහිතයෝයි; එතෙහි පන, මේ ප්‍රාදිචාදින් කෙරෙන්වනාහි; යථාසම්භවං, සම්භවවූ පරිද්දෙන්; විහිතානං, කරණලද; විභත්තිනං, විභක්තීන්ට.

අසඞ්ඛ්‍යෙහි සබ්බාසං යනු සියලු විභක්තිලොප්විධාන සූත්‍රයි; අසඞ්ඛ්‍යෙහි යනු පඤ්චමීබහුවචනාන්තපදය, සබ්බාසං යනු ෂෂ්ඨීබහුවචනාන්තපදයි; අවිජ්ජමානසඞ්ඛ්‍යෙහි, අවිද්‍යමානවූ සඞ්ඛ්‍යාඇති ශබ්දයන්කෙරෙන්; පරාසං, පරවූ; සබ්බාසං විභත්තීනං, සියලු විභක්තීන්ට; ලොපොහොතීති, ලොප්වේනුයි; ලොපොච, ලොප්මවේ.

විහත්තියා කතො භෙදෙ සලිඞ්ගානං භවෙ තථා,
තුම්හාදිනං තලිඞ්ගෙසු නෙවත්ථි පාදිචාදිනං.

**වුත්තානි ස්‍යාද්‍යන්තානි.**

අථෙකත්ථමුච්චතෙ-උපසද්දෘ පඨමෙකවචනං සි-තස්ස “අසඞ්ඛ්‍ය හිසඞ්ඛ්‍යාසං”ති ලොපො-කුම්භසද්ද ඡඨියෙකවචනං ස-උප කුම්භස ඉති ඨිතෙ “අවිග්ගහො නිච්චසමාසො පදන්තරවිග්ගහො වෙති” සමී පංකුම්භස්සෙති පදන්තරවිග්ගහෙ-“ස්‍යාදි ස්‍යාදිනෙකත්ථ”න්ති සබ්බ ත්‍ථෙකත්ථෙ වත්තතෙ.

**අසඞ්ඛ්‍යං විභත්ති සම්පත්ති සමීප සාකල්‍යාභාව යථාපච්ඡා යුගපදත්ථෙ.**

අසඞ්ඛ්‍යං ස්‍යාද්‍යන්තං විභත්‍යාදිනමත්ථෙ වත්තමානං ස්‍යාද්‍යන්තෙන සහෙකත්ථංභවති.

---

විහත්තියා, විභක්තිය විසින්; කතො, කරණලද; භෙදො, රූප භෙදයතෙම; සලිඞ්ගානං, (බුද්ධාදි) සලිඞ්ගශබ්දයන්ටම; භවෙ, වන් නේයි; අලිඞ්ගෙසු, අලිඞ්ගශබ්දයන්කෙරෙහි; තුම්හාදිනන්තු, තුම්හා දින්ට හෙවත් තුම්හ අම්හශබ්දයන්ට; තථා, එසේම; (රූපභෙදයවන් නේය;) පාදිචාදිනන්ද; ප්‍රාදිචාදින්ටවනාහි; නෙවඅත්ථි, (විභක්තිය විසින් කරණලද රූපභෙදයෙක්) නොමඇති.

වුත්තානි ස්‍යාද්‍යන්තානි, ස්‍යාද්‍යන්තානි, ස්‍යාද්‍යන්තයෝ; වුත්තා නි, කියනලද්දහුයි.

---

අථ, ඉක්බිත්තෙන්; හෙවත් ඒ මෙසේ පුලලිඞ්ගාදි පඤ්චප්‍රකාරය කින් නාම පදයන්ගේ සාධනක්‍රමය දක්වා ඉක්බිතිව; එකත්ථං, භින්නාර්ථඇතිපදයන්ගේඑකාර්ථභාවයයිකියනලද පදසංක්ෂෙපය; හෙ වත් සමාසය; වුච්චතෙ, කියනුලැබේ; උපසද්ද, උපශබ්දයාකෙරෙන් පරව; පඨමෙකවචනං, ප්‍රථමෛකවචනවූ; සි, සිවිභත්තිවේ; තස්ස, ඒසිවචනයහට; අසඞ්ඛ්‍යහිසඞ්ඛ්‍යාසං ඉති, අසඞ්ඛ්‍යහිසඞ්ඛ්‍යාසං යන සූත්‍රයෙන්; ලොපො, ලොප්වේ; කුම්භසද්ද, කුම්භශබ්දයාකෙරෙන්; ඡඨියෙකවචනං, ෂෂ්ඨ්‍යෙකවචනවූ; ස, සවිභක්තිවේ; උපකුම්භසඉති උපකුම්භස කියා; ඨිතෙ, සිටිකල්හි; අවිග්ගහො නිච්චසමාසො පද න්තරවිග්ගහොවෙති, අවිග්ගහො නිච්චසමාසො පදන්තර විග්ගහොව යනු න්‍යාය හෙයින්; සමීපං කුම්භස්සෙති, සමීපංකුම්භස්සකියා; පද න්තරවිග්ගහෙ, අන්‍යපදයෙන් වාක්‍යගත්කල්හි; ස්‍යාදි ස්‍යාදි නෙක ත්ථං ඉති, ස්‍යාදි ස්‍යාදිනෙකත්ථං යනු; සබ්බත්ථෙකත්ථෙ, සියලු සමාස කාණ්ඩයෙහි; වත්තතෙ, වැටේ.

අසඞ්ඛ්‍යං විභත්තිසම්පත්ති සමීපසාකල්‍යාභාව යථාපච්ඡායුග පදත්ථෙ යනු අසඞ්ඛ්‍යසමාස විධානසූත්‍රයි; අසඞ්ඛ්‍යං යනු ප්‍රථමෛක

**ඒකත්ථතායං.**

ඊයාදිණාදිසමාසෙහි එකත්ථීභාවො එකත්ථතා- තස්මිං ස්‍යාදි ලොපො හොති- "තං නපුංසක" මිති නපුංසකලිඞ්ගං- තතො ස්‍යාදි- "පුබ්බස්මාමාදිතො"ති ලොපෙ සම්පත්තෙ.

**නාතොමපඤ්චමියා.**

අමාදෙකත්ථා පුබ්බං යදෙකත්ථමකාරන්තං තතො පරාසං සබ්බාසං විභත්තීනං ලොපො න හොති අං තු භවත්‍යපඤ්චමියා- උපකුම්භං තිට්ඨ- කුම්භස්ස සමීපං තිට්ඨතීති අත්ථො- උපකුම්භං පස්ස.

**වා තතියාසත්තමීනං.**

---

වචනාන්තපදය, විභත්ති සම්පත්තිසමීපසාකල්‍යාභාවයථාපච්ඡා යුග පදයේ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; විභත්ත්‍යාදිනමත්ථේ, විභත්ත්‍යාදීන්ගේ අර්ථයෙහි; වත්තමානං, වැටෙන්නාවූ; අසඞ්ඛ්‍යංස්‍යාද්‍යන්තං, අසඞ්ඛ්‍යවූස්‍යාද්‍යන්තතෙම; ස්‍යාද්‍යන්තෙන සහ, ස්‍යාද්‍යන්තයා හා එක්ව, එකත්ථමභවති, සමාසවේ.

ඒකත්ථතායං යනු ස්‍යාදිවිභක්තිලොප්විධානසූත්‍රයි; ඒකත්ථතායං යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; ඊයාදිණාදිසමාසෙහි, ඊයාදිණාදි සමාසයන්හා, එකත්ථීභාවො, එකාර්ථීභාවයතෙම; එකත්ථතා, එකාර්ථතානම; තස්මිං, ඒඑකාර්ථීභාවයක් ඇතිකල්හි; ස්‍යාදිලොපොහොති ස්‍යාදිහටලොප්වේ; තංනපුංසකං ඉති, තංනපුංසකං යන සූත්‍රයෙන්; නපුංසකලිඞ්ගං, නපුංසකලිඞ්ගවේ; තතො, ඉක්බිත්තෙන්; ස්‍යාදි, ස්‍යාදි විභක්තිවේ; පුබ්බස්මාමාදිතො ඉති, පුබ්බස්මාමාදිතො යන සූත්‍රයෙන් ලොපෙ, සම්පත්තෙ, ලොප්පැමිණිකල්හි.

නාතොමපඤ්චමියා යනු සියලු විභක්තිලොප ප්‍රතිෂෙධ අයනාදෙශ විධානසූත්‍රයි; නයනු ලුප්ත ප්‍රථමෛක වචනාන්ත නිපාතපදය, අතොයනු පඤ්චම්‍යෙක වචනාන්තනිෂ්පන්නනිපාතපදය; අයනු ප්‍රථමෛක වචනාන්ත රූඪිපදය, අපඤ්චමියා යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදයි; අමාදෙකත්ථා, අමාදිසමාසයාකෙරෙන්; පුබ්බං, පූර්වවූ; යංඑකත්ථං, යම් සමාසයෙක්ඇද්ද; තතො, ඔහුකෙරෙන්; හෙවත් අසඞ්ඛ්‍ය සමාසයෙන්; පරාසං, පරවූ; සබ්බාසං විභත්තීනං, සියලු විභක්තීන්ට ලොපො නහොති, ලොප්නොවෙයි; අපඤ්චමියා, පඤ්චමින් පිටත්සෙසු විභක්තීන්ට; අංතු, අංයනාදෙශයවනාහි; භවති, වේ; උපකුම්භං, කුම්භසමීපයතෙම; තිට්ඨ, සිටී; කුම්භස්ස, කුම්භයාගේ; සමීපං, සමීපයතෙම; තිට්ඨතීති, සිටිනේය යන අත්ථො, අර්ථයි; උපකුම්භං, කුම්භසමීපය; පස්ස, බලා.

වා තතියාසත්තමීනං යනු විකල්පයෙන් අං යනාදෙශවිධාන සූත්‍රයි; වායනු ප්‍රථමෛකවචනාන්තනිපාතපදය, තතියාසත්තමීනං යනු ෂෂ්ඨී බහුවචනාන්තපදයි; අමාදෙකත්ථා, අමාදිසමාසයෙන්;

අමාදෙකත්ථා පුබ්බං යදෙකත්ථමකාරන්තං තතො පරාසං තතියාසත්තමීනං අං හොති වා–උපකුම්භං කතං, උපකුම්භෙන වා, උපකුම්භං දෙහි, පඤ්චමියං අමභාවා–උපකුම්භා අපෙහි–උපකුම්භමායත්තං උපකුම්භං නිධෙහි, උපකුම්භෙ වා–එවමුපනගරමිච්චාදි–සමීපං අඟිනො උපඟි–එත්ථපන–"පුබ්බස්මාමාදිතො"ති සබ්බස්‍යාදි ලොපොව, එවමුපගුරු–වෙති සබ්බත්ථ වත්තතෙ.

**අමාදි.**

අමාදි ස්‍යාද්‍යන්තං ස්‍යාද්‍යන්තෙන සහ බහුලමෙකත්ථං හොති–ගාමං ගතො ගාමගතො, මුහුත්තං සුඛං මුහුත්තසුඛං–වුත්තියෙවොපපදසමාසෙ–කුම්භකාරො, එත්ථ බහුලාධිකාරා අස්‍යාද්‍යන්තෙනාපි සමාසො. න්තමානක්තවන්තූහි වාක්‍යමෙව–ධම්මං සුණන්තො, ධම්මං සුණමා

---

පුබ්බං, පූර්වවූ;—පෙ—තතියාසත්තමීනං, තෘතියාසප්තමීන්ට; වා, විකල්පයෙන්; අංහොති, අංයනාදෙශවේ; උපකුම්භං, කුම්භසමීපයාවිසින් කතං, කරණලදී; උපකුම්භෙනවා, උපකුම්භෙන කතං කියාහෝවේ, උපකුම්භං, කුම්භසමීපයහට; දෙහි, දෙව; පඤ්චමියා, පඤ්චමීවිභක්තිහට; අමභාවා, අංයනාදෙශනොවනහෙයින්; උපකුම්භාඅපෙහි යනුවේ; උපකුම්භං, කුම්භසමීපයාගේ; ආයත්තං, අයතියි; උපකුම්භං, කුම්භසමීපයාකෙරෙහි; නිධෙහි, පිහිටුව; උපකුම්භෙවා, උපකුම්භෙනිධෙහි කියාහෝවේ; උපනගරං ඉති, උපනගරං යන; ආදි, මේ ආදියද; එවං, මෙසේමැයි; අඟිනො, වහනිහුගේ; සමීපං, සමීපයතෙම; උපඟි, උපඟිනම්වේ; එත්ථපන, මේ උපඟියන තන්හි වනාහි; පුබ්බස්මාමාදිතො ඉති, පුබ්බස්මාමාදිතො යන සූත්‍රයෙන්; සබ්බස්‍යාදි ලොපොව, සියලුස්‍යාදිහට ලොප්මවේ; උපගුරු, උපගුරුයනුද; එවං, මෙසේමැයි; වෙති, වායනු; සබ්බත්ථ, හැමතන්හි; වත්තතෙ, වැටේ.

අමාදි යනු අමාදිසමාසවිධානසූත්‍රයි; අමාදි යනු ප්‍රථමෙකවචනාන්තපදය, අමාදිස්‍යාද්‍යන්තං, අමාදිවූස්‍යාද්‍යන්තතෙම; ස්‍යාද්‍යන්තෙනසහ, ස්‍යාද්‍යන්තයාහා එක්ව; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; එකත්ථංහොති, සමාසවේ; ගාමං, ගමට; ගතො, ගියේ; ගාමගතො, ගාමගතනම්වේ; මුහුත්තං, ඇසිල්ලෙක්හිවූ; සුඛං, සැපයතෙම; මුහුත්තසුඛං, මුහුත්තසුඛනම්වේ; උපපදසමාසෙ, උපපදසමාසයෙහි; වුත්තියෙව, සමාසමවෙ; කුම්භකාරො යනුවේ; කුම්භං, ඝටය; කරොතීති, කෙරේනුයි; කුම්භකාරො, කුම්භකාරනම්වේ; එත්ථ, මේ කුම්භකාරො යනතන්හි; බහුලාධිකාරා, බහුලාධිකාරය හෙතුකොටගෙන; අස්‍යාද්‍යන්තෙනාපි, අස්‍යාද්‍යන්තවූකාරශබ්දයාහාද; සමාසො, විතීයා අමාදිසමාසවේ; න්තමානක්තවන්තූහි, න්තමානක්තවන්තූ ප්‍රත්‍යයන්හා;

නො, ඔදනං භුත්තවා, රඤ්ඤා හතො රාජහතො, අසිනා ඡින්නො අසිච්ඡින්නො, පිතරාසදිසො පිතුසදිසො, දධිනා උපසිත්තං භොජනං දධිභොජනං, ගුළෙන මිස්සො ඔදනො ගුළොදනො—ඉහ පන වුත්තිපදෙනෙවොපසිත්තාදි ක්‍රියාඛ්‍යාපනතො න තදත්ථායුත්ත ත්ථතා—ක්වචිවුත්තියෙව—උරගො—ක්වචි වාක්‍යමෙව—ඵරසුනා ඡින්නවා, දස්සනෙන පහාතබ්බා, බ්‍රාහමණස්ස දෙය්‍යං බ්‍රාහමණදෙය්‍යං, සූපාය දාරු සූපදාරු, ඉධ නහොති සඞ්ඝස්ස දාතබ්බං—ගාමා නිග්ගතො ගාම නිග්ගතො, ක්වචි වුත්ති යෙව—කම්මජං—ඉධ න හොති රුක්ඛා පති තො—රඤ්ඤො පුරිසො රාජපුරිසො—බහුලාධිකාරා නත්වමානනිධාරිය

---

වාක්‍යමෙව, වාක්‍යමවේ; ධම්මංසුණන්තො, ධම්මංසුණමානොයනුවේ; ධම්මං, ධර්‍මය; සුණන්තො, අසන්නේයි; ධම්මං, ධර්‍මය; සුණමානො; අසන්නේයි; ඔදනං බත, භුත්තවා, අනුභවකෙළේයි; රඤ්ඤා, රජහු විසින්; හතො, නසනලද්දේ; රාජහතො, රාජහතනම්වේ; අසිනා, ඛඩ්ගයකරණකොටගෙන; ඡින්නො, කපනලද්දේ; අසිච්ඡින්නො, අසිච්ඡින්නනම්වේ; පිතරා, පියාහා, සදිසො, සදෘශවූයේ; පිතුසදිසො, පිතුසදිසනම්වේ; දධිනා, දියෙන්, උපසිත්තං, මිශ්‍රකරණලද; භොජනං, භොජනයතෙම; දධිභොජනං, දධිභොජන නම්වේ; ගුළෙන, උක්සකුරෙන්; මිස්සො, මිශ්‍රකරණලද; ඔදනො, බත; ගුළොදනො, ගුළොදනනම්වේ; ඉහපන, මෙහි වනාහි; වුත්තිපදෙනෙව, සමාසපදයෙන්ම; උපසිත්තාදික්‍රියාය, උපසිත්තාදික්‍රියාවගේ; ආඛ්‍යාපනතො; කථනයහෙතුකොටගෙන; අයුත්තත්ථතා, අයුක්තාර්ථබවෙක්; නත්ථි, නැති; ක්වචි, කිසිතැනෙක්හි; වුත්තියෙව, සමාසම වේ; උරගොයනුවේ; උරෙන, ලයකරණකොටගෙන; ගච්ඡතීති, යේනුයි; උරගො, උරගනම්වේ; ක්වචි, කිසිතැනෙක්හි; වාක්‍යමෙව, වාක්‍යමවේ; ඵරසුනා ඡින්නවා යනුවේ; ඵරසුනා, පරසුවකරණකොටගෙන; ඡින්නවා, කැපුයේයි; දස්සනෙන, ප්‍රථමමාර්ගයෙන්; පහාතබ්බා, ප්‍රහාතව්‍යයෝයි; බ්‍රාහමණස්ස, බ්‍රාහමණයහට; දෙය්‍යං, දියයුත්ත; බ්‍රාහමණදෙය්‍යං, බ්‍රාහමණදෙය්‍යනමවේ; සූපාය, යාගසඞ්ඛ්‍යපිණ්ඩස ගෙනඑනලද; දාරු, දූවය; සූපදාරු, සූපදාරුනම්වේ; සංඝස්සදාතබ්බං, සඞ්ඝස්සදාතබ්බංයන; ඉධ, මෙහි; නහොති, (චතුර්ථීසමාස) නොවේ; ගාමා, ගම්න්; නිග්ගතො, නික්මුනේ; ගාමනිග්ගතො, ගාමනිග්ගතනම්වේ; ක්වචි, කිසිතැනෙක්හි; වුත්තියෙව, සමාසම්වේ; කම්මජංයනුවේ; කම්මුනා; කර්මයෙන්; ජාතං, උපන්නේ; කම්මජං, කර්මජනම්වේ; රුක්ඛාපතිතො, රුක්ඛාපතිතො යන; ඉධ, මෙහි; නහොති, පඤ්චමීසමාසනොවේ; රඤ්ඤො, රජහුගේ; පුරිසො,

පූරණ භාවතිත්තත්ථෙහිනහොති—මමානුකුබ්බං, මමානුකුරුමානො
ගුන්නං කණ්හා සම්පන්නඛීරතමා, සිස්සානං පඤ්චමො, පටස්ස සුක්ක
තා–කිඤ්චි හොතෙව–වත්තමානසාමීප්‍යං. ඵලානං තිත්තො. ඵලානං
සුහිතො, බ්‍රාහ්මණස්ස කණ්හා දන්තා ඉච්චත්‍ර දන්තාපෙක්ඛා ඡට්ඨී
කණ්හෙන සම්බන්ධාභාවා න සමාසො– අඤ්ඤමඤ්ඤසම්බන්ධානං හි
සමාසො-යදාතු කණ්හා ච තෙ දන්තා චෙති විසෙසනසමාසො තදා
ඡට්ඨී කණ්හදන්තාපෙක්ඛාති බ්‍රාහ්මණකණ්හදන්තාති හොතෙව—
රඤ්ඤො, මාගධස්ස ධනමිච්චත්‍ර රඤ්ඤොති ඡට්ඨී ධනමපෙක්ඛතෙ න
මාගධං රාජා එව මාගධසද්දෙන වුච්චතෙති භෙදාභාවා සම්බන්ධාභා
වොති තුල්‍යාධිකරණෙන මාගධෙන සහ රාජා න සමස්‍යතෙ—

---

පුරුෂතෙම; රාජපුරිසො, රාජපුරිස නම්වේ; බහුලාධිකාරා, බහුලාධි
කාරය හෙතුකොටගෙන; තත, තතප්‍රත්‍යය; මාන, මානප්‍රත්‍යය;
නිද්ධාරිය, නිද්ධාරියමානය; පූරණ, පූරණාර්ථය; භාව, භාවප්‍රත්‍යය;
තිත්තත්ථෙහි, තෘප්ත්‍යර්ථය යන මොවුන්හා; නහොති, ෂෂ්ඨීආදි
සමාසනොවේ; මම, මට; අනුකුබ්බං, අනුක්‍රියාකරන්නේයි; මම, මට;
අනුකුරුමානො; අනුක්‍රියාකරන්නේයි; ගුන්නං, ධෙනූන් අතුරෙන්;
කණ්හා, කෘෂ්ණධෙනුතොම; සම්පන්නඛීරතමා, අතිශයෙන් මධුරවූ
කිරිඇත්තීයි; සිස්සානං, ශිෂ්‍යයන් සම්බන්ධීව; පඤ්චමො, පස්වැනි
තැනැත්තේයි; පටස්ස, වස්ත්‍රයාගේ; සුක්කතා, ධවලබවයි; කිඤ්චි,
කිසිතැනෙක්හි; හොතෙව, (බහුලාධිකාරයහෙතුකොටගෙන භාව
ප්‍රත්‍යයහා ද) ෂෂ්ඨීසමාසවේමැයි; වත්තමානසාමීප්‍යංයනුවේ, වත්ත
මානස්ස, වර්තමානකාලයට; සාමීප්‍යං, ආසන්නවූයේ; වත්තමානසා
මීප්‍යං, වත්තමානසාමීප්‍ය නම්වේ; ඵලානං, ඵලයන් සම්බන්ධව;
තිත්තො, තෘප්තයි; ඵලානං, ඵලයන්සම්බන්ධව; සුහිතො, පිරිණී;
බ්‍රාහ්මණස්ස කණ්හාදන්තා ඉති, බ්‍රාහ්මණස්සකණ්හා දන්තා යන;
අත්‍ර, මෙහි; ඡට්ඨී, (බ්‍රාහ්මණස්ස යන) ෂෂ්ඨීතොම; දන්තාපෙක්ඛාති,
දන්තයන් අපෙක්ෂාකෙරේනුයි; කණ්හෙන, කණ්හශබ්දයාහා; සම්බ
න්ධාභාවා, සම්බන්ධයක් නැතිහෙයින්; න සමාසො, ෂෂ්ඨීසමාසනො
වේ; හි, එසේමැයි; සමාසො, සමාසනම්; අඤ්ඤමඤ්ඤ සම්බන්ධානං,
අන්‍යොන්‍යසම්බන්ධඇති ශබ්දයන්ගේයි; යදාතු, යම්කලෙක්හිවනාහි;
කණ්හාච තෙ දන්තාචෙති, කණ්හාච තෙ දන්තාච කියා; විසෙසන
සමාසො, විශෙෂණ සමාසවේද; තදා, එකල්හි; ඡට්ඨී, (බ්‍රාහ්මණස්සයන)
ෂෂ්ඨීතොම; කණ්හදන්තාපෙක්ඛාති, කණ්හදන්තායන සමාසපදය
අපෙක්ෂාකෙරේනුයි; බ්‍රාහ්මණකණ්හදන්තාති, බ්‍රාහ්මණකණ්හදන්තා
කියා; හොතෙව, (ෂෂ්ඨීසමාස) වේමැයි; රඤ්ඤොමාගධස්ස ධනං
ඉති, රඤ්ඤො මාගධස්සධනං යන; අත්‍ර, මෙහි; රඤ්ඤොති, රඤ්ඤො,

රඤ්ඤො අස්සො ච පුරිසො චාති එත්ථ රඤ්ඤො අස්සො රඤ්ඤො පුරිසොති ච පච්චෙකං සම්බන්ධතො සාපෙක්ඛතාය න සමාසො— අස්සො ච පුරිසො චාති චත්ථසමාසෙ කතෙ තු රාජස්සපුරිසාති හොතෙවඤ්ඤානපෙක්ඛත්තා—රඤ්ඤො ගරුපුත්තොති එත්ථ පන රාජාපෙක්ඛිනොපි ගරුනො පුත්තෙන සහ සමාසො ගමකත්තා—ගමකත්තම්පිහි සමාසස්ස නිබන්ධනං—දන්තෙ සොණ්ඩො දන්තසොණ්ඩො-ක්වචි වුත්තියෙව පබ්බතට්ඨො-ක්වචි සමාසෙපි විභත්ත්‍යලොපො-ජනෙසුතො.

---

යන; ෂෂ්ඨී, ෂෂ්ඨීතොම; ධනං, ධනය; අපෙක්ඛතෙ, අපෙක්ෂාකෙරෙයි; න මාගධං, මාගධශබ්දය අපෙක්ෂා නොකෙරෙයි; රාජාඑව, රජම; මාගධසද්දෙන, මාගධශබ්දයෙන්; වුච්චතෙති, කියනු ලැබේනුයි; භෙදාභාවා, භෙදයක්නැතිහෙයින්; හෙවත් රාජමාගධ දෙදෙනාගේ වෙනසක් නැතිහෙයින්; සම්බන්ධාභාවොති, සම්බන්ධයාගේ නොවීම නුයි; තුල්‍යාධිකරණෙන, සමානාධිකරණවූ; මාගධෙනසහ, මාගධශබ්දයාහා එක්ව; රාජා, රාජශබ්දයතෙම; නසම්භවතෙ, සමාසනොකරණුලැබේ; රඤ්ඤො අස්සොච පුරිසොචාති, රඤ්ඤො අස්සොච පුරිසොච යන; එත්ථ, මෙහි; රඤ්ඤො, රජහුගේ; අස්සොතිච, අශ්වයයි කියාද; රඤ්ඤො පුරිසොතිච, රජහුගේ පුරුෂයයි කියාද; පච්චෙකං, වෙනවෙනම; සම්බන්ධතො, සම්බන්ධහෙයින්; සාපෙක්ඛතාය, අපෙක්ෂාසහිතබැවින්; නසමාසො, ෂෂ්ඨීසමාසනොවේ; අස්සොච පුරිසොචාති, අස්සොච පුරිසොචකියා; චත්ථසමාසෙ කතෙතු, චාර්ථසමාසකළකල්හිවනාහි; රාජස්සපුරිසාති, රාජස්සපුරිසායීකියා; හොතෙව, (ෂෂ්ඨීසමාස) වේමැයි; කුමක්හෙයින්දයත්? අඤ්ඤානපෙක්ඛත්තා, අනිකක්හු අපෙක්ෂා නොකරණ හෙයිනි; රඤ්ඤො ගරුපුත්තොති, රඤ්ඤො ගරුපුත්තොයන; එත්ථපන, මෙහි වනාහි; රාජාපෙක්ඛිනොපි, රජහු අපෙක්ෂාකරන්නාවූ; ගරුනො, ගුරුහුගේ; පුත්තෙන සහ, පුත්තශබ්දයාහාඑක්ව; සමාසො, සමාසයතෙම; ගමකත්තා, ගමකභාවහෙයිනි; ගමකත්තම්පිහි, ගමකත්වයද; හෙවත් අර්ථප්‍රතීතියද; සමාසස්ස, සමාසයහට; නිබන්ධනං, කාරණයි; දන්තෙ, දත්දි මෙහි; සොණ්ඩො, ලොල්වූයේ; දන්තසොණ්ඩො, දන්තසොණ්ඩනම් වේ; ක්වචි, කිසිතැනෙක්හි; වුත්තියෙව, සමාසමවේ; පබ්බතට්ඨො යනුවේ; පබ්බතෙ, පර්වතයෙහි; තිට්ඨතීති, සිටීනුයි; පබ්බතට්ඨො, පබ්බතට්ඨනම්වේ; ක්වචි, කිසිතැනෙක්හි; සමාසෙපි, සමාසවිෂයෙහිදු; විභත්ත්‍යලොපො, විභක්තිලොප්නොවේ; ජනෙසුතො යනුවේ; ජනෙ, ජනයාකෙරෙහි; සුතො, ප්‍රසිද්ධයි.

**විසෙසනමෙකත්ථෙන.**

විසෙසනං ස්‍යාද්‍යන්තං විසෙස්සෙන ස්‍යාද්‍යන්තෙන සමානාධිකරණෙන සහෙකත්ථං හොති—නීලං ච තං උප්පලං චෙති නීලුප්පලං—වාක්‍යෙ තුල්‍යාධිකරණභාවප්පකාසනත්ථං චසද්දප්පයොගො—වුත්තියන්තු සමාසෙනෙව තප්පකාසනතො න තප්පයොගො—එවමඤ්ඤත්‍රාපි වුත්තත්ථානමප්පයොගො—බහුලාධිකාරා ක්වචි උපමානභූතං විසෙසනම්පරං භවති—සීහො'ව සීහො—මුනි ච සො සීහො චාති මුනිසීහො—මුනිසද්දොයෙව වා විසෙසනං—තථා හි—සීහොති වුත්තෙ උපචරිතානුපචරිතසීහානං සාමඤ්ඤප්පතීතියං මුනිසද්දො විසෙසෙති—සීලමෙව ධනං සීලධනං—ධම්මොති සම්මතො ධම්මසම්මතො—මහන්තී ච සා සද්ධා චාති සමාසෙ කතෙ—"ඉත්ථියම්භාසිතපුමිත්ථි පුමෙවෙකත්ථෙ"ති පුම්භාවා ඊප්පච්චයාභාවො—"ටන්තන්තූනන්ති"න්තස්ස ටෙ—"බ්‍යඤ්ජනෙ දීඝරස්සා"ති දීඝෙ—මහාසද්ධා.

---

විසෙසනමෙකත්ථෙන යනු විශෙෂණ සමාසවිධානසූත්‍රයි; විසෙසනං යනු ප්‍රථමෛකවචනාන්තපදය, එකත්ථෙන යනු තෘතීයෛකවචනාන්තපදයි; විසෙසනං ස්‍යාද්‍යන්තං විශෙෂණවාචිවූ ස්‍යාද්‍යන්තනෙම; සමානාධිකරණෙන, සමානවූ අර්ථඇති; විසෙස්සෙන ස්‍යාද්‍යන්තෙන සහ, විශෙෂ්‍යවාචිවූ ස්‍යාද්‍යන්තයාහා එක්ව; එකත්ථං හොති, සමාසවේ; නීලඤ්ච, නිල්වූයේද; තං, හෙම; උප්පලඤ්ච, උපුල්වූයේද; තංඉති, හෙම්නුයි; නීලුප්පලං, නීලුප්පලනම්වේ; වාක්‍යෙ, විග්‍රහවාක්‍යයෙහි; තුල්‍යාධිකරණ භාවප්පකාසනත්ථං, පදයන්ගේ සමානාධිකරණබව; ප්‍රකාශකරණු පිණිස; චසද්දප්පයොගො, චශබ්දනශබ්දයන්ගේ ප්‍රයොගයවේ; වුත්තියන්තු, සමාසපදයෙහි වනාහි; සමාසෙනෙව, සමාසපදයෙන්ම; තප්පකාසනතො, පදයන්ගේ ඒ සමානාධිකරණබව ප්‍රකාශකරණ හෙයින්; නතප්පයොගො, ඒචශබ්දනශබ්දයන්ගේම ප්‍රයොගය නොවේ; අඤ්ඤත්‍රාපි, මෙයින් පිටත් සෙසු තන්හිදු; වුත්තත්ථානං, උක්තාර්ථඇති පදයන්ගේ; අප්පයොගො, අප්‍රයොගයද; එවං, මෙසේමැයි; බහුලාධිකාරා, බහුලාධිකාරයහෙතුකොට ගෙන; ක්වචි, කිසිතැනෙක්හි; උපමානභූතං, උපමානවූ; විසෙසනං, විශෙෂණය; පරම්භවති, පරවවේ; සීහොව, සිංහයකු වැනිනුයි; සීහො, සීහනම්වේ; මුනිච, මුනිවූයේද; සො, හෙමය; සීහොච, සිංහවූයේද; සොඉති, හෙතෙමනුයි; මුනිසීහො, මුනිසීහනම්වේ; මුනිසද්දොයෙවවා; මුනිශබ්දයමහෝ; විසෙසනං, විශෙෂණයි; තථාහි, ඒඑසේමැයි; සීහොතිවුත්තෙ, සිංහයයි කීකල්හි; උපචරිතානුපචරිත සීහානං, උපචරිත අනුපචරිත සිංහයන්ගේ; සාමඤ්ඤප්පතීතියං, සාමාන්‍යයෙන් ප්‍රතීතියක් ඇතිකල්හි; මුනිසද්දොයෙව, මුනිශබ්දයම;

**නඤ්**

නඤිච්චෙතං ස්‍යාද්‍යන්තං ස්‍යාද්‍යන්තෙන සහෙකත්‍ථං හොති-ඤකාරො "ට නඤ්ඤස්සා" ති විසෙසනත්‍ථො-පාමනපුත්තාදිසුමාහොතූති.

**ටනඤ්ඤස්ස.**

උත්තරපදෙ නඤ්සද්දස්ස ට හොති–න බ්‍රාහ්මණො අබ්‍රාහ්මණො, නඤායං පරියුදසවුත්ති පසජ්ජප්පටිසෙධ වුත්ති ච-පඨමපක්ඛෙ-බ්‍රාහ්මණා අඤ්ඤො, බ්‍රාහ්මණමත්තා නඤ්ඤාසිතො ඛත්තියාදි බ්‍රාහ්මණ

---

විසෙසෙති, වෙසෙසා; සීලමෙව, සීලයම; ධනං, ධනවූයේ; සීලධනං සීලධනනම්වේ; ධම්මොති, ධර්මයයි, සම්මතො, දන්නාලද්දේ; ධම්ම සම්මතො, ධම්මසම්මතනම්වේ; මහන්තීච සා සද්ධාචෙති, මහන්තීච සා සද්ධාචයි කියා; සමාසෙ කතෙ, විශෙෂණසමාසකළකල්හි; ඉත්‍ථියම්භාසිතපුමිත්‍ථීපුමෙවෙකත්‍ථෙ ඉති, ඉත්‍ථියම්භාසිත් පුමිත්‍ථි පුමෙවෙකත්‍ථෙයන සූත්‍රයෙන්; පුම්භාවො, පුංවත්කිරීම හෙතුකොටගෙන; ඊප්පච්චයාභාවො, ඊප්‍රත්‍යයාගේ නොවීම්වේ; ටන්තන්තූනං ඉති, ටන්තන්තූනං යන සූත්‍රයෙන්, න්තුස්ස, න්තුප්‍රත්‍යයහට; ටෙ, ටකාරා දෙශකළකල්හි; ව්‍යඤ්ජනෙදීඝරස්සා ඉති, ව්‍යඤ්ජනෙ දීඝරස්සායන සූත්‍රයෙන්; දීඝෙ, දීර්ඝකළකල්හි; මහාසද්ධායනුවේ.

නඤ් යනු නඤ්සමාසවිධාන සූත්‍රයි; නඤ් යනු ලුප්ත ප්‍රථමෙක වචනාන්ත නිපාතපදයි; නඤ් ඉති, නඤ්යන; එතං ස්‍යාද්‍යන්තං, මේ ස්‍යාද්‍යන්තතෙම; ස්‍යාද්‍යන්තෙන සහ, ස්‍යාද්‍යන්තයා හා එක්ව; එකත්‍ථංහොති, සමාසවේ; ඤකාරො, ඤකාරතෙම; ටනඤ්ඤස්සඉති, ටනඤ්ඤස්ස යන සූත්‍රයෙහි; විසෙසනත්‍ථො, විශෙෂණාර්ථය ප්‍රයොජනකොටඇත්තේයි; පාමනපුත්තාදිසු, පාමනපුත්‍රනායනාදි තන්හි; මාහොතූති, කෙවලනකාරයහට ටකාරාදෙශ නහමක්වේවයි කියායි.

ටනඤ්ඤස්ස යනු ටකාරාදෙශවිධාන සූත්‍රයි; ටයනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදය, නඤ්ඤස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදයි; උත්තරපදෙ, උත්තරපදයාපරකල්හි; නඤ්සද්දස්ස, නඤ්ශබ්දයහට; ටහොති, ටකාරාදෙශවේ; නබ්‍රාහ්මණො, බ්‍රාහ්මණ සදෘශවූයේ; අබ්‍රාහ්මණො, අබ්‍රාහ්මණ නම්වේ; අයං, නඤ්, මේනඤ්ශබ්දයතෙම; පරියුදසවුත්ති, පර්‍ය්‍යුදාසපක්ෂයෙහි පැවතුම්ඇත්තේවෙයි; පසජ්ජපටිසෙධවුත්තිච, ප්‍රසජ්‍යප්‍රතිෂෙධ පක්ෂයෙහි ප්‍රවෘත්තීඇත්තේදවේ; පඨමපක්ඛෙ, පළමුවෙනිවූ පර්‍ය්‍යුදාස පක්ෂයෙහි; බ්‍රාහ්මණා අඤ්ඤො, බ්‍රාහ්මණයාකෙරෙන්අන්‍යවූ; බ්‍රාහ්මණමත්තානඤ්ඤාසිතො, බ්‍රාහ්මණ ධර්මයෙහි නොපිහිටියාවූ; ඛත්තියාදි බ්‍රාහ්මණසදිසොයෙව, ක්ෂත්‍රියාදිවූ

සදිසො යෙව අබ්‍රාහ්මණොති වුත්තෙ පතීයතෙ-ඉතරස්මිං පන පක්ඛෙ කෙනචි සංසයනිමිත්තෙන ඛත්තියාදෙ බ්‍රාහ්මණොති පවත්තස්ස මිච්ඡාඤාණනිවුත්ති කරීයති-බ්‍රාහ්මණොයං න භවති අබ්‍රාහ්මණොති බ්‍රාහ්මණමත්තජ්ඣාසිතො නභවතීති අත්ථො-තත්ථ විනාසදිසත්තං මිච්ඡාඤාණාසම්භවා පයොගසාමඤ්ඤා ච සදිසපටිපත්ති තග්ගතා ච ලිඞ්ගසඞ්ඛ්‍යා භවන්ති-අතොයෙවොච්චතෙ නඤිවයුත්තමඤ්ඤසදිසාධිකරණෙ තථා හි අත්ථසම්පච්චයොති-තදෙවං පක්ඛද්වයෙපි පුබ්බපදත්ථප්පධානත්තං-එවමනයෙසො-ඉහතු.

**අන් සරෙ.**

සරාදෙ උත්තරපදෙ නඤ්සද්දස්ස අන්හොතීති නස්ස අන්.

---

බ්‍රාහ්මණසදෘශයෙක්ම; අබ්‍රාහ්මණොති වුත්තෙ, අබ්‍රාහ්මණයයිකීකල්හි; පතීයතෙ, දත්නාලැබේ; ඉතරස්මිං පන පක්ඛෙ, අන්‍යවූ ප්‍රසජ්‍යප්‍රතිෂෙධපක්ෂයෙහි වනාහි; කෙනචි සංසයනිමිත්තෙන, (ශිඛායඥොපවීතාදිවූ) යම් කිසිශංසයකාරණයෙකින්; ඛත්තියාදෙ, ක්ෂත්‍රියාදීහු කෙරෙහි; බ්‍රාහ්මණොති පවත්තස්ස, බ්‍රාහ්මණයයි පැවතුම් ඇත්තාහුගේ; මිච්ඡාඤාණනිවුත්ති, මිථ්‍යාඥානයාගේ නිවෘත්තිතොම; කරීයති, කරණුලැබේ; අයං, මේතෙම; බ්‍රාහ්මණො න භවති, බ්‍රාහ්මණයෙක් නොවෙයි; අබ්‍රාහ්මණොති, අබ්‍රාහ්මණයයිකියයි; බ්‍රාහ්මණමත්තජ්ඣාසිතො නභවතීති, බ්‍රාහ්මණධර්මයෙහි නොපිහිටනලද්දේයයත; අත්ථො, අර්ථයි; තත්ථ, ඒ මේදෙපක්ෂයෙහිම; සදිසත්තං විනා, සදෘශත්වයක් නැතිව; මිච්ඡාඤාණාසම්භවා, මිථ්‍යාඥානයාගේ සම්භවයක් නැතිහෙයින්ද; පයොගසාමඤ්ඤාච, ප්‍රයොගසාමාන්‍යයෙන්ද; සදිස පටිපත්ති, සදෘශයාගේපරිඥානයද; තග්ගතා, ඒබ්‍රාහ්මණගතවූ; ලිඞ්ගසඞ්ඛ්‍යාච භවන්ති, ලිඞ්ගසඞ්ඛ්‍යාවෝදවෙත්; අතොයෙව, එයින්ම; නඤිවයුත්තං, නඤ්යුක්තයාහා ඉවයුක්තයා; අඤ්ඤසදිසාධිකරණෙ, අන්‍යවූ සදෘශයක්හුගේ අර්ථයෙහි; වුච්චතෙ, කියනුලැබේ; අත්ථසම්පච්චයො, අර්ථයාගේ පරිඥානයද; හෙවත් දැනගැන්මද; තථාහි, එසේමැයි; තදෙවංපක්ඛද්වයෙපි, පර්‍යුදාස ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධපක්ෂය යන ඒ මේදෙපක්ෂයෙහිම; පුබ්බපදත්ථප්පධානත්තං, පූර්වපදයාගේ අර්ථප්‍රාධාන්‍යයවේ; අනයෙසො, අනයෙසෑ යනුද; එවං, මෙසේමැයි; ඉහතු, මෙහිවනාති.

අන්සරෙ යනු අන්යනාදෙශ විධානසූත්‍රයි; අන් යනු ප්‍රථමෛක වචනාන්තපදය, සරෙයනු සප්තම්‍යෙක වචනාන්තපදයි; සරාදෙ උත්තරපදෙ, ස්වරාදිවූ උත්තරපදයා පරකල්හි; නඤ්සද්දස්ස, නඤ් ශබ්දයහට; අංහොතීති, අංයනාදෙශවේනුයි; නස්ස, නකාරයහට; අංහොති, අංයනාදෙශවේ.

**කුපාදයො නිච්චමස්‍යාදිවිධිම්හි.**

කුසද්දො පාදයො ච ස්‍යාද්‍යන්තෙන සහෙකත්ථා හොන්ති නිච්චං ස්‍යාදිවිධිවිසයතො'ඤ්ඤත්ථ — කුච්ඡිතො බ්‍රාහ්මණො කුබ්‍රාහ්මණො — එවංකුපුරිසො — "පුරිසෙ වා" ති පක්ඛෙ කාදෙසෙ – කාපුරිසො - ඊසකං උණ්හං කදුණ්හං — "සරෙ කද් කුස්සුත්තරත්ථෙ" ති කුස්ස කද්දෙසො - අප්පකං ලවණං කාලවණං — "කාප්පත්ථෙ" ති කාදෙසො.

**පාදයො ගතාද්‍යත්ථෙ පඨමාය.**

පගතො ආචරියො පාචරියො — එවං පන්තෙවාසී — සුට්ඨු කතං සුකතං — කිච්ඡෙන කතං දුක්කතං.

---

කුපාදයො නිච්චමස්‍යාදිවිධිම්හි යනු කුපාදිසමාස විධානසූත්‍රයි; කුපාදයො යනු ප්‍රථමාබහුවචනාන්තපදය; නිච්චං යනු ප්‍රථමෛකවචනාන්තපදය, අස්‍යාදි විධිම්හි යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; කුසද්දො, කුශබ්දයද; පාදයොච, පාදිහුද; ස්‍යාදිවිධිවිසයතොඤ්ඤත්ථ, (ලක්ඛණිත්ථම්භූතවීච්ඡාස්වභිනා යනාදීන් දක්වනලද) ස්‍යාදි විධිවිෂයෙන් පිටත්තන්හි; ස්‍යාද්‍යන්තෙන සහ, ස්‍යාද්‍යන්තයාහා එක්ව; නිච්චං, අවිකල්පයෙන්; එකත්ථං හොන්ති, සමාසවෙත්; කුච්ඡිතො, නින්දිතවූ; බ්‍රාහ්මණො, බ්‍රාහ්මණතෙම; කුබ්‍රාහ්මණ නම්වේ; කුපුරිසො යනුද; එවං, මෙසේමැයි; පුරිසෙවා ඉති, පුරිසෙවා යන සූත්‍රයෙන්; පක්ඛෙ, එක්පක්ෂයෙක්හි; කාදෙසෙ, කා යනාදෙශ කළකල්හි; කාපුරිසො යනුවේ; ඊසකං, මඳක්වූ; උණ්හං, උණ්හයතෙම; කදුණ්හං, කදුණ්හ නම්වේ; සරෙ කද්කුස්සුත්තරත්ථෙති, සරෙ කද්කුස්සුත්තරත්ථෙ යන සූත්‍රයෙන්; කුස්ස, කුශබ්දයහට; කද්දෙසො, කද් යනාදෙශවේ; අප්පකං, ස්වල්පවූ; ලවණං, ලවණයතෙම; කාලවණං, කාලවණ නම්වේ; කාප්පත්ථෙති, කාප්පත්ථෙ යන සූත්‍රයෙන්; කාදෙසො, කා යනාදෙශවේ.

පාදයොගතාද්‍යත්ථෙ පඨමාය යනු ගණසූත්‍රයි; පාදයො යනු ප්‍රථමාබහුවචනාන්තපදය, ගතාද්‍යත්ථෙ යනු සප්තමි එකවචනාන්තපදය, පඨමාය යනු සහාර්ථයෙහි තෘතීයෛක වචනාන්තපදයි; පාදයො, ප්‍රාදිහු; ගතාද්‍යත්ථෙ, ගතාද්‍යර්ථයෙහි වැටෙන්නාහු; පඨමාය, ප්‍රථමා විභක්ත්‍යන්තයාහා එක්ව; (සමාසියනෙත, සමාසකරණු ලැබෙත්;) පගතො, ඉක්මගියාවූ; ආචරියො, ආචාර්‍ය්‍යතෙම; පාචරියො, පාචරිය නම්වේ; පන්තෙවාසී, පන්තෙවාසීයනුද; එවං, මෙසේමැයි; පගතො, ඉක්මගියාවූ; අන්තෙවාසී, අතවැසිතෙම; පන්තෙවාසී, පන්තෙවාසී නම්වේ; සුට්ඨු, මොනවට; කතං, කරණලද්දේ; සුකතං, සුකත නම්වේ; කිච්ඡෙන, දුකින්; කතං, කරණලද්දේ; දුක්කතං, දුක්කත නම්වේ.

**අච්චාදයො කන්තාද්‍යත්ථෙ දුතියාය.**

අතික්කන්තො මාලමතිමාලො.

**ඝපස්සාන්තස්සාප්පධානස්ස.**

අන්තභූතස්සාප්පධානස්ස ඝපස්ස ස්‍යාදිසු රස්සො හොතීති රස්සො.

**අවාදයො කුඨාද්‍යත්ථෙ තතියාය.**

අවකුඨං කොකිලාය වනමවකොකිලං-අවකුඨන්ති පරිච්චත්තං

**පරියාදයො ගිලානාද්‍යත්ථෙ චතුත්ථියා.**

පරිගිලානො 'ජ්ඣෙනාය පරියජ්ඣෙනො.

---

අච්චාදයො කන්තාද්‍යත්ථෙ දුතියාය, යනු ගණසූත්‍රයි; අච්චාදයො යනු ප්‍රථමාබහුවචනාන්තපදය; කන්තාද්‍යත්ථෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය; දුතියාය යනු තෘතීයෛක වචනාන්තපදයි; කන්තාද්‍යත්ථෙ, ක්‍රාන්තාද්‍යර්ථයෙහි වැටෙන්නාවූ; අච්චාදයො, අතිශබ්දාදිහු; දුතියාය, ද්විතීයාවිභක්ත්‍යන්තයාහා එක්ව (සමාසකරණුලැබෙත්;) මාලං, මාලාව; අතික්කන්තො, ඉක්මුනේ; අතිමාලො, අතිමාලනම්වේ

ඝපස්සාන්තස්සාප්පධානස්ස යනු හ්‍රස්වවිධානසූත්‍රයි; ඝපස්සයනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය, අන්තස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත පදය; අප්පධානස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදයි; ස්‍යාදිසු, ස්‍යාදි විභක්තින් පරකල්හි; අන්තභූතස්ස, සමාසාන්තවූ; අප්පධානස්ස, (අන්‍යපදාර්ථවෘත්තිහෙයින්) අප්‍රධානවූ; ඝපස්ස, ඝපසංඥනාමයහට; රස්සොහොතීති, හ්‍රස්වවේනුයි; රස්සො, හ්‍රස්වවේ.

අවාදයො කුඨාද්‍යත්ථෙ තතියාය යනු ගණසූත්‍රයි; අවාදයො යනු ප්‍රථමාබහුවචනාන්තපදය, කුඨාද්‍යත්ථෙ යනු සප්තම්‍යෙකවචනාන්ත පදය, තතියාය යනු තෘතීයෛක වචනාන්තපදයි; අවාදයො, අව ශබ්දාදිහු; කුඨාද්‍යත්ථෙ, කෘෂ්ටාද්‍යර්ථයෙහි වැටෙන්නාහු; තතියාය, තෘතීයා විභක්ත්‍යන්තයාහා එක්ව (සමාසකරණු ලැබෙත්;) කොකිලාය, කෙවිල්ල විසින්; අවකුඨං, හරණලද; වනං, වනයතෙම; අවකොකිලං, අවකොකිලනම්වේ; අවකුඨන්ති, අවකුඨනම්; පරිච්චත්තං, (කෙවිල්ලන් විසින්) හරණලද්දේයි.

පරියාදයො ගිලානාද්‍යත්ථෙ චතුත්ථියා යනු ගණ සූත්‍රයි; පරියාදයො යනු ප්‍රථමාබහුවචනාන්තපදය; ගිලානාද්‍යත්ථෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදය; චතුත්ථියා යනු තෘතීයෛක වචනාන්තපදයි; ගිලානාද්‍යත්ථෙ, ග්ලානාද්‍යර්ථයෙහි වැටෙන්නාවූ; පරියාදයො, පරි ශබ්දාදිහු; චතුත්ථියා, චතුර්ථී විභක්ත්‍යන්තයාහාඑක්ව, (සමාසකරණු ලැබෙත්;) අජ්ඣෙනාය, හැදෑරීමෙන්; පරිගිලානො, මිරිකුනේ; පරියජ්ඣෙනො, පරියජ්ඣෙන නම්වේ.

**න්‍යාදයො ක්‍තත්‍යාද්‍යත්ථෙ පඤ්චමියා.**

නික්ඛන්තො කොසම්බියා නික්කොසම්බි–ස්‍යාදිනා රස්සො.

**වා නෙකඤ්ඤත්ථෙ.**

අනෙකං ස්‍යාද්‍යන්ත මඤ්ඤස්ස පදස්සත්ථෙ එකත්ථං වා හොති–ඔතිණ්ණො හංසො යං සො ඔතිණ්ණහංසො–(ජලාසයො). ජිතො මාරො යෙන සො ජිතමාරො (භගවා)—ඡින්නොතරු යෙන සො ඡින්නතරු (ඵරසු) දින්නො සුඞ්කො යස්ස සො දින්නසුඞ්කො (රාජා)–අපගතං කාලකං යස්මා සො අපගතකාලකො (පටො) පහූතං ධනං යස්ස සො පහූතධනො–(පුරිසො)–නත්ථි සමො යස්ස සො අසමො—නස්ස ටාදෙසො–චිත්තා ගාවො යස්සාති සමාසෙ කතෙ.

---

න්‍යාදයො ක්‍තත්‍යාද්‍යත්ථෙ පඤ්චමියා යනු ගණසූත්‍රයි; න්‍යාදයො යනු ප්‍රථමා බහුවචනාන්තපදය; ක්‍තත්‍යාද්‍යත්ථෙ, යනු සප්තම්‍යෙක වචනාන්තපදය, පඤ්චමියා යනු තෘතීයෙකවචනාන්තපදයි; ක්‍තත්‍යාද්‍යත්ථෙ, ක්‍රාන්තාද්‍යර්ථයෙහි වැටෙන්නාවූ; න්‍යාදයො, නිශබ්දාදිහු; පඤ්චමියා, පඤ්චමීවිභක්ත්‍යන්තයාහා එක්ව; (සමාසීය න්නෙතා, සමාසකරණුලැබෙත්;) කොසම්බියා, කොසඹෑනුවරින්; නික්ඛන්තො, නික් මුනේ; නික්කොසම්බි, නික්කොසම්බිනම්වේ; ස්‍යාදිනා, ස්‍යාදිසූත්‍රයෙන්; රස්සො, හ්‍රස්වවේ.

වානෙකඤ්ඤත්ථෙයනු විකල්පයෙන් අන්‍යාර්ථසමාසවිධානසූත්‍රයි. වායනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදය, අනෙකංයනු ප්‍රථමෛකවචනාන්තපදය; අඤ්ඤත්ථෙ යනු සප්තම්‍යෙකවචනාන්ත පදයි, අනෙකං ස්‍යාද්‍යන්තං, නොයෙක් ස්‍යාද්‍යන්තතෙම; අඤ්ඤස්ස පදස්සත්ථෙ, අන්‍යපදයාගේ අර්ථයෙහි වැටෙන්නේ; වා, විකල්පයෙන්; එකත්ථංහොති, සමාසවේ; ඔතිණ්ණො, අවතීර්ණවූ හෙවත් බටුවාවූ; හංසො, හංසතෙම; යං, යම්තැනකටද; සො, හෙතෙම; ඔතිණ්ණහංසො; ඔතිණ්ණහංසනම්වේ; හේකවරේද? ජලාසයො, විලයි; ජිතො, දිනන ලද; මාරො, මාරතෙම; යෙන, යමක්හුවිසින්ද; සො, හෙතෙම; ජිත මාරො, ජිතමාරනම්වේ; හේකවරේද? භගවා, භාග්‍යවතී; ඡින්නො, කපනලද; තරු, වෘක්ෂයතෙම; යෙන, යමක්කරණකොට ගෙනද; සො, හෙතෙම, ඡින්නතරු; ඡින්නතරුනම්වේ; හේකවරේද? ඵරසු, ඵරසුවයි; දින්නො, දෙනලද; සුංකො, සුංවත්; යස්ස, යමක් හටද; සො, හෙතෙම; දින්නසුංකො, දින්නසුඞ්කනම්වේ; හේකව රේද? රාජා, රජයි; අපගතං, පහවූ; කාලකං, කෘෂ්ණවර්ණයතෙම; යස්මා, යමක්කෙරෙන්ද; සො, හෙතෙම; අපගතකාලකො, අපගත

**ගොස්සු.**

අන්තභූතස්සාප්පධානස්ස ගොස්ස ස්‍යාදිසු උ හොති—චිත්තගු—(ගොමා)-මත්තානෙකගජා යස්මිං තං මත්තානෙකගජං-(වනං) සහ පුත්තෙන වත්තමානො සපුත්තො සහ පුත්තො වා—"සහස්ස සො'ඤ්ඤත්ථෙ"ති පක්ඛෙ සහස්ස සො-ධවා ච ඛදිරා ච පලාසා චෙති විග්ගහෙ.

**චත්ථෙ.**

අනෙකං ස්‍යාද්‍යන්තං චත්ථෙ එකත්ථං වා භවති-සමුච්චයො'න්වාචයො ඉතරීතරයොගො සමාහාරො චෙති චත්තාරො චත්ථා-තත්ථ ඉතරී

---

කාලකනම්වේ; හේකවරේද? පටො, වස්ත්‍රයයි; පහූතං, බොහෝවූ; ධනං, ධනයතෙම; යස්ස, යමක්හටද; සො, හෙතෙම; පහූතධනො, පහූතධනනම්වේ; හේකවරේද? පුරිසො, පුරුෂයි; යස්ස, යමක්හට; සමො, සදෘශයෙක්; නත්ථි, නැද්ද; සො, හෙතෙම; අසමො, අසමනම්වේ; නස්ස, නකාරයහට; ටාදෙසො, ටකාරාදෙශවේ; චිත්තාගාවො යස්සාති, චිත්තාගාවො යස්සායිකියා; සමාසෙකන්තෙ, අන්‍යාර්ථ සමාසකළකල්හි.

ගොස්සු යනු උකාරාදෙශවිධානසූත්‍රයි; ගොස්සයනු ෂෂ්ඨ්‍යෙකවචනාන්ත අනුකරණපදය, උයනු ලුප්තප්‍රථමෛකවචනාන්තපදයි; ස්‍යාදිසු, ස්‍යාදිවිභක්තීන් පරකල්හි; අන්තභූතස්ස, සමාසාන්තවූ; අප්පධානස්ස, අප්‍රධානවූ; ගොස්ස, ගොශබ්දයහට; උහොති, උකාරාදෙශවේ; චිත්තගුයනුවේ; ගොමා, ගෙරින්ඇති තැනැත්තේයි; මත්ත මත්වූ; අනෙකා, නොයෙක්; ගජා, හස්තීහු; යස්මිං, යම්තෙනෙක්හිද? තං, ඒ; මත්තානෙකගජං, මත්තානෙකගජනම්වේ; හේකවරේද? වනං, වනයයි; පුත්තෙන සහ, පුත්‍රයාහා එක්ව; වත්තමානො, පවත්නේ; සපුත්තො, සපුත්තනම්වේ; සහපුත්තොවා, සහපුත්තෝ කියා හෝවේ; සහස්ස සොඤ්ඤත්ථෙඉති, සහස්ස සොඤ්ඤත්ථෙ යන සූත්‍රයෙන්; පක්ඛෙ, එක්පක්ෂයෙක්හි; සහස්ස, සහශබ්දයහට; සො, සකාරාදෙශවේ; ධවාච ඛදිරාච පලාසාචෙති, ධවාචඛදිරාච පලාසාච යන; විග්ගහෙ, වාක්‍යයෙහි.

චත්ථෙ යනු විකල්පයෙන් චාර්ථසමාසවිධානසූත්‍රයි; චත්ථෙ යනු සප්තම්‍යෙකවචනාන්තපදයි; අනෙකං ස්‍යාද්‍යන්තං, නොයෙක් ස්‍යාද්‍යන්තතෙම; චත්ථෙ, චශබ්දයාගේ අර්ථයෙහි; වා, විකල්පයෙන්; එකත්ථංහොති, සමාසවේ; සමුච්චයො, සමුච්චයද; අන්වාචයො, අන්වාචයද; ඉතරීතරයොගො, ඉතරීතරයොගයද; සමාහාරොචෙති, සමාහාරයදැයි කියා; චත්ථා, චශබ්දයාගේ අර්ථයෝ; චත්තාරො, සතරදෙනෙකි;

තරයොගෙ සමාහාරෙ ච එකත්ථීභාවො සම්භවති පදානං අඤ්ඤම
ඤ්ඤසම්බන්ධතො—න සමුච්චයෙ නාප්‍යන්වාචයෙ තදභාවතො, චසද්ද
නිවුත්තත්.

**සමාහාරෙ නපුංසකං.**

චත්ථෙ සමාහාරෙ යදෙකත්ථං තං නපුංසකලිඞ්ගං භවති-සමාහාර
ස්සෙකත්තා එකවචනමෙව—ධවඛදිරපලාසං—කත්ථචි න හොති
'සභාපරිසායා'ති ඤාපකා—ආධිපච්චපරිවාරො-ඉතරීතරයොගෙ අව
යවප්පධානත්තා බහුවචනං—ධවඛදිරපලාසා-සමාසෙ යං පුබ්බං වු
ත්තං තදෙව පුබ්බං නිපතති කමාතික්කමෙ පයොජනාභාවා-ක්වචි

---

තත්ථ, ඒ චතුර්විධවූ; වාක්‍යයන් අතුරෙන්; ඉතරීතරයොගෙ, ඉතරීතර
යොගයෙහිද; සමාහාරෙච, සමාහාරයෙහිද; එකත්ථීභාවො, එකාර්ථී
භාවයතෙම; සම්භවති, සම්භවවේ; කුමක්හෙයින්දයත්? පදානං, පද
යන්ගේ; අඤ්ඤමඤ්ඤ සම්බන්ධතො, අන්‍යොන්‍ය සම්බන්ධය ඇති හෙ
යිනි; සමුච්චයෙ, සමුච්චයෙහිද; න, සමාසසම්භවයනොවෙයි; අන්වා
චයෙ, අන්වාචයෙහිද; න, සමාස සම්භවයනොවෙ; කුමක්හෙයින්ද
යත්? තදභාවතො, පදයන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධය නැතිහෙයිනි;
චසද්දනිවුත්තං, චශබ්දයාගේ නිවෘත්තියයි.

සමාහාරෙ නපුංසකං යනු නපුංසක ලිඞ්ගවිධානසූත්‍රයි; සමාහා
රෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදය, නපුංසකං යනු ප්‍රථමෛක
වචනාන්තපදය; චත්ථෙ සමාහාරෙ, සමාහාරවාක්‍යයෙහි; යං එකත්ථං,
යම් සමාසයෙක් ඇද්ද; තං, ඒ, නපුංසකලිඞ්ගං භවති, නපුංසකලිඞ්ග
වේ; සමාහාරස්ස, සමාහාරසමාසයානමා; එකත්තා, එකක්බවහෙ
යින්; එකවචනමෙව, එකවචනමවේ; ධවඛදිරපලාසං යනුවේ;
ධවාච, දූවගස්ද; ඛදිරාච, කිහිරිගස්ද; පලාසාච, කැලගස්ද; ධවඛදිර
පලාසනම්වේ; සභාපරිසායාති, සභාපරිසායයන; ඤාපකා, සූත්‍රඥාප
කයහෙතුකොටගෙන; කත්ථචි, කිසිතැනෙක්හි; නහොති, නපුංසක
ලිඞ්ගනොවේ;—ආධිපච්චපරිවාරො යනුවේ; ආධිපච්චං, ආධිප්‍රත්‍යයද;
පරිවාරොච, පිරිවරසම්පත්තියද; ආධිපච්චපරිවාරො; ආධිපච්චපරි
වාරනම්වේ; ඉතරීතරයොගෙ, ඉතරීතරයොගයෙහි; අවයවප්පධාන
ත්තා, අවයවප්‍රධානහෙයින්; බහුවචනං, බහුවචනවේ; ධවඛදිරප
ලාසායනුවේ; සමාසෙ, සමාසවිෂයෙහි; යං, යම්පදයෙක්තෙම; පුබ්බං,
පළමුකොට; වුත්තං, කියනලද්ද; තදෙව, ඒ පදයම; පුබ්බං, පළමු
කොට; නිපතති, නිපාතනකරණුලැබේ; කුමක්හෙයින්දයත්? කමා
තික්කමෙ, ක්‍රමවිපර්‍ය්‍යාසකිරීමෙහි; පයොජනාභාවා, ප්‍රයොජනයක්
නැතිහෙයින්; ක්වචි, කිසිතැනෙක්හි; බහුලාධිකාරතො, බහුලාධි

විපල්ලාසොපි හොති බහුලාධිකාරතො—දන්තානං රාජරාජදන්තො—පාපා භූමි යස්මිං පාපා ච සා භූමි චෙති වා විගය්හ සමාසෙ සමාසන්තඉච්චාධිකාරො.

**පාපාදීහි භූමියා.**

පාපාදීහි පරා යා භූමි තස්සා සමාසන්තො අ හොති-පාපභූමං, (ඨානං)—ඉජ්ජියම්ච්චාදිනා ආප්පච්චයො නිවත්තතෙ—ජාතියා උපලක්ඛිතා භූමි ජාතිභූමං.

**සඞ්ඛ්‍යාහි.**

සඞ්ඛ්‍යාහි පරා යා භූමි තස්සා සමාසන්තො අහොති-වෙ භූමියො අස්සාති විභූමං-එවං, තිභූමං, චතුභූමං-බහුලාධිකාරා ක්වචි න හොති-චතුභූමි.

---

කාරයහෙතුකොටගෙන විපල්ලාසොපි හොති, (පූර්වපදයාගේ) විපයර්‍ය්‍යාසදවේ; දන්තානං රාජ රාජදන්තො යනුවේ; දන්තානං, දන්ත යන්ට; රාජා, රජවූයේ; රාජදන්තො, රාජදන්තනම්වේ; පාපාභූමි යස්මිං, පාපාභූමියස්මිං කියාහෝ; පාපා ච සා භූමිචෙති, පපාවසාභූමිව කියාහෝ; විගය්හ, වාක්‍යගෙන; සමාසෙ, අන්‍යාර්‍ථසමාසහෝ විශෙෂණ සමාසහෝ කලකල්හි; සමාසන්ත ඉති, සමාසන්තයනු; අධිකාරො මතු මතු සූත්‍රහා සම්බන්ධකරණුලැබේ.

පාපාදීහි භූමියා යනු සමාසාන්ත අප්‍රත්‍යය විධානසූත්‍රයි; පාපාදීහියනු පඤ්චමීබහුවචනාන්තපදය; භූමියායනුසප්තම්‍යෙකවචනාන්ත පදයි; පාපාදීහි, පාපාදීන්කෙරෙන්පරවූ; යාභූමි, යම් භූමියක්ඇද්ද; තස්සා, ඇට; සමාසන්තො, සමාසාන්තවූ; අහොති, අප්‍රත්‍යයවේ; පාපභූමං, පාපභූමනම්වේ; හේකවරේද? ඨානං, ස්ථානයයි; ඉජ්ජියංඉති, ඉජ්ජියංයන; ආදිනා, මේ ආදි සූත්‍රයෙන්; ආප්පච්චයො, ආප්‍රත්‍යය තෙම; නිවත්තතෙ, වලකී; ජාතියා, ජාතියෙන්; උපලක්ඛිතා, විහනිතවූ; භූමි, භූමිතොම; ජාතිභූමං, ජාතිභූමනම්වේ.

සඞ්ඛ්‍යාහි යනු සමාසාන්ත අප්‍රත්‍යයවිධානසූත්‍රයි; සඞ්ඛ්‍යාහියනු පඤ්චමීබහුවචනාන්තපදයි; සඞ්ඛ්‍යාහි, සඞ්ඛ්‍යාවාචිශබ්දයන්කෙරෙන්; පරා, පරවූ; යාභූමි, යම්භූමියෙක් ඇද්ද; තස්සා, ඇට; සමාසන්තො, සමාසාන්තවූ; අහොති, අප්‍රත්‍යයවේ; වෙභූමියො, භූමිහුදෙදෙනෙක්; අස්සාති. මෙයටනුයි; විභූමං, විභූමනම්වේ; තිභූමං චතුභූමං යනුද; එවං, මෙසේමැයි; බහුලාධිකාරා, බහුලාධිකාරයහෙතුකොටගෙන; ක්වචි, කිසිතැනෙක්හි; නහොති, සමාසාන්ත අප්‍රත්‍යයනොවේ; චතුභූමියනුවේ.

**දීඝාහොවස්සෙකදෙසෙහි ච රත්‍යා.**

දීඝාදීහි අසඞ්ඛ්‍යෙහි සඞ්ඛ්‍යාහි ච පරස්මා රත්තිසද්දා අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසු සමසිතා සමාසන්තො අ හොති—දීඝා ච සා රත්ති චාති දීඝරත්තං-අහො ච රත්ති ච අහොරත්තං—අහස්ස ආපදිත්තා 'මනාද්‍යාපාදීනමො මයෙ චෙ''ති ඔ—වස්සාසු රත්ති වස්සාරත්තං—පුබ්බා ච සා රත්ති චාති පුබ්බරත්තං—එවං අපරරත්තං—අතික්කන්තො රත්තිං අතිරත්තො—ද්වින්නං රත්තීනං සමාහාරො ද්විරත්තං—අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසුත්වෙව—දීඝරත්ති—(හෙමන්තො)-උපරත්ති-ක්වචි හොතෙව බහුලං විධානා—යථාරත්තං

**ගොත්වචත්ථෙ චාලොපෙ.**

---

දීඝාහොවස්සෙකදෙසෙහි ච රත්‍යා යනු සමාසාන්ත අප්‍රත්‍යය විධානසූත්‍රයි; දීඝාහොවස්සෙක දෙසෙහි යනු පඤ්චමී බහුවචනාන්ත පදය; ච යනු ලුප්තප්‍රථමෛක වචනාන්ත නිපාතපදය, රත්‍යා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදයි; දීඝාදීහි, සූත්‍රොක්තදීඝාදි ශබ්දයන් කෙරෙන්ද; අසඞ්ඛ්‍යෙහි, අසඞ්ඛ්‍යයන් කෙරෙන්ද; සඞ්ඛ්‍යාහිච, සඞ්ඛ්‍යාවාචිශබ්දයන් කෙරෙන්ද; පරස්මා, පරවූ; අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසු සමසිතා, අන්‍යාර්ථඅසඞ්ඛ්‍යාර්ථ දෙක්හි සමාස නොකරණලද; රත්තිසද්දා, රත්තිශබ්දයාකෙරෙන්; සමාසන්තො, සමාසාන්තවූ; අහොති, අප්‍රත්‍යයවේ; දීඝාච, දිඝීවූවාද; සා, හොමය; රත්තිච, රාත්‍රිවූවාද; සා ඉති, හොමනුයි; දීඝරත්තං, දීඝරත්ත නම්වේ; අහොච, දිනයද; රත්තිච, රාත්‍රියද; අහොරත්තං, අහොරත්ත නම්වේ; අහස්ස, අහශබ්දයානමා; ආපාදිත්තා ආපාදිබවහෙයින්ම; මනාද්‍යාපාදිනමොමයෙ චෙති, මනාද්‍යාපාදිනමොමයෙචයන සූත්‍රයෙන්; ඔ, ඔකාරයෙක්වේ; වස්සාසු, වර්ෂාකාලයෙහිවූ; රත්ති, රාත්‍රිතොමව; වස්සාරත්තං, වස්සාරත්ත නම්වේ; පුබ්බාච, පූර්වවූවාද; සා, හොම[illegible]; රත්තිච, රාත්‍රිවූවාද; සාඉති, හොමනුයි; පුබ්බරත්තං, පුබ්බරත්ත නම්වේ; අපරරත්තං යනුද; එවං, මෙසේමැයි; රත්ති, රාත්‍රිය; අතික්කන්තො, ඉක්මූනේ; අතිරත්තො, අතිරත්ත නම්වේ; ද්වින්නංරත්තීනං, රාත්‍රින්දෙදෙනෙක් හුගේ; සමාහාරො, බුඩින් එක්කිරීම; ද්විරත්තං, ද්විරත්ත නම්වේ; අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසු ඉති, අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසුයිනු; එව, වැටෙයි; දීඝරත්ති හෙමන්තො උපරත්ති යන තන්හි; සමාසාන්ත අප්‍රත්‍යය නොවන පිණිසයි; බහුලංවිධානා, බහුලං යනු වැටෙනහෙයින්; ක්වචි, කිසිතැනෙක්හි; හොතෙව, (අසඞ්ඛ්‍යසමාසකරණලද රත්ති ශබ්දයාකෙරෙන්ද සමාසාන්තඅප්‍රත්‍යය) වේමැයි; යථාරත්තංයනුවේ.

ගොත්වචත්ථෙ චාලොපෙ යනු සමාසාන්ත අප්‍රත්‍යයවිධානසූත්‍රයි; ගොතො යනු පඤ්චම්‍යෙක වචනාන්ත නිපාතපදය; අචත්ථෙයනුසප්ත

ගොසද්දා අලොපවිසයා සමාසන්තො අ හොති න වෙ චත්ථෙ සමාසො අඤ්ඤපදත්ථෙ අසඞ්ඛ්‍යත්ථෙ ච—රඤ්ඤො ගො රාජගවො අවඞ්-පඤ්ච ගාවො ධනමස්ස පඤ්චගවධනො—විසෙසනසම සඞ්ගහො අඤ්ඤපදත්ථසමාසො—දසන්නං ගුන්නං සමාහාරො දසගවං—අලොපෙති කිං?-පඤ්චහි ගොහි කීතො පඤ්චගු-විසෙසන සමාසෙ- “තෙන කතං මිච්චාදිනා ණිකෙ “ලොපොති” තස්ස ලොපෙ චකතෙ “ගොස්සූති උකාරො—අචත්ථෙති කිං?-අජස්සගාවො—අනඤ්ඤාසඞ්ඛ්‍යත්ථෙසුත්වෙව ච-චිත්තගු, උපගු-විසාලානි අක්ඛීනි අස්සාති අඤ්ඤපදත්ථසමාසෙ “අක්ඛිස්මාඤ්ඤත්ථෙ”ති අකාරෙ-විසාලක්ඛො—පධානත්ථාවසෙන චතුබ්බිධමෙකත්ථං තිවිධන්ති කෙචි-වුත්තං හි.

---

මෙය්‍යක වචනාන්තපදය, ච යනු ලුප්ත ප්‍රථමෛක වචනාන්තනිපාත පදය, අලොපෙ යනු සප්තමෙය්‍යකවචනාන්තපදයි; අලොපවිසයා, ලොප්විෂයනොවන්නාවූ; ගොසද්දා, ගොශබ්දයා කෙරෙන්; සමාස න්තො, සමාසාන්තවූ; අහොති, අප්‍රත්‍යයවේ; සමාසො, සමාසයතෙම චත්ථෙ, චාර්ථයෙහිද; අඤ්ඤපදත්ථෙ, අන්‍යපදාර්ථයෙහිද; අසඞ්ඛ්‍යත්ථෙච, අසඞ්ඛ්‍යාර්ථයෙහිද; නවෙ, ඉදින් සමාස නොකරණ ලද්දේවිනම්; රඤ්ඤො, රජහුගේ; ගො, වෘෂභතෙම; රාජගවො, රාජගවනම්වේ; අවඞ්, ගොස්සාවඞ් යන සූත්‍රයෙන් අවඞ්යනාදෙශවේ; පඤ්චගවො, ගවයෝ පස්දෙනෙක්; ධනං, ධනවූවාහු; අස්ස, මෝහටතුයි; පඤ්ච ගවධනො, පඤ්චගවධනනම්වේ; විසෙසනසමාසසඞ්ගහො, විශෙෂණ සමාසසංගහීකොට ඇති; අඤ්ඤපදත්ථසමාසො, අන්‍යපදාර්ථසමාසයි; දසන්නංගුන්නං, ගෙරින්දසදෙනෙක්හුගේ; සමාහාරො, බුඩින් එක් කිරීම; දසගවං, දසගවනම්වේ; අලොපෙ ඉති, අලොපෙ යනු; කිං, කුමටය; පඤ්චහිගොහිකීතො පඤ්චගු යනතන්හි සමාසාන්තඅප්‍රත්‍යය නොවන පිණිසයි; විසෙසන සමාසෙ, විශෙෂණ සමාසකළකල්හි; තෙන කතං ඉති, තෙනකතං යන; ආදිනා, මේ ආදිසූත්‍රයෙන්; ණිකෙ, ණිකප්‍රත්‍යයකළකල්හි; ලොපොඉති, ලොපොයනසූත්‍රයෙන්; තස්ස, ඒණිකප්‍රත්‍යයහට; ලොපෙචකතෙ, ලොප්දකළකල්හි ගොස්සූති, ගොස්සූයන සූත්‍රයෙන්; උකාරො, උකාරයෙක්වේ; අචත්ථෙ ඉති, චාර්ථසමාස විධානයෙහි අප්‍රත්‍යයනොවෙයියනු; කිං, කුමටය? අජස්සගාවො යනතන්හි අප්‍රත්‍යය නොවනපිණිසයි; අනඤ්ඤා සඞ්ඛ්‍යත්ථෙසුඉති අනඤ්ඤා සඞ්ඛ්‍යත්ථෙසු යනු; එව, වැටෙයි; චිත්තගු උපගු යනතන්හි; සමාසාන්ත අප්‍රත්‍යය නොවන පිණිසයි; විසාලානි අක්ඛීනි අස්සඉති, විසාලානි අක්ඛීනි අස්සකියා; අඤ්ඤපදත්ථසමාසෙ, අන්‍යපදාර්ථසමාසකළකල්හි; අක්ඛිස්මාඤ්ඤත්ථෙ ඉති, අක්ඛිස්මාඤ්ඤත්ථෙ යන සූත්‍රයෙන්; අකාරෙ, අප්‍රත්‍යයකළකල්හි; විසාලක්ඛො

පුබ්බුත්තරොභයඤ්ඤත්‍ථමිච්චෙකත්‍ථං චතුබ්බිධං
විසෙසඤ්ඤොභයත්‍ථා තිධා වක්ඛන්ති තං පරෙ.
එකත්‍ථං.

---

අථ ඉත්‍ථිප්පච්චයන්තා නිද්දිසීයන්තෙ.

**ඉත්‍ථියමතො.**

ඉත්‍ථියං වත්තමානතො අකාරන්තතො නාමස්මා ආප්පච්චයො හොති—දෙවදත්තා, අජා, කොකිලා, ඉච්චාදි.

**නදාදිතො ඊ.**

ආකතිගණොʻයං-නදාදිහි ඉත්‍ථියං ඊප්පච්චයො හොති-ඊකාරෙ "න්තන්තූනං ඊම්හි තො වා"ති සමෙකන්තත්‍ථො-නදී, මහී, කුමාරි,

---

යනුවේ; පධානත්‍ථාවසෙන, ප්‍රධානාර්‍ථාවශ්‍යෙශයෙන්; එකත්‍ථං, සමාසයතෙම; චතුබ්බිධං, සතර වැදෑරුම්වේ; කෙවි, සමහරකෙනෙක්;තිවිධම්පි, තුන්ප්‍රකාරයකැයිදකියත්;වුත්තාංහි, කියනලදමැයි

පුබ්බ, පූර්‍වපදාර්‍ථය; උත්තර, උත්තරපදාර්‍ථය; උභය, උභය, උභය පදාර්‍ථය; අඤ්ඤත්‍ථංඉති, අන්‍යපදාර්‍ථයයිකියා; එකත්‍ථං, සමාසයතෙම; චතුබ්බිධං, සතරවැදෑරුම්වේ; විසෙසඤ, විශෙෂ්‍යාර්‍ථවය; අඤ්ඤ, අන්‍යපදාර්‍ථවය; උභයත්‍ථා, උභයපදාර්‍ථවයයි කියා; පරෙ, අන්‍යයෝ; තං, මේසමාසයතෙම; තිධා, තුන්පරිද්දෙකින්; ආචික්ඛන්ති, කියත්.

**එකත්‍ථං, සමාසයයි.**

---

අථ, ඉක්බිත්තෙන්; ඉත්‍ථිප්පච්චයන්තා, ස්ත්‍රීප්‍රත්‍යයාන්ත ශබ්දයෝ; නිද්දිසීයන්තෙ, දක්වනුලැබෙත්;

ඉත්‍ථියමතො යනු ආප්‍රත්‍යය විධානසූත්‍රයි; ඉත්‍ථියං යනු සප්තම්‍යෙකවචනාන්තපදය; අතො යනු පඤ්චම්‍යෙකවචනාන්ත නිපාතපදය;ආයනු ලුප්තප්‍රථමෙක වචනාන්තපදයි; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; අකාරන්තතො නාමස්මා, අකාරාන්ත නාමයාකෙරෙන්; ආප්පච්චයොහොති, ආප්‍රත්‍යයවේ; දෙවදත්තා අජාකොකිලා ඉති; දෙවදත්තා අජාකොකිලා යන; ආදි, මේආදියවේ.

නදාදිතො ඊ යනු ඊ ප්‍රත්‍යයවිධානසූත්‍රයි; නදාදිතො යනු පඤ්චම්‍යෙක වචනාන්ත නිෂ්පන්නනිපාතපදය, ඊ යනු ප්‍රථමෙකවචනාන්තපදයි; අයං, මෙ සූත්‍රයතෙම; ආකතිගණො, ජාතිප්‍රධානගණයි; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන්නාවූ; නදාදිහි, නදාදිශබ්දයන් කෙරෙන් පරව; ඊප්පච්චයො හොති, ඊප්‍රත්‍යයවේ; ඊකාරෙ, ඊකාර

තරුණී, වාරුණී, ගොතමී, ගච්ඡන්තී—"න්තන්තූනං ඊම්හි තො වා"ති වා තකාරෙ-ගච්ඡතී-එවං ගුණවන්තී, ගුණවතී-"ගොතො වා" ති නදාදිසු පාඨා වා ඊම්හි "ගොස්සාවඞ්"ති ගොසද්දස්ස ආවඞ්-ගාවී, ගො.

**යක්ඛාදිත්‍යිනී ච.**

යක්ඛාදිතො ඉත්‍ථියමිනී හොති ඊ ච-යක්ඛිනී, යක්ඛී-නාගිනී, නාගී.

**ඉුවණ්ණණ්ඛ නී.**

ඉත්‍ථියමිවණ්ණුවණ්ණන්තෙහි නී හොති බහුලං-පයතපාණිනී, දණ්ඩිනී, භික්ඛුනී, පරචිත්තවිදූනී.

**යුවා තී.**

යුවසද්දතො තී හොතිත්‍ථියං—යුවතී.

---

තෙම; න්තන්තූනං ඊම්හිතොවා ඉති, න්තන්තූනං ඊම්හිතොවා යන සූත්‍රයෙහි; සඞ්ඛෙතත්ථො, විභත්‍යන්වය ප්‍රයොජනකොට ඇත්තේයි; නදී මහී තරුණී ගොතමී ගච්ඡන්තී යනුවේ; න්තන්තූනං ඊම්හිතො වාඉති, න්තන්තූනංඊම්හිතොවා යන සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; තකාරෙ, තකාරාදෙශකලකල්හි; ගච්ඡතී යනුවේ; ගුණවන්තී ගුණවතී යනුද; එවං, මෙසේමැයි; ගොතොවාති, ගොතොවායි කියා; නදාදිසු, නදාදීන්කෙරෙහි; පාඨා, හදාළහෙයින්; වා, විකල්පයෙන්; ඊම්හි, ඊප්‍රත්‍යයකළකල්හි; ගොස්සාවඞ් ඉති, ගොස්සාවඞ් යන සූත්‍රයෙන්; ගොසද්දස්ස, ගොශබ්දයහට; ආවඞ්, ආවඞ් යනාදෙශවේ; ගාවී ගොයනුවේ.

යක්ඛාදිත්‍යිනිච යනු ඉනීප්‍රත්‍යය ඊප්‍රත්‍යය විධානසූත්‍රයි; යක්ඛාදිතො යනු පඤ්චමී බහුවචනාන්තනිපාතපදය, ඉනී යනු ප්‍රථමෛක වචනාන්තපදය, ච යනු ලුප්තප්‍රථමෛක වචනාන්තනිපාතපදයි; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙත්නාවූ; යක්ඛාදිතො, යක්ඛාදි ශබ්දයන් කෙරෙන් පරව; ඉනීහොති, ඉනීප්‍රත්‍යයවෙයි; ඊච, ඊප්‍රත්‍යයදවේ; යක්ඛිනී, යක්ඛී; නාගිනී, නාගී යනුවේ.

ඉුවණ්ණණ්හිනී යනු නීප්‍රත්‍යයවිධානසූත්‍රයි; ඉුවණ්ණණ්හි යනු පඤ්චමී බහුවචනාන්තපදය; නීයනු ප්‍රථමෛකවචනාන්තපදයි; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙත්නාවූ; ඉවණ්ණුවණ්ණන්තෙහි, ඉවර්ණාන්ත උවර්ණාන්තනාමයන්කෙරෙන්පරව; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; නී, හොති; නීප්‍රත්‍යයවේ; පයතපාණිනී දණ්ඩිනීභික්ඛුනී පරචිත්තවිදූනී යනුවේ.

යුවාති යනු තිප්‍රත්‍යය විධානසූත්‍රයි; යුවා යනු පඤ්චම්‍යෙක වචනාන්තපදය; ති යනු ප්‍රථමෛක වචනාන්තපදයි; ඉත්‍ථියං, ස්ත්‍රීලිඞ්ග

## යඉත්‍යප්පච්චයන්තා.

අථ ණාදයො වුච්චන්තෙ-රඤ්ඤස්සාපච්චමිති විග්ගහෙ.

**ණො වාපච්චෙ.**

ඡට්ඨියන්තා නාමස්මා වා ණප්පච්චයො හොතපච්චෙ'භිධෙය්‍යෙ-ණකාරො ණානුබන්ධකාරියත්ථො—ණෙනෙව අපච්චත්ථස්ස වුත්තත්තා අපච්චසද්දප්පයොගො-''එකත්ථතාය''මිති ස්‍යාදි ලොපො.

**සරානමාදිස්සායුවණ්ණස්සා එ ඔ ණානුබන්ධෙ.**

සරානමාදිභූතා යෙ අකාරිවණ්ණුවණ්ණා තෙසං ආ එ ඔ හොන්ති යථාක්කමං ණානුබන්ධෙති අකාරස්ස ආකාරො.

---

යෙහිවැටෙන්නාවූ; යුවසද්දතො, යුවශබ්දයාකෙරෙන්පරව; තිහොති, තිප්‍රත්‍යයවේ; යුවති යනුවේ.

ඉත්‍යප්පච්චයන්තා, ඝත්‍රිප්‍රත්‍යයාන්තයෝයි.

අථ, ඉක්බිත්තෙන්; ණාදයො, ණාදිප්‍රත්‍යයාන්තයෝ; වුච්චන්තෙ, කියනු ලැබෙත්; රඤ්ඤස්සාපච්චංඉති, රඤ්ඤස්සාපච්චං යන; විග්ගහෙ, වාක්‍යයෙහි.

ණොවාපච්චෙ යනු විකල්පයෙන් ණප්‍රත්‍යය විධානසූත්‍රයි; ණො යනු ප්‍රථමෙක වචනාන්තපදය; වා යනු ප්‍රථමෙක වචනාන්තනිපාතපදය; අපච්චෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි ඡට්ඨියන්තානාමස්මා, ෂෂ්ඨිවිභක්ත්‍යන්තනාමයාකෙරෙන්; අපච්චෙභිධෙය්‍යෙ, පුත්‍රයා කිවමනාකල්හි; වා, විකල්පයෙන්; ණප්පච්චයොහොති, ණප්‍රත්‍යය වේ; ණකාරො, ප්‍රත්‍යය ණකාරනෙම; ණානුබන්ධකාරියත්ථො, ණකාරානුබන්ධකාර්‍ය්‍යය ප්‍රයොජනකොට ඇත්තේ හෙවත් වෘද්ධියප්‍රයොජනකොට ඇත්තේයි; ණෙනෙව, ණප්‍රත්‍යයා විසින්ම; අපච්චත්ථස්ස, අපත්‍යාර්‍ථයාගේ; වුත්තත්තා, කියනලදබවහෙයින්; අපච්චසද්දප්පයොගො, අපච්චශබ්දයාගේ අප්‍රයොගයවේ; එකත්ථතායං ඉති, එකත්ථතායං යන සූත්‍රයෙන්; ස්‍යාදිලොපො, ස්‍යාදිලොප්වේ.

සරානමාදිස්සායුවණ්ණස්සාඑඔ ණානුබන්ධෙ යනු ආ එ ඔ යනාදෙශ විධානසූත්‍රයි; සරානං යනු ෂෂ්ඨිබහුවචනාන්තපදය; ආදිස්ස යනු ෂෂ්ඨ්‍යෙකවචනාන්තපදය; අයුවණ්ණස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; ආ එ ඔ යනු ලුප්ත ප්‍රථමා බහුවචනාන්තපදය; ණානුබන්ධෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; ණානුබන්ධෙ, ණානුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි; සරානං, ස්වරයන් අතුරෙන්; ආදිභූතා, ආදියෙහිවූ; යෙ අකාරිවණ්ණුවණ්ණා, යම් අකාර ඉවර්ණ උවර්ණ කෙනෙක් ඇද්ද; තෙසං, ඔවුන්ට; යථාක්කමං, පතතීන්; ආ එ ඔ හොන්තීති, ආ එ ඔ යනාදෙශයෝ වෙත්නුයි; වා, විකල්පයෙන් අකාරස්ස, අකාරයහට; ආකාරො, ආකාරාදෙශවේ.

**උවණ්ණස්සාවඞ් සරෙ.**

සරාදෙ ණානුබන්ධෙ උවණ්ණස්ස අවඞ් හොති-තතො ස්‍යාදි-රාස වොච්චාදි-ඉත්ථියං-රාසවිච්චාදි-වා විධානා රඤ්ඤස්සාපච්චං රඤ්ඤවපච්චන්තිපි හොති.

ණාදයො'භිධෙය්‍යලිඞ්ගා අපච්චෙච ත්වනපුංසකා
නපුංසකෙ සකත්ථේ ණ්‍යො භියො භාවසමූහජා.
තා තුත්ථියමසඞ්ඛ්‍යානෙ ත්වාද් විප්පච්චයන්තකා
නපුංසකෙන ලිඞ්ගෙන සද්දො'දුභු පුමෙන වා
නිද්දිස්සතීති ඤාතබ්බමවිසෙසෙ පතිච්ඡතෙ.

වා අපච්චෙති වාධිකාරො.

---

උවණ්ණස්සාවඞ්සරෙ යනු අවඞ්යනාදෙශ විධානසූත්‍රයි; උවණ්ණස්ස යනු ෂෂ්ඨ්‍යෙක වචනාන්තපදය; අවඞ් යනු ලුප්ත ප්‍රථමෛකවචනාන්තපදය; සරෙ යනු සප්තම්‍යෙක වචනාන්තපදයි; සරාදෙ ණානුබන්ධෙ, සවරාදිවූණානු බන්ධප්‍රත්‍යයාපර කල්හි; උවණ්ණස්ස, උවණියහට; අවඞ්හොති, අවඞ්යනාදෙශවේ; තතො, ඉක්බිත්තෙන්; ස්‍යාදි, ස්‍යාදිවිභක්තිවේ; රාසවොඉති, රාසවොයන; ආදි, මේ ආදිය වේ; ඉත්ථියං, ස්ත්‍රිලිඞ්ගයෙහි; (ඊප්‍රත්‍යයකලකල්හි;) රසවී ඉති, රාසවි යන; ආදි, මේ ආදියවේ; වාවිධානා, විකල්පවිධානය හෙතුකොට ගෙන; රඤ්ඤස්සාපච්චංරසවපච්චං ඉති, රඤ්ඤස්සාපච්චං රඤ්ඤවපච්චං කියාද; හොති, ෂෂ්ඨීසමාසවේ.

ණාදයො, ණාදිප්‍රත්‍යයාන්තයෝ; අභිධෙය්‍යලිඞ්ගා, වාච්‍යාඑයට බඳුවූ ලිඞ්ගඇත්තාහ; අපච්චෙතු, අපත්‍යාඑයෙහිවූ ණාදිප්‍රත්‍යයෝ වනාහි; අනපුංසකා, නපුංසලිඞ්ගනොවන්නාහ; සකත්ථේ, ස්වාඑයෙහි කරණලද; ණ්‍යො,ණ්‍යප්‍රත්‍යයතෙම; නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වන්නේය; භාවසමූහජා, භාවාඑසමූහාඑයෙහිවූ ප්‍රත්‍යයෝ; භියො, බොහෝසේ; (නපුංසකලිඞ්ගයෙහි වන්නාහ;)

තාතු, තාප්‍රත්‍යයවනාහි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි (වන්නේය;) ත්වාදි, ත්වප්‍රත්‍යය ආදිකොට ඇති; විප්පච්චයන්තකා, විප්‍රත්‍යයඅන්තකොටඇති; තෙ, ඒප්‍රත්‍යයෝ; අසඞ්ඛ්‍යා, අසඞ්ඛ්‍යයෝයි.

අවිසෙසෙඉච්ඡිතෙපන, සාමාන්‍යයක් අභිමතකල්හි; සද්දො, (නිෂ්පන්නවූ) ශබ්දරූපයතෙම; නපුංසකෙන ලිඞ්ගෙන, නපුංසකලිඞ්ගයෙන්හෝ; උදුභු, නොහොත්; පුමෙනවා, පුල්ලිඞ්ගයෙන්හෝ; නිද්දිස්සතීති, දක්වනුලබන්නේයයි; ඤාතබ්බං, දතයුත්තේයි.

වාඉති, වායනුද; අපච්චෙතිච, අපච්චෙයනුද; අධිකාරො, මතුසූත්‍රහා සම්බන්ධකරනුලැබේ.

**වච්ඡාදිතො ණාන ණායනා.**

වච්ඡාදිතො ගොත්තාදිභූතා ගණතො ච ණාන ණායනප්පච්චයා හොන්ති පපුත්තාදෙ'පවෙච්-පපුත්තප්පභුති ගොත්තං—වච්ඡස්සාපච්චං වච්ඡානො, වච්ඡායනො-'සංයොගෙ ක්වචී'ති වුත්තත්තා න වුඩ්ඪි—කතිස්සාපච්චං කච්චානො, කච්චායනො— යකාරවග්ගපුබ්බරූපානි—යාගමෙ—කාතියානො.

කත්තිකාය අපච්චමිච්චෙවමාදි විග්ගහෙ.

---

වච්ඡාදිතොණානණායනා යනු ණානණා යන ප්‍රත්‍යය විධාන සූත්‍රයි; වච්ඡාදිතො යනු පඤ්චමී බහුවචනාන්ත නිපාතපදය; ණාන ණායනායනු ප්‍රථමා බහුවචනාන්තපදයි; වච්ඡාදිතො, වච්ඡාදිවූ ගොත්තාදිභූතා ගණතොච, ගොත්‍රාදිවූ ශබ්දගණයාකෙරෙන්ද; පපුත්තාදෙ පවෙච, මුනුබුරාආදිකොට ඇති පුත්‍රයා කිවමනාකල්හි; ණානණායනප්පච්චයා හොන්ති, ණානණායන ප්‍රත්‍යයෝවෙත්; පපුත්තප්පභුති, මුනුබුරාකෙරෙහි පටන්; ගොත්තං, ගොත්‍රනම්වේ; වච්ඡකච්චාදි යම්කෙනෙකුන්කෙරෙන් ණාන ණායනප්‍රත්‍යයන් කෙරෙන් එකෙකුදුපෙණේනම් ඔහු වච්ඡාදි නම්වේත්, ගොත්‍රනම් වංශයයි; එයට ආදිනම් වත්සගොත්‍රය කාශ්‍යපගොත්‍රය යනාදින් යමක්හු වංශයෙන් ව්‍යවහාරකරනුලැබේද ඒසංඥානප්‍රජාවට ආදිවූ වත්සාදිපුරුෂයෝයි වච්ඡස්ස, වච්ඡයාගේ; අපච්චං, පුත්‍රතෙම; වච්ඡානො, වච්ඡානනම්වෙයි; වච්ඡායනො, වච්ඡායන නම්වෙයි; සංයොගෙ ක්වචිති, සංයොගෙ ක්වචියි; වුත්තත්තා, කියනලදබවහෙයින්; නවුඩ්ඪි, ආදිස්වරයහට වෘඩිනොවේ.

වච්ඡස්සාපච්චංනත්‍යාදි යනවාක්‍යයෙහි ෂෂ්ඨ්‍යන්ත වච්ඡශබ්දයාකෙරෙන් පරව; වච්ඡාදිතො ණානණායනා යන සූත්‍රයෙන් අපත්‍යාර්ථයෙහි ණාන ප්‍රත්‍යයහා; ණායන ප්‍රත්‍යයවෙයි; ණකාර අප්‍රයොගීවේයි, ණානුබන්ධප්‍රත්‍යයාපරකල්හි; ප්‍රකෘතිසම්බන්ධිවූ ස්වරාදිවූ අකාරයහට සරානමාදිස්ස'යනාදි සූත්‍රයෙන්වෘඩිපත්නෙහි සංයොගවිෂයෙහිවූ අකාරයහට සංයොගෙ ක්වචි යනසූත්‍රයෙන් ප්‍රතිෂෙධවෙයි; ස්වරලොප්ආදි කාර්‍ය්‍යවෙයි; වච්ඡානො, වච්ඡායනො යනුවේ.

කතිස්ස, කතිහුගේ; අපච්චං, පුත්‍රතෙම; කච්චානො, කච්චාන නම; කච්චායනො, කච්චායන නම්; යකාරවවග්ගපුබ්බරූපානි, යකාරවවර්ගපූර්වරූප යන මොහුවෙත්; ස්වරයා පරකල්හි ඉකාරයහට යවාසරෙ යන සූත්‍රයෙන් යකාරාදෙශද යකාරයා පරකල්හි තවර්ගයහට තවග්ගවරණාදීන් චවග්ගද වග්ගලසෙහිතෙයි යකාරයහට පූර්වරූපදවේ යාගමෙ, යකාරගම කළකල්හි; කාතියානො යනුවේ;

**කත්තිකාවිධවාදීහි ණෙය්‍යණෙරා.**

කත්තිකාදීහි විධවාදීහි ච ණෙය්‍යණෙරවා යථාක්කමං හොන්ති පච්චෙ—කත්තිකෙය්‍යො, වෙණතෙය්‍යො—වෙධවෙරො, සාමණෙරො.

**ණ්‍ය දිච්චාදීහි.**

දිතිප්පභුතීහි ණ්‍යො වා හොතපච්චෙ.

**සංයොගෙ ක්වචි.**

---

කතිස්සාපච්චං නත්තාවාදි යනු විග්‍රහයි; සෙස්ස සුබොධයි. මෙහි මෙසේ කියනලද පඤ්චිකායෙහි චනාහි කතිස්සාපච්චං නත්තාවාදි යන වාක්‍යයෙහි ණ්‍යප්‍රත්‍යය පරකල්හි 'ලොපො ච ණෙහි වණ්ණනං' යි අන්තඉකාරයා ලොප්කොට තවගගවරණාදීන් තහට චකාරකොට 'වග්ගලසෙහිතෙ යි යහටපූර්රූපදකොට නිපදවූ කච්ච ප්‍රකෘතියකෙරෙන් මේසූත්‍රයෙන්නැවත අපත්‍යාර්ථයෙහි ණාන ණායන ප්‍රත්‍යයන් කළකල්හි කච්චානො කච්චායනො යනු වෙයි කියනලද කතිස්සාපච්චං නත්තාවා දිවාක්‍යයෙහි කතිශබ්දයාකෙරෙන් කත්තාණියොච යන ගණසූත්‍රයෙන් නියමකලහෙයින් ණ්‍යදිච්චාදීහි යන සූත්‍රයෙන් ණ්‍ය ප්‍රත්‍යයකොට වෘඬිකොට නිපදවූ කාතිය ශබ්දයාකෙරෙන් මේ සූත්‍රයෙන් ණාන කළකල්හි කාතියානො යනු වෙයි කියනලදී; කත්තිකාය අපච්චංඉති, කත්තිකාය අපච්චං යන; එවමාදිවිග්‍රහෙ, මේආදි වාක්‍යයෙහි.

කත්ති—විපදයි—කත්තිකාදීහි, කත්තිකාදිශබ්දයන්කෙරෙන්ද; විධවාදිහිච, විධවාදිශබ්දයන්කෙරෙන්ද; අපපච්චෙ, පුත්‍රයාකිවමනාකල්හි; යථාක්කමං, පනාතීන්; ණෙය්‍යණෙරා, ණෙය්‍යණෙරප්‍රත්‍යයෝ; වාහොන්ති, විකල්පයෙන්වෙත්; කත්තිකෙය්‍යොයනාදියවේ; (කත්තිකාය අපච්චං විනතාය අපච්චං විධවාය අපච්චං සමණස්ස අපච්චං යනුවාක්‍යයි; කත්තිකාය, කත්තිකාවගේ; අපච්චං, පුත්‍රතෙම; කත්තිකෙය්‍යො, කත්තිකෙය්‍යනම්වේ; සකන්දකුමාරයි; විනතාය, ගරුඩීමාතාවගේ; අපච්චං, පුත්‍රතෙම; වෙනතෙය්‍යො, වෙනතෙය්‍ය නම්වේ; ගුරුළුයි; විධවානම් වැන්දඹුයි; කත්තියා විනතාවිධවා යන ශබ්දයෝතුන්ආදන සඞ්ලිඞ්ගවෙයි, සිඞ්සුගමයි.)

ණ්‍යදි,—විපදයි—දිතිප්පභුතීහි, දිති ආදිශබ්දයන්කෙරෙන්; අපච්චෙ, පුත්‍රයා කිවමනාකල්හි; වා, විකල්පයෙන්; ණ්‍යොහොති, ණ්‍ය ප්‍රත්‍යයවේ.

සංයො—විපදයි—සංයොගවිසයෙණානුබන්ධෙ, සංයොගවිෂයෙහිවූණානුබන්ධප්‍රත්‍යයාපරකල්හි; සරානං, ස්වරයන් අතුරෙහි; ආදිභූතා, ආදියෙහිවූ; යෙඅයුවණ්ණා, යම් අවණී ඉවණී උවණී කෙ

සරනමාදිභූතා යෙ අසුවණ්ණා තෙසං ආ එ ඔ හොන්ති ක්වචි දෙව සංයොගවිසයෙ ණානුබන්ධෙති විසයසත්තමියා නිද්දිට්ඨත්තා සංයොගතො පුබ්බොව එකාරො.

**ලොපො'වණ්ණිවණ්ණානං.**

යකාරාදෙ පච්චයෙ අවණ්ණිවණ්ණානං ලොපො හොති-දිතියා අපච්චං දෙච්චො, කුණ්ඩනියා අපච්චං කොණ්ඩඤ්ඤො-නස්ස ඤ්ඤෙ පුබ්බරූපං-භාතුනො අපච්චං භාතබ්බො—එත්ථ.

**යම්හි ගොස්ස ච.**

---

නෙක් ඇද්ද; තෙසං, ඔවුන්ට; ක්වචිදෙව, කිසිතැනෙක්හිම; ආ එ ඔ හොන්තීති, ආ එ ඔ යන මොහුවෙතියි; විසයසත්තමියා නිද්දිඨත්තා, විෂය සප්තමින් දක්වූහෙයින්; සංයොගතො පුබ්බෙව, සංයොගයෙන් පූර්වයෙහිම; එකාරො, එකාරාදෙශවේ.

ලොපො—ද්විපදයි—යකාරාදෙ පච්චයෙ, යකාරාදි ප්‍රත්‍යයාපර කල්හි; අවණ්ණිවණ්ණානං, ප්‍රකෘතිසම්බන්ධිවූ අවර්ණ ඉවර්ණයන්ට; ලොපොහොති, ලොප්වේ; දිතියා, අසුරමාතාවගේ; අපච්චං, පුත්‍රතෙම; දෙච්චො, දෙච්චනම්වේ.

දිතියා අපච්චං යන වාක්‍යයෙහි මෙයින් ණ්‍ය ප්‍රත්‍යයකොට විභක්තිලොප්කොටදිතිය යී තුබූකල්හි යපරකල්හි ඉවර්ණයහට "ලොපොවණ්ණිවණ්ණානං"යි ලොප්කොට; තවග්ගවරණාදින් තකාරය හට චකාරද "වග්ගලසෙහිතෙ"යි යහටද චකාරකළකල්හි දෙච්චො යනුවේ.

කුණ්ඩනියා, කුණ්ඩනියගේ; අපච්චං, පුත්‍රතෙම; කොණ්ඩඤ්ඤො, කොණ්ඩඤ්ඤනම්වේ; නස්ස, නකාරයහට; ඤ්ඤෙ, ඤ්ඤකාර කළකල්හි; පුබ්බරූපං, පූර්වරූපදවේ.

කුණ්ඩනියා අපච්චං යනවාක්‍යයෙහි මෙයින් ණ්‍යප්‍රත්‍යයකොට විභක්තිලොපාදියකළකල්හි ණානුබන්ධප්‍රත්‍යයාපරකල්හි "සංයොගෙ ක්වචි"යි සවරාදිවූ උවර්ණයහට වෘද්ධි ඔකාරකොට "ලොපොවණ්ණිවණ්ණානං"යි කුණ්ඩනිශබ්දයාගේ ඊකාරයා ලොප්කොට තවග්ගවරණාදින්නහට ඤ්ඤකාරද 'වග්ගලසෙහිතෙ'යි යහටද ඤ්ඤකාරකළකල්හි කොණ්ඩඤ්ඤො යනුවේ.

භාතුනො, බෑයාගේ; අපච්චං, පුත්‍රතෙම; භාතබ්බො, භාතබ්බනම්වේ; එත්ථ, මෙහි.

යම්හි—ත්‍රිපදයි—යකාරාදෙ පච්චයෙ, යකාරාදි ප්‍රත්‍යයා පර කල්හි; ගොස්ස, ගොශබ්දයහටද; උවණ්ණස්සච, උවර්ණයහටද; අවඞ් හොන්ති, අවඞ්වෙතියි; උස්ස, උකාරයහට; අවඞ්හොති, අවඞ්වේ.

යකාරාදෙ පච්චයෙ ගොසසුවණ්ණස්ස ච අවඩ්ඪහොතීති උකාරස්ස අවඩ්ඪ.

**ආණ්.**

අකාරන්තතොණි වා හොතපච්චෙ බහුලං-දක්ඛස්සාපච්චං දක්ඛි-එවං වාරුණි—බහුලං විධානා න සබ්බත්ථ අකාරන්තෙහි-තෙනෙව වසිඨස්සාපච්චං වාසිඨො තෙව හොති.

**රාජතො ඤ්ඤො ජාතියං.**

රාජසද්දතො ඤ්ඤො වා හොතපච්චෙ ජාතියං ගම්මමානායං—රඤ්ඤො, අපච්චං රාජඤ්ඤො-ජාතිනති කිං?-රාජපච්චං.

---

භාතුනො අපච්චං යන වාක්‍යයෙහි මෙයින්යප්‍රත්‍යයකොට විභක්තිලොපාදියද යකාරාදි ප්‍රත්‍යයා පරකල්හි උවණ්ණයහට යම්හිගොසසව යන සූත්‍රයෙන් අවඩ්ඪකළකල්හිද භාතබ්බො යනුවේ.

ආණි,—ඵිපදයි—අකාරන්තතො, අකාරාන්තනාමයාකෙරෙන්; අපච්චෙ, පුත්‍රයාකිවමනාකල්හි; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; වා, විකල්පයෙන්; ණිහොති, ණිප්‍රත්‍යයවේ; දක්ඛස්ස, දක්ඛයාගේ; අපච්චං, පුත්‍රතෙම; දක්ඛි, දක්ඛිනම්වේ; වාරුණියනුද; එවං, මෙසේමැයි; දක්ඛස්ස අපච්චංයනු විග්‍රහයි; (මෙහි සංයොගෙ ඤවිධියි වෘඩිනොවේ; වරුණස්ස අපච්චං යනු විග්‍රහයි; ණිප්‍රත්‍යයකොට වෘඩිකළකල්හි වාරුණි යනුවේ;) බහුලාධිකාරා බහුලං යනු වැටෙනහෙයින් සබ්බත්ථිඅකාරන්තෙහි, සියලු අකාරාන්තනාමයන් කෙරෙන්; න හොති, ණිප්‍රත්‍යයනොවේ; තෙන එව, එහෙයින්ම; වසිඨස්සාපච්චං වාසිඨොතෙවහොති, වසිඨස්සාපච්චං වාසිඨොයි කියාමවේ; (බහුලංයනු වැටෙනහෙයින් සියලු අකාරාන්තනාමයන් කෙරෙන්ම අපත්‍යාර්ථයෙහි ණිප්‍රත්‍යය නොවෙයි; එහෙයින් වසිඨස්සා පච්චංවාසිඨියි කියා නොව වාසිඨොයි කියාමවෙයි යනු භාවයි.)

රාජ—ත්‍රිපදයි—ජාතියං ගම්මමානායං, ප්‍රත්‍යයාන්තයාවිසින්, ක්‍ෂත්‍රියජාතියක් ගම්‍යමානකල්හි; අපච්චෙ, පුත්‍රයා කිවමනාකල්හි; රාජසද්දතො, රාජ ශබ්දයාකෙරෙන්; වා, විකල්පයෙන්; ඤ්ඤො, හොති, ඤ්ඤප්‍රත්‍යයවේ; රඤ්ඤො, රජහුගේ; අපච්චං, පුත්‍රතෙම; රාජඤ්ඤො, රාජඤ්ඤනම්වේ; ජාතියනති, ක්‍ෂත්‍රියජාතියක් ගම්‍යමානකල්හි වෙයි යනු; කිං, කුමටය; රාජපච්චං යනතන්හි ඤ්ඤප්‍රත්‍යයනොවන පිණිසයි; මෙහිඅපත්‍යාර්ථමාත්‍රයක්මුත් ක්‍ෂත්‍රියජාතිය අවිවක්‍ෂිතනුයි ඤ්ඤප්‍රත්‍යය නොවෙයි; රඤ්ඤො, අපච්චං රාජපච්චංයි ෂෂ්ඨීසමාසවේ.

**ඛත්තා යියා.**

ඛත්තසද්දා යඉයා හොන්තපච්චෙ ජාතියං-ඛත්තස්සාපච්චං ඛත්තෙය්‍යා, ඛත්තියො-ජාතිය ත්වෙව-ඛත්ති.

**මනුතොස්ස සණ්.**

මනුසද්දතො ජාතියා ස්ස සණ් හොන්තපච්චෙ-මනුනො අපච්චං මනුස්සො, මානුසො-ජාතියන්ත්වෙව-මානවො.

**ජනපදනාමස්මා ඛත්තියා රඤ්ඤෙ ච ණො.**

ජනපදස්ස යං නාමං තන්නාමස්මා ඛත්තියාපච්චෙ රඤ්ඤෙ ච

---

ඛත්තා—විපදයි— ජාතියං, ක්‍ෂත්‍රියජාතියක් ගම්‍යමානකල්හි; අපච්චෙ, පුත්‍රයා කියමනාකල්හි; ඛත්තසද්දා, ඛත්තශබ්දයාකෙරෙන්; යඉයාහොන්ති, යඉය ප්‍රත්‍යයෝවෙත්; ඛත්තස්ස, ක්‍ෂත්‍රයාගේ; අපච්චං, පුත්‍රතෙම; ඛත්තෙය්‍යා, ඛත්ත්‍යනම්වේ; ඛත්තියො, ඛත්තියනම් වේ; ඛත්තශබ්දයාකෙරෙන් මේ සූත්‍රයෙන් ය ප්‍රත්‍යයකොට යකාරාදි ප්‍රත්‍යයා පරකල්හි අවර්ණයහට ලොපොවණ්ණිවණ්ණානං යි ලොප් කොට ස්‍යාදිකාර්‍ය්‍යය කළකල්හි ඛත්තෙය්‍යායනුවේ; ඉයප්‍රත්‍යයකොට ස්වරලොප්කළකල්හි ඛත්තියොයනුවේ; රාජඤ්ඤය ඛත්ත්‍යය ඛත්තියය යනු ක්‍ෂත්‍රියජාතිඇති රජදරුවන්ට නම්; ජාතියන්ති, ජාතියං යනු එවවැවේ; ඛත්තියන තන්හි යඉය ප්‍රත්‍යය නොවන පිණිසයි; ඛත්තස්සා පච්චං ඛත්ති, ආණි යී ණිප්‍රත්‍යයවූතැනි.

මනු—විපදයි-ජාතියං, සමුද්‍රවෙන් ජාතියක් ගම්‍යමානකල්හි; මනුසද්දතො, මනුශබ්දයාකෙරෙන්; අපච්චෙ, අපත්‍යාර්ථයෙහි; ස්ස සණ්, ස්සසණ් ප්‍රත්‍යයෝ; හොන්ති, වෙත්; මනුනො, මනුරජහුගේ; අපච්චං, පුත්‍රතෙම; මනුස්සො, මනුස්සනම; මානුසො, මානුසනම්; සණ් ප්‍රත්‍යයකොට අකාරයහට වෘද්ධිකළකල්හි මානුසො යනුවේ; ජාතියන්ති, ජාතියංයනු; එවවැටෙයි; මානවොයනතන්හි ස්සසන් ප්‍රත්‍යයන්නොවන පිණිසයි; මානවොයී අපත්‍යයම කියනුකැමතිවන ලද හෙයින් ජාතිය අනපෙක්‍ෂිතනුයි ‘ණොවාපච්චෙ’යී ණප්‍රත්‍යය කොට ‘උවණ්ණස්සාවඩ්ඪ සරෙ’යී උකාරයාහට අවඩ් ආදෙශකළකල්හි මානවො යනුවේ.

ජන—පස්පදයි—ජනපදස්ස, ජනපදයාගේ; යං නාමං, යම් නමෙක්ඇද්ද; තංනාමස්මා, ඒනමැති; ඛත්තියා, ක්‍ෂත්‍රියවාචිශබ්දයා කෙරෙන්; අපච්චෙ, පුත්‍රයා කියමනාකල්හි; ණොහොති, ණප්‍රත්‍යය වේ; පඤ්චාලානං, පඤ්චාලදෙශවාසීන්ගේ; අපච්චං, පුත්‍රහෝ; රාජාවා, රජහෝ; පඤ්චාලො, පඤ්චාලනම්වේ; මගධානං අපච්චං රාජාවා මාගධොයනු විග්‍රහයි;—ජනපදනාමස්මාති, ජනපදනාමස්මායනු;

ණො හොති-පඤ්චාලානං අපච්චං රාජා වා පඤ්චාලො, මාගධො-ජනපද නාමස්මාති කිං?-දාසරථි—ඛත්තියාති කිං? පඤ්චාලස්ස බ්‍රාහ්මණස්ස පච්චං පඤ්චාලි.

**ණ්‍ය කුරුසිවීහි.**

කුරුසිවිහපච්චෙ රඤ්ඤෙ ච ණ්‍යො හොති—කුරූනං අපච්චං රාජා වා කොරබ්‍යො, සෙබ්‍යො.

**ණ රාගා තෙන රත්තං.**

රඤ්ජතෙ යෙන සො රාගො—තතො රාගවාචිතතියන්තතො රත්ත

---

කිං, කුමටය; දාසරථියනතන්හි ණප්‍රත්‍යය නොවන පිණිසයි; මෙහි දසරථනම් ක්‍ෂත්‍රියමය ජනපදනොවෙයි; එහෙයින් දසරථස්සාප ච්චංයනවාක්‍යයෙහි දසරථශබ්දයාකෙරෙන්'ආණි'යී ණිප්‍රත්‍යයවේ;-ඛත්තියාති, ක්‍ෂත්‍රියවාචිනාමයාකෙරෙන්වෙයි යනු කුමටය; පඤ්චාල ස්ස බ්‍රාහ්මණස්සාපච්චං පඤ්චාලියන තැන්හි ණප්‍රත්‍යය නොවනපිණි සයි;-මෙහිපඤ්චාලිනම් බ්‍රාහ්මණපුත්‍රය රජනොවෙයි, එහෙයින් මෙහිදු 'ආණි'යී ණිප්‍රත්‍යයමවේ.

ණ්‍යකු-ච්පදයි-කුරුසිවීහි, කුරුසිවිශබ්දයන්කෙරෙන්; අපච්චෙ, පුත්‍රයා කිවමනා කල්හිද; රඤ්ඤෙච, රජහු කිවමනාකල්හිද; ණ්‍ය හොති, ණ්‍යප්‍රත්‍යයවෙ; කුරූනං, කුරුරට වාසීන්ගේ; අපච්චං, පුත්‍ර හෝ; රාජාවා, රජහෝ; කොරබ්‍යො, කොරබ්‍යනම්වේ; සෙබ්‍යො, සෙබ්‍යනම්වේ;—යපරකල්හි කුරුශබ්දයාගේ අන්තයහට යම්හ්ගො ස්සච යන සූත්‍රයෙන් අවඩාදෙශකොට තවඟග වර්ණාදින් වහටබ කළකල්හි කොරබ්‍යො යනුවේ; සිවීනං අපච්චං, රාජාවා යන වාක්‍ය යෙහි මෙයින්ම ණ්‍යප්‍රත්‍යයකොට යකාරාදි ප්‍රත්‍යයා පරකල්හි ඉවණී යාහට 'ලොපොවණණිවණණානං'යී ලොප්කොට කීතියෙන්වහට බකාරකොට වග්‍යාලසෙහිතෙ'යී යහටද බකාරකළකල්හිද සෙබ්‍යො යනුවේ; වසිඨස්සාපච්චං යනාදියෙහිමෙන් එකවචනාන්තකොට නොකියා කුරූනං සිවිනංයී බහුවචනාන්තකොටකීම ජනපදවාචි ශබ්දයන් බහුවචනාන්තහෙයිනැයි දතයුතු—"පුමබහුත්තෙන කුරුස ක්කා කොසලාමගධාසිවී" යනු නිඝණ්ඩුයි.

ණරා—සතරපදයි—යෙන, යම් කුසුම්භකිංසුකාදියකින්; රඤ්ජ තෙ, රඳනුලැබේද; සො, හෙතෙම; රාගො, රාගනම්වේ; තතොරාග වාචිතතියන්තතො, ඒරාගවාචිවූ තෘතීයාන්තනාමයා කෙරෙන්; රත්තංඉති, රඳනලද යන; එතස්මිංඅත්ථෙ, මේ අර්ථයෙහි; ණොහොති, ණප්‍රත්‍යයවේ; කසාවෙන, කසටින්; රත්තං, රඳනලද්දේ; කාසාවං, කාසාවනම්වේ; කොසුම්භං, කොසුම්භනම්වේ; කුසුම්භෙන රත්තං

ම්චෙවතස්මිං අත්ථෙ ණො හොති–කසාවෙන රත්තං කාසාවං, කොසුම්භං-ඉධ කස්මා න හොති 'නීලංපීත'න්ති? ගුණවචනත්තා විනාපි ණෙන ණත්ථස්සාභිධානතො.

**නක්ඛත්තෙනින්දුයුත්තෙන කාලෙ.**

තතියන්තතො නක්ඛත්තා තෙන ලක්ඛිතෙ කාලෙ ණො හොති තචෙ නක්ඛත්තමින්දුයුත්තං හොති–ඵුස්සෙන ඉන්දුයුත්තෙන ලක්ඛිතා පුණ්ණමාසී ඵුස්සී, ඵුස්සො (අහො) මඝාය ඉන්දුයුත්තාය ලක්ඛිතා පුණ්ණමාසී මාඝී, මාඝො (අහො).

**සා ස්ස දෙවතා පුණ්ණමාසී.**

---

යනු විග්‍රහයි; කුසුම්භ නම් වනුක්වලි; නීලංපීතන්ති, නීලං පීතං යනු; ඉධ, මෙහි; කස්මා නහොති, කුමක්හෙයින් ණප්‍රත්‍යය නොවේ දයත්? ගුණවචනත්තා, ගුණවචනබවහෙයින් (නීලාදිගුණයම කියන හෙයින්) විනාපිණෙන, ණප්‍රත්‍යය නැතිවද; ණත්ථස්ස, ණප්‍රත්‍යයාගේ අර්ථය; අභිධානතො, කථනය හෙයිනි; ප්‍රත්‍යයකිරීම අර්ථප්‍රකාශයය, නීලාදිශබ්දයෝ ප්‍රත්‍යයානැත්වද අර්ථප්‍රකාශකෙරෙත් නුයි ඔවුන්කෙරෙන් ප්‍රත්‍යය නොවෙයි දතයුතුයි.

නක්ඛ–ත්‍රිපදයි–තතියන්තතො, තෘතියාන්තවූ; නක්ඛත්තා, නක්ෂත්‍රවාචිවූනාමයා කෙරෙන්; තෙන, ඒනක්ෂත්‍රයෙන්; ලක්ඛිතෙ, විහනිතවූ; කාලෙ, කාලයකිවමනා කල්හි; ණොහොති, ණප්‍රත්‍යය වේ; චෙ, ඉදින්; තංනක්ඛත්තං, ඒනක්ෂත්‍රය; ඉන්දුයුත්තං හොති, සඳුහායුක්තවීනම්; ඉන්දුයුත්තෙන, සඳුහා යුක්තවූ; ඵුස්සෙන, පුස නකතින්; ලක්ඛිතා, විහනිතවූ; පුණ්ණමාසී, පෞර්ණමාසීතොම; ඵුස්සී, ඵුස්සීනමු; අහො, දිනයතෙම; ඵුස්සො, ඵුස්සනම්වේ; ඵුස්සෙන ඉන්දුයුත්තෙන ලක්ඛිතා පුණ්ණමාසී යනවාක්‍යයෙහි තෘතීයාන්තවූ ඵුස්සශබ්දයාකෙරෙන්; එයින්ලක්ෂිතවූ පෞර්ණමාසිය කිවමනාකල්හි මේ සූත්‍රයෙන් ණප්‍රත්‍යයකොට විභක්තිලොප්කොට 'නදාදිතොඊ'යි ඊකළකල්හි ඵුස්සීයනුවේ, පුසනකතින් යුක්තවූ පූර්ණචන්ද්‍රයා ඇති පණ්ණරසීතිථිතොමෝ ඵුස්සීනමු. දෙවනතැන ඵුස්සෙන ඉන්දුයුත්තෙන ලක්ඛිතො අහොයි විග්‍රහයි, මෙහි ඵුස්සනම් දිනයයි. ඉන්දුයුත්තාය, සඳුහායුක්තවූ; මඝාය, මානකතින්; ලක්ඛිතා, විහනිතවූ; පුණ්ණමාසී, පෞර්ණමාසීතොම; මාඝී, මාඝීනමු; අහො, දිනයතෙම; මාඝො, මාඝනම්වේ; මඝාය ඉන්දුයුත්තාය ලක්ඛිතො අහොයනු විග්‍රහයි; දෙතන්හිම සංයොග පූර්වනොවන විසින් වෘද්ධිවේ; මඝාශබ්දය ඈලිංගහෙයින් මඝායයි කියනලදී.

සාස්ස–සාය අස්සය දෙවතාය පුණ්ණමාසීයනු පදයි; සෙති, සායන; පඨමන්තා, ප්‍රථමාන්තයාකෙරෙන්; අස්සෙති, මෝහටයයන;

සෙති පඨමනතා අසෙසති ඡඪතෙව ණො හොති යං පඨමනතං සාවෙ දෙවතා පුණණමාසී වා–සුගතො දෙවතා අසෙසති සොගතො–මාහිනෙදා, යාමො, වාරුණො—ඵුසසී පුණණමාසී අසස සමබනධිනීති ඵුසෙසා, (මාඝසා) එවංමාසො.
ව්‍යාකරණමධිතෙ ජානාති වාතෙවමාදිවිගගහෙ.

---

ඡඪතෙව, ෂෂඨ්‍යර්ථයෙහි; ණොහවති, ණප්‍රත්‍යයවෙයි; පඨමනතං, ප්‍රථමානතවූ; යං, යමෙක් ඇද්ද; සා, හොතොමෝ; වෙ, ඉදින්; දෙවතා, දෙවතානම්වූහෝ; පුණණමාසීවා, පෞණීමාසී නම්හෝයි; සුගතො, සර්‍වඥතෙම; දෙවතා, දෙවතාවූයේ; අසසාති, මෝහට නුයි; සොගතො, සොගතනම්වේ; මාහිනෙදා යාමො වාරුණො යනුවේ;–සුගතො දෙවතා අසසයන වාක්‍යයෙහි ප්‍රථමානතවූ සුගතශබ්දයා කෙරෙන් ඒ මෝහට දෙවතාය යනමේ අර්ථයෙහි මේසූත්‍රයෙන් ණප්‍රත්‍යයකොට වෘඩ්ආදිකළකල්හි සොගතොයනුවේ; මාහිනෙදාදි ශබ්දත්‍රයෙහි මෙමනයයි, මහිනෙදාදෙවතා අසස යමොදෙවතා අසස වරුණො දෙවතා අසසයි විග්‍රහයි; ඵුසසී පුණණමාසී, පුෂ්‍යපෞණීමාසී තොම; අසසසමබනධිනීති, මෝහට සමබනධිනුයි; ඵුසෙසා, ඵුසසනම්වේ; මාසො, මාසයයි; ඵුසෙසනකෂත්‍රයුතෙතන ලකඛිතා පුණණමාසී යනවාක්‍යයෙහි තෘතීයානතවූ ඵුසසශබ්දයාකෙරෙන් පූර්වසූත්‍රයෙන් ණප්‍රත්‍යයකොට “නදාදිතොඊ”යි ඊප්‍රත්‍යයකොට ඵුසසීශබ්දයානිපදවාගෙන ඵුසසී පුණණමාසී අසසසමබනධිනී යන වාක්‍යයෙහි ප්‍රථමානතවූ ඵුසසීශබ්දයාකෙරෙන් හොතොමෝ සමබනධය යන අර්ථයෙහි මේ සූත්‍රයෙන් ණප්‍රත්‍යයකොට සවරලොපකලකල්හි ඵුසෙසායනුවේ; ඵුසසනම් දුරුතුමසයි; මාසො, මාසොයනුද එවං මෙසේමැයි; මාඝී පුණණමාසී අසසසමබනධිනී යනු විග්‍රහයි; සෙසස අනනතර සඳශයි; මාඝනම් නවම්මසයි; ඵුසසය මාඝය යනාදිවූ ව්‍යවහාරය ඒ ඒ මැදිපොහොයෙහි ලැබෙනනක්‍ෂත්‍රයන්ගේ වශයෙනැයි දතයුතු; එගගුණියා චිතතාය විසාඛාය ජෙඪමූලෙන ආසාළහාය සවණෙන පොඨපාදෙන අසසයුජෙන කතතිකාය මගසිරෙන ඉනදුයුතෙතන ලකඛිතා පුණණමාසී එගගුණීචිතතිවෙසාඛී ජෙඪමූලි ආසාළහී සාවණී පොඨපාදී අසසයුජී කතතිකී මාගසිරී පුණණමාසී අසසසමබනධිනීති, එගගුණො මාසොයනාදින් දතයුතුයි.

> “චිතෙතා වෙසාඛ ජෙඪොචා සාළෙහාචිසුව සාවණො,
> පොඨපාදසසයුජෙච මාසා වාදස කතතිකො,
> මාගසිරො තථා ඵුසෙසා කමෙන මාඝඑගගුණො.”

යනු හෙයින් චිතතාය විසාඛය යනාදි ක්‍රමයෙන් මාඝාදිදොළොස් මසටනම් දතයුතු; බ්‍යාකරණමධිතෙ, බ්‍යාකරණං අධිතෙයනාහෝ;

**තමධීතෙ තංජානාති කණිකා ච.**

දුතියන්තතො තමධීතෙ තංජානාතීති එතෙසවත්‍ථෙසු ණොහොති කොණිකොච— වෙය්‍යාකරණො—කත්‍යාදෙසස්සීකාරස්ස "තදාදෙසා තදිව භවන්ති"ති ඤායා සරානමිච්චාදිනා එකාරෙ යාගමචිත්තානි-කෙ-කමකො,පදකො-ණිකෙ-සුත්තන්තිකො, වෙනයිකො-"තෙන නිබ්බත්තෙ"ති තතියන්තා නිබ්බත්තත්‍ථෙණො-කුසම්බෙන නිබ්බත්තා කොසම්බි, (නගරී).

**තත්‍ර භවෙ.**

---

ජානාතිචා ඉති, ව්‍යාකරණං ජානාතියීහෝ, එවමාදිවිග්‍රහෙ, මේ ආදි වාක්‍යයෙහි.

තම—සපදයි— දුතියන්තතො, විතීයාන්තනාමයා කෙරෙන්; තං අධීතෙ, ඒහදාරයි; තංජානාති, ඒදනීයන; එතෙසු අත්‍ථේසු, මේ අර්‍ථයෙහි; ණොහොති, ණප්‍රත්‍යයවෙයි; කො, කප්‍රත්‍යයද; ණිකොච, ණිකප්‍රත්‍යයදවේ; මේ ප්‍රත්‍යයන්සාමාන්‍යයෙන් විධානකළශබ්දයක් සඳහා හැමදෙනම වන්නෝනොවෙති බහුලාධිකාරයෙන් ආගමාන්‍ත රූපව කිසිවක්හුකෙරෙන් කිසිප්‍රත්‍යයෙක්ම වන්නේය එපරිද් දෙන්ම උදාහෘනයි, මත්තෙහිදු අනෙකප්‍රත්‍යය විධානයෙහි මෙසේම දතයුතු; කත්‍යාදෙසස්ස, කරණලද යකාරාදෙශඇති; ඉකාරස්ස, ඉකාරයහට; තදාදෙසා තදිවභවන්තීති ඤායා, "තදාදෙසා තදිවභවන්ති"යන න්‍යායෙන් සරානමාදිස්ස යනාදිසූත්‍රයෙන් එකාරාදෙශ කොට "වනතරගාචාගමා"යී යකාරාගමකොට ඕහට විනුවකළකල්හි වෙය්‍යාකරණො යනුවේ; ඛ්‍යාකරණ මධීතෙයි වාක්‍යගත්කල්හි ඉකාරයහට එකාරාදෙශවේ; කෙ, කප්‍රත්‍යය කළකල්හි; කමකො පදකො යනුවේ; කමමධීතෙ පදමධීතෙයි විග්‍රහයි; කමය පදයයි වෙදයෙහි ග්‍රන්‍ථවිශෙෂයෙයි; ණිකෙ, ණිකප්‍රත්‍යයකළකල්හි; සුත්තන්තිකොවෙනයිකො යනුවේ; සුත්තන්තමධීතෙ විනය මධීතෙ යනු විග්‍රහයි; තෙන නිබ්බත්තෙති, තෙනනිබ්බත්තෙ යන සූත්‍රයෙන්; තතියන්තා, තෘතීයාන්තනාමයාකෙරෙන්; නිබ්බත්තත්‍ථෙ, නිෂ්පන්නාර්‍ථයෙහි; ණො, ණප්‍රත්‍යත්‍යයවේ; කුසම්බෙන, කුසම්බනම් සෘෂිහු විසින් නිෂ්පන්නා, නිපදනලද්දී; කොසම්බි, කොසම්බිනමු; නගරී, නුවරයි; කුසම්බෙන නිබ්බත්තායන වාක්‍යයෙහි තෘතීයාන්තනාමයා කෙරෙන් නිෂ්පන්නාර්‍ථයෙහි මෙයින් ණප්‍රත්‍යයවෙ.

තත්‍ර—විපදයි—සත්තම්‍යන්තා, සප්තම්‍යන්තනාමයා කෙරෙන්; භවත්‍ථෙ, භවාර්‍ථයෙහි (වූයේයනඅර්‍ථයෙහි,) ණොහොති, ණප්‍රත්‍යයවේ; උදකෙභවො, දියෙහිවූයේ; ඔදකො, ඔදකනම්වේ; මනුස්‍යයායි; අජ්ජා

සත්තම්‍යන්තා භවත්ථේ ණො හොති-උදකෙ භවො ඔදකො-"අජ්ජා දිහි තනො"ති භවත්ථේ තනො—අජ්ජ භවො අජ්ජතනො—එවං හිය්‍යත්තනො-"එ ඔ න මවණ්ණෙ"ති අකාරො—"සරම්හා වෙ"ති තස්ස විභාවො.

**පුරාතො ණො ච.**

පුරා ඉච්චෙතස්මා භවත්ථේ ණො හොති තනො ච—පුරා භවො පුරාණො, පුරාතනො.

**අමාත්වච්චො.**

අමා සද්දතො අච්චො හොති භවත්ථේ—අමා භවො අමච්චො.

**මජ්ඣාදිත්විමො.**

මජ්ඣාදීහි සත්තම්‍යන්තෙහි භවත්ථේ ඉමො හොති—මජ්ඣෙ භවො මජ්ඣිමො, අන්තිමො-කුසිනාරායං භවො වෙච්චමාදිවිග්ගහෙ.

---

දිහිතනොති, අජ්ජාදිහිතනො යන සූත්‍රයෙන්; භවත්ථේ, භවාර්‍ථයෙහි; තනොහොති, තනප්‍රත්‍යයවේ; අජ්ජභවො, අදවූයේ; අජ්ජතනො, අජ්ජතන නම්වේ; හිය්‍යත්තනො, හීයත්තනොයනුද; එවං, මෙසේ මැයි; එ ඔ නමවණ්ණෙති, එ ඔ නමවණ්ණෙ යන සූත්‍රයෙන්; අකාරො, (ඔකාරයහට) අකාරාදෙශවේ; සරම්හාවෙති, සරම්හාවෙ යන සූත්‍රයෙන්; විභාවො, (තකාරයහට) විත්වවේ;-හීයොභවොයනුවිග්‍රහයි.

පුරා—නිපදයි—පුරාඉති, පුරායන; අස්මා, මේ නිපාතයා කෙරෙන්; භවත්ථේ, භවාර්‍ථයෙහි; ණොහොති, ණප්‍රත්‍යයවෙයි; තනො, තනප්‍රත්‍යයදවේ; මෙහිණකාරතෙම අවයවය, අනුබන්ධනොවෙයි; පුරාභවො, පෙරවූයේ; පුරාණො, පුරාණනම; පුරාතනො, පුරාතන නම්.

අමා-අමාතොය අච්චාය යනු පදයි; අමාසද්දතො, අමායන මේ අසඞ්ඛ්‍යශබ්දයා කෙරෙන්; භවත්ථේ, භවාර්‍ථයෙහි; අච්චාහොති, අච්චප්‍රත්‍යයවේ; අමාභවො, එකකාලයෙහිවූයේ; අමච්චො, අමච්ච නම්වේ.

මජ්ඣා-මජ්ඣාදිතොය ඉමොයයනුපදයි; මජ්ඣාදීහි, මජ්ඣාදිවූ; සත්තම්‍යන්තෙහි, සප්තම්‍යන්ත නාමයන් කෙරෙන්; භවත්ථේ, භවාර්‍ථයෙහි; ඉමො හොති, ඉමප්‍රත්‍යයවේ; මජ්ඣෙභවො, මධ්‍යයෙහිවූයේ; මජ්ඣිමො, මජ්ඣිම නම්වේ; අන්තිමො, අන්තිමනම්වේ; කුසිනාරායංභවොති, කුසිනාරායංභවො යන, එවමාදිවිග්ගහෙ, මේආදි වාක්‍යයෙහි.

**කණ ණෙය්‍ය ණෙය්‍යකය්‍යා.**

සත්තම්‍යන්තා එතෙ පච්චයා හොන්ති බහුලං භවත්ථෙ—කණ—කොසිනාරකො-ණෙය්‍ය-ගඞ්ගෙය්‍යො, වානෙය්‍යො-ණෙය්‍යක-කොලෙය්‍යකො-ය-ගම්මො—රස්සාකාරලොපපුබ්බරූපානි- ඉය-ගමියො, උදරියං—"ණිකො"ති සත්තම්‍යන්තා භවත්ථෙ ණිකො හොති, සරදෙ භවො සාරදිකො, හෙමන්තිකො.

**තමස්සසිප්පං සීලම්පණ්‍යම්පහරණම්පයොජනං.**

පඨමන්තා සිප්පාදිවාචකා අස්සෙති ඡට්ඨ්‍යත්ථෙ ණිකොහොති—වීණාවාදනං සිප්පමස්ස වෙණිකො, පංසුකූලධාරණං සීලමස්ස පංසුකූලිකො, ගන්ධො පණ්‍යමස්ස ගන්ධිකො, චාපො පහරණමස්ස චාපිකො,

---

කණ—සත්තම්‍යන්තා, සප්තම්‍යන්තනාමයාකෙරෙන්; භවත්ථෙ, භවාර්ථයෙහි; එතෙපච්චයා, මේ ප්‍රත්‍යයෝ; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; හොන්ති, වෙත්; කණ, කණප්‍රත්‍යයවේ; කොසිනාරකො යනුවේ; ණෙය්‍ය, ණෙය්‍යප්‍රත්‍යයවේ; ගඞ්ගෙය්‍යො වානෙය්‍යොයනුවේ; ගඞ්ගායංභවො වනෙ භවො යනු විග්‍රහයි—ණෙය්‍යක, ණෙය්‍යකප්‍රත්‍යයවේ; කොලෙය්‍යකො යනුවේ; කුලෙභවො යනු විග්‍රහයි; කොලෙය්‍යයි කීනම බල්ලන් කියත්-ය, යප්‍රත්‍යයවේ; ගම්මො, ගම්මොයනුවේ; රස්සාකාරලොපපුබ්බරූපානි; හ්‍රස්වය අකාරලොපය පූර්වරූපය යන මොහුවෙත්; ගාමෙ භවො යන වාක්‍යයෙහි භවාර්ථයෙහි මෙයින් යප්‍රත්‍යයකොට ඔහුපරකල්හි "ලොපො වණ්ණනිච්චණ්ණානං"යි අකාරලොප්කොට "වග්ගලසෙහිතෙ"යි යකාරයහට පූර්වරූප මකාරයක්කොට ආකාරයහට හ්‍රස්වකළකල්හි ගම්මොයනුවේ; ඉය, ඉයප්‍රත්‍යයවේ; ගාමියො උදරියංයනුවේ; ගාමෙ භවො උදරෙභවො යනු විග්‍රහයි; උදරියනම් ආමාශයයි; ණිකොති, ණිකොයනසූත්‍රයෙන්; සත්තම්‍යන්තා, සප්තම්‍යන්තනාමයාකෙරෙන්; භවත්ථෙ, භවාර්ථයෙහි; ණිකොහොති, ණිකප්‍රත්‍යයවේ; සරදෙභවො, ශරත්කාලයෙහිවූයේ; සාරදිකො, සාරදිකනම්වේ; හෙමන්තිකො, හෙමන්තිකනම්වේ; හෙමන්තෙ භවො යනු විග්‍රහයි.

තමස්ස—සතරපදයි—පඨමන්තා, ප්‍රථමාන්තවූ; සිප්පාදිවාචකා, ශිල්පාදිවාචකවූ නාමයාකෙරෙන්; අස්සෙති, මොහටය යන; ඡට්ඨ්‍යත්ථෙ, ෂෂ්ඨ්‍යර්ථයෙහි; ණිකොහොති, ණිකප්‍රත්‍යයවේ; වීණාවාදනං, වීණාවාද්‍යය; සිප්පං, ශිල්පවූයේ; අස්ස, මොහටනුයි; වෙණිකො, වෛණිකනම්වේ; පංසුකූලධාරණං, පාංශුකූලද්‍රීම, සීලං, ස්වභාවවූයේ; අස්ස, මොහටනුයි; පංසුකූලිකො, පංසුකූලිකනම්වේ; ගන්ධො, ගන්ධයතෙම; පණ්‍යං, වික්ණිබඩුවූයේ; අස්ස, මොහටනුයි; ගන්ධිකො, ගාන්ධිකනම්වේ; චාපො, දුන්නතෙම; පහරණං, ආවුධවූයේ; අස්ස,

සතං පයොජනමස්ස සාතිකං "තංහන්තාරහති ගච්ඡතුඤ්ජතිච රතී"ති දුතියන්තා හනතිච්චෙවමාදිස්වත්ථෙසු ණිකො හොති පක්ඛිනො හනතීති පක්ඛිකො—සාකුණිකො-සතමරහතීති සාතිකං—පරදාරං ගච්ඡතීති පාරදාරිකො-බදරෙ උඤ්ඡතීති බාදරිකො-ධම්මංචරතීති ධම්මිකො—අධම්මිකො-"තෙන කතං කීතං බද්ධමභිසඞ්ඛතං සංසට්ඨං හතං හනති ජිතං ජයති දිබ්බති ඛනති තරති චරති වහති ජීවතී"ති තතියන්තා කතාදිස්වත්ථෙසු ණිකො හොති—කායෙන කතං කායිකං—සතෙන කීතං සාතිකං-වරත්තාය බද්ධො වාරත්තිකො—ඝතෙන අභිසඞ්ඛතං සංසට්ඨං වා ඝාතිකං -(අභිසඞ්ඛතං කතාභිසඞ්ඛාරං, සංසට්ඨං මිස්සිතං)—ජාලෙන හතො හනතීතිවා ජාලිකො-

---

මෝහටනුයි; චාපිකො, චාපිකනම්වේ; සතං, සියයෙක්; පයොජනං, ප්‍රයොජනවූයේ; හෙවත් හෙතුවූයේ; අස්ස, මෝහටනුයි; සාතිකං, සාතිකනම්වේ; තංහන්තාරහතිගච්ඡතුඤ්ජති චරතීති, තංහන්තාරහති ගච්ඡතුඤ්ජත්වරති යන සූත්‍රයෙන්; දුතියන්තා, විතීයාන්ත නාමයා කෙරෙන්; හනතීති, හනතියන; එවමාදිස්වත්ථෙසු; මේ ආදි අර්ථයෙහි; ණිකො, ණිකප්‍රත්‍යයවේ; පක්ඛිනො, පක්ෂීන්; හනතීති, මරානුයි; පක්ඛිකො, පක්ඛිකනම්වේ; සාකුනිකො, සාකුනිකනම්වේ; සකුනෙ හනතියනු විග්‍රහයි—මෙහි විතීයා බහුවචනාන්තවූ පක්ඛිශබ්දයා කෙරෙන්ද සකුනශබ්දයා කෙරෙන්ද හනති යන අර්ථයෙහි ණිකප්‍රත්‍යයවේ; සතං, සියයකට; අරහතීති, සුදුසුනුයි; සාතිකං, සාතිකනම්වේ. පරදාරං, පරදාරයන්කරා; ගච්ඡතීති, යේනුයි; පාරදාරිකො, පාරදාරිකනම්වේ; බදරෙ, ඩෙබර; උඤ්ඡතීති, අවුලානුයි; බාදරිකො, බාදරිකනම්වේ; ධම්මං, කුශලධර්මය; චරතීති, හැසිරේනුයි; ධම්මිකො, ධාර්මිකනම්වේ; අධම්මිකො, අධාර්මික නම්වේ; අධම්මංචරති යනු විග්‍රහයි; මෙහි "දිස්සන්තඤ්ඤෙපි පච්චයා"යි ඉකප්‍රත්‍යයවේ; තෙන—පෙ—ජීවති යන සූත්‍රයෙන්; තතියන්තා, තෘතීයාන්ත නාමයා කෙරෙන්; කතාදිස්වත්ථෙසු; කෘතාදිවූ අර්ථයෙහි; ණිකො හොති, ණිකප්‍රත්‍යයවේ; තෙන යනු කරණාර්ථයෙහි තෘතීයාය, ඒ ප්‍රත්‍යයයෙන් සම්බන්ධකරණුලැබේ; කායෙන, කයකරණකොටගෙන; කතං, කරණලද්දේ; කායිකං, කායිකනම්වේ; සතෙන, සියයක්කරණකොටගෙන, කීතං, විකිණීගන්නාලද්දේ; සාතිකං, සාතිකනම්වේ; වරත්තාය, වරපටකරණකොටගෙන; බද්ධො, බඳනාලද්දේ; වාරත්තිකො, වාරත්තිකනම්වේ; (වරත්තාශබ්දය ස්ත්‍රීලිඟුයි। ඝතෙන, ඝෘතය කරණකොටගෙන; අභිසඞ්ඛතං, කරණලද්දේහෝ; සංසට්ඨංවා, මිශ්‍රකරණලද්දේහෝ; ඝාතිකං, ඝාතිකනම්වේ; අභිසඞ්ඛතං, අභිසඞ්ඛත නම්; කතාභිසඞ්ඛාරං, කරණලද අභිසංසකාර ඇත්තේයි; සංසට්ඨං,

අක්ඛෙහි ජිතමක්ඛිකං-අක්ඛෙහි ජයති දිබ්බතීති වා අක්ඛිකො—ඛනිත්තියා ඛනතීති ඛානිත්තිකො—ඉහ නභවති "අඞ්ගුලියා ඛනතී"ති අනභිධානා, අභිධානලක්ඛණා හි තද්ධාදිණාදිසමාසා-උළුම්පෙන තරතීති ඔළුම්පිකො—සකටෙන චරතීති සාකටිකො-ඛන්ධෙන වහතීති ඛන්ධිකො—වෙතනෙන ජීවතීති වෙතනිකො-"තස්ස සංවත්තතී"ති චතුත්ථ්‍යන්තා සංවත්තතීති අස්මිං අත්ථෙ ණිකො—පුනබ්භවාය සංවත්තතීති පොනොභවිකො—"මනාද්‍යාපාදීනමො මයෙ චෙ"ති දුතියො කාරො.

---

සංසට්ඨනම්; මිස්සිතං, මිශ්‍රකරණලද්දේයි; ජලෙන, දූලකරණකොට ගෙන; හතො, මරණලද්දේහෝ; හනතීතිවා, මරානුයිහෝ; ජාලිකො, ජාලිකනම්වේ; අක්ඛෙහි, පසඇටකරණකොටගෙන; ජිතං, දිනනලද්දේ; අක්ඛිකං, අක්ඛිකනම්වේ; (අබ්භූනයයිවඩ්ඪියයිසේයි) අක්ඛෙහි, පසඇට කරණකොටගෙන; ජයති, දිනේනුයිහෝ; දිබ්බතීතිවා, කෙළිනුයිහෝ; අක්ඛිකො, අක්ඛිකනම්වේ; ඛනිත්තියා, හුලින්; ඛනතීති, කනීනුයි; ඛානිත්තිකො, ඛානිත්තිකනම්වේ; (ඛනිත්ති ශබ්දය ස්ත්‍රීලිඞ්ගයි) අඞ්ගුලියා ඛනතීති, අඞ්ගුලියාඛනතියන; ඉහ, මෙහි; නභවති, ණිකප්‍රත්‍යය නොවේ; කුමක්හෙයින්නොවේදයත්? අනභිධානා, එබඳු අර්ථකථනයක් නැතිහෙයිනි; හි, එසේමැයි; තද්ධාදිණාදිසමාසා, තද්ධාදිණාදි සමාසය යනමොහු; අභිධානලක්ඛණා, තදර්ථකථනය ස්වභාවකොට ඇත්තෝයි; උළුම්පෙන, පසුරෙන්; තරතීති, එතරවේනුයි; ඔළුම්පිකො, ඔළුම්පිකනම්වේ; සකටෙන, ගැළින් චරතීති, යේනුයි; සාකටිකො, සාකටිකනම්වේ; ඛන්ධෙන, කඳැටින්; වහතීති, උසුලානුයි; ඛන්ධිකො, ඛන්ධිකනම්වේ; වෙතනෙන, වැටුපෙන්; ජීවතීති, ජීවත්වේනුයි; වෙතනිකො, වෙතනිකනම්වේ; තස්සසංවත්තතීති, තස්ස සංවත්තතියන සූත්‍රයෙන්; චතුත්ථ්‍යන්තා, චතුර්ථ්‍යන්තනාමයා කෙරෙන්; සංවත්තතීති, පවතීය යන; අස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි; ණිකො, ණිකප්‍රත්‍යයවේ; පුන, නැවත; භවාය, භවය පිණිස; සංවත්තතීති, පවතීනුයි; පොනොභවිකො, පොනොභවිකනම්වේ; මනාද්‍යාපාදීනමොමයෙචෙති, මනාද්‍යාපාදීනමොමයෙච යන සූත්‍රයෙන්; දුතියොකාරො, දෙවනඔකාරයෙක්වේ; (පුන යන අසඞ්ඛ්‍යයා උපපදකොට ඇති භවශබ්දයාකෙරෙන් තාදර්ථ්‍ය’යී චතුර්ථීවිභක්තිකොට පුනභවාය සංවත්තති යන වාක්‍යයෙහි චතුර්ථ්‍යන්තනාමයාකෙරෙන් නැවත භවයපිණිස පවතී යනමේ අර්ථයෙහි මෙයින් ණිකකොටසරානමා දිස්සායනාදීන් උකාරයහට වෘද්ධිකොට උත්තරපදයාපරකල්හි පුනශබ්දයාගේ අන්තයහට මනාද්‍යාපාදීනමොමයෙච යන සූත්‍රයෙන් ඔකාරාදෙශ කළකල්හි පොනොභවිකො යනුවේ.

**තතොසම්භූතමාගතා.**

පඤ්චම්‍යන්තා සම්භූතමාගතත්ථෙ එතෙස්වත්ථෙසු ණිකො හොති— මාතිතො සම්භූතමාගතං වා මත්තිකං, පෙත්තිකං.

සුරභිතො සම්භූතත්ථෙ විග්ගහෙ.

**දිස්සන්තඤ්ඤෙපි පච්චයා.**

වුත්තතො'ඤ්ඤෙපි පච්චයා දිස්සන්ති වුත්තාවුත්තත්ථෙසූති ණ්‍යො— සොරබ්භං—"තත්ථ වසති විදිතො භත්තො නියුත්තො"ති ණිකො— රුක්ඛමූලෙ වසතීති රුක්ඛමූලිකො, ලොකෙ විදිතො ලොකිකො, චතුමහාරාජෙසු භත්තා චාතුම්මහාරාජිකා—ද්වාරෙ නියුත්තො දොවාරිකො—දසෙසාක් තදමිතාදිපාඨා.

---

තතො—ත්‍රිපදයි—පඤ්චම්‍යන්තා, පඤ්චම්‍යන්ත නාමයා කෙරෙන්; සම්භූතං, සම්භූතය; ආගතත්ථෙ, ආගතය යන; එතෙසු අත්ථෙසු; මේ අර්ථයෙහි; ණිකො හොති, ණිකප්‍රත්‍යයවේ; මාතිතො, මවකෙරෙන් සම්භූතං, වූයේ හෝ; ආගතංවා, ආයේහෝ; මත්තිකං, මත්තිකනම් වේ; පෙත්තිකං, පෙත්තිකනම්වේ; (පිතිතො සම්භූතමාගතං වායනු විග්‍රහයි) මාතිතො පිතිතො යනු මාතිතොච භගිනියංඡො යන සූත්‍ර නිපාතයෙන් උකාරයහට ඉකාරකොටයි, 'ව්‍යඤ්ජනෙදීඝරස්සා'යි හ්‍රස්ව කොට තකාරයහට ද්විත්වකොට ස්වරලොප් ආදියකළකල්හි මත්තිකං යනුවේ; වෘද්ධිවිත්වකළකල්හි පෙත්තිකංයනුවේ; සුරභිතො සම්භූතත්ථෙ, සුරභිතොසම්භූතං යන විග්ගහෙ, වාක්‍යයෙහි.

දිස්ස-දිස්සන්තිය අඤ්ඤෙය අපිය පච්චයාය යනු පදයි-වුත්තා වුත්තත්ථෙසු, කියනලද නොකියනලද අර්ථයන්හි; වුත්තතො, කියන ලද ප්‍රත්‍යයන්කෙරෙන්; අඤ්ඤෙපි පච්චයා, අන්‍යදවූ ප්‍රත්‍යයෝ; දිස්සන්තීති, දක්නා ලැබෙත්නුයි; ණ්‍යො, (සම්භූතාර්ථයෙහි ණ්‍යප්‍රත්‍යයවේ; සොරබ්භං යනුවේ; සුරභිතො සම්භූතං යන වාක්‍යයෙහි පඤ්චම්‍යන්ත නාමයාකෙරෙන් සම්භූතාර්ථයෙහි මෙයින් ණ්‍යප්‍රත්‍යයද වෘද්ධිදකොට 'ලොපොවණ්ණිවණ්ණානං'යි ඉකාරලොපාදිය කළ කල්හිසොරබ්භංයනුවේ; සුරභිතො, සුගන්ධවත්ද්‍රව්‍යයෙන්; සම්භූතං, උපන්නේ; සොරබ්භං, සොරබ්භනම්වේ; මෙතැන්හි සුරභිශබ්දයෙන් සුගන්ධවත් ද්‍රව්‍යයම් අභෙදෙපචාරයෙන්; කීහයිදතයුතු,තත්ථ—පෙ— නියුත්තොති, නියුත්තො යන සූත්‍රයෙන්; ණිකො, ණිකප්‍රත්‍යයවේ; රුක්ඛමූලෙ, රුක්මුල්හි, වසතීති, වෙසේනුයි; රුක්ඛමූලිකො, රුක්ඛමූලිකනම්වේ; ලොකෙ, ලෙව්හි; විදිතො, ප්‍රසිද්ධවූයේ; ලොකිකො, ලොකිකනම්වේ; චතුමහාරාජෙසු, සතරම්හරජුන්කෙරෙහි; භත්තා, ආදරඇත්තාහු; චාතුම්මහාරාජිකා, චාතුම්මහාරාජික නම්වෙත්; දෙවතාවෝයි; (මෙහිවෘද්ධි ද්විත්වදවේ,) ද්වාරෙ,දොර; නියුත්තො, යෙදු

**ණාඃසිදං.**

ණ්ඩියනතා ඉදම්වචසිං අතේ ණිකො හොති-සඞ්ඝස්ස ඉදං සඞ්ඝිකං, පුග්ගලිකං-"ණොති ණ්ඩියනතා ඉදමිචෙවනසිං අනෙණො— මොග්ගල්ලායනස්ස ඉදං මොග්ගල්ලායනං, (ව්‍යාකරණං)—සොගතං, (සාසනං).

**පිතිතො භාතරි රෙය්‍යණ්.**

පිතුසද්දා තස්ස භාතරි රෙය්‍යණ් හොති—රෝ'නුබන්ධො.

**රානුබන්ධෙ'න්තසරාදිස්ස.**

අනෙනා සරෙ ආදි යස්සාවයවස්ස තස්ස ලොපො හොති රානුබන්ධෙත් උලොපො—පිතු භාතා පෙත්තෙයෝ‍යා.

**මාතිතො ච භගිනියං ජො.**

---

නේ; දෙවාරිකො, දෙවාරිකනම්වේ; තදමිනාදී පාඨා, තදමිනාදිති යන සූත්‍රයෙන්; ද්‍ස්ස, දකාරයහට; ඔක්, ඔක්ආගමවේ; (වාරශබ්දයාගේ දකාරවකාර දෙදෙනාමැද ඔක්වෙයි කකාර අප්‍රයොගවෙයි.

තසයි—විපදයි—ණ්ඩියනතා, ෂණ්ඩ්‍යනන නාමයාකෙරෙන්; ඉදං ඉති, මෙය යන; අස්මිං අතේ, මේඅර්ථයෙහි; ණිකොහොති, ණිකප්‍රත්‍යයවේ; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; ඉදං, මේ; සඞ්ඝිකං, සඞ්ඝිකනම්වේ; පුග්ගලිකං, පුග්ගලිකනම්වේ; පුග්ගලස්ස ඉදං යනු විග්‍රහයි; ණොති, ණොයනසූත්‍රයෙන්—පෙ—ණො, ණප්‍රත්‍යයවේ; මොග්ගල්ලායනස්ස, මොග්ගල්ලායනයාගේ; ඉදං, මේ; මොග්ගල්ලායනං, මොග්ගල්ලායන නම්වේ; ව්‍යාකරණං, ව්‍යාකරණයයි; සොගතං, සොගත නම්වේ; සාසනං, ශාසනයයි; සුගතස්ස ඉදං යනු විග්‍රහයි.

පිතු—ත්‍රිපදයි—පිතුසද්දා, පිතුශබ්දයාකෙරෙන්; තස්සභාතරි, ඔහුගේ බෑයාකිවමනාකල්හි; රෙය්‍යණ්හොති, රෙය්‍යණ්ප්‍රත්‍යයවේ; රෝ, රකාරතෙම; අනුබන්ධො, අනුබන්ධනම්වේ.

රානු—විපදයි—රානුබන්ධෙ, රානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; අනෙනාසරෙ, ප්‍රකෘතිසම්බන්ධවූ අන්ත්‍යස්වරතෙම; ආදි, ආදිවූයේ; යස්සාවයවස්ස, යම් අවයවයක් හටද; තස්ස, ඕහට; ලොපොහොතිති, ලොප්වේනුයි; උලොපො, උකාරයහට ලොප්වේ; පිතුභාතා, පියාගේ බෑයා; පෙත්තෙයෝ‍යා, පෙත්තෙය්‍යනම්වේ; මෙති රානුබන්ධප්‍රත්‍යයා පරකල්හි පිතුශබ්දයාගේ උකාරයහට ලොප්කොට තකාරයහට ද්විත්වද ඉකාරයහට වෘද්ධිඑකාරද වෙයිදතයුතු.

මාති—සතරපදයි—මාතුතොච, මාතුශබ්දයාකෙරෙන්ද; පිතුතොච, පිතුශබ්දයාකෙරෙන්ද; තෙසංභගිනියං, ඒවපිය දෙදෙනාගේ බුහුණක්වමනාකල්හි; ජොහොති, ජප්‍රත්‍යයවේ; මාතුභගිනී,

මාතුතො ච පිතුතො ච තෙසං භගිනියං ඡො හොති—මාතු භගිනී මාතුච්ඡා—"ඉත්ථියමත්තා"ති ආ—එවමපිතුච්ඡා.

**මාතාපිතුස්වාමහො.**

මාතාපිතූහි තෙසං මාතාපිතුස්වාමහො හොන්ති—මාතු මාතා මාතාමහී-මාතු පිතා මාතාමහො—පිතු මාතා පිතාමහී-පිතු පිතා පිතාමහො.

**හිතෙ රෙය්‍යණ.**

මාතා පිතූහි හිතෙ රෙය්‍යණ හොති—මාතු හිතො මත්තෙය්‍යො, පෙත්තෙය්‍යො.

**තමස්ස පරිමාණං ණිකො ච.**

පඨමන්තා අස්සෙති අස්මිං අත්ථෙ ණිකො හොති කො ච, තඤ්චෙ පඨමන්තං පරිමාණම්භවති.

---

මවගේ බුහුණ; මාතුච්ඡා, මාතුච්ඡා නමු; ඉත්ථියමත්තාති, ඉත්ථියමත්තා යන සූත්‍රයෙන්; ආපච්චයො, ආප්‍රත්‍යයවේ; පිතුච්ඡායනුද; එවං, මෙසේමැයි; (දෙතැන්හිම ඡකාරයහට ච්ඡද ආප්‍රත්‍යයදවේ.)

මාතා—මාතාපිතූහි, මාතාපිතුශබ්දයන්කෙරෙන්; තෙසංමාතා පිතුසු, ඔවුන්ගේ මවිපියන්කිවමනාකල්හි; ආමහොහොති, ආමහ ප්‍රත්‍යයවේ; මාතුශබ්දයාකෙරෙන්මව කිවමනාකල්හිම පිතුශබ්දයා කෙරෙන් පියා කිවමනාකල්හිම වන්නේ නොවෙයි, එකි එකි ශබ්ද යක්හුකෙරෙන් දෙදෙනාම කිවමනාකල්හිවෙයි දතයුතු—මාතු මාතා, මවගේ මව්; මාතාමහී, මාතාමහීනමු; මාතුපිතා, මවගේපිය, මාතාමහො, මාතාමහනම්වේ; පිතුමාතා, පියාගේමව, පිතාමහී, පිතාමහීනමු; පිතුපිතා, පියාගේපිය; පිතාමහො, පිතාමහනම්වේ; (මාතාමහී පිතාමහීයන දෙතැන්හි ආමහප්‍රත්‍යයද 'නදාදිතොඊ'යි ඊප්‍රත්‍යයදවේ.

හිතෙ—ඒපදයි-මාතාපිතූහි, මාතාපිතුශබ්දයන්කෙරෙන්; හිතෙ, හිතාර්ථයෙහි; රෙය්‍යණහොති, රෙය්‍යණප්‍රත්‍යයවේ; මාතුහිතො, මවටහිතවූයේ; මත්තෙය්‍යො, මත්තෙය්‍යනම්වේ; පෙත්තෙය්‍යො, පෙත්තෙය්‍යනම්වේ; පිතුහිතො යනුවිග්‍රහයි; 'ව්‍යඤ්ජනෙදීඝරස්සා'යි ආකාරයහට හ්‍රස්වද ඉකාරයහට වෘද්ධිදවේ.

තමස්ස—පස්පදයි—පඨමන්තා ප්‍රථමාන්තනාමයා කෙරෙන්; අස්සෙති, මෝහටය යන; අස්මිංඅත්ථෙ, මේ අර්ථයෙහි; ණිකොහොති, ණිකප්‍රත්‍යයවෙයි; කොච, කප්‍රත්‍යයදවේ; පඨමන්තං, ප්‍රථමාන්තවූ; තං, ඒශබ්දරූපය; චෙ, ඉදින්; පරිමාණම්භවති, පරිමාණවාචීනම්; දෙණො, ද්‍රොණයෙක්තෙම; පරිමාණං, හාත්පසින් ප්‍රමාණවූයේ; අස්ස, මෝහටනුයි; දෙණිකො, දෙණිකනම්වේ; වීහි, වීයි; එකං,

දෙණො පරිමාණමස්ස දෙණිකො, (වීහි)—එකම්පරිමාණමස්ස එකකං—ද්වීකං, තිකං, චතුක්කං, පඤ්චකමිච්චාදි.

**සඤ්ජාතා තාරකාදිත්විතො.**

තාරකාදිහි පඨමන්තෙහි අසෙසති ඡට්ඨත්ථෙ ඉතො හොති, තෙ චෙ සඤ්ජාතා හොන්ති-තාරකා සඤ්ජාතා අස්ස තාරකිතං-(ගගනං)-පුප්ඵිතො-(රුක්ඛො). පල්ලවිතා ලතා,

**මානෙ මත්තො.**

පඨමන්තා මානවුත්තිතො අසෙසති අස්මිං අත්ථෙ මත්තො හොති-පලං උම්මානමස්ස පලමත්තං, හත්ථො පරිමාණමස්ස හත්ථමත්තං, සතං මානමස්ස සතමත්තං.

---

එකෙක්; පරිමාණං, ප්‍රමාණවූයේ; අස්ස, මෝහටතුයි; එකකං, එකක නම්වේ; ද්වීකං තිකං චතුක්කංපඤ්චකං ඉති, ද්වීකං තිකං චතුක්කං පඤ්චකං යන; ආදි, මේ ආදියුවේ; ද්වෙපරිමාණමස්ස තීණිපරිමාණමස්ස චත්තාරිපරිමාණමස්ස පඤ්චපරිමාණමස්ස යනු විග්‍රහයි; ප්‍රථමාන්තවූ මොවුන් හැමදෙනාකෙරෙන් කප්‍රත්‍යයවේ.

සඤ්ජාතා—සඤ්ජාතාය තාරකාදිතොය ඉතොය යනුපදයි; පඨමන්තෙහි, ප්‍රථමාන්තවූ; තාරකාදීහි, තාරකාදි ශබ්දයන්කෙරෙන්; අසෙසති, මෝහටය යන; ඡට්ඨත්ථෙ, ෂෂ්ඨ්‍යර්ථයෙහි; ඉතොහොති, ඉත ප්‍රත්‍යයවේ; තෙ, ඒතාරකාදීහු; චෙ, ඉදින්; සඤ්ජාතා හොන්ති, උපන්නාහුනම්වෙද්ද; තාරකා, තාරකාවෝ; සඤ්ජාතා, උපන්නාහු; අස්ස, මෝහටතුයි; තාරකිතං, තාරකිත නම්වේ; ගගනං, ආකාශයයි; ප්‍රථමාන්තවූ තාරකාශබ්දයාකෙරෙන්; සඤ්ජාතා තාරකාඅස්ස යන වාක්‍යයෙහි මේ සූත්‍රයෙන් ෂෂ්ඨ්‍යර්ථයෙහි ඉතප්‍රත්‍යයවෙයි පූර්වස්වර ලොප්වෙයි තාරකිතං යනුවේ; පුප්ඵිතො, පුප්ඵිතනම්වේ; රුක්ඛො, රුකයි; පුප්ඵානි සඤ්ජාතානි අස්ස යනු විග්‍රහයි; මේ පුල්ලිඟුවට උදාහරණයි, ස්ත්‍රීලිඟුයෙහි පල්ලවිතා ලතායනුවේ; පල්ලවා සඤ්ජාතා අස්සාති විග්‍රහයි.

මානෙ—ඒපදයි—මානවුත්තිතො, පරිමාණයෙහි වැටෙන්නාවූ; පඨමන්තා, ප්‍රථමාන්ත නාමයා කෙරෙන්; අසෙසති, මෝහටය යන; අස්මිංඅත්ථෙ, මේ අර්ථයෙහි; මත්තොහොති, මත්තප්‍රත්‍යයවේ; පලං, පලෙක්; උම්මානං, මත්තෙන් ප්‍රමාණකරණුලබන්නේ; අස්ස, මෝහටතුයි; පලමත්තං, පලමත්ත නම්වේ; (පලෙක්නම් දසකලදෙකි, ධරණානි පලං දස යනු නිඝණ්ඩුයි) හත්ථො, හස්තයතෙම; හෙවත් රියනෙක්; පරිමාණං, ප්‍රමාණකරණුලබන්නේ; අස්ස, මෝහටතුයි; හත්ථමත්තං, හත්ථමත්ත නම්වේ; සතං, ශතයෙක්; මානං, සංඛ්‍යාවූයේ; අස්ස, මෝහටතුයි; සතමත්තං, සතමත්ත නම්වේ.

**ණො ච පුරිසා.**

පුරිසා පඨමන්තා උද්ධමානවුත්තිතො අසෙසති අස්මිං අත්ථෙ ණො හොති මත්ත තග්ඝා ච—පුරිසො උම්මානමස්ස පොරිසං, පුරිසමත්තං, පුරිසතග්ඝං.

**තස්ස භාවකම්මෙසු ත්ත තා ත්තන ණ්‍ය ණෙය්‍ය ණිය ඉයා.**

භවන්ති එතස්මා සද්දබුද්ධීති භාවො සද්දප්පවත්ති නිමිත්තං—කම්මං ක්‍රියා-ඡට්ඨියන්තා භාවෙ කම්මෙ ච ත්ත තාදයො හොන්ති බහුලං—සාමඤ්ඤවිධයො පයොගමනුසාරයන්තීති කුතොචි විසු කුතොචි භාවෙ යෙව—න ච සබ්බෙ සබ්බතො හොන්ති අඤ්ඤත්‍ර ත්තතාහි—නීලස්ස පටස්ස භාවො නීලත්තං නීලතාති ගුණො භාවො—ඉහ ගුණවසා නීලසද්දො නීලගුණයුත්තෙ දබ්බෙ වත්තතෙ නිමිත්තස්සරූපානුගතා

---

ණොච—ත්‍රිපදයි—උද්ධමානවුත්තිතො, උන්මානයෙහි වැටෙන්නාවූ; පඨමන්තා, ප්‍රථමාන්තවූ; පුරිසා, පුරිසශබ්දයා කෙරෙන්; අසෙසති, මෝහටය යන; අස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි; ණොහොති, ණප්‍රත්‍යයවේ; මත්තතග්ඝාච, මත්තතග්ඝ ප්‍රත්‍යයෝද (වෙත්;) පුරිසො, පුරුෂයෙක්තෙම; උම්මානං, උද්ධමානවූයේ; අස්ස, මෝහටත්‍රුයි; පොරිසං, පොරිසනම්වේ; පුරිසමත්තං පුරිස තග්ඝං, පුරිසමත්ත නම් වේ; පුරිසතග්ඝනම්වේ; ලිඞ්ගත්‍රයෙහිම එකවාක්‍යයයි.

තස්ස—ත්‍රිපදයි—එතස්මා, මොහුකෙරෙන්; සද්දබුද්ධිච, ශබ්ද බුද්ධිදෙදෙන; භවන්තී ඉති, වෙත්ත්‍රුයි; භාවො, භාවනම්වේ; හේකි මෙක්දයත්? සද්දප්පවත්තිනිමිත්තං, ශබ්දයාගේ ප්‍රවෘත්තියට කාරණ යයි; කම්මං, කර්මනම්; ක්‍රියා, ක්‍රියාවයි; ඡට්ඨියන්තා, ෂෂ්ඨ්‍යන්තනාම යාකෙරෙන්; භාවෙ, භාවයකිවමනාකල්හිද; කම්මෙච, ක්‍රියාව කිව මනාකල්හිද; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; ත්තතාදයො හොන්ති, ත්ත තාදිප්‍රත්‍යයෝද වෙත්; සාමඤ්ඤවිධයො, සාමාන්‍යවිධීහු; පයොග මනුසාරයන්තීති, ප්‍රයොගය අනුවපවතීත්‍රුයි; කුතොචි, කිසිශබ්ද යක්හු කෙරෙන්; විසු, භාවකර්මදෙක්හි වෙති; කුතොචි, කිසිශබ්ද යක්හුකෙරෙන්; භාවෙයෙව, භාවයෙහිමවෙත්; ත්තතාහි අඤ්ඤත්‍ර, ත්තතා ප්‍රත්‍යයන් විනා; සබ්බෙපි, සියලු ප්‍රත්‍යයෝ; සබ්බතො නච හොන්ති; සියලු ශබ්දයන් කෙරෙන් නොමවෙත්; ශබ්දප්‍රවෘත්ති නිමි ත්තයද අනෙකාකාරබැවින් දූත් ඒවිභාගය දක්වන්නාහු නීලස්ස යනාදිකිහු; නීලස්ස පටස්ස, නීලවස්ත්‍රයාගේ; භාවො, භාවයතෙම; නීලත්තං, නීලත්තනම; නීලතාති, නීලතානම යනමෙහි; ගුණො, නීලගුණයතෙම; භාවො, භාවනම්වේ; ශබ්දප්‍රවෘත්තිනිමිත්ත නම්වෙ යිසේයි; ඉහ, මෙහි; ගුණවසා, නීලගුණවශයෙන්; නීලසද්දො, නීල

චබුද්ධි-එවමඤ්ඤත්‍රාපි යථානුරූපං ඤාතබ්බං, නීලස්සගුණස්සභාවො නීලත්තං, නීලතාති නීලගුණජාති-ගොත්තං ගොතාති ගොජාති—පාචකත්තන්ති පචනක්‍රියාසම්බන්ධො-රාජපුරිසත්තන්ති රාජසම්බන්ධො-දෙවදත්තත්තං චන්දත්තං සුරියත්තන්ති තදවත්ථාවිසෙස සාමඤ්ඤං-

---

ශබ්දයතෙම; නීලගුණයුත්තොදබ්බෙ වත්තතෙ, නීලගුණයෙන්යුක්තාවූ පටද්‍රව්‍යයෙහි වැටේ; නිමිත්තස්සරූපානුගතාවබුද්ධි, නිමිත්තස්වරූපයා අනුවගියාවූ බුද්ධියද පටද්‍රව්‍යයෙහි වැටේ; අඤ්ඤත්‍රාපි, සෙසුතන්හිදු; යථානුරූපං, සුදුසු සුදුසුවූ පරිද්දෙන්; එවං, මෙසේ; ඤාතබ්බං, දතයුත්තේයි; නීලස්ස ගුණස්ස, නීලගුණයාගේ; භාවො, භාවය තෙම; නීලත්තං, නීලත්ත නම; නීලතාති, නීලතානම යන මෙහි; නීලගුණජාති, නීලගුණජාතිතොම; භාවො, භාවනම්වේ; නීලගුණ ජාතිනිමිත්තව නීලශබ්දය නීලගුණයෙහි වැටෙතු හෙයිනි, මෙයින් ගුණ ශබ්දයන්ගේ ගුණයෙහි ප්‍රවෘත්තියක් ඇතිකල්හි ගුණජාති නිමිත්තය ද්‍රව්‍යයෙහි ප්‍රවෘත්තියක්ඇතිකල්හි ගුණය නිමිත්තයයිදතයුතු. ගොත්තං ගොතාති, ගොත්තං ගොතා යනමෙහි; ගොජාති, ගොජාතිතොම; භාවො, භාවනම්වේ; මෙයින් ජාතිශබ්දයන්ගේ ද්‍රව්‍යයෙහි ප්‍රවෘත්තියක් ඇතිකල්හි; ජාතියනිමිත්තයයි කථිතයි; පාචකත්තන්ති පාචකත්තං යනමෙහි; පචනක්‍රියා සම්බන්ධො, පචනක්‍රියා සම්බන්ධය තෙම; භාවො, භාවනම්වේ; පචනක්‍රියාසම්බන්ධයෙන් පාචකයයිකියනු ලබන හෙයින් පචන ක්‍රියාසම්බන්ධය නිමිත්ත නම්වේ; රාජපුරිසත්තන්ති, රාජපුරිසත්තං යනමෙහි; රාජසම්බන්ධො, රාජසම්බන්ධය; භාවො, භාවනම්වේ; රාජසම්බන්ධයෙන් රාජපුරුෂයයි කියනලදබව හෙයින් රාජසම්බන්ධය නිමිත්තවේ; දෙවදත්තත්තං—පෙ— සුරියත්තං යන මෙහි; තදවත්ථාවිසෙසසාමඤ්ඤං, ඒ දෙවදත්තාදීන්ගේ අවස්ථාවිශෙෂසාමාන්‍යය, භාවො, භාවනම්වේ; එසේමැයි, දෙවදත්තයාගේ බාල්‍යාවස්ථාභෙදහෙයින් චන්ද්‍රයාගේ චිත්‍රියාදියෙහි කලාද්‍යවස්ථාභෙදහෙයින් සූර්‍ය්‍යයාගේ දවස දවස උදයාදියෙහි මද පවු පවු තරාද්‍යවස්ථාභෙද හෙයින් ඔවුන්ගේ සාමාන්‍යය දෙවදත්තත්තං යනාදි භාවප්‍රත්‍යයෙන් කියනු ලැබේ; මෙයින් විද්‍යමාන පදාර්ථවිෂයවූ සංඥශබ්දයන්ගේ ප්‍රවෘත්ති නිමිත්තයකථිතයි; ආකාසත්තං අභාවත්තන්ති, ආකාසත්තං අභාවත්තං යනමෙහි; උපචරිත භෙද සාමඤ්ඤං, ආකාශාදි අභෙදයන්කෙරෙහි; ද්‍රව්‍යභෙද කල්පනා සාමාන්‍යයයි; එසේමැයි, ඝටිකාකාසො පිඨරාකාසොයි සම්බන්ධිභෙදයෙන් අභෙදයෙහිදු භෙදයෝලොකයෙහි උපචරිතයහ, ඝටාභාවො පටාභාවොයි අභෙදයෙහි භෙද කල්පිතය, ඒ උපචරිතභෙදයන්ගේ සාමාන්‍යය යමෙක් නිමිත්තකොට ඔවුන්කෙරෙහි ආකාසො, ආකාසො

ආකාසත්තං අභාවත්ත්තානි උපචරිතභෙදසාමඤ්ඤං-අලසස්ස භාවො කම්මංවා අලසත්තං අලසතා-ත්තන, පුථුජ්ජනත්තනං-ණ්‍ය, චාපල්‍යං -"සකත්‍ථෙනි" සකත්‍ථෙපි-අකිඤ්චනමෙව ආකිඤ්චඤ්ඤං—ණෙය්‍ය, සොචෙය්‍යං—ණ, පාටවං-අවඩ්-ඉය, නග්ගියං—ණිය, පොරොහිතියං.

**තර තමිස්සිකියිඨාතිසයෙ.**

අතිසයෙ වත්තමානතො හොන්තෙතෙ පච්චයා—අතිසයෙන පාපො පාපතරො, පාපතමො, පාපිස්සිකො, පාපියො, පාපිඨො-අතිසයන්තාපි අතිසයප්පච්චයො—අතිසයෙන පාපිඨො පාපිඨ තරො—උදුම්බරස්ස විකාරො'වයවොචෙමාදිවිග්ගහෙ.

---

සිද්; අභාවො, අභාවොයිද ශබ්දය පවතීද ඒභාවප්‍රත්‍යයෙන් කියනු ලැබේ; අලසස්ස, අලසයාගේ; භාවො, භාවයහෝ; කම්මංවා, ක්‍රියාව හෝ; අලසත්තං, අලසත්තනම්වේ; අලසතා, අලසතානම්වේ; ත්තන, ත්තනප්‍රත්‍යයවේ; පුථුජ්ජනත්තනං යනුවේ; පුථුජ්ජනස්සභාවො යනු විග්‍රහයි; ණ්‍ය, ණ්‍යප්‍රත්‍යයවේ; චාපල්‍යං යනුවේ; චපලස්සභාවො යනු විග්‍රහයි; සකත්‍ථෙනි, සකත්‍ථෙ යන සූත්‍රයෙන්; සකත්‍ථෙපි, ස්වාර්‍ථයෙහිදු ණ්‍ය ප්‍රත්‍යයවේ; අකිඤ්චනමෙව, කිසිවක්නැතිබවම; ආකිඤ්චඤ්ඤං, ආකිඤ්චඤ්ඤනම්වේ; අකිඤ්චනමෙව යන වාක්‍යයෙහි ප්‍රථමාන්තවූ අකිඤ්චන ශබ්දයාකෙරෙන් සකත්‍ථෙ යන සූත්‍රයෙන් ස්වාර්‍ථයෙහි ණ්‍යප්‍රත්‍යයද වෘඩ්දකොට තවග්ගවරණාදීන් නකාරයහට ඤකාරද 'වග්ගලසෙහිතෙ'යි යකාරයහට පූර්වරූපද කළකල්හි ආකිඤ්චඤ්ඤනම්වේ; ණෙය්‍ය, ණෙය්‍යප්‍රත්‍යයවේ; සොචෙය්‍යං යනුවේ; සුචිනොභාවො යනු විග්‍රහයි; ණ, ණප්‍රත්‍යයවේ; පාටවං යනුවේ; අවඩ්, උවණ්ණස්සාවඩ්සරෙ යන සූත්‍රයෙන් අවඩ්වේ; පටුනොභාවො යනු විග්‍රහයි; ඉය, ඉය ප්‍රත්‍යයවේ; නග්ගියං යනුවේ;-නග්ගස්සභාවො යනු විග්‍රහයි; ණිය, ණියප්‍රත්‍යයවේ; පොරොහිතියං යනුවේ; පුරොහිතස්ස භාවො යනු විග්‍රහයි.

තර-තරතමිස්සිකියිඨාය අතිසයෙය යනුපදයි; අතිසයෙවත්තමානතො, උත්කර්‍ෂයෙහි වැටෙන්නාවූ නාමයාකෙරෙන්; එතෙපච්චයා, මේ තරාදි ප්‍රත්‍යයෝ; හොන්ති, වෙත්; අතිසයෙන, උත්කර්‍ෂයෙන්; පාපො, පවිටුතෙම; පාපතරො, පාපතරනම්වේ; පාපතමො, පාපතමනම්වේ; පාපිස්සිකො, පාපිස්සිකනම්වේ; පාපියො, පාපියනම්වේ; පාපිඨො, පාපිඨනම්වේ; අයඤ්චපාපො අයඤ්චපාපො අය මෙතෙසමතිසයෙන පාපොයන වාක්‍යයෙහි තරතමස්සික ඉය ඉඨප්‍රත්‍යයෝවෙත්—අතිසයන්තාපි, අතිසය ප්‍රත්‍යයාන්තයා කෙරෙන්; අතිසයප්පච්චයො, අතිසයප්‍රත්‍යයවේ; අතිසයෙන, උත්කර්‍ෂයෙන්; පාපිඨො, පාපිඨතෙම; පාපිඨතරො, පාපිඨතරනම්වේ; අයඤ්චපාපිඨො අයඤ්ච

**තස්ස විකාරාවයවෙසු ණ ණික ණෙය්‍ය මයා.**

පකතියා උත්තරමවත්ථන්තරං විකාරෙ—ඡට්ඨියන්තා නාමස්මා විකාරෙ'වයවෙ ච ණාදයො හොන්ති බහුලං—ණ, ඔදුම්බරං- භස්මං පණ්ණං වා )ණික, කප්පාසිකං-ණෙය්‍ය, එණෙය්‍යං-මය, තිණමයං—"අඤ්ඤස්මින්ති" අත්ථන්තරෙපි—ගුන්නං කරීසං ගොමයං.

මනුස්සානං සමූහොත්‍යෙවමාදිවිග්ගහෙ.

**සමූහෙ කණ් ණ ණිකා.**

ඡට්ඨියන්තා සමූහෙ කණ් ණ ණිකා හොන්ති—මානුස්සකං, කාකං,

---

පාපිට්ඨො අයමෙතෙසමතිසයෙන පාපිට්ඨො යනු විග්‍රහයි; උදුම්බරස්ස විකාරො'වයවො ඉති, උදුම්බරස්සවිකාරො'වයවො යන එවමාදිවිග්ගහෙ, මේ ආදි වාක්‍යයෙහි.

තස්ස–ත්‍රිපදයි—පකතියා, ප්‍රකෘතියගේ; උත්තරං, මත්තෙහිවූ; අවත්ථන්තරං, අන්‍යාවස්ථාව; විකාරො, විකාරනම්; ඡට්ඨියන්තා නාමස්මා, ෂෂ්ඨ්‍යන්ත නාමයාකෙරෙන්; විකාරෙ, විකාරාර්ථයෙහිද; අවයවෙච, අවයවාර්ථයෙහිද; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; ණාදයො හොන්ති, ණප්‍රත්‍යයාදීහුවෙත්; ණ, ණප්‍රත්‍යයවේ; මත්තෙහිදු මෙමනයයි, ඔදුම්බරං, ඔදුම්බරනම්වේ; භස්මං, භස්මයහෝ, පණ්ණංවා, පණීය හෝයී; කාප්පාසිකං, කප්පාසිකනම්වේ; වස්ත්‍රයයි; කප්පාසස්ස විකාරොයනු විග්‍රහයි; එණෙය්‍යං එණෙය්‍යනම්වේ; එණස්ස විකාරොවයවොවායනු විග්‍රහයි, විකාරාර්ථයෙහි වූව මාංසයයි; අවයවාර්ථයෙහිවූව සප්පයයි; සප්පියනම් පිණ්ඩියයි; තිණමයං, තිණමයනම්වේ; තිණානං විකාරොයනු විග්‍රහයි; අඤ්ඤස්මින්ති, අඤ්ඤස්මිං යන සූත්‍රයෙන් අත්ථන්තරෙපි, මෙයින් අන්‍යවූ අර්ථයෙහිද මයප්‍රත්‍යයවේ; ගුන්නං, ගෙරින්ගේ; කරීසං, කරීෂය; ගොමයං, ගොමයනම්වේ; ගුන්නංකරීසංයනු විග්‍රහයි; කරීෂය ගෙරින්ගේ විකාරද අවයවද නොවනබැවින් අඤ්ඤස්මිං යනාදිකීහු; බහුලංවිධානයෙන් මේ ණාදිප්‍රත්‍යයෝ ප්‍රාණි ඖෂධි වෘක්ෂවාචීන්කෙරෙන් විකාරාවයවදෙක්හිවෙති, අන්‍යයන්කෙරෙන් විකාර මාත්‍රයෙහි වෙති; මනුස්සානං සමූහොත්, මනුස්සානං, සමූහො යන; එවමාදි විග්ගහෙ, මේ ආදිවාක්‍යයෙහි.

සමූ–ත්‍රිපදයි—ඡට්ඨියන්තා, ෂෂ්ඨ්‍යන්ත නාමයාකෙරෙන්; සමූහෙ, සමූහාර්ථයෙහි; කණ්ණණිකාහොන්ති, කණ්ණණිකප්‍රත්‍යයෝවෙත්; මානුස්සකං—මනුස්සානං සමූහො කාකානං සමූහො අපූපානං සමූහොයනු විග්‍රහයි-අපූපනම් කොලින් පැසූයේයි; ජනාදීහිතාති, ජනාදීහිතායන සූත්‍රයෙන්; සමූහෙ, සමූහාර්ථයෙහි; තා, තාප්‍රත්‍යයවේ; ජනානං, ජනයන්ගේ; සමූහො, සමූහයතෙම; ජනතා, ජනතා

ආපූපිකං–“ජනාදීහි තා” ති සමූහෙ තා—ජනානං සමූහො ජනතා, ගජතා, බන්ධුතා.

**එකා කාක්‍යසහායෙ.**

එකස්මා අසහායත්ථෙ ක ආකී හොන්ති–එකො'ව එකකො, එකාකී

**අයුභද්විතීහංසෙ.**

උභද්විතීහි අවයවවුත්තීහි පඨමන්තෙහි අංසෙති ඡට්ඨ්‍යත්ථෙ අයො හොති–උභො අංසා අස්ස උභයං, ද්වයං, තයං–ද්වින්නං පූරණො ද්වා දිවිග්ගහෙ–“චතුත්ථදුතියෙස්වෙසං තතියපඨමා”ති නිපාතනා පූරණත්ථෙ ද්විතො තියො ද්විස්ස දු ච තිචතූහි අතියත්ථා ච දුතියො, තතියො, චතුත්ථො.

**ම පඤ්චාදීහි කතීහි.**

ඡට්ඨියන්තාය පඤ්චාදිකාය සඞ්ඛ්‍යාය කතිස්මා ච මො හොති පූරණ

---

නම්වේ; ගජතා බන්ධුතා යනුවේ; ගජානං සමූහො බන්ධූනං සමූහො යනුවිග්‍රහයි.

එකා–එකාය ආකීය අසහායෙය යනු පදයි—පඨමන්තෙහි, ප්‍රථමාන්තවූ; අවයවවුත්තීහි, අවයවයෙහි වැටෙන්නාවූ; උභද්විතීහි, උභශබ්දද්විශබ්දතිශබ්දයන්කෙරෙන්; අංසෙති, මෝහටයයන; ඡට්ඨ්‍යත්ථෙ, ෂෂ්ඨීයගේ අර්ථයෙහි; අයො හොති, අයප්‍රත්‍යයවේ; උභොඅංසා, කොඨාසයෝ දෙදෙනෙක්; අස්ස, මෝහටනුයි; උභයං, උභයනම්වේ; ද්වයංතයං යනුවේ; ද්වෙ අංසා අස්ස තයො අංසා අස්ස යනු විග්‍රහයි; ද්වින්නංපූරණො ඉති; ද්වින්නං පූරණො යන; ආදිවිග්ගහෙ, මේ ආදි වාක්‍යයෙහි; චතුත්ථ—පෙ—පඨමාති, පඨමායන; නිපාතනා, සූත්‍ර නිපාතනයෙන්; පූරණත්ථෙ, පූරණාර්ථයෙහි; ද්විතො, ද්විශබ්දයාකෙ කෙරෙන්; තියො, තියප්‍රත්‍යයද; ද්විස්ස, ද්විශබ්දයහට; දුච, දුයනආදෙශදවෙයි; තිචතූහි, තිශබ්ද චතුශබ්දයන් කෙරෙන්; අතියත්ථාච, අතියත්ප්‍රත්‍යයෝදවෙත්; දුතියො යනාදියවේ; ද්වින්නං පූරණො ඉති, ද්වින්නං පූරණො යන; ආදිවිග්ගහෙ, මේ ආදිවාක්‍යයෙහිෂෂ්ඨ්‍යන්තවූ ද්විශබ්දයා කෙරෙන් ‘චතුත්ථදුතියෙස්වෙසං තතියපඨමා’ යන සූත්‍ර නිපාතයෙන් සඞ්ඛ්‍යාපූරණාර්ථයෙහි තියප්‍රත්‍යයද ද්විශබ්දයහටදු ආදෙශදකළකල්හි දුතියො යනුවේ; තිශබ්දයා කෙරෙන් අතිය ප්‍රත්‍යය කොට ස්වරලොප්ආදි කළකල්හි තතියො යනුවේ; චතුශබ්දයා කෙරෙන් කීතියෙන් ත්ථප්‍රත්‍යයකළකල්හි චතුත්ථො යනුවේ.

මපඤ්චා—මිපදයි—ඡට්ඨියන්තාය, ෂෂ්ඨ්‍යන්තවූ; පඤ්චාදිකාය, පඤ්ච ශබ්දයා ආදිකොට ඇති; සඞ්ඛ්‍යාය, සඞ්ඛ්‍යාවාචීවූශබ්දයන්කෙරෙන්ද; කතිස්මාච, කතිශබ්දයාකෙරෙන්ද; පූරණත්ථෙ, සඞ්ඛ්‍යාපූරණාර්ථයෙහි

ත්ථෙ-පඤ්චන්නං පූරණො පඤ්චමො-එවං සත්තමො, අට්ඨමො, ඉච්චාදි.

**ඡා ඨ ඨමා.**

ඡසද්දා ඨ ඨමා හොන්ති පූරණත්ථෙ-ඡන්නං පූරණො ඡට්ඨො,, ඡට්ඨමො වා.

**ත්‍යස්ස පූරණෙකාදසාදිතො වා.**

ඡට්ඨියන්තායෙකාදසාදිකාය සඞ්ඛ්‍යාය ඩො හොති පූරණත්ථෙ විභාසා-ඩකාරො'නුබන්ධො-එකාදසන්නං පූරණො එකාදසො-අඤ්ඤත්‍ර—එකාදසමොච්චාදි-එවං ද්වාදසො ඉච්චාදි-එකූනවීසත්‍යාදිහිතු ඩෙ.

**ඩෙ සතිස්ස තිස්ස.**

ඩෙ පරෙ සත්‍යන්තස්ස තිකාරස්ස ලොපො හොතීති තිලොපො. එකූනවීසො.

**සතා දීනමි ච.**

---

මොහොති, මප්‍රත්‍යයවේ; පඤ්චන්නං, පස්දෙනෙකුගේ සඞ්ඛ්‍යාව; පූරණො, පුරන්නේ; පඤ්චමො, පඤ්චමනම්වේ; සත්තමො අට්ඨමො ඉති, සත්තමො අට්ඨමො යන; ආදි, ආදියද; එවං, මෙසේමැයි.

ඡ-විපදයි—ඡසද්දා, ඡශබ්දයාකෙරෙන්; පූරණත්ථෙ, පූරණාර්ථයෙහි; ඨ ඨමාහොන්ති, ඨ ඨමප්‍රත්‍යයෝවෙත්; ඡන්නං, සදෙනෙකුගේ සඞ්ඛ්‍යාව; පූරණො, පුරන්නේ; ඡට්ඨො, ඡට්ඨනම්වෙයි; ඡට්ඨමොවා, ඡට්ඨමනම්හෝවේ.

ත්‍යස්ස-සතරපදයි-ඡට්ඨියන්තාය, ෂෂ්ඨ්‍යන්තවූ; එකාදසාදිකාය, එකාදසශබ්දයා ආදිකොටඇති; සඞ්ඛ්‍යාය, සඞ්ඛ්‍යාශබ්දයා කෙරෙන්; පූරණත්ථෙ, සඞ්ඛ්‍යාපූරණාර්ථයෙහි; විභාසා, විකල්පයෙන්; ඩොහොති, ඩප්‍රත්‍යයවේ; ඩකාරො—පෙ—එකාදසො යනුවේ; අඤ්ඤත්‍ර, ඩප්‍රත්‍යයනුවූ පක්ෂයෙහි; එකාදසමො, එකාදසමො යනුවේ; (මපඤ්චාදිහික තීහි'යී මප්‍රත්‍යයවූ තැනි) ද්වාදසො යනුවේ;—පෙ—මෙසේමැයි; එකූනවීසත්‍යාදීහිතු, එකූනවිසති ආදීන්කෙරෙන්; පූරණත්ථෙ, සඞ්ඛ්‍යාපූරණාර්ථයෙහි වනාහි; ඩෙ, ඩප්‍රත්‍යය කළකල්හි.

ඩෙස—ත්‍රිපදයි—ඩෙපරෙ, ඩපරකල්හි; සත්‍යන්තස්ස, සතිප්‍රත්‍යයාන්තයාගේ; තිකාරස්ස, තිකාරයහට; ලොපොහොතීති, ලොප්වේනුයි; ලොපො, (තිහට) ලොප්වේ; එකූනවීසො යනුවේ; එකූනවීසතියා පූරණො යනු විග්‍රහයි.

සතා-විපදයි—ඡට්ඨියන්තා, ෂෂ්ඨ්‍යන්තවූ; සතාදිකාය සඞ්ඛ්‍යාය, සතශබ්දයා ආදිකොට ඇති; සඞ්ඛ්‍යාශබ්දයාකෙරෙන්; පූරණත්ථෙ, පූරණාර්ථයෙහි; මොහොති, මප්‍රත්‍යයවේ; සතාදීනං, සතාදීන්ගේ;

සතාදිකාය සඞ්ඛ්‍යය ඡඨියන්තාය පූරණත්ථේ මො හොති සතාදීනම් චාන්තාදෙසො—සතස්ස පූරණො සතිමො, සහස්සිමො.

වීසති අධිකා අස්මිං සතෙ සහස්සෙ වා'ති එවමාදිවිග්ගහෙ.

**සඞ්ඛ්‍යාය සච්චුතීසාසදසන්තායාධිකාස්මිං සතසහස්සෙ ඩො.**

සත්‍යන්තාය මුත්‍යන්තාය ඊසන්තාය ආසන්තාය දසන්තාය ච සඞ්ඛ්‍යාය පඨමන්තාය අස්මින්ති සත්තම්‍යත්ථේ ඩො හොති සා චෙ සඞ්ඛ්‍යා අධිකා හොති යදස්මින්ති තචෙ සතං සහස්සං සතසහස්සං වාහොති-තිලොපෙ-වීසං-සතං, සහස්සං, සතසහස්සං වා —උත්‍යන්තාය-නවුති—සතං, සහස්සං, සතසහස්සං වා-ඊසන්තාය- චත්තාරීසං-සතං, සහස්සං, සතසහස්සං වා—ආසන්තාය —පඤ්ඤාසං-සතං, සහස්සං, සතසහස්සං වා—දසන්තාය—එකාදසං-සතං, සහස්සං, සතසහ·

---

අන්තාදෙසො, අන්තයහට ආදෙශවූ; ඉච, ඉකාරයෙක්දවේ; සතස්ස, සතයක් සම්බන්ධව; පූරණො, පුරන්නේ; සතිමො, සතිමනම්වෙයි; සහස්සිමො, සහස්සිමනම්වේ; (සහස්සස්සපූරණො යනු විග්‍රහයි) විසති—පෙ—මේ ආදි වාක්‍යයෙහි.

සඞ්ඛ්‍යා-සඞ්ඛ්‍යායය සච්චුතීසාසදසන්තාය අධිකාය අස්මිංය සත සහස්සෙයඩොයයනු පදයි-පඨමන්තාය, ප්‍රථමාන්තවූ; සත්‍යන්තාය, සති අන්තවූද; උත්‍යන්තාය, උතිඅන්තවූද; ඊසන්තාය, ඊසන්තවූද; ආසන්තාය, ආසන්තවූද; දසන්තාය, දසන්තවූද; සඞ්ඛ්‍යාවාචීශබ්ද යන් කෙරෙන්; අස්මින්ති, මෙහිය යන; සත්තම්‍යත්ථේ, සප්තම්‍යර්ථ යෙහි; ඩොහොති, ඩප්‍රත්‍යයවෙයි; සාසඞ්ඛ්‍යා, ඒසඞ්ඛ්‍යානොමෝ; චෙ, ඉදින්; අධිකාහොති, අධිකවූනම්; යං, යමෙක්තෙම; අස්මින්ති, මෙහියයිකියනලද; තං, ඒ; සතං, සියයෙක්හෝ; සහස්සං, දහසෙක්හෝ; සතසහස්සංවා, ලක්‍ෂයෙක්හෝවීනම්; තිලොපෙ, තිහටලොප්කළ කල්හි; (වීසතිඅධිකා අස්මිං සතෙ යන වාක්‍යයෙහි ප්‍රථමාන්තවූවී සතිශබ්දයා කෙරෙන් මේ සූත්‍රයෙන් සප්තම්‍යර්ථයෙහි ඩප්‍රත්‍යයවෙයි; ඩකාර අප්‍රයොගීවෙයි ඩකාරානුබන්ධප්‍රත්‍යයා පරකල්හි සත්‍යන්තයා ගෙ තිකාරයහට; ඩෙසතිස්ස තිස්ස'යි ලොප්වෙයි, (මෙසේ නිපදවූ විසති ශබ්දයාකෙරෙන්වූ සිහට අංකලකල්හි වීසං යනුවේ) වීසංසතං සහස්සං සතසහස්සංවා, විස්සක්අධිකකොටඇති සියයහෝ දහසහෝ ලක්‍ෂයහෝයි; උත්‍යන්තාය, උතිඅන්තයාකෙරෙන් (ඩප්‍රත්‍යය කියනු ලැබේ;) මත්තෙහිදුමෙමනයයි; නවුතියනාදියට වාක්‍ය නවුති අධිකා චත්තාලීසං අධිකා පඤ්ඤාසං අධිකායනාදීන් දතයුතු. සච්චුතීසාස දසන්තා ඉති, සති උති ඊස ආස දසන්තයන් කෙරෙන්වෙයියනු කුමටය? ඡ අධිකා අස්මිං සතෙ යන තන්හි ඩප්‍රත්‍යය නොවන පිණිසයි;

ස්සං වා-සචචුතීසාසදසනතායාති කිං? ඡ අධිකා අස්මිං සතෙ-අධිකෙති කිං? පඤ්චදස හිනා අස්මිං සතෙ=අස්මින්ති කිං? වීසති අධිකා එතස්මිං සතා-සතසහස්සෙති කිං? එකාදසාධිකා අස්සං වීසතියං.

**තමෙත්ථස්සත්ථීති මන්තු.**

පඨමන්තා එත්ථ අස්ස අත්ථීති එතෙස්වත්ථෙසු මන්තු හොති-ඉතිසද්දස්ස විවක්ඛානියමනත්ථත්තා පහුතාදියුත්තෙනයෙව අත්ථෙහොති—වුත්තංහි.

පහූතෙ ච පසංසායං නින්දායඤ්චාතිසායනෙ
නිච්චයොගෙ ච සංසග්ගෙ හොන්තීමෙ මන්තුආදයො.

පහූතා ගාවො එත්ථ දෙසෙ අස්ස වා පුරිසස්ස සන්තීති ස ගොමා—පසංසායං, පසත්ථා ජාති අස්ස අත්ථීති ජාතිමා—නින්දායං, වලිමා-අතිසායනෙ, බුද්ධිමා-නිච්චයොගෙ, ජුතිමා-සංසග්ගෙ, හලිද්දිමා.
තමෙත්ථස්සත්ථීති අධිකාරො.

---

අධිකෙති, අධිකයාකෙරෙන් වෙයියනු; කිං, කුමටය? පඤ්චදසහිනා අස්මිං සතෙ ඉනතන්හි ඩප්‍රත්‍යයනොවන පිණිසයි; අස්මින්ති, අස්මිං යනු; කිං, කුමටය? වීසති අධිකාඑතස්මිං සතා යනතන්හි ඩප්‍රත්‍යය නොවන පිණිසයි; සතසහස්සෙසයනු; කිං, කුමටය; එකාදසඅධිකා අස්සං වීසතියං යනතන්හි ඩප්‍රත්‍යයනොවන පිණිසයි.

තමෙත්-සපදයි—පඨමන්තා, ප්‍රථමාන්තවූ නාමයාකෙරෙන්; එත්ථඅස්ස අත්ථීති, මෙහි ඇතමෝහට ඇතයන; එතෙස්වත්ථෙසු; මේ අර්ථයෙහි; මන්තුහොති, මන්තුප්‍රත්‍යයවේ; ඉතිසද්දස්ස, ඉතිශබ්දයාගේ; විවක්ඛානියමනත්ථත්තා, අසතිවිවක්ෂාවව විෂයනියමකිරීම අර්ථකොට ඇතිබව හෙයින්; පහුතාදි යුත්තෙනව, පහූතාදීන්හා යුක්තවූම; අත්ථෙ, හොති, අන්‍යාර්ථයෙහිවේ; වුත්තංහි, කියනලදමැයි.

ඉමෙ මන්තුආදයො, මේ මන්තුවාදිප්‍රත්‍යයෝ; පහූතෙච, ප්‍රභූතාර්ථයෙහිද; පසංසායං, ප්‍රශංසාවෙහිද; නින්දායඤ්ච, ගර්හායෙහිද; අතිසායනෙ, අතිශයනාර්ථයෙහිද; නිච්චයොගෙච, නිත්‍යයොගයෙහිද; සංසග්ගෙ, සංසක්තාර්ථයෙහිද; හොන්ති, වෙත්. පහූතා, බොහෝවූ; ගාවො, ගෙරි, එත්ථදෙසෙ, මේ දෙශයෙහිනුයිහෝ; අස්සවා පුරිසස්ස, මේ පුරුෂයාටහෝ; සන්තීති, ඇත්නුයි; සො, හෙතෙම; ගොමා, ගොමන්තු නම්වෙයි; පසංසායං, ප්‍රශංසායෙහි උදාහරණකියනුලැබේ; පසත්ථා, ප්‍රශස්තවූ; ජාති, ජාතිනොම; අස්සඅත්ථි, මෝහට ඇත්නුයි; ජාතිමා, ජාතිමන්තු නම්වෙයි; මතෙනහිදු වාක්‍යමෙමනයයි; තමෙත්ථස්සත්ථීති, තමෙත්ථස්සත්ථියනු අධිකාරො, මතුමතුසූත්‍රහා සම්බන්ධ කරණුලැබේ.

**වන්තුවණ්ණා.**

පඨමන්තතො අවණ්ණන්තා මත්වත්ථෙ වන්තු හොති—සීලවා, දයාවා—අවණ්ණාති කිං? බුද්ධිමා.

**දණ්ඩාදිත්විකඊ.**

දණ්ඩාදිහි ඉක ඊ හොන්ති වා මත්වත්ථෙ—දණ්ඩිකො, දණ්ඩී—ගන්ධිකො ගන්ධී—ඉතිසද්දස්ස විසයනියමනත්ථත්තා කුතොචි වෙ කුතොචෙකමෙකංව—නාවිකො, සුඛී.

**තපාදීහි සී.**

තපාදිතො වා සී හොති මත්වත්ථෙ—තපස්සී, යසස්සී—වානෙව ච-යසවා.

**සද්ධාදිත්ව.**

සද්ධාදිහිමත්වත්ථෙඅහොතිවා—සද්ධො, පඤ්ඤො—වානෙවච—පඤ්ඤවා.

---

වන්තු—ද්විපදයි—පඨමන්තතො, ප්‍රථමාන්තවූ, අවණ්ණන්තා, අවර්ණාන්ත නාමයාකෙරෙන්; මත්වත්ථෙ, මත්වර්ථයෙහි; හෙවත් මන්තුප්‍රත්‍යයා වියයුතු අසහිවිවක්‍ෂායෙහි; වන්තුහොති, වන්තුප්‍රත්‍යයවේ; සීලවා දයාවායනුවේ;-සීලං අස්ස අත්ථි දයා අස්ස අත්ථියනු විග්‍රහයි; අවණ්ණාති, අවර්ණයාකෙරෙන්වෙයි යනු; කිං, කුමටය? බුද්ධිමා යන තන්හි මන්තුප්‍රත්‍යයනොවන පිණිසයි.

දණ්ඩා-ත්‍රිපදයි—දණ්ඩාදිහි, දණ්ඩාදින්කෙරෙන්;-මත්වත්ථෙ, මත්වර්ථයෙහි; වා, විකල්පයෙන්; ඉකඊහොන්ති, ඉකඊප්‍රත්‍යයෝවෙත්; දණ්ඩිකොයනාදිවේ; දණ්ඩොඅස්ස අත්ථි ගන්ධො අස්ස අත්ථි යනු විග්‍රහයි; ඉතිසද්දස්ස, ඉතිශබ්දයාගේ නියමනත්ථත්තා, (අස්ති විවක්‍ෂාවට විෂය) නියමිත කිරීම අර්ථකොට ඇතිබවහෙයින්; කුතොචි, කිසිශබ්දයක්හු කෙරෙන්; වෙ, (ඉකඊප්‍රත්‍යයෝ) දෙදෙනවෙති; කුතොචි, කිසිශබ්දයක්හු කෙරෙන්; එකමෙකං, එකෙක් එකෙක්මවේ; නාවිකොයනුවේ; නාවා අස්ස අත්ථි සුඛමස්ස අත්ථි යනු විග්‍රහයි නාවාශබ්දයා කෙරෙන් ඉක ප්‍රත්‍යයමවෙයි සුඛශබ්දයා කෙරෙන් ඊප්‍රත්‍යයමවෙයි.

තපා-ද්විපදයි—තපාදිතො, තපාදිශබ්දයාකෙරෙන්; මත්වත්ථෙ, මත්වර්ථයෙහි; වා, විකල්පයෙන්; සීහොති, සීප්‍රත්‍යයවේ; තපස්සී යනාදිවේ; තපො අස්ස අත්ථි යසො අස්ස අත්ථි යනු විග්‍රහයි වානි, වායනු; එව, වැවේ; යසවා යනතන්හි සීප්‍රත්‍යයනොවන පිණිසයි.

සද්ධා-ද්විපදයි—සද්ධාදිහි, සද්ධාදිශබ්දයන් කෙරෙන්; මත්වත්ථෙ, මත්වර්ථයෙහි; අහොති, අප්‍රත්‍යයවේ; සද්ධො පඤ්ඤොයනුවේ; (සද්ධා අස්ස අත්ථි පඤ්ඤා අස්ස අත්ථි යනු විග්‍රහයි) වානි, වායනු; එව,වැවේ; පඤ්ඤවා යන තන්හි අප්‍රත්‍යය නොවන පිණිසයි.

**ණෝ තපා.**

තපසද්දා ණෝ හෝති මත්වත්ථේ - තාපසෝ — මනාදිත්තා "මනාදීනං සක්" ඉති ණානුබන්ධේ සක් - "මායාමේධාහි වී"ති මත්වත්ථේ වී - මායාවී, මේධාවී.

**තො පඤ්චම්‍යා.**

පඤ්චම්‍යන්තා බහුලං තො හෝති—ගාමස්මා ගාමතො—ඉමෙතකිං සද්දෙහි තොම්හි-"ඉතො එත්තො කුතො"ති ඉමස්ස ඉ නිපච්චන්තෙ එතස්ස ටඑත් කිස්ස කුත්තඤ්ච— ඉමස්මා ඉතො, එතස්මා අතො එත්තො, කස්මා කුතො.

**අභ්‍යාදිහි.**

---

ණෝ-විපදයි—තපසද්දා, තපශබ්දයා කෙරෙන්; මත්වත්ථේ, මත්වර්ථයෙහි; ණෝහොති, ණප්‍රත්‍යයවේ; තාපසො යනුවේ; මනාදිත්තා, තපශබ්දයා මනාදිබවහෙයින්; මනාදිනංසක් ඉති, මනාදිනං සක් යන සූත්‍රයෙන්; ණානුබන්ධෙ, ණානුබන්ධ ප්‍රත්‍යයාපරකල්හි; සක්, (තපශබ්දයහට) සක්වේ; මායාමේධාහිවීති, මායාමේධාහිවී යන සූත්‍රයෙන්; මත්වත්ථේ, මත්වර්ථයෙහි; වී, වීප්‍රත්‍යයවේ; මායාවී මෙධාවීයනුවේ; මායාඅස්ස අත්ථි මෙධා අස්ස අත්ථි යනු විග්‍රහයි.

තොප-විපදයි—පඤ්චම්‍යන්තා, පඤ්චම්‍යන්තනාමයාකෙරෙන්; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; තොහොති, තොප්‍රත්‍යයවේ; ගාමස්මා, ගමින්ය යන අර්ථයෙහි; ගාමතො යනුවේ; (පඤ්චම්‍යන්තවූ ගාමශබ්දයා කෙරෙන් ගාමස්මා යන අර්ථයෙහි මේ සූත්‍රයෙන් තො ප්‍රත්‍යයකොට "එකත්ථතායං"යි පඤ්චමී විභක්තිලොප්කොට නිපදවූ ගාමතො ශබ්දයා කෙරෙන්වූසිහට "අසඞ්ඛ්‍යෙහි සඞ්ඛ්‍යාසංයි ලොප්කරනු—මත්තෙහිදු මෙසේමැයි) ඉමෙත කිංසද්දෙහි, ඉමඑතකිං ශබ්දයන්කෙරෙන්; තොම්හි, තොප්‍රත්‍යය කළකල්හි; ඉතොඑත්තොකුතොති, ඉතොඑත්තොකුතො යන සූත්‍රනිපාතනයෙන්; ඉමස්ස, ඉමශබ්දයාහට; ඉනිපච්චන්තෙ, ඉආදෙශනිපදවනු ලැබෙයි, එතස්ස, එතශබ්දයාහට; ටඑත් ටඑත් දෙදෙන නිපදවනු ලැබෙති; කිස්ස, කිංශබ්දයහට; කුත්තඤ්ච, කුත්තයද නිපදවනුලැබේ; (ඉමස්මා යන පඤ්චම්‍යන්තයා කෙරෙන් පූර්වසූත්‍රයෙන් තොප්‍රත්‍යයකොට යථාවිධියෙන් පඤ්චමීලොප්කොට මේ සූත්‍රනිපාතනයෙන් ඉමශබ්දයාහට ඉ ආදෙශකළකල්හි ඉතො යනුවේ; එතස්මා යන අර්ථයෙහි අතො එත්තො යනුවේ; කස්මා යන අර්ථයෙහි කුතො යනුවේ—සිද්ධි උක්තානුසාරයෙන් දතයුතු.

අභා-එකපදයි—අභි ආදීහි, අභිආදීන් කෙරෙන්; තොහොති, තොප්‍රත්‍යයවේ; අයං, මේ සූත්‍රය; අපඤ්චම්‍යන්තෙහි; අපඤ්චම්‍යන්තයා

අභිආදිහි තො හොති—අපඤ්චම්‍යන්තෙහිපි විධානත්ථො'යං-අභිතො, පරිතො, පච්ඡතො, හෙට්ඨතො.

**ආද්‍යාදීහි.**

ආදිප්පභුතීහි තො හොති—ආදො ආදිතො, මජ්ඣෙ මජ්ඣතො, යස්මිං යතො.

**සබ්බාදිතො සත්තම්‍යා ත්‍රත්ථා.**

සබ්බාදීහි සත්තම්‍යන්තෙහි ත්‍රත්ථා හොන්ති—සබ්බස්මිං සබ්බත්‍ර, සබ්බත්ථ-යස්මිං යත්‍ර, යත්ථ-බහුලාධිකාරා න තුම්හාමෙහි.

**කත්ථෙත්ථකුත්‍රාත්‍ර ක්වෙහිධ.**

එතෙ සද්දා නිපච්චන්තෙ—කස්මිං කත්ථ, කුත්‍ර, ක්ව-එතස්මිං එත්ථ, අත්‍ර-අස්මිං ඉහ, ඉධ.

---

කෙරෙන්; විධානත්ථො, (තොප්‍රත්‍යය) විධාන ප්‍රයොජනකොට ඇත්තේයි; අභිතො යනාදිවේ; (අභිපරියන උපසර්ගයන් දෙදෙනාගේ අර්ථයෙහිද) පච්ඡාහෙට්ඨා යන නිපාතයන් දෙදෙනාගේ අර්ථයෙහිද සප්තම්‍යර්ථයෙහි තොප්‍රත්‍යයකොට අන්තදෙදෙන "ව්‍යඤ්ජනෙදීඝරස්සා"යි හ්‍රස්වකරණු.

ආද්‍ය-එකපදයි—ආදිප්පභුතීහි, ආදිශබ්දාදීන්කෙරෙන්; තො හොති, (සප්තම්‍යර්ථයෙහි) තොප්‍රත්‍යයවේ; ආදො, ආදියෙහිය (යන සප්තම්‍යර්ථයෙහි;) ආදිතො යනුවේ; මජ්ඣෙ, මධ්‍යයෙහිය (යනසප්තම්‍යර්ථයෙහි) මජ්ඣතො යනුවේ; යස්මිං, යමෙක්හිය යන (සප්තම්‍යර්ථයෙහි;) යතොයනුවේ.

සබ්බා-ත්‍රිපදයි— සත්තම්‍යන්තෙහි, සප්තම්‍යන්තවූ; සබ්බාදීහි, සබ්බාදීන්කෙරෙන්; ත්‍රත්ථාහොන්ති, ත්‍රාත්ථප්‍රත්‍යයෝවෙත්; සබ්බස්මිං, සියල්ලෙහි (යන අර්ථයෙහි;) සබ්බත්‍ර සබ්බත්ථ යනුවේ; (මත්තෙහිදු මෙමනයයි.) බහුලාධිකාරා, බහුලාධිකාරය හෙතුකොටගෙන; තුම්හ අම්හෙහි, තුම්හඅම්හශබ්දයන් කෙරෙන්; න, නොවෙත්.

කත්ථෙ-එකපදයි—එතෙසද්දා, මේ ශබ්දයෝ නිපච්චන්තෙ, නිපදවනු ලැබෙත්; කස්මිං, කොහිදයන අර්ථයෙහි; කත්ථකුත්‍ර ක්වයනුවේ; කත්ථ කුත්‍ර යනාමෙහි ත්ථ ප්‍රත්‍යයද ත්‍රප්‍රත්‍යයද පූර්වසූත්‍රයෙන්ම සිද්ධයි; කිංශබ්දයහට ක ආ දෙශද කුආදෙශද මේ සූත්‍රනිපාතනයෙන් මවේ; සප්තම්‍යන්තවූ කිංශබ්දයා කෙරෙන් මේ සූත්‍රනිපාතයෙන් වප්‍රත්‍යයද කිංශබ්දයාගේ ඉලොපයදකොට කීතියෙන් සප්තම්ලොප් කළකල්හි ක්වයනුවේ එතස්මිං, මෙහියන අර්ථයෙහි; එත්ථඅත්‍රයනුවේ; සප්තම්‍යන්තවූ එතශබ්දයාකෙරෙන් පූර්වසූත්‍රයෙන් ත්ථප්‍රත්‍යයද ත්‍රප්‍රත්‍යයදකොට කීතියෙන්සප්තම්ලොප්කොට එතශබ්දයහට මේ සූත්‍ර

**ධි සබ්බා වා.**

සබ්බනාමතො සබ්බස්මා ධි වා හොති-සබ්බධි-වාතිකිං, සබ්බත්‍ර.

**යා හිං.**

සබ්බනාමතො යසද්දා හිං වා හොති-යහිං-වාත්වෙව—යත්‍ර.

**තා හඤ්ච.**

සබ්බනාමතො තතො වා හං හොති හිඤ්ච-තහං, තහිං-වාත්වෙව-තත්‍ර.

**කුහිං කහං.**

කිංසද්දා සබ්බනාමතො හිං හං නිපච්චන්තෙ කිස්ස කුකා ච-කුහිං කහං—සබ්බස්මිං කාලෙචෙවවමාදි විග්ගහෙ.

**සබ්බෙකඤ්ඤයතෙහි කාලෙ දා.**

එතෙහි සබ්බනාමෙහි කාලෙ දා හොති-සබ්බදා එකදා, අඤ්ඤදා, යදා, තදා.

---

නිපාතනයෙන් වෙආදෙශද ට ආදෙශද කළකල්හි එත්ථ අත්‍රයනුවේ; අස්මිං, මෙහි යන අර්ථයෙහි; ඉහ ඉධ යනුවේ;—සප්තම්‍යන්තවූ ඉම ශබ්දයාකෙරෙන් මේ සූත්‍රනිපාතනයෙන් හප්‍රත්‍යයද ධප්‍රත්‍යයද ඉම ශබ්දයහට ඊ ආදෙශදකොට කීනියෙන් සප්තමිලොප්කළකල්හි ඉහ ඉධ යනුවේ.

ධිස—ත්‍රිපදයි—සබ්බනාමතො, සප්තම්‍යන්තවූ; සබ්බස්මා, සබ්බශබ්දයාකෙරෙන්; වා, විකල්පයෙන්; ධිහොති, ධිප්‍රත්‍යයවේ; සබ්බධියනුවේ; වාති, වායනු; කිං, කුමටය; සබ්බත්‍රයනතන්හි ධිප්‍රත්‍යයනොවන පිණිසයි.

යාහිං-ද්විපදයි—සබ්බනාමතො, සප්තම්‍යන්තවූ; යසද්දා, යශබ්දයාකෙරෙන්; වා, විකල්පයෙන්; හිංහොති, හිංප්‍රත්‍යයවේ; යහිංයනුවේ; වාති, වායනු; එව වැටේ; යත්‍ර යනතන්හි හිංප්‍රත්‍යයනොවන පිණිසයි.

තාහඤ්ච-ත්‍රිපදයි—සබ්බනාමතො, සප්තම්‍යන්තවූ; තතො, තශබ්දයාකෙරෙන්; වා, විකල්පයෙන්; හංහොති, හංප්‍රත්‍යයවෙයි; හිංච, හිංප්‍රත්‍යයදවේ; තහං තහිං යනුවේ; වාති, වායනු; එව, වැටේ; තත්‍ර යනතන්හි හිංහංප්‍රත්‍යය නොවන පිණිසයි.

කුහිං-එකපදයි—සබ්බනාමතො, සප්තම්‍යන්තවූ; කිංසද්දා, කිං ශබ්දයා කෙරෙන්; හිංහංනිපච්චන්තෙ, හිංහංදෙදෙන නිපදවනු ලැබෙති; කිස්ස, කිංශබ්දයහට කුකාච, කුකආදෙශයෝ නිපදවනු ලැබෙත්; සබ්බස්මිංකාලෙ ඉති, සබ්බස්මිංකාලෙ යන; එවමාදිවිග්ගහෙ, මේ ආදිවාක්‍යයෙහි.

සබ්බෙ-ත්‍රිපදයි—සබ්බනාමෙහි, සප්තම්‍යන්තවූ; එතෙහි, මේ ශබ්දයන්කෙරෙන්; කාලෙ, කාලයසිව්මනාකල්හි, දාහොති, දාප්‍රත්‍යයවේ; සබ්බදායනුවේ; (සබ්බස්මිංකාලෙ යනාදි විග්‍රහයි.)

**කදා කුදා සදා ධුනෙදානි.**

එතෙ සද්දා නිපච්චන්තෙ—කස්මිං කාලෙ කදා, කුදා—සබ්බස්මිං කාලෙ සදා—ඉමස්මිං කාලෙ අධුනා, ඉදානි.

**අජ්ජසජ්ජ්වපරජ්ජ්වෙතරහි කරහා.**

එතෙ සද්දා නිපච්චන්තෙ —

පකති පච්චයො ආදෙසො කාලවිසෙසොති සබ්බමෙතං නිපාතනා ලබ්භති-ඉමස්ස ටො ජ්ජො චාහනි නිපච්චතෙ—අස්මිං අහනි අජ්ජ—සමානස්ස සභාවො ජ්ජු චාහනි-සමානෙ අහනි සජ්ජු—අපරස්මා ජ්ජු චාහනි—අපරස්මිං අහනි අපරජ්ජු—ඉමස්සෙතො කාලෙරහි ච-ඉමස්මිං කාලෙ එතරහි-කිංසද්දස්ස කො රහ චානජ්ජතනෙ—කස්මිං කාලෙ කරහ.

---

කදා-එකපදයි—එතෙසද්දා, මේශබ්දයෝ; නිපච්චන්තෙ, නිපදවනුලැබෙත්; කස්මිංකාලෙ, කවරකලෙක්හිද යනමේ අර්ථයෙහි කදා කුදා යනුවේ; (සප්තම්‍යන්ත නාමයා කෙරෙන් කාලය කියවමනාකල්හි මේ සූත්‍රනිපාතනයෙන්දා ප්‍රත්‍යයද කිංශබ්දයහට කආදෙශද කු ආදෙශද නිපදයි)—සබ්බස්මිංකාලෙ, හැමකල්හිය යන අර්ථයෙහි; සදා යනුවේ;—(සබ්බශබ්දයහටසආදෙශනිපදයි) ඉමස්මිංකාලෙ, මෙකල්හිය යන අර්ථයෙහි; අධුනා ඉදානියනුවේ; (ඉමශබ්දයහට ටආදෙශ ටිආදෙශයෝද ධුනාදානි ප්‍රත්‍යයෝද නිපදිත්.

අජ්ජ-එකපදයි—එතෙසද්දා, මේ ශබ්දයෝ; නිපච්චන්තෙ, නිපදවනුලැබෙත්; පකති, ප්‍රකෘතිය; පච්චයො, ප්‍රත්‍යයය; ආදෙසො, ආදෙශය; කාලවිසෙසොති, කාලවිශෙෂය යන; එතං සබ්බං, මේ සියල්ල; නිපාතනාලබ්භති, සූත්‍රනිපාතනයෙන්ලැබේ; අහනි, දිනයකියවමනාකල්හි; ඉමස්ස, ඉමශබ්දහට; ටො, ටආදෙශද; ජ්ජොච, ජ්ජප්‍රත්‍යයද; (නිපදවනුලැබේ;) අස්මිංඅහනි, මේ දිනයෙහිය යන අර්ථයෙහි; අජ්ජයනුවේ; අහනි, දිනයකියවමනාකල්හි; සමානස්ස, සමානශබ්දයහට; සභාවො, සකාරවීමද; ජ්ජුච, ජ්ජුප්‍රත්‍යයද; (නිපදවනුලැබේ;) සමානෙ අහනි; සමානවූ දිනයෙහිය යන අර්ථයෙහි; සජ්ජුයනුවේ; (එදවසයයිසේයි) අහනි, දිනයකියවමනාකල්හි; අපරස්මිං, අපරශබ්දයාකෙරෙන්; ජ්ජු, ජ්ජුප්‍රත්‍යයද නිපදවනුලැබේ; අපරස්මිං අහනි; අන්‍යදිනයෙක් හිය යන අර්ථයෙහි; අපරජ්ජුයනුවේ; කාලෙ, කාලය කියවමනාකල්හි; ඉමස්ස, ඉමශබ්දයහට එතො, එතයන ආදෙශද; රහිච, රහිප්‍රත්‍යයද (නිපදවනු ලැබේ;) ඉමස්මිංකාලෙ, මෙකල්හිය යන අර්ථයෙහි; එතරහි යනුවේ; අනජ්ජතනෙ, අද දවසින් අන්‍යවූ කාලය කියවමනාකල්හි; කිංසද්දස්ස, කිංශබ්දයහට; කො, කකාරාදෙශද; රහච, රහප්‍රත්‍යයද (නිපදවනු ලැබේ;) කස්මිංකාලෙ, කවර කාලෙක්හිද යූනමේ අර්ථයෙහි; කරහයනුවේ.

**සබ්බාදීහි පකාරෙ ථා.**

සාමඤ්ඤස්ස භෙදකො විසෙසො. පකාරෙ, තබ්බ වත්තමානෙහි සබ්බාදීහි ථා හොති - සබ්බෙන පකාරෙන සබ්බථා—යථා, තථා.

**කථමිත්ථං.**

එතෙ සද්දා නිපච්චන්තෙ පකාරෙත්ථ කිම්මෙහි ථංපච්චයො ක ඉත් තෙසං යථාක්කමං—කෙන පකාරෙන කථං, ඉමිනා පකාරෙන ඉත්ථං. එකෙන පකාරෙන එකං වා පකාරං කරොතිච්චෙවමාදිවිග්ගහෙ.

**ධා සඞ්ඛ්‍යාහි.**

සඞ්ඛ්‍යාවාචීහි පකාරෙ ධා පරො හොති—එකධා කරොති—ද්විධා, තිධා, චතුධා පඤ්චධා කරොතිච්චෙවමාදිවිග්ගහෙ—බහුසද්දා වෙපුල්ල වාචී සඞ්ඛ්‍යාවාචී ච—යදා සඞ්ඛ්‍යාවාචී තදා බහුධා කරොති.

---

සබ්බා-ත්‍රිපදයි—සාමඤ්ඤස්ස, සාමාන්‍යයාගේ; භෙදකොයිසේයි විසෙසො, විශෙෂය; පකාරො, ප්‍රකාරනම්; තබ්බ, ඒප්‍රකාරයෙහි; වත්තමානෙහි, වැටෙන්නාවූ; සබ්බාදීහි, සර්වාදීන් කෙරෙන්; ථා හොති, ථාප්‍රත්‍යයවේ; සබ්බෙන පකාරෙන, සර්වප්‍රකාරයෙන් යන අර්ථයෙහි; සබ්බථා යනුවේ; යථා තථායනුවේ; යෙන පකාරෙන, තෙන පකාරෙන යනු විග්‍රහයි.

කථං-එකපදයි—පකාරෙ, ප්‍රකාරාර්ථයෙහි; එතෙසද්දා, මේ ශබ්ද යෝ; නිපච්චන්තෙ, නිපදවනු ලැබෙත්; කිම්මෙහි, කිංශබ්ද ඉමශබ්ද යන් කෙරෙන්; ථංපච්චයො, ථංප්‍රත්‍යයද; තෙසං, ඒශබ්දයන් දෙදෙනාට; යථාක්කමං, පනාතින්; කඉත්, කආදෙශ ඉත් ආදෙශයෝද; (නිපදවනු ලැබෙති;) කෙන පකාරෙන, කවරප්‍රකාරයකින්ද යන අර්ථයෙහි; කථංයනුවේ; ඉමිනාපකාරෙන මේ ප්‍රකාරයෙන් යන අර්ථයෙහි; ඉත්ථං යනුවේ; එකෙන පකාරෙන කරොති, එකෙන පකාරෙන කරොති යනහෝ; එකංවා පකාරං කරොති, එකං පකාරං කරොති යනහෝ එවමාදි විග්ගහෙ, මේ ආදිවාක්‍යයෙහි.

ධා ද්විපදයි—පකාරෙ, ප්‍රකාරාර්ථයෙහි වැටෙන්නාවූ; සඞ්ඛ්‍යාවාචීහි, සඞ්ඛ්‍යාවාචී ශබ්දයන්කෙරෙන්; පරො, පරවූ; ධාහොති, ධාප්‍රත්‍යයවේ; එකධා කරොතියනුවේ; ද්විධාකරොති යනාදියවේ; (එකෙන පකාරෙන ද්වීහි පකාරෙහි තීහි පකාරෙහි චතූහි පකාරෙහි පඤ්චහිපකාරෙහි කරොති යනාදින්හෝ එකංපකාරං ද්වෙපකාරෙ තයො පකාරෙ චත්තාරො පකාරෙ පඤ්චපකාරෙ කරොතියි කියාහෝ වාක්‍යගතයුතු; බහුසද්දො, බහුශබ්දයතෙම; වෙපුල්ලවාචී, විපුලත්වවාචීදවෙයි; සඞ්ඛ්‍යාවාචී, සඞ්ඛ්‍යාවාචීදවේ; යදා, යම්කලෙක්හි; සඞ්ඛ්‍යාවාචී, සඞ්ඛ්‍යාවාචීද; තදා, එකල්හි; බහුධා කරොති යනාදියවේ; (බහූහි පකාරෙහි කරොතියි කියාහෝ බහුපකාරෙ කරොතියි කියාහෝ වාක්‍යගතයුතු.)

**වෙකාජ්ඣං.**

එකස්මා පකාරෙ ජ්ඣං වා හොති—එකජ්ඣං වා'ති කිං,, එකධා.

**ද්විතීහෙධා.**

ද්විතීහි පකාරෙ එධා වා හොති—ද්වෙධා, තෙධා—වා'ත්වෙව—ද්විධා, තිධා—එකං වාරං භුඤ්ජතිච්චෙවමාදිවිග්ගහෙ.

**වාර සඞ්ඛ්‍යාය ක්ඛත්තුං.**

වාරසම්බන්ධිනියා සඞ්ඛ්‍යාය ක්ඛත්තුං හොති—එකක්ඛත්තුං භුඤ්ජති—ද්වික්ඛත්තුං තික්ඛත්තුමිච්චාදි-වාරග්ගහණං, කිං, පඤ්ච භුඤ්ජති-සඞ්ඛ්‍යායාති කිං, පහූතෙ වාරෙ භුඤ්ජති.

**කතිම්හා.**

වාරසම්බන්ධිනියා කතිසඞ්ඛ්‍යාය ක්ඛත්තුං හොති—කතිවාරෙ භුඤ්ජති කතික්ඛත්තුං භුඤ්ජති

**බහුම්හා ධා ච පච්චාසත්තියං.**

වාරසම්බන්ධිනියා බහුසඞ්ඛ්‍යාය ධා හොති ක්ඛත්තුඤ්ච වාරානඤ්චෙ පච්චාසත්ති හොති-බහුවාරෙ භුඤ්ජති බහුධා වා දිවසස්ස භුඤ්ජති, බහුක්ඛත්තුං වා, පච්චාසත්තියන්ති කිං, බහුක්ඛත්තුං මාසස්ස භුඤ්ජති.

---

වෙකා-වායඑකාය ජ්ඣංයයනුපදයි-එකස්මා, එකශබ්දයාකෙරෙන්; පකාරෙ, ප්‍රකාරාර්ථයෙහි; වා, විකල්පයෙන්; ජ්ඣංහොති, ජ්ඣංප්‍රත්‍යය වේ; (එකජ්ඣංයනුවේ;) බහුපකාරෙ එකප්පකාරං (කරොති යනු විග්‍රහයි) වාති, වායනු; කිං, කුමටය; එකධායනතන්හි ජ්ඣංප්‍රත්‍යය නොවන පිණිසයි.

ද්විති-දෙපදයි—ද්විතීහි, ද්විශබ්දතිශබ්දයන් කෙරෙන්; පකාරෙ, ප්‍රකාරාර්ථයෙහි; වා, විකල්පයෙන්; එධාහොති, එධාප්‍රත්‍යයවේ; ද්වෙධා තෙධා යනුවේ; වාති, වායනු; එව, වැවේ; ද්විධාතිධා යනතන්හි එධා ප්‍රත්‍යය නොවන පිණිසයි; එකංවාරං භුඤ්ජතීති, එකං වාරංභුඤ්ජතියන; එවමාදිවිග්ගහෙ, මේ ආදිවාක්‍යයෙහි.

වාර-තිපදයි—වාරසම්බන්ධිනියා, වාරසම්බන්ධිවූ; කතිසඞ්ඛ්‍යාය, සඞ්ඛ්‍යාවාචීවූ කතිශබ්දයාකෙරෙන්; ක්ඛත්තුංහොති, ක්ඛත්තුංප්‍රත්‍යයවේ; කතිවාරෙ, කීපවරෙක; භුඤ්ජති, අනුභවකෙරේද යන අර්ථයෙහි කතික්ඛත්තුං භුඤ්ජති යනුවේ.

බහු-සතරපදයි-වාරසම්බන්ධිනියා, වාරසම්බන්ධිවූ; බහුසඞ්ඛ්‍යාය, බහුසඞ්ඛ්‍යාව කෙරෙන්; ධාහොති, ධාප්‍රත්‍යයවෙයි; ක්ඛත්තුං, ක්ඛත්තුංප්‍රත්‍යයදවේ; වාරානං, වාරයන්ගේ; පච්චාසත්තිහොතිචෙ, ආසන්නතාවවීනම්; බහුවාරෙභුඤ්ජති, බොහෝවර අනුභවකෙරෙයි යන අර්ථයෙහි; දිවසස්ස, දවසකට; බහුධාභුඤ්ජති, බහුධාභුඤ්ජති යනුවේ;

**සකිං වා.**

එකං වාරමිච්චස්මිං අත්ථෙ සකින්ති වා නිපච්චතෙ එකස්මා කිං එකස්ස ච සාදෙසො-එකං වාරං භුඤ්ජති සකිං භුඤ්ජති-වාති කිං, එකක්ඛත්තුං භුඤ්ජති.

**ගුණාදිච්ඡාපකාරෙසු.**

ක්‍රියාය ගුණෙන දබ්බෙන වා භිනෙන අත්ථෙ ව්‍යාපිතුමිච්ඡාවිච්ඡා—විච්ඡායම්පකාරෙ ච සො හොති බහුලං—සාමඤ්ඤනිද්දෙසා යථාසම්භවං විභත්‍යන්තා යතො කුතො චි සද්දා හොති-විච්ඡායං—ඛණ්ඩං ඛණ්ඩංකරොති ඛණ්ඩසො කරොති-සබ්බෙන පකාරෙන සබ්බසො.

**අභූතතබ්භාවෙ කරාසභුයොගෙ විකාරා චි.**

---

බහුක්ඛත්තුංවා, බහුක්ඛත්තුංකියාදවේ; පච්චාසත්තියන්තී, ආසන්නතාවක් ඇතිකල්හි වෙයියනු; කිං, කුමටය? බහුක්ඛත්තුංමාසස්සභුඤ්ජතියන තන්හි ධාප්‍රත්‍යයනොවන පිණිසයි.

සකිං-විපදයි—එකංවාරංඉති, එක්වරෙකයන; අස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි; වා, විකල්පයෙන්; සකින්තී, සකිංයනු; නිපච්චතෙ, නිපදවනුලැබෙයි; එකස්මා, එකශබ්දයාකෙරෙන්; කිං, කිංප්‍රත්‍යයද; එකස්ස, එකශබ්දයහට; සාදෙසොච, සකාරාදෙශදවේ; එකංවාරං, එක්වරක්; භුඤ්ජති, අනුභවකෙරෙයි යන අර්ථයෙහි; සකිංභුඤ්ජති යනුවේ; වාති, වායනු; කිං, කුමටය; එකක්ඛත්තුං භුඤ්ජති යන තන්හි සකිං යනු නොවන පිණිසයි.

සො—විපදයි—භිනෙන, දෙශාදිභෙදයෙන් අනෙකප්‍රකාරවූ; අත්ථෙ, (ද්‍රව්‍යගුණක්‍රියා ලක්‍ෂණවූ) වසතූන්; ක්‍රියාය, ක්‍රියායෙකින්හෝ ගුණෙනවා, ගුණයකින්හෝ; දබ්බෙනවා, ද්‍රව්‍යයකින්හෝ; ව්‍යාපිතුං, සම්බන්ධකරන්නට; ඉච්ඡා, අභිලාෂානොමෝ; විච්ඡා, වීප්සානම්; විච්ඡායං, වීප්සාර්ථයෙහිද; පකාරෙච, ප්‍රකාරාර්ථයෙහිද; බහුලං, ඉතාපරිද්දෙන්; සොහොති, සොප්‍රත්‍යයවේ; සාමඤ්ඤනිද්දෙසා, සාමාන්‍යනිර්දේශය ඉහතුකොටගෙන; යථාසම්භවං, සම්භවවූපරිද්දෙන්; විභත්‍යන්තා, විභක්ත්‍යන්තවූ, යතොකුතොචිසද්දා, යම් කිසිශබ්දයක් කෙරෙන්; හොති, වේ; විච්ඡායං, වීප්සාර්ථයෙහි (ඡ්සාප්‍රත්‍යය කියනු ලැබේ;) ඛණ්ඩං ඛණ්ඩං කරොති, කඩ කඩ කෙරෙයි යන අර්ථයෙහි; ඛණ්ඩසොකරොති යනුවේ; සබ්බෙන පකාරෙන, හැමපරිද්දෙන්යන අර්ථයෙහි; සබ්බසො යනුවේ.

අභූත-සතරපදයි-අවත්ථාවතො, අවස්ථාවත්වූ; අවත්ථන්තරෙන, අන්‍යඅවස්ථාවෙකින්; අභූතස්ස, නොවූවහුගේ; තායඅවත්ථාය, ඒ නොවූ අවස්ථාවෙන්; භාවෙ, වීමෙහි; කරාසභූති, කර-කරණෙය අස

අවත්ථාවතො'වත්ථන්තරෙනා භූතස්ස තායාවත්ථාය භාවෙ කරාසභූහි සම්බන්ධෙ සති විකාරවාචකා චී හොති—චකාරො "චී ක්‍රියත්ථෙහි" ති විසෙසනත්ථො—අධවලං ධවලං කරොතීති ධවලීකරොති අධවලො ධවලො සියා භවති වා ධවලීසියා, ධවලීභවති—අභූතතබ්භාවෙති කිං, ඝටං කරොති—කරාසභූයොගෙති කිං අධවලො ධවලො ජායතෙ—විකාරාති කිං, සුවණ්ණං කුණ්ඩලිකරොති.

ණාදයො.

---

භූවිය භූ-සත්තායං යන ධාතූන් තුන්දෙනාහා; සම්බන්ධෙසති, යෙදී මක් ඇතිකල්හි, විකාරවාචකා, විකාරවාචීහු කෙරෙන්; චීහොති, චීප්‍රත්‍යයවේ; චකාරො, චකාරතෙම, චීක්‍රියත්ථෙහිති, චීක්‍රියත්ථෙහි යන සූත්‍රයෙහි; විසෙසනත්ථො, විශෙෂණය ප්‍රයොජනකොට ඇත් තේයි; අධවලං, පෙරධවලනුවූවා; ධවලංකරොති, දූන්ධවලකෙරෙයි යන මේ අර්ථයෙහි; ධවලී කරොති යනුවේ; (අධවලංධවලං කරොති යන වාක්‍යයෙහි ධවලංයන ද්විතීයාන්තයාකෙරෙන් පෙරධවල නුවූ වාදූන් ධවලකෙරෙයි යන මේ අර්ථයෙහි මේ සූත්‍රයෙන් චීප්‍රත්‍යයවෙයි චකාර අප්‍රයොගීවෙයි "එකත්ථතායං"යි ද්විතීයාවිභක්ති ලොප්වෙයි "සරොලොපොසරෙ"යි පූර්වස්වරලොප්වෙයි මෙසේ නිපදවූ ධවලී ශබ්දයාකෙරෙන්වූ සියලු විභක්තීන්ට "අසඞ්ඛ්‍යෙහි සබ්බාසං"යී ලොප් වේ) අධවලො, පෙරධවලනොවූයේ; ධවලොසියා, දූන්ධවලවියයන අර්ථයෙහිහෝ; භවතිවා, වෙයි යන අර්ථයෙහිහෝ; ධවලීභවතියනුවේ; සිද්ධියටකීතියෙන්ම දතයුතුයි—අභූතතබ්භාවෙති, අභූතතබ්භාවයක් විවක්ෂිතකල්හිය යනු; කිං, කුමටය; ඝටංකරොති යන තන්හි චීප්‍රත්‍යය නොවනපිණිසයි; (ඝටංකරොතියි කර්මමාත්‍රයක් විවක්ෂිතය අභූතතබ්භාවය අවිවක්ෂිතය එහෙයින් චීප්‍රත්‍යයනොවේ) කරාසභූයොගෙති, කරාසභූධාතූන්හායොගයක් ඇතිකල්හිය යනු; කිං, කුමටය; අධවලොධවලො ජායතෙ යනතන්හි චීප්‍රත්‍යයනොවන පිණිසයි; (මෙහි ජන ජනනෙ යන්නාහුගේ යොගය හෙයින් නොවේ; විකාරාති, විකාරවාචීහුකෙරෙන්වෙයි යනු; කිං, කුමටය? සුවණ්ණං කුඬලිකරොති ප්‍රකෘතිවාචීහුකෙරෙන් චීප්‍රත්‍යය නොවන පිණිසයි; (සුවණ්ණංකුඬලී කරොතියි කුඬලරූපයනොවූවහුගේ කුඬලරූපයෙන්විම ඇතිකල්හි අභූතතබ්භාවයද කරධාතුයොගයද ඇතිබැවින් ප්‍රකෘතිවචනවූ සුවණ්ණශබ්දයාකෙරෙන් චීප්‍රත්‍යය නොවන පිණිස විකාරායී කියනලදී.

සාමඤ්ඤඤ්ච විසෙසොච නිපාතො භාවජො තථා,
ඉතිවිඤ්ඤූහි විඤ්ඤෙය්‍යො තද්ධිතො චතුබ්බිධො.

අථ තබ්බාදයො වුච්චන්තෙ ක්‍රියත්ථෙහි "ක්‍රියත්ථා"ති අධිකාරතො, ක්‍රියා අත්ථො එතස්සාති ක්‍රියත්ථො ධාතු-සො ච විවිධො සකම්මකාකම්මකවසෙන-තත්ථ යස්මිං ක්‍රියත්ථෙ කත්තුවාචිනි කම්මං ගවෙසීයතෙ, සො සකම්මකො ඉතරො අකම්මකො-තෙසු යථාරහං සකම්මකතො කම්මාදෙ කාරකෙ. කම්මාවචනිච්ඡායම්භාවෙ ච තබ්බාදයො වෙදිතබ්බා-අකම්මකතො පන භාවෙ කම්මවජ්ජිතෙ ච කාරකෙ-ක්‍රියාති ච ගමනාපචනාදිකො අසත්තාසම්මතො කත්තරි කම්මෙච්චා පතීතො කාරකසමූහසාධියො පදත්ථො වුච්චති, වුත්තංහි.

"අදබ්බභූතං කත්තාදි-කාරකග්ගාමසාධියං
පදත්ථං කත්තුකම්මත්ථං-ක්‍රියමිච්ඡන්ති තබ්බිදූ"

---

මෙහි සාමාන්‍යතද්ධිතනම් අපත්‍යාද්‍යර්ථයෙහි විහිතවූ ලිඞ්ගත්‍රයට සාධාරණවූ ණාඝිණාදිහුය, විශෙෂණතද්ධිතනම් ස්වාර්ථසමූහාර්ථයෙහිවූ එකෙකි ලිඞ්ගඇති "ආකිඛකස්සං ගාමනා" යනාදියය, නිපාතනද්ධිතනම් ත්වාදි විප්‍රත්‍යයාන්තවූ "ගාමතො" යනාදියය, භාවතද්ධිතනම් භාවයෙහිවූ "චණ්ඩත්තං" යනාදියයි.

ණාදයො, ණාදීහුයි;

---

අථ, ඉක්බිත්තෙන්; ක්‍රියත්ථාති අධිකාරතො, ක්‍රියත්ථායනු වැටෙනහෙයින්; ක්‍රියත්ථෙහි, ධාතූන්කෙරෙන්; තබ්බාදයො, තබ්බාදි ප්‍රත්‍යයෝ; වුච්චන්තෙ, කියනු ලැබෙත්; ක්‍රියා, ක්‍රියාතොමෝ; අත්ථො, අර්ථවූයේ; එතස්සාති, මොහටනුයි; ක්‍රියත්ථො, ක්‍රියත්ථනම්වේ; ධාතු, ධාතුවයි; (ධාතුශබ්දය භූවාදීන් කෙරෙහි වැටෙනකල විලිඞ්ගිකයි "ධාතුවිසවණිච සඛාදි භූවාදිගෙරිකාදිසු" යනු නිඝණ්ඩුයි) සොච, ඒ ධාතුවද; සකම්මකාකම්මකවසෙන, සකර්මක අකර්මකවශයෙන්; විවිධො, විප්‍රකාරවේ; තත්ථ, ඒවිවිධධාතූන් අතුරෙහි; යස්මිංක්‍රියත්ථෙ, යම්ධාතුවක්හු; කත්තුවාචිනි, කර්තෘවාචිකල්හි; කම්මං, (ඔදනාදි) කර්මයතෙම; ගවෙසීයතෙ, සොයනු ලැබේද; සො, හෙතෙම; සකම්මකො, සකර්මකය; ඉතරො, එයින් අන්‍යවූ ධාතුවතෙම; අකම්මකො, අකර්මකයි; තෙසු, ඔවුන්අතුරෙන්; යථාරහං, සුදුසුසුදුසු පරිද්දෙන්; සකම්මකතො, සකර්මකධාතුහුකෙරෙන්; කම්මාදො කාරකෙ, කර්මාදි කාරකයෙහිද; කම්මාවචනිච්ඡායං, (විද්‍යමානවූ) කර්මය අවිවක්ෂිත කල්හි; භාවෙච, භාවයෙහිද; තබ්බාදයො, තබ්බාදිප්‍රත්‍යයෝ; වෙදිතබ්බා, දතයුත්තාහ; අකම්මකතොපන, අකර්මකධාතුහු කෙරෙන් වනාහි; භාවෙ, භාවයෙහිද; කම්මවජ්ජිතෙච කාරකෙ, කර්මවර්ජිතවූ සෙසුකාරකයෙහිදවෙත්; ක්‍රියාතිච, ක්‍රියායයිද; ගමනපචනාදිකො, ගමනපචනාදිවූ; අසත්තාසම්මතො, අද්‍රව්‍යයයි දන්නාලද; කත්තරි,

කර කරණෙ—අකාරො උච්චාරණත්‍ථො—එවමුත්තරත්‍රාපි-කර්ඉති ඨිතෙ-බහුලමිති සබ්බත්‍ථ වත්තතෙ.

**භාවකම්මෙසු තබ්බානීයා.**

තබ්බඅනීයා ක්‍රියත්‍ථා පරෙ භාවකම්මෙසු බහුලං භවන්ති-පච්ච යෙති පච්චයවිධානතොඤ්ඤත්‍ථං සබ්බත්‍ථාධිකාරො.

**තුංතුනතබ්බෙසු වා.**

තුමාදිසු පච්චයෙසු කරස්ස ආ හොති-අඤ්ඤත්‍ර—

**පරරූපමයකාරෙ බ්‍යඤ්ජනෙ.**

ක්‍රියත්‍ථානමන්තබ්‍යඤ්ජනස්ස පරරූපං හොති යකාරතොඤ්ඤස්මිං බ්‍යඤ්ජනාදෙ පච්චයෙති පරරූපං-කරණං කාතබ්බං, කත්තබ්බං වා-

---

කත්‍රෘකෙරෙහිහෝ; කමෙමවා, කර්ම්යෙහිහෝ; පතිඨිතො, පිහිටියාවූ; කාරකසමූහසාධියො, කාරකසමූහයා විසින් සිඬකටයුතුවූ; පදත්‍ථො, පදාර්ථයතෙම; වුච්චති, ක්‍යනුලැබේ; වුත්තංති, (ශබ්දාර්ථචින්තාචාර්යයෙහි රත්නශ්‍රීඥානාචාර්‍යයන් විසින්) කියනලදමැයි.

අදද්බ්බභූතං, ද්‍රව්‍යනුවූ; කත්තාදිකාරකගගාම, කර්තෘකරණාදි කාරකසමූහයා විසින්; සාධියං, සිඬකටයුතුවූ; කත්තුකම්මඨං, කර්තෘ කර්මදෙක්හි පිහිටියාවූ; හෙවත් කර්තෘසථවූහෝ කර්මසථවූහෝ; පදත්‍ථං පදාර්ථය; තබ්බිදූ, ඒක්‍රියාලක්‍ෂණඥන්නාහු; ක්‍රියං, ක්‍රියාවයයි; ඉච්ඡන්ති, කැමතිවෙත්.

කර, කරයනධාතු; කරණෙ, කිරීමෙහිවැටේ; අකාරො, ධාතුවන් තවූඅකාරතෙම; උච්චාරණත්‍ථො, සුඛොච්චාරණය ප්‍රයොජනයකොට ඇත්තේයි; උත්තරත්‍රාපි, මත්තෙහිදු; එවං, මෙසේමැයි; (මත්තෙහිදු අකාරාන්තධාතුන්ගේ අකාරතෙම උච්චාරණය පිණිසයයිසේයි) කර් ඉති, කර්යයි; ඨිතෙ, සිටිකල්හි; බහුලංඉති, බහුලංයනු; සබ්බත්‍ථ, හැමතන්හි; වත්තතෙ, වැටේ.

භාව-ද්විපදයි—තබ්බඅනීයා, තබ්බඅනීයප්‍රත්‍යයෝ; ක්‍රියත්‍ථා, ධාතු හුසෙරෙන්; පරෙ, පරවූවාහු; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; බහු ලං, ඉඬපරිද්දෙන්; භවන්ති, වෙත්; පච්චයෙති, පච්චයෙ යනු; පච්චයවිධානතො, ප්‍රත්‍යයවිධානයෙන්; අඤ්ඤස්මිං, අන්‍යවූ; සබ්බ ත්‍ථ, හැමතැන්හිම; අධිකාරො, සම්බන්ධකාරනුලැබේ.

තුං තුන-ද්විපදයි—තුමාදිසු පච්චයෙසු, තුමාදි ප්‍රත්‍යයන් පර කල්හි; කරස්ස, කරයන ධාතුහට; වා, විකල්පයෙන් ආහොති, ආකා රාදෙශවේ අඤ්ඤත්‍ර, ආකාරාදෙශ නුවූපක්‍ෂයෙහි.

පර—ත්‍රිපදයි— යකාරතො, යකාරයාකෙරෙන්; අඤ්ඤස්මිං, අන්‍යවූ (බ්‍යඤ්ජනාදි ප්‍රත්‍යයා) පරකල්හි; ක්‍රියත්‍ථානං, ධාතුන් සම්බ න්ධවූ; අන්තබ්‍යඤ්ජනස්ස, අන්තවූබ්‍යඤ්ජනයහට; පරරූපංහොතීති,

නපුංසකලිඞ්ගං—භාවසෙසකත්තාපි තබ්බාද්‍යභිහිතො භාවො දබ්බමිව පකාසතීති බහුවචනඤ්ච හොති—කම්මෙ-කරීයතීති කාතබ්බො කත්තබ්බො—අභිධෙය්‍යසෙසව ලිඞ්ගවචනානි.

විසෙසලිඞ්ගා තබ්බාදී තත්ථාදෙ පඤ්ච භාවජා
නපුංසකෙ සියුං භාවෙ ක්තො චානො අකත්තරි
භාවස්මිං ඝ්‍යණ් පුමෙ එවං ඉයුවණ්ණගහාදිජෙ
අප්පච්චයො'පි චාසඞ්ඛ්‍යාතුමාදි ක්ත්වාන්තකා සියුං.

අතියෙ—

---

පරරූපවේනුයි; (පරරූපතකාරයෙක්වේ) කරණං, කිරීම; කාතබ්බං, කාතබ්බනම්වෙ; කත්තබ්බංවා, කත්තබ්බ නම්හෝවේ; නපුංසකලිඞ්ගං, (භාවයෙහි නිෂ්පන්නහෙයින්) නපුංසකලිඟුයි; භාවස්ස, භාවයානමා; එකත්තෙපි, එකක්මබවවූවද; තබ්බාද්‍යභිහිතොභාවො, තබ්බාදීන්විසින් කියනලද භාවයතෙම; දබ්බමිවපකාසතීති; ද්‍රව්‍යයක්මෙන් ප්‍රකාශවේනුයි; බහුවචනඤ්චහොති, බහුවචනදවේ; මෙම කීහු;.

තබ්බාද්‍යභිහිතො භාවො දබ්බභූතො තුඤ්ඤයතෙ,
තස්මා යොආදයො පෙත්ථ පාකාඉවෙච්චමාදිසු''යි

කර, කරණෙ යනධාතු කරකියාතිබෙයි අකාරඋච්චාරණයපිණිසය, කරණං යන වාක්‍යයෙහි ධාතුන්කෙරෙන් පරව ''භාවකම්මෙසු තබ්බානීයා'' යන සූත්‍රයෙන් භාවයෙහි තබ්බ ප්‍රත්‍යයවෙයි, තබ්බ ප්‍රත්‍යයා පරකල්හි කර යන ධාතුහුගේ අන්තයහට තුංතුනතබ්බෙසුවා යන සූත්‍රයෙන් විකල්පයෙන් ආකාරාදෙශවේ පූර්වස්වරලොප් වෙයි, කාතබ්බං යනුවේ; නුවූපක්ෂයෙහි යකාරවර්ජිතවූ ව්‍යඤ්ජනාදි ප්‍රත්‍යයාපරකල්හි ධාත්වන්තයහට පරරූපමයකාරෙ ව්‍යඤ්ජනෙ යන සූත්‍රයෙන් පරරූපතකාරයෙක්වෙයි කත්තබ්බං යනුවේ) කම්මෙ, කර්මකාරකයෙහි; (උදාහරණ කියනුලැබේ) කරීයතීති, කරනුලැබේනුයි; කාතබ්බො, කාතබ්බනම්වේ; කත්තබ්බො, කත්තබ්බනම්වේ; (කරණං යනු භාවයට වාක්‍යය කරීයති යනු කර්මයට වාක්‍යය කරොතීයනු කර්තෘවට වාක්‍යයි) අභිධෙය්‍යසෙසව, වාච්‍යාර්ථයට බඳුවූ; ලිඞ්ගවචනානි, ලිඟුහාවචන ඇත්තෝයි.

තබ්බාදී, තබ්බාද්‍යන්තනාමයෝ; විසෙසලිඞ්ගා, විශෙෂ්‍යයට බඳුලිඟු ඇත්තාහ; තත්ථ, ඔවුන් අතුරෙහි; භාවජා, භාවයෙහිවූ; ආදෙපඤ්ච, ආදීයෙහි (දක්වනලද තබ්බ අනීය ඝ්‍යණ් ය යක් යන මොහු) පස්දෙනද; භාවෙ, භාවයෙහි (කරණලද;) ක්තො, ක්තප්‍රත්‍යයද; අකත්තරි, කර්තෘකාරයෙන් පිටත්තන්හි (කරණලද;) අනොච, අනප්‍රත්‍යයද යන මොහු; නපුංසකෙ, නපුංසලිඟුයෙහි; සියුං, වන්නාහ.

**රා නස්ස ණො.**

රානන්තතො ක්‍රියත්ථා පරස්ස පච්චයනකාරස්ස ණො හොති—කරණීයං-බහුලාධිකාරා කරණාදිසුපි භවන්ති-සිනා සොචෙය්‍යෙ-දිවාදිසෙසො- සිනායනෙත'නෙනාති සිනානීයං-(චුණ්ණං)-දා දානෙ—දියතෙ අස්සාති දානීයො—(බ්‍රාහ්මණො)—ඨා ගතිනිවුත්තියං—උපපුබ්බො—උපතිට්ඨතීති උපට්ඨානීයො—(සිස්සො)— ධාතූනමනෙකත්ථත්තා යෙව ඨා ඉච්චස්මිං ධාතුම්හි සන්තමෙවොපට්ඨානත්ථං උපසද්දො ජොතෙති—වුත්තං හි.

"සන්තමෙව හි නීලාදි-වණ්ණං දීපාදයො විය
ධාතුස්මිං සන්තමෙවත්ථං උපසග්ගා පකාසකා"

---

භාවස්මිං, භාවයෙහි (කරණලද;) ස්‍යණ්, ස්‍යණ් ප්‍රත්‍යය; පුමෙ, පුල්ලිඞ්ගයෙහි (වන්නේය;) ඉයුවණ්ණගහාදිජෙ, ඉවර්ණාන්ත උවර්ණාන්තධාතුන්කෙරෙන් හා ගහාදිධාතුන්කෙරෙන්වූ; අප්පච්චයොපිච, අ ප්‍රත්‍යයද; එවං, මෙසේම (පුලලිඟුයෙහි වන්නේය;) තුමාදික්ත්වාන්තකා, තුං ප්‍රත්‍යයා ආදිකොට ක්ත්වාප්‍රත්‍යයාඅන්තකොටඇති ප්‍රත්‍යයෝ; අසඞ්ඛ්‍යාසිය්‍යුං, අසඞ්ඛ්‍ය නම් වන්නාහුයි;
අනියෙ, අනියප්‍රත්‍යයාපරකල්හි.

රා-ත්‍රිපදයි—රානන්තතො, රකාරාන්තවූ; ක්‍රියත්ථා, ධාතුහු කෙරෙන්; පරස්ස, පරවූ; පච්චයනකාරස්ස, ප්‍රත්‍යයාසම්බන්ධවූ නකාරය හට; ණොහොති, ණකාරාදෙශවේ; කරණීයං යනුවේ; (මෙහිදු භාවයෙහි නපුංසකලිඟුය, කර්මයෙහිවාච්‍යලිඟුයි) බහුලාධිකාරා, බහුලං යනු වැටෙන්නෙහි; කරණාදිසුපි භවන්ති, කරණාදිකාරකයෙහිදු (තබ්බාදිප්‍රත්‍යයෝ) වෙත්; සිනා යන ධාතු; සොචෙය්‍යෙ, ශුචිභාවයෙහි වැටේ; දිවාදිසෙසො, මේ ධාතුවනෙම දිවාදිශෙෂයි; (ප්‍රචුර ප්‍රයොගනොවන බැවින් ධාතුපාඨයෙහි අපඨිතයි) අනෙන, මේ කරණකොටගෙන; සිනායන්තීති, නාත්නුයි; සිනානියං, සිනානීය නම් වේ; චුණ්ණං, චූර්ණියි; (ධාතුහු ආකාරාන්තහෙයින් ඉකාරඅනුපාන්තනුයි එකාරාභාවයයි, පරොක්ඛවි යී පරස්වරලොප්වේ) දායනධාතු; දානෙ, දීමෙහි වැටේ; අස්ස, මොහට; දියන්තීති, දෙනුලැබේනුයි; දානියො, දානීයනමවේ; බ්‍රාහ්මණො, බමුණුයි; ඨායනධාතු; ගතිනිවුත්තියං, ගමන්වැළකීමෙහි වැටේ; උපපුබ්බයි; උපතිට්ඨතීති, එළඹසිටීනුයි; උපස්ථාන කෙරේනුයි; උපට්ඨානියො, උපට්ඨානීය නම්වෙ; සිස්සො, ශිෂ්‍යයි; ධාතුනං, ධාතුන්ගේ; අනෙකත්ථතාය එව, අනෙකාර්ථයෙහි ප්‍රවෘත්ති ඇති බව හෙයින්ම; ඨාඉති, ඨායන; අස්මිං (ධාතුම්හි) මේ ධාතුයෙහි; සන්තමෙව, විද්‍යමානවූම; අත්ථං, අර්ථය; උපසද්දො, උප ශබ්දයතෙම; ජොතෙති, පහළකෙරේ; වුත්තං හි, කියනලද මැයි.

වච බ්‍යත්තවචනෙ—

**ස්‍යණ්.**

භාවකම්මෙසු ක්‍රියත්‍ථා පරො ස්‍යණ් හොති බහුලං-සකාරණකාරා නුබන්‍ධා.

**කගා චජානං සානුබන්‍ධෙ.**

සානුබන්ධෙ චකාරජකාරන්තානං ක්‍රියත්‍ථානං කගා හොන්ති යථාක්කමන්ති චස්ස කො.

**අස්සා ණානුබන්‍ධෙ.**

ණකාරානුබන්ධෙ පච්චයෙ පරෙ උපන්තස්ස අකාරස්ස ආ හොති- වුච්චතීති වාක්‍යං—වී චයෙ-ස්‍යණ්.

---

සන්තමෙවහි, විද්‍යමානවූම; නීලාදිවණ්ණං, නීලාදිවර්‍ණය (ප්‍රකාශකරන්නාවූ;) දීපාදයොවිය, ප්‍රදීපසූර්‍ය්‍යයසීාදීන්මෙන්; ධාතුඝම්ං, ධාතුයෙහි; සන්තං එව, විද්‍යමානවූම; අත්‍ථං, ගමනපචනාදිවූඅර්‍ථය; උපසග්ගා, උපසර්‍ගයෝ; පකාසකා, ප්‍රකාශකරන්නාහුයි.

උපපූඨ්‍යා-ගතිනිවුත්තියං යනධාතු ඨා කියා තිබෙයි උපතිඨන්ති යනවාක්‍යයෙහි ධාතුහුකෙරෙන් පරව බහුලංයනු වැටෙන හෙයින් භාවකම්මෙසු තබ්බානීයා යන සූත්‍රයෙන් කර්‍තෘකාරකයෙහි ආනීය ප්‍රත්‍යයවෙයි; පරොක්ඛවි යන සූත්‍රයෙන් පරස්වර ලොප්වෙයි ප්‍රාදි තෙම අසාද්‍යන්තයාහා එක්ව බහුලංයනු වැටෙනහෙයින් කුපාදයො නිච්චමසාද්‍යාදි විධිම්හි යන සූත්‍රයෙන් සමාසවෙයි උපඨානීයො යනු වේ; වචයන ධාතු; බ්‍යත්තවචනෙ, අක්ෂරාත්මක ශබ්දයෙහි වැටේ; (හස්තතාලාදි නිරක්ෂරශබ්දයෝ අව්‍යක්තනම්වෙති)

ස්‍යණ්-එකපදයි—භාවකම්මෙසු, භාවකර්‍මදෙක්හි; ක්‍රියත්‍ථාප රො, ධාතුහුකෙරෙන් පරවූ; ස්‍යණ්, ස්‍යණ්ප්‍රත්‍යයතෙම; බහුලං, ඉෂ්ටපරිද්ඡෙදන්; හොති, වේ; සකාරණකාරා, සකාරණකාරයෝ; අනුබන්ධා, අනුබන්ධයෝයි.

කගා-ත්‍රිපදයි—සානුබන්ධෙ, සානුබන්ධප්‍රත්‍යයාපරකල්හි; චකාරජකාරන්තානං ක්‍රියත්‍ථානං, චකාරජකාරාන්තවූධාතුන්ටවූ; යථාක්කමං, පතනින්; කගාහෙන්තීති, කකාරගකාරයෝ වෙත්නුයි; චස්ස, චකාරයහට; කො, කකාරයෙක්වේ.

අස්සා-ත්‍රිපදයි—ණකාරානුබන්ධෙ පච්චයෙ පරෙ, ණකාරානුබන්ධ ප්‍රත්‍යයාපරකල්හි; උපන්තස්ස අකාරස්ස, උපාන්තවූ අකාරයහට; ආහොති, ආකාරාදෙශවේ; වුච්චතීති, කියනුලැබේනුයි; වාක්‍යං, වාක්‍යනම්වේ; වියනධාතු; චයෙ, රුස්කිරීමෙහිවැටේ; ස්‍යණ්, ස්‍යණ් ප්‍රත්‍යයවේ.

**යුවණ්ණානමෙඔ පච්චයෙ.**

ඉවණ්ණ උවණ්ණන්තානං ක්‍රියත්ථානං එ ඔ හොන්ති යථාක්කමං පච්චයෙති ඉස්සෙකාරෙ "සරම්හාවෙ"ති යස්ස විභාවෙ ච-චයනං චියත්ති වා චෙය්‍යං- ද දනෙ—

**ආස්සෙ ච.**

ආකාරන්තතො ඝ්‍යණ් හොති භාවකම්මෙසු ආස්ස එ ච-දනං දීයතීති වා දෙය්‍යං-වද වචනෙ—"වදාදීහි යො"ති භාවකම්මෙසු යොච වග්ගපුබ්බරූපෙසු-වදනං වදිතබ්බං වා වජ්ජං-අමගම ගමනෙ වදාදිත්තා යෙ-ගමනං ගම්‍යතෙති වා ගම්‍යං—ගුහ සංවරණෙ—"ගුහාදීහි යක්" ඉති භාවකම්මෙසු යක්—කකාරො කානුබන්ධකාරියත්ථො.

**ලහුස්සුපන්තස්ස.**

---

යුවණ්ණ-ත්‍රිපදයි—ඉවණ්ණුවණ්ණන්තානං ක්‍රියත්ථානං, ඉවර්ණාන්ත උවර්ණාන්තධාතූන්ට; යථාක්කමං, පනාතින්; එ ඔ හොන්තීති එකාර ඔකාර දෙදෙනවෙත්නුයි; ඉස්ස, ඉකාරයහට; එකාරෙ, එක, රාදෙශද; සරම්හාවෙති, සරම්හාවෙයන සූත්‍රයෙන්; යස්ස, යකාරය හට; විභාවෙව, විකල්ප කලකල්හි; චයනං, රැස්කිරීමහෝ; චියතීතිවා රැස්කරනු ලැබෙයිහෝ; චෙය්‍යං, චෙය්‍යනම්වේ; භාවකර්මදෙකට වාක්‍යයි; මත්තෙහිදු මෙබඳු තන්හි මෙමනයයි.

ආස්සෙච—ත්‍රිපදයි—ආකාරන්තතො, ආකාරාන්තධාතුහු කෙරෙන්; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; ඝ්‍යණ්හොති, ඝ්‍යණ්ප්‍රත්‍යය වෙයි; ආස්ස, ආකාරයහට; එච, එකාරාදෙශදවේ; දනං, දීමහෝ; දීයතීතිවා, දෙනුලැබෙයිහෝ; දෙය්‍යං, දෙය්‍යනම්වේ; වදයනධාතු, වචනෙ, කීමෙහි වැටේ; වදාදීහියොති, වදාදීහියොයන සූත්‍රයෙන්; භාවකම්මෙසු, භාවකර්මදෙක්හි; යො, යප්‍රත්‍යයවේ; චවග්ගපුබ්බරූපෙසු; චවර්ගපූර්වරූපකලකල්හි; වදනං, කීමහෝ; වදිතබ්බංවා, කියයුත්තහෝ; වජ්ජං, වජ්ජනම්වේ; අමයනධාතුද ගමයනධාතුද; ගමනෙ, ගමන්හිවැටේ; වදාදිත්තා, වදාදිබවහෙයින්; යෙ, යප්‍රත්‍යය කලකල්හි ගමනං, යාමහෝ; ගම්‍යතෙතිවා, යනු ලැබෙයි හෝ; ගම්‍යං, ගම්‍යනම්වේ; ගුහයනධාතු; සංවරණෙ, මුවාකිරීමෙහිවැටේ; ගුහාදීහි යක්ඉති, ගුහාදිහියක් යනසූත්‍රයෙන්; භාවකම්මෙසු භාවකර්මදෙක්හි; යක්, යක්ප්‍රත්‍යයවේ; කකාරො, කකාරතෙම; කානුබන්ධකාරියත්ථො, කානුබන්ධකාර්‍ය්‍යය ප්‍රයොජනකොට ඇත්තේයි; (වෘද්ධිනොවීම ප්‍රයොජනකොට ඇත්තේයි සේයි.)

ලහු-විපදයි—පච්චයෙ, ප්‍රත්‍යයාපරකල්හි; ලහුභූතස්ස, ලඝුවූ; උපන්තස්ස, උපාන්තවූ; යුවණ්ණස්ස, ඉවර්ණ උවර්ණයාහට; යථාක්කමං, පනාතීන්; එ ඔ හොන්තීති, එ ඔ දෙදෙනවෙත්නුයි; සම්ප්‍රාප්ත

ලහුභූනස්ස උපන්තස්ස යුවණ්ණස්ස එ ඔ හොන්ති යථාක්කමං පච්චයෙති සම්පත්තස්සො කාරස්ස "නතෙ කානුබන්ධනාගමෙසු"ති පටිසෙධො—ගුහණං ගුහිතබ්බං වා ගුය්හං—විපල්ලාසො—සාස අනුසිඨියං—යක්.

**සාසස්ස සිස්වා.**

සාසස්ස වා සිස් හොති කානුබන්ධෙ–පුබ්බරූපෙ–සාසියතීති සිස්සො සිසාදෙසාභාවපක්ඛෙ.

**ඤි බ්‍යඤ්ජනස්ස.**

ක්‍රියත්‍ථා පරස්ස බ්‍යඤ්ජනාදිප්පච්චයස්ස ඤි වා හොති—ඤකාරො "ඤි ලසෙස"–ති විසෙසනත්‍ථො, සාසියො—වවත්‍ථිත විභාසත්තා වාධිකාරස්ස කචි ඤිස්සාභාවො—කත්තබ්බං.

**කත්තරි ලතුණකා.**

---

ස්ස, සම්ප්‍රප්තවූ; ඔකාරස්ස, ඔකාරයහට; නතෙකානුබන්ධනාගමෙසූති, නතෙකානුබන්ධනාගමෙසු යන සූත්‍රයෙන්; පටිසෙධො, ප්‍රතිෂෙධවේ; ගුහනං, සැඟවීමහෝ; ගුහිතබ්බංවා, සැඟවිය යුත්තේහෝ; ගුය්හං, ගුය්හනම්වේ; විපල්ලාසො, (හකාර) විපර්‍යාසවේ; සාස යන ධාතු; අනුසිඨියං, අනුශාසනයෙහි වැටේ; යක්, යක්ප්‍රත්‍යයවේ.

සාස-විපදයි—කානුබන්ධෙ, කානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; සාසස්ස, සාස අනුසිඨියං යන ධාතුහට; වා, විකල්පයෙන්; සිස්හොති, සිස්යනාදෙශවේ; පුබ්බරූපෙ, (යකාරයහට) පූර්වරූපකලකල්හි; සාසියතීති, අනුශාසනාකරනු ලැබේනුයි; සිස්සො, ශිෂ්‍යනම්වේ; සිසාදෙසාභාවපක්ඛෙ, සිස්යන ආදෙශ නුවූපක්ෂයෙහි.

ඤි-විපදයි—ක්‍රියත්‍ථාපරස්ස, ධාතුහුකෙරෙන් පරවූ; බ්‍යඤ්ජනාදිප්පච්චයස්ස, බ්‍යඤ්ජනාදි ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; ඤිහොති, ඤිආගමවේ; ඤකාරො, ඤකාරතෙම; ඤිලසෙසති, ඤිලසෙස යන සූත්‍රයෙහි; විසෙසනත්‍ථො, විශෙෂණය ප්‍රයොජනකොට ඇත්තේයි; සාසියො, යනුවේ; වාධිකාරස්ස, වාධිකාරයාගේ; වවත්‍ථිත විභාසත්තා, ව්‍යවස්ථිතවිභාෂාබව හෙයින්; කචි, කිසිතැනෙක්හි; ඤිස්ස, ඤිආගමයාගේ; අභාවො, නොවීමවේ; කත්තබ්බං යනුවේ; මෙහි බ්‍යඤ්ජනාදි ප්‍රත්‍යයා පරවූවද වාධිකාරයෙන් ඤිආගමනොවේ.

කත්තරි-විපදයි—ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; ලතුණකාහොන්ති, ලතුණකප්‍රත්‍යයෝවෙත්; ලකාරො ලකාරතෙම; ලතුපිතාදිනමාසිම්හිති, ලතුපිතාදිනමා සිම්හියන සූත්‍රයෙහි; විසෙසනත්‍ථො, විශෙෂණය ප්‍රයොජනකොට ඇත්තේයි; දදන්ති, දේනුයි; දදා, දදානම්වේ; දා, දදෙ යන ධාතුහුකෙරෙන්

කත්තරි කාරකෙ ක්‍රියත්ථා ල්තුණකා හොන්ති—ලකාරො “ල්තුපිතාදීනමා සිම්හි”ති විසෙසනතෝ—දදාතීති දාතා—ණකෙ—

**අස්සාණාපිම්හි යුක්.**

අකාරන්තස්ස ක්‍රියත්ථස්ස යුක් හොති ණාපිතො’ඤ්ඤස්මිං ණානුබන්ධෙ, දායකො—වධ හිංසායං“—ඤී බ්‍යඤ්ජනස්සා”ති ඤී— වධෙතීති වධිතා, ණකෙ—අස්සාණානුබන්ධෙ”ති උපන්තස්ස අස්ස ආත්තෙසම්පත්තෙ—

**අඤ්ඤත්‍රාපි.**

කානුබන්ධනාගමතො’ඤ්ඤස්මිම්පි තෙ එ ඔ ආ ක්වචි න හොන්තීති පටිසෙධො-වධකො—ලූ ඡෙදනෙ.

**ක්වචණ්,**

කම්මතො පරා ක්‍රියත්ථා ක්වචි අණ් හොති කත්තරි—ඔකාරෙ—

---

පරව දදති යන වාක්‍යයෙහි මෙයින් ල්තු ප්‍රත්‍යයවේ ලකාර අප්‍රයොගීවේ දතුශබ්දයව ඔහුකෙරෙන් සිවිභක්තිවෙයි; සිපරකල්හි ල්තු ප්‍රත්‍යයාන්තයාහට ල්තුපිතාදීනමාසිම්හි යන සූත්‍රයෙන් ආකාරවෙයි; සිහට ගසීනං යන සූත්‍රයෙන් ලොප්වෙයි දාතායනුවේ; ණකෙ, ණක ප්‍රත්‍යයාකල්හි.

ආස්සා-ආස්සය අණාපිම්හිය යුක්ය යනු පදයි—ණාපිතො, ණාපි ප්‍රත්‍යයාකෙරෙන්; අඤ්ඤස්මිං, අන්‍යවූ; ණානුබන්ධෙ, ණානුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි; ආකාරන්තස්ස ක්‍රියත්ථස්ස, ආකාරාන්තධාතුහට; යුක්හොතියුක්වේ; දායකො යනුවේ; වධයන ධාතු හිංසා කිරීමෙහි වැටේ; ඤී බ්‍යඤ්ජනස්සාති, ඤීබ්‍යඤ්ජනස්ස යන සූත්‍රයෙන්; ඤී, ඤීආගමවේ; වධෙතීති, මරානුයි; වධිතා, වධිතානම්වේ; ණකෙ, ණකප්‍රත්‍යයාකල්හි; අස්සාණානුබන්ධෙති, අස්සාණානුබන්ධෙ යන සූත්‍රයෙන්; උපන්තස්ස, උපාන්තවූ; අස්ස, අකාරයහට; ආත්තෙසම්පත්තෙ, ආත්වය සම්ප්‍රප්තවූ කල්හි.

අඤ්ඤ-ඒපදයි—කානුබන්ධනාගමතො, කානුබන්ධනාගමයෙන්; අඤ්ඤස්මිම්පි, අන්‍යදවූ ප්‍රත්‍යයාපරකල්හි; තෙ එ ඔ ආ, එ ඔ ආ යනාදෙශයෝ; ක්වචි, ක්සිතැනෙක්හි; න හොන්තීති, නොවෙත්නුයි; පටිසෙධො, ප්‍රතිෂෙධවේ; වධකො යනුවේ; ලූයනධාතු; ඡෙදනෙ, කැපීමෙහි වැටේ.

ක්වචණ්-ක්වචිය අණ්ය යනු පදයි; කම්මතො පරා, කර්මවාචිහු කෙරෙන්පරවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්පරව; කත්තරි, කර්තෘකාරකයෙහි; ක්වචි, කිසිතැනෙක්හි; අණ්හොති, අණ්ප්‍රත්‍යයවේ; ඔකාරෙ, (ධාතුහුගේ ඌකාරයහට) ඔකාරාදෙශකළකල්හි.

**ආයාවා ණානුබන්ධෙ.**

එඔනමායාවා හොන්ති යථාක්කමං සරාදෙ ණානුබන්ධෙති තස්සාවාදෙසො—සරං ලුණාතීති සරලාවො, කුම්භං කරොතීති කුම්භකාරො-ඛවිති කිං, කම්මකාරො-එත්ථ "භාවකාරකෙස්ව ඝණ්ඝකා"ති අප්පච්චයො—දිස පෙක්ඛණෙ.

**සමානඤ්ඤභවන්තයාදිතූපමානා දිසා කම්මෙ රීරික්ඛකා.**

සමානාදිහි යාදිහි චොපමානෙහි පරා දිසා කම්මකාරකෙ රිරික්ඛකා හොන්ති="රානුබන්ධෙ'න්තසරංදිසස්සා"ති දිසස්ස ඉසභාගස්සලොපෙ"රීරික්ඛකෙසු"ති සමානස්ස සාදෙසෙ ච—සමානො විය දිස්සතීති සදී, සදික්ඛො—කෙ—

---

ආයා-විපදයි—සරාදෙ ණානුබන්ධෙ, සවරාදිවූ ණානුබන්ධ ප්‍රත්‍යයාපරකල්හි; ඒ ඔනං, ඒකාර ඔකාර දෙදෙනාහට; යථාක්කමං, පන්තීන්; ආයාවාහොන්තීති, ආයආව් යන ආදෙශයෝවෙත්නුයි; තස්ස, ඔහට; ආවාදෙසො, ආවයනාදෙශවේ; සරං, ශරය; ලූනාතිති, කපානුයි; සරලාවො, සරලාවනම්වෙ; සරංයන විතීයාන්තයා උපපදකොට ඇති ලූ ඡේදනෙ යනධාතුහුකෙරෙන් සරං ලූනාති යන වාක්‍යයෙහි "ඛවණ" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි අණප්‍රත්‍යයකොට ඔකාරද ආවාදෙශද අමාදිසමාසද කටයුතු—කුම්භං, ඝටය; කරොතීති කෙරේනුයි; කුම්භකාරො, කුම්භකාරනම්වේ; කුම්භං යන විතීයාන්තයා උපපදකොට ඇති කර කරණෙ යන ධාතුහුකෙරෙන් කීනියෙන් අණප්‍රත්‍යයාදි කටයුතු-ඛවිති—පෙ—කම්මකාරො යන තන්හි අණ ප්‍රත්‍යයනොවනපිණිසයි; එත්, මේ කම්මකරො යන තන්හි; භාවෙ—පෙ—ඝකා යන සූත්‍රයෙන්; අප්පච්චයො, අප්‍රත්‍යයවේ; දිස යන ධාතු; පෙක්ඛණෙ, බැලීමෙහි වැටේ.

සමා-සමානඤ්ඤභවන්තයාදිනොය උපමානාය දිසාය කම්මෙය රීරික්ඛකාය යනු පදයි—උපමානෙහි; උපමානවාචිවූ; සමානාදීහි, සමානාදින් කෙරෙන්ද; යාදීහිච, යාදින්කෙරෙන්ද පරා, පරවූ; දිසා, දිසපෙක්ඛණෙ යන ධාතුහුකෙරෙන්; කම්මකාරකෙ, කර්මකාරකයෙහි; රීරික්ඛකා හොන්ති, රිරික්ඛකප්‍රත්‍යයෝවෙත්; (රියරික්ඛයකය යනමේ ප්‍රත්‍යයෝ තුන්දෙන වෙතියිසේයි) සමානාදිහුනම්සූත්‍රොක්තසමාන අඤ්ඤ භවන්ත යන මොහුය, යාදිහුනම් යත්‍යත එත ඉම අමුකිං තුම්හ අම්හ යන සබ්බාදියෙහි පඨිතශබ්දයෝයි; රානු—පෙ—යන සූත්‍රයෙන්; දිසස්ස, දිසයනධාතුහුගේ; ඉසභාගස්සලොපෙ, ඉස්භාගලොපද; රීරික්ඛකෙසූති, රීරික්ඛකෙසු යන සූත්‍රයෙන්; සමානස්ස, සමාන ශබ්දයහට; සාදෙසෙච, සකාරාදෙශදභාලිකල්හි; සමානොවිය, සදෘශයක්හුමෙන්; දිස්සතීති, දක්නාලැබේනුයි; සදී, සදීනම්වෙයි; සදික්ඛො, සදික්ඛනම්වේ; කො, කප්‍රත්‍යය කළකල්හි.

**න තෙ කානුබන්ධනාගමෙසු.**

ෆෙ එ ඔ ආ කානුබන්ධෙ නාගමෙ ච න හොන්තීති එත්තාභාවෙ, සදිසො.

**සමානා රො රීරික්ඛකෙ.**

සමානසද්දතො පරස්ස දිසස්ස ර හොති වා රීරික්ඛකෙසුති පක්ඛෙ දස්ස රාදෙසෙ—සරී, සරික්ඛො, සරිසො.

**සබ්බාදීනමා,**

රීරික්ඛකෙසු සබ්බාදිනමා හොති - අඤ්ඤාදී, අඤ්ඤාදික්ඛො, අඤ්ඤාදිසො.

---

නතෙ-ප්‍රතිෂෙධසූත්‍රයි-ත්‍රිපදයි; කානුබන්ධෙ, කානුබන්ධප්‍රත්‍යයා පරකල්හිදු; නාගමෙච, නකාරාගම විෂයෙහිදු; තෙ එ ඔ ආ, ඒ එ ඔ ආයන මොහු; නහොන්තීති, නොවෙත්නුයි; එත්තාභාවෙ, එත්වය නුවූකල්හි; සදිසො, සදිසොයනුවේ; ප්‍රථමාන්තවූ සමානශබ්දයා උප පදකොටඇති දිසපෙක්ඛනෙ යන ධාතු දිස්කියා තුන්තැනක තිබෙයි සමානොවිය දිස්සති යනවාක්‍යයෙහි උපමානවාචිවූ සමාන ශබ්දයා කෙරෙන් පරවූ දිසපෙක්ඛනෙ යන ධාතුහු කෙරෙන් පරව සමාන ඤ්ඤ යනාදි සූත්‍රයෙන් කර්මකාරකයෙහි රීප්‍රත්‍යයවෙයි; රික්ඛප්‍රත්‍යය වෙයි කප්‍රත්‍යයවෙයි රානුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි දිසයන ධාතුහුගේ ඉස්භාගයහට රානුබන්ධෙන්තස්සරාදිස්ස යන සූත්‍රයෙන් ලොප්වෙයි විසෙසන මෙකත්ථෙන'යි හෝ ස්‍යාදි ස්‍යාදිනෙකත්ථං'යි හෝ සමාන ශබ්දයාහා සමාසවෙයි. රීරික්ඛක ප්‍රත්‍යයන් පරකල්හි සමානශබ්දය හට රීරික්ඛකෙසු යන සූත්‍රයෙන් සකාරාදෙශවෙයි සදී සදික්ඛො යනු වේ; කප්‍රත්‍යයාගේ කකාරානු බන්ධප්‍රත්‍යයාපරකල්හි ලඝුවූ උපාන්තය හට ලහුස්සුපන්තස්ස'යි එකාරාදෙශද පත්නෙහි "නතෙකානු බන්ධ නාගමෙසු'යි ප්‍රතිෂෙධ වෙයි සදිසො යනුවේ.

සමා-චිපදයි—රීරික්ඛකෙසු, රීරික්ඛකප්‍රත්‍යයන් පරකල්හි; සමා නසද්දතො පරස්ස, සමානශබ්දයාකෙරෙන්පරවූ; දිසස්ස, දිසයන ධාතුහට; වා, විකල්පයෙන්; රහොතීති, රකාරාදෙශවෙනුයි; පක්ඛෙ, පක්ෂයෙක්හි; දස්ස, දකාරයහට; රාදෙසෙ, රකාරාදෙශකළකල්හි; සරීයනාදිවේ; වාක්‍යද සිද්ධද අර්ථද යට කීනියෙන් දතයුතු.

සබ්බා—චිපදයි—රීරික්ඛකෙසු, රීරික්ඛකප්‍රත්‍යයන් පරකල්හි; සබ්බාදිනං, සබ්බාදීන්ට; ආහොති, ආකාරාදෙශවේ; අඤ්ඤාදීයනාදි වේ; අඤ්ඤොවිය දිස්සති යනු විග්‍රහයි-අනිකක්හුමෙන් දක්නාලැබේ නුයි යන අර්ථයි.

**නනාකිම්මානං වා කි ථී.**

රීරික්ඛකෙසු නන කිං ඉම සද්දානං වා කි ථී හොන්ති යථාක්කමං ටකාරා සබ්බාදෙසත්ථා—භවාදී, භවාදිකෙඛා, භවාදිසො—යාදී, යාදී කෙඛා, යාදිසො—ත්‍යාදී, ත්‍යාදිකෙඛා, ත්‍යාදිසොචවාදි—තුම්හාම්හානනතු අයං විසෙසො.

**තුම්හාම්හානං තා මෙකස්මිං.**

රීරික්ඛකෙසු තුම්හඅම්හානං තාමා හොන්ති ක ස්මිං යථාක්කමං-තාදී, මාදී, තාදිකෙඛා, මාදිකෙඛා, තාදිසො, මාදිසො-එකස්මින්ති කිං, තුම්හාදිසො, අම්හාදිසො—වී වයෙ.

**භාවකාර කෙඛ්‍යස ණ්සකා.**

භාවෙ කාරකෙ ච ක්‍රියත්ථා අ සණ් ස කා හොන්ති බහුලං—අ—ඉ සෙසකාරෙ.

---

නන—නනාකිම්මානංයවාකිථීය යනු පදයි—රීරික්ඛකෙසු, රීරික්ඛ කප්‍රත්‍යයන් පරකල්හි; නනකිං ඉමසද්දානං, නනකිං ඉමශබ්දයන්ට; යථාක්කමං, පනතින්; වාකිථීහොන්ති, වාකිථී යන මේ ආදෙශයෝ වෙත්; ටකාරා, ටකාරයෝ; සබ්බාදෙසත්ථා, සර්වාදෙශප්‍රයොජනකොට ඇත්තාහුයි; භවාදීයනාදිවේ; භවංවියදිස්සතියො වියදිස්සති සොවිය දිස්සති යනු විග්‍රහයි; භවංවිය, භවත්හුමෙන්; යොවිය, යමක්හු මෙන්; සොවිය, ඔහුමෙන් යන අර්ථයි; තුම්හාම්හානනතු, තුම්හඅම්හ ශබ්දයන්ගේ වනාකි; අයං, මේතෙම; විසෙසො, වෙනසයි.

තුම්හ-තුම්හාම්හානංය තාමාය එකස්මිංයයනුපදයි-රීරික්ඛකෙසු රීරික්ඛක ප්‍රත්‍යයන් පරකල්හි; එකස්මිං, එකවචනයෙහි වැටෙන් නාවූ; තුම්හ අම්හානං, තුම්හ අම්හශබ්දයන්ට; යථාක්කමං, පනතීන්; තාමාහොන්ති, තාමායන ආදෙශයෝවෙත්; තාදීයනාදිවේ; ත්වම්ව දිස්සතී අහම්වදිස්සති යනුවිග්‍රහයි; ත්වම්ව,තාමෙන්; අහම්ව,මාමෙන්; එකස්මින්ති, එකවචනයෙහි වැටෙන්නාවූයනු; කිං, කුමටය; තුම්හා දිසො අම්හාදිසො යනතන්හි බහුවචන විෂයෙහි තාමා යන ආදෙශ නොවන පිණිසයි; මේ ප්‍රත්‍යුදාහරණයෙහි 'තුම්හෙවියදිස්සති අම්හෙ වියදිස්සති'යී බහුත්වයෙන් විග්‍රහය 'බ්‍යඤ්ජනෙ දීඝරස්සා'යි දීර්ඝවෙයි; වියනධාතු; වයෙ, රැස්කිරීමෙහි වැටේ.

භාව-ඊපදයි—ක්‍රියත්ථා, ධාතුහුකොරෙන්පරව; භාවෙ, භාවයෙ හිද; කාරකෙච, කාරකයෙහිද; බහුලං, ඉෂටපරිද්දෙන්; අසණ්සකා හොන්ති, අසණ්සකප්‍රත්‍යයෝවෙත්; මෙහි ණකාරස්කාරයෝ ඒ ඒ කායර්‍ය්‍යප්‍රයොජනකොට ඇති අනුබන්ධයෝය, එහෙයින් අකාර මාත්‍ර යෙක්මවේ; අ; අප්‍රත්‍යයවේ; ඉස්ස, ඉකාරයහට; එකාරෙ, එකාරා දෙශකළකල්හි.

**එඛනමයවා සරෙ.**

සරෙ පරෙ එඛනමයවා හොන්ති යථාක්කමං තනිනස්ස අයාදෙසො ච්-චයනං චියන්ති වා චයො-නි පාපුණනෙ—වි පුබ්බො-විනයනං විනෙනීති වා විනයො-රු සද්දෙ-රවනං රවො-භූ සත්තායං, භවනං භවො-ගහ උපාදනෙ-ප පුබ්බො-පග්ගණ්හණං පග්ගහො-ගහ මද දප රණ සර වර වරාදයො ගහාදයො--කර කරණෙ, කිච්ඡතෙථ දුමයි අකිච්ඡතෙථසුඊසං සුඛුපපදෙසු— දුක්ඛෙන කරීයතීති කරණං වා, ඊසක්කරං, සුකරං-වජ හානියං-සණ්-වජනං වාගො=පච පාකෙ-

---

එඛ-ත්‍රිපදයි—සරෙපරෙ, ස්වරයාපරකල්හි; එඛනං, ධාතුහුසම්බ න්‍ධිවූ එකාරඛකාරයන්ට; යථාක්කමං, පනතීන්; අයවා හොන්තීති, අය අව යන ආදෙශයෝවෙත්නුයි; තස්ස, ඒකරණලද එකාරය හට; අයාදෙසො, අයාදෙශවේ; චයනං, රුස්කිරීමහෝ; චියතීති වා; රුස්කරනු ලැබේනුයිහෝ; චයො, චය නම්වේ; නීයනධාතු; පාපු ණනෙ, පැමිණීමෙහි වැටේ; විපුබ්බො, විපූර්වයි; විනයනං, හික් මීමහෝ; විනෙතීතිවා, හික්මවානුයිහෝ; විනයො, විනයනම්වේ;- භාවකර්තෘදෙක්හි අප්‍රත්‍යයකොට ප්‍රාදිසමාසකටයුතු— රුයනධාතු; සද්දෙ, ශබ්දයෙහි වැටේ; රවනං, ශබ්දකිරීම; රවො, රවනම්වේ; භූ යනධාතු; සත්තායං, වීමෙහිවැටේ; භවනං, වීම; භවො, භවනම්වේ ගහයනධාතු; උපාදනෙ, ගැන්මෙහිවැටේ; පපුබ්බො, පපූර්වයි; පග්ග ණ්හණං, ප්‍රග්‍රහකිරීම; පග්ගහො, පග්ගහනම්වේ; පපූර්වූගහඋපාද නෙයනධාතුය ප්‍රාදිසමාසකොට ගකාරයහටද්විත්වකරනු, ගහ—පෙ— වරාදයො, ගහ උපාදනෙ මද උම්මාදෙ දරදුරණෙ රණ සද්දෙ සරගති හිංසා චින්තාසු වර ආවරණිච්ඡාසු වරගතිභක්ඛණෙසු යන මේ ආදීහු ගහාදීහුනම්වෙත්; ගහාදිධාතුන්කෙරෙන් භාවයෙහි කරණලද අප්‍ර ත්‍යය පුල්ලිඟුයයි යටකීහෙයින් ගහාදීහුනම් මොහුයයිදක්වනුපිණිස ගහාදීන්ගේ නිදේශය කරණලදී; කර' කරයනධාතු, කරණෙ, කිරී මෙහි වැටේ; කිච්ඡතෙථ, කෘච්ඡ්‍රාර්ථයෙහි වැටෙන්නාවූ; දුමහ්, දුශබ්ද යාද; අකිච්ඡතෙථසු, අකෘච්ඡ්‍රාර්ථයන්හි වැටෙන්නාවූ; ඊසංසුව, ඊසංය සුය යනමොවුන්ද; උපපදෙසු, උපපදකල්හි; දුක්ඛෙන, දුකින්; කරී යතීති, කරනුලැබේනුයිහෝ; කරණංවා, කිරීමහෝ; දුක්කරං, දුක්ක රනම්වේ; සුඛෙන, සුවයෙන්; කරීයතීති, කරනු ලැබේනුයිහෝ කර ණංවා, කිරීමහෝ; ඊසක්කරං, ඊසක්කරනම්වේ; ඊසංශබ්දයාසුකරත්ව යෙහි වැටෙනහෙයින් සුඛෙනකරීයතියි කියනලදී. ඊසමකිච්ඡෙන කරීයතී කරණංවා යනු විග්‍රහයි, ස්‍යාදිස්‍යාදිනෙකත්ථං යි සමාසවේ; සුකරං යනු ප්‍රාදිසමාසයි—වජ යන ධාතු; හානියං, හැරීමෙහි වැටේ;

නිපුබ්බෝ-ස, නිපචතීති නිපකො—ඛීප පෙරණෙ—ක—ඛීපතීති ඛිප කො—පිතපපණෙ.

**යුවණ්ණානමියඛුවඞ සරෙ.**

ඉවණ්ණුවණ්ණන්තානං ක්‍රියත්ථානමියඛුවඞ හොන්ති සරෙ ක්වචිති ඉයඞ-පිණෙතීති පියො—භූ සත්තායං—අභි පුබ්බො.

**ක්වි.**

ක්‍රියත්ථා ක්වි හොති බහුලං භාවකාරකෙසු.

**ක්විස්ස.**

ක්‍රියත්ථා පරස්ස ක්විස්ස ලොපො හොතිති ක්විලොපෙ—අභිභවතීති අභිභූ-එවං සයම්භූ-අම ගම ගමනෙ-ක්විම්හි-''ක්විම්හි ලොපො'න්ත බ්‍යඤ්ජනස්සා''ති මලොපො—උරසා ගච්ඡතීති උරගො—දා දානෙ—

---

ඝණ්, ඝණ්ප්‍රත්‍යයවේ; චජනං, හැරිම; චාගො, චාගනම්වේ; පච යනධාතු; පාකෙ, පිසීමෙහි වැටේ; නිපුබ්බො, නිපූර්වයි; ස, සප්‍රත්‍යය වේ; නිපචතීති, ඥානපරිපාකයටයේනුයි; නිපකො, නිපකනම්වේ; ඛීපයනධාතු, පෙරණෙ, දැම්මෙහිවැටේ; ක, කප්‍රත්‍යයවේ; ඛිපතීති, දමානුයි; ඛිපකො, ඛිපකනම්වේ; පි, යනධාතු; තප්පණෙ, පිනවීමෙහි වැටේ.

යුවණ්ණ—ත්‍රිපදයි—සරෙ, ස්වරයා පරකල්හි; ඉවණ්ණුවණ්ණ න්තානං ක්‍රියත්ථානං, ඉවර්ණාන්ත උවර්ණාන්තධාතූන්ට; ක්වචි, කිසි තැනෙක්හි; ඉයඞුවඞ හොන්තිති, ඉයඞ් උවඞ් යන මොහුවෙත්නුයි; ඉයඞ්හොති, ඉයඞ්වේ; පිණෙතීති, පිණවානුයි; පියො, පියනම්වේ; භූයනධාතු; සත්තායං, විමෙහිවැටේ; අභිපුබ්බො, අභිපූර්වයි.

ක්වි-එකපදයි—ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්පරව; භාවකාරකෙසු, භාවකාරකදෙක්හි; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; ක්විහොති, ක්විප්‍රත්‍යයවේ.

ක්විස්ස-එකපදයි—ක්‍රියත්ථාපරස්ස, ධාතුහුකෙරෙන්පරවූ; ක්විස්ස, ක්විහට; ලොපොහොතීති, ලොප්වේනුයි; ක්විලොපෙ, ක්විහටලොප්කළ කල්හි; අභිභවතීති, මැඩපවතීනුයි; අභිභූ, අභිභූනම්වේ; ප්‍රාදිසමාසයි; සයම්භවතීති, සයම්භූ-ස්‍යාදි සමාසයි; සයං, තෙමේ; භවතීති, වේනුයි; සයම්භූ, සයම්භූයනු; එවං, මෙසේයි; අමියනධාතුද ගමයන ධාතුද; ගමනෙ, ගමන්හිවැටේ; ක්විම්හි, ක්විප්‍රත්‍යයකළකල්හි; ක්විම්හි—පෙ—යන සූත්‍රයෙන්; මලොපො, (ධාතුහුගේ) මකාරයහට ලොප් වේ; උරසා, ලයකරණකොටගෙන; ගච්ඡතීති, යේනුයි; උරගො, උරගනම්වේ; (සපියි) අමාදි සමාසයි-අනොති, අනොයන සූත්‍රයෙන්; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්පරව; භාවකාරකෙසු, භාවකාරකදෙක්හි; අනො, අනප්‍රත්‍යයවේ; දදාති, දීමහෝ; දීයතීතිවා, දෙනුලැබේනුයි

“අනො”ති ක්‍රියත්ථා භාවකාරකෙසුවනො—දනාති දියතීති වා දානං—සංප පුබ්බො—සම්මා පදීයතෙ යස්ස තං සම්පදානං—අප ආ පුබ්බො—අපාදදාති එතස්මාති අපාදානං—කර කරණෙ—අධි පුබ්බො—“රා නස්ස ණො”—ති ණො—අධිකරීයති එතස්මින්ති අධිකරණං—ගහ උපාදානෙ

**තථනරානං ටඨණලා.**

තථනරානං ටඨණලා හොන්ති වා යථාක්කමන්ති නස්ස ණාදෙසෙ—ගණ්හිතබ්බං ගහණං—පද ගමනෙ=ති පුබ්බො.

**පදාදීනං ඝවි.**

පදාදීනං යුක් හොති ඝවි පච්චයෙ—නිපතන්ති නිපජ්ජනං—පී තප්පණෙ—අනඝ්ඝි චනාදිනා නාගමෙච ‘න නෙ’ ඉච්චාදිනා එ න හොති—පීති පීණනං—විජී භය චලනෙසු—සං පුබ්බො—සංවිජන්ති සංවෙජනං—“අඤ්ඤත්‍රාපි”,ති එත්තාභවෙ—සංවිජනං—කුධ කොපෙ—ඝුණ්ඩනි සීලෙ නාති කොධනො—භික්ඛ යාචනෙ.

---

හෝ; දානං, දානනම්වේ; සංපපුබ්බො, ධාතුහු සංපපූර්වකල්හි; යස්ස, යමක්හට; සම්මා, මනාකොට; දීයතෙ, දෙනුලැබේද; තං, ඒ; සම්පදානං, සම්පදානනම්වේ; අප ආපුබ්බො, එමධාතු අප ආපූර්වකල්හි; එතස්මා, මොහුකෙරෙන්; අපාදදාතීති, පහවේනුයි; අපාදානං, අපාදානනම්වේ; මේ දෙනැන්හිම ප්‍රාදිසමාසයි; අධිපුබ්බො, අධිපූර්වයි; රානස්සණොති, රානස්සණො යනසූත්‍රයෙන්; ණො, (ප්‍රත්‍යයනකාරය හට) ණකාරාදෙශවේ; එතස්මිං, මෙහි; අධිකරීයතීති, පිහිටුවනුලැබේනුයි; අධිකරණං, අධිකරණනම්වේ; ආධාරයෙහියි; ප්‍රාදිසමාසයි.

තථ-විපදයි—තථනරානං, තථනරයන මොවුන්ට; යථාක්කමං, පනතීන්; ටඨණලා, ටඨණල යනමොහු; වාහොන්තීති, විකල්පයෙන් වෙත්නුයි; නස්ස, නකාරයහට; ණාදෙසෙ, ණකාරාදෙශකළ කල්හි; ගණ්හිතබ්බං, ගැන්ම; ගහණං, ගහණනම්වේ; පදයනධාතු, ගමනෙ, ගමන්හිවැටේ; නිපුබ්බො, නිපූර්වයි.

පද-විපදයි—පච්චයෙ, ප්‍රත්‍යයාපරකල්හි; පදාදීනං, පදාදිධාතුන්ට; යුක්හොති, යුක්වේ; නිපතන්ති, පහවීම; නිපජ්ජනං, නිපජ්ජනනම්වේ; ප්‍රාදිසමාසයි; අනඝ්ඝි, අනප්‍රත්‍යයද; චනාදිනා, චනාදි සූත්‍රයෙන්; නාගමෙච, නකාරාගමද කළකල්හි; නනෙඉති, නනෙ යන; ආදිනා, මේආදිසූත්‍රයෙන්; එනහොති, එකාරාදෙශනොවේ; පීති, ප්‍රීතිනොම; පීණනං, පීණනනම්වේ; විජියනධාතු; භයචලනෙසු, භයචලනදෙක්හි වැටේ; සංවිජන්ති, කලකිරීමනොම; සංවෙජනං, සංවෙජනනම්වේ; අඤ්ඤත්‍රාපීති, අඤ්ඤත්‍රාපි යන සූත්‍රයෙන්; එත්තාභාවෙ, (ලහුවූ උපාන්තයහට) එත්වයනුවූකල්හි; සංවිජනංයනුවේ;

**ඉත්ථියම ණ ක්ති ක යක් යා ච.**

ඉත්ථිලිඞ්ග භාවෙ කාරකෙ ච ක්‍රියත්ථා අආදයො හොන්ත්‍යනො ච බහුලං—අ—භික්ඛනං භික්ඛියතීති වා භික්ඛා-ආපච්චයො—ණ—කරණං කාරා—චාරකං—යථාකථඤ්චි සද්දනිප්ඵත්ති රූළ්හිතො අත්ථනිච්ඡයො—භිද විදාරණෙ-ක්ති—භෙදනං භිජ්ජතෙති වා භිත්ති-රුජ භඞ්ගෙ-ක-රුජතීති රුජා-විද ඤාණෙ—යක්-වෙදනං විදන්ති එතායාති වා විජ්ජා—අජ වජ ගමනෙ-ප පුබ්බො-යො-පබ්බජනං පබ්බජ්ජා "වචඞ්ගබයඤ්ඤ"ති යොගවිභාගා වස්ස බකාරෙ චින්තනං-වන්ද අභිවාදනත්ථුතිසු—අනො—වන්දනං වන්දනා.

---

කුධයනධාතු, කොපෙ, කිපිමෙහිවැවේ; සීලෙන, ප්‍රකෘතීන්; කුජ්ඣනීති, කිපේනුයි; කොධනො, කොධනනම්වේ; භික්ඛ යන ධාතු, යාචනෙ, ඉල්වීමෙහි වැටේ.

ඉත්ථිය-ඉත්ථියංශූ අණක්තිකයක්යාය චය යනුපදයි-ඉත්ථිලිඞ්ග ස්ත්‍රීලිඟයෙහි වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; භාවෙ, භාවයෙහිද; කාරකෙච, කාරකයෙහිද; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; අආදයො හොන්ති, අආදිප්‍රත්‍යයෝවෙති; අනොච, අනප්‍රත්‍යයදවේ; අ, අප්‍රත්‍යයවේ; භික්ඛණං, සිඟිමහෝ; භික්ඛියතීවා, සිඟනුලැබේනුයි හෝ; භික්ඛා, භික්ඛානම; ආපපච්චයො, (ඉත්ථියමත්වා'යී) ආප්‍රත්‍යයවේ; ණො, ණප්‍රත්‍යයවේ; කරණං, කිරීම; කාරා, කාරානමවේ; චාරකං, දඟගෙයයි; කිරීම්පමණක් කාරනාම්වතහොත් කාරාශබ්දය දඟගෙය කෙසේවාච්‍යවේද යන්නාහට පරිහාරදක් වන්නාහු යථා කථඤ්චි, යනාදිකිහු; සද්දනිප්ඵත්ති, ශබ්දනිෂ්පත්තිතොම; යථා කථඤ්චි යම්කිසිපරිද්දෙකින් වන්නිය; අත්ථනිච්ඡයො, අර්ථනිශ්චයතෙමේ; රූළ්හිතො, රූඪිවශයෙන් වන්නේයි; භිදයනධාතු, විදාරණෙ, පැළීමෙහි වැටේ; ක්ති, ක්තිප්‍රත්‍යයවේ; කකාරඅනුබන්ධයි; භෙදනං, බිඳීමහෝ; භිජ්ජතෙතිවා, බිඳුනාලැබේනුයිහෝ; භිත්ති, භිත්තිනම්වේ; "ලහුස්සුපන්තස්ස"යී පැමිණිඑකාර "නතෙකානුබන්ධනාගමෙසු"යී ප්‍රතිෂෙධවේ; පරරූපවෙයි; භිත්තියනුවේ; රුජයනධාතු; භඞ්ග, බිඳීමෙහි වැටේ; ක, කප්‍රත්‍යයවේ; රුජතීති, පෙළානුයි; රුජා, රුජානමු; කානුබන්ධහෙයින් ඔංචනිවෘත්තියයි; විදයනධාතු, ඤාණෙ, දැන්මෙහි වැටේ; යක්, යක්ප්‍රත්‍යයවේ; වෙදනං, දැන්මහෝ; එතාය, මේකරණකොටගෙන; විදන්තිතිවා, දනිත්නුයිහෝ; විජ්ජා, විජ්ජානමු; අජ යන ධාතුද වජයනධාතුද; ගමනෙ, ගමන්හිවැටේ; පපුබ්බො, පපූර්වයි; යො, යප්‍රත්‍යයවේ; පබ්බජනං, පැවිදිවීම; පබ්බජ්ජා, පබ්බජ්ජානමු; චවඞ්ගබයඤ්ඤති, චචඞ්ගබයඤ්ඤ යන; යොගවිභාගා, යොනවිභා

**ඉකිති සරූපෙ.**

ක්‍රියත්ථස්ස සරූපේ'භිධෙය්‍යෙ ක්‍රියත්ථා පරෙ ඉ කි ති හොන්ති— ඉ–වච ඉච්චයං ධාතු එව වචි—කිම්හි–යුධි–ති–සරූපෙ තිම්හි කරොතිස්ස බො ති විකරණස්ස ලුපිතත්තා "කත්තරි ලො"ති ලො–පචති කථමකාරො ඉච්චාදි? ඝණෙනෙත්ථ කාරසද්දෙන ඡට්ඨීසමාසො–අස්සකාරො අකාරො–භුජ පාලනජ්ඣොහාරෙසු.

**සීලාභික්ඛඤ්ඤාවස්සකෙසු ණී.**

---

ගයෙන්; වස්ස, වකාරයහට; බකාරෙ, බකාරාදෙශකළකල්හි, විත්තං විත්වේ; වදයනධාතු, අභිවාදනත්‍ථුතීසු, ප්‍රණාමයස්තුතියන මෙදෙක්හිවැවේ; අනො, අනප්‍රත්‍යයවේ; වන්දනං, වැඳීම; වන්දනා, වන්දනා නමු.

ඉකි–විපදයි—ක්‍රියත්‍ථස්ස, ධාතුහුගේ; සරූපෙභිධෙය්‍යෙ, ස්වරූපයකිවමනාකල්හි; ඉකිතී, ඉකිතිප්‍රත්‍යයෝ, ක්‍රියත්‍ථාපරෙ, ධාතුහු කෙරෙන් පරවූවාහු; හොන්ති, වෙත්; ස්වරූපනම් වචයනාදි ධාතු ප්‍රකෘතියි; ඉ, ඉප්‍රත්‍යයවේ; වචඉති, වචයන; අයංධාතු එව, මේධාතු වම; වචි, වචිනම්වේ; කිම්හි, කිප්‍රත්‍යය පරකල්හි; යුධි, යුධියනුවේ; යුධඉච්චයං ධාතු එවයනු විග්‍රහයි; ති, තිප්‍රත්‍යයවේ; සරූපෙතිම්හි, ධාතුස්වරූපයෙහි විහිත තිප්‍රත්‍යයා පරකල්හි; කරොතිස්සබොති, කරොතිස්සබො'යි කියා; විකරණස්ස, විකරණයාගේ; ලුපිතත්තා, ලුපිතබවහෙයින්; කත්තරිලොති, කත්තරිලොයන සූත්‍රයෙන්; ලෙ, ලවිකරණකළකල්හි; පචතියනුවේ; පචඉච්චයං ධාතුඑව යනවාක්‍යයෙහි පචපාකෙයන ධාතුහුකෙරෙන්පරව "ඉකිතිසරූපෙ" යන සූත්‍රයෙන් ධාතු ස්වරූපයෙහි තිප්‍රත්‍යයවෙයි ධාතුස්වරූපයෙහි විහිත තිප්‍රත්‍යයාපරකල්හි "කත්තරිලො" යන සූත්‍රයෙන් ලවිකරණවෙයි ලකාර අප්‍රයොගීවේ; පචතියනුවේ; අකාරොති, අකාරො යන; ආදි, මේආදිය; කථං, කෙසේවේදයත්? ඝණෙනෙත්ථ, ඝණ්ප්‍රත්‍යයාන්තවූ; කාරසද්දෙන, කාරශබ්දයාහා; ඡට්ඨීසමාසො, ෂෂ්ඨීසමාසවේ; කර කරණෙ යන ධාතුහුකෙරෙන් කරණං යන වාක්‍යයෙහි භාවයෙහි ඝණ් කොට නිපදවූ කාරශබ්දයාහා අශබ්දයාහා ෂෂ්ඨීසමාසවෙයි; අස්ස, අවර්ණයාගේ; කාරො, උච්චාරණය; අකාරො, අකාරනම්වේ; භුජ යනධාතු, පාලනෙ, රක්‍ෂාකිරීමෙහි වැවේ; අජ්ඣොහාරෙසු, අභ්‍යවහරණයෙහිද වැවේ.

සීලා–විපදයි–සීලාදීසුපතීයමානෙසු, සීලාදියක් ගම්‍යවානකල්හි ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්; ණීහොති, ණීප්‍රත්‍යයවේ; සීලෙන, ප්‍රකෘතීන් හෙවත් ස්වභාවයෙන්; උණ්හං, උෂ්ණය; භුජතීති, අනුභව කෙරේනුයි; උණ්හභොජී, උණ්හභොජීනම්වේ; උණ්හයනවිතීයාන්තයා

ක්‍රියත්ථා ණී හොති සීලාදීසු පතීයමානෙසු - උණ්හං භුඤ්ජති සීලෙනාති උණ්හභොජී — පා පානෙ - "ආසංසාඤ්ඤපිමහි යුක්" ඉති - යුක් — ඛීරමභික්ඛණං පිබතීති ඛීරපායී - අවස්සං කරොතීති අවස්සකාරී, සතමවස්සං දදාතීති සතදායී.

**කත්තරි භූතෙ කතවන්තු කතාවී.**

භූතෙ පරිසමත්තෙත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා කතවන්තු කතාවී හොන්ති කත්තරි - අභුඤ්ජීති භුත්තවා, භුත්තාවී සු සවණෙ — අසුණීති සුතවා, සුතාවී.

---

උපපදකොටඇති භුජපාලනාභ්‍යවහාරෙසු යන ධාතුහු කෙරෙන් උණ්හංභුඤ්ජති සීලෙන යන වාක්‍යයෙහි මෙයින් ණී ප්‍රත්‍යයවෙයි "ලහුස්සුපන්තස්ස"යි ඕ වෙයි අමාදිසමාසවෙයි, උණ්හභොජීයනුවේ. මේ ශීලාර්‍ථයෙහි උදාහරණයි; පායනධාතු; පානෙ, පීමෙහි වැටේ; ආසංසා—පෙ—සූත්‍රයෙන්; යුක්, යුක්වේ; ආභික්ඛණං, නැවත නැවත; ඛීරං, ක්‍ෂීරය; පිබතීති, බෝනුයි; ඛීරපායී, ඛීරපායීනම්වේ; ඛීරං යන විභක්ත්‍යන්තොපපදවූ පාපානෙ යන ධාතුහුකෙරෙන් "ඛීරමාභික්ඛණං පිබති" යන වාක්‍යයෙහි මෙයින් ණී ප්‍රත්‍යයවෙයි යුක් වෙයි අමාදිසමාසවේ, ඛීරපායීයනුවේ; ආභීක්‍ෂණ්‍යයෙහි උදාහරණයි- අවස්සං, අවශ්‍යයෙන්; කරොතීති, කෙරේනුයි; අවස්සකාරී, අවස්සකාරීනම්වේ; අවස්සං යන අසඞ්ඛ්‍යයා උපපදකොට ඇති කර කරණෙ යන ධාතුහුකෙරෙන් "අවස්සංකරොති" යන වාක්‍යයෙහි ආවශ්‍යකාර්‍ථයෙහි මෙයින් ණී ප්‍රත්‍යයවෙයි වෘද්ධි නිග්ගහීතලොප්දවෙයි; ස්‍යාදිසමාසවේ; අවස්සකාරීයනුවේ; සතං, ශතයක්; අවස්සං, එකාන්තයෙන්; දදාතීති, දේනුයි; සතදායී, සතදායීනම්වේ; සතමවස්සං දදාති යනු විග්‍රහයි—අමාදිසමාසව විභක්තිලොප්නොවෙයි නිග්ගහීතයහට වර්‍ගාන්තවෙයි සෙස්ස අනන්තරසදෘශයි; මේ උදාහරණවය ආවශ්‍යකාර්‍ථයෙහියි; මෙහි සීලනම් ප්‍රකෘතිය, ආභීක්‍ෂණ්‍යනම් නැවත නැවතවීමය, අවශ්‍යනම් අවශ්‍යකර්‍තව්‍යයි, මේතුන ගම්‍යමානකල්හි ධාතුහුකෙරෙන් ණී ප්‍රත්‍යයවෙයි.

කත්තරි-ත්‍රිපදයි—භූතෙයයිසේයි; පරිසමත්තෙත්ථෙ, පරිසමාප්තවූ අර්‍ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහු කෙරෙන්පරව; කත්තරි, කර්‍තෘකාරකයෙහි; කතවන්තු කතාවී, කතවන්තු කතාවීප්‍රත්‍යයෝ; හොන්ති, වෙත්; අභුඤ්ජීති, අනුභවකෙළේනුයි; භුත්තවා, භුත්තවන්තුනම්වෙයි; භුත්තාවී, භුත්තාවීනම්වේ; සුයන ධාතු සවණෙ, ඇසීමෙහිවැටේ; අසුණීති, ඇසීනුයි; සුතවා, සුතවන්තුනම්වෙයි; සුතාවී, සුතාවීනම්වේ.

**ක්ත්තා භාවකම්මෙසු.**

භාවෙ කම්මෙච භූතෙ ක්ත්තා හොති-ආස උපවෙසනෙ-ආසනමාසිතං—ඤ්ඤී—රුද රොදනෙ.

**වා ක්වචි.**

නෙ එ ඔ ආ ක්වචි වා න හොන්ති කානුබන්ධනාගමෙසු—රොදනං රුදිතං, රොදිතං—කරීයිත්ථාති කතො.

**ගමාදිරාන්තං ලොපොන්තස්ස.**

ගමාදීනං රකාරන්තානං ධාතූනං අන්තස්ස ලොපො හොති ත්කාරාදෙ කානුබන්ධෙ පච්චයෙ කණ්ඨානකාඤ්ඤාවජ්ජිතෙහි රලොපො-යා පාපුණනෙ.

**ගමනත්ථාකම්මකාධාරෙ ච.**

---

ක්ත්තා-ෂිපදයි—භූතෙ, භූතාර්ථයෙහි වැටෙන්නාවූ (ධාතුහුකෙරෙන්පරව;) භාවෙ, භාවයෙහිද; කම්මෙච, කර්මකාරකයෙහිද; ක්ත්තා හොති, ක්තප්‍රත්‍යයවේ; ආසයනධාතු උපවෙසනෙ, හිඳීමෙහිවැටේ; ආසනා, හිඳිම; ආසිතං, ආසිතනම්වේ; ඤ්ඤී, ("ඤ්ඤීබ්‍යඤ්ජනස්ස"යි) ඤ්ඤීආගමවේ; ධාතුහු අකර්මකහෙයින් කර්මයෙහිනොවේ—රුදයන ධාතු; රොදනෙ, හැඬීමෙහිවැටේ.

වා-ෂිපදයි—කානුබන්ධනාගමෙසු, කානුබන්ධනාගමයන් පරකල්හි; නෙ එ ඔ ආ, ඒ එ ඔ ආ යන ආදෙශයෝ; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; න හොන්ති, නොවෙත්; රොදනං, හැඬීම; රුදිතං, රුදිතනම්වෙයි; රොදිතං, රොදිතනම්වේ; රුදරොදනෙ යන ධාතුහුකෙරෙන්පරව රොදනං යන වාක්‍යයෙහි භාවයෙහි ක්ත ප්‍රත්‍යයවෙයි ප්‍රත්‍යයා පරකල්හි ලහුවූ උපාන්තයාහට ලහුස්සුපන්තස්සයී පැමිණි ඔකාරයහට නනෙකානුබන්ධනාගමෙසු'යි නිත්‍යයෙන් ප්‍රතිෂෙධ පත්නෙහි වාක්වචී යන සූත්‍රයෙන් විකල්පයෙන් ප්‍රතිෂෙධ වෙයි; රුදිතංයනුවේ; නුවූපක්ෂයෙහි රොදිතං යනුවේ—කරීයිත්ථාති, කරණලදනුයි; කතො, කතනම්වේ; කර්මයෙහික්තවූනැති.

ගමාදි-ත්‍රිපදයි-කණ්ඨානකාඤ්ඤාවජ්ජිතෙ, කණ්ඨානකාඤ්ඤාවර්ජිතකොට ඇති; තකාරාදෙ, තකාරයා ආදිකොටඇති; කානුබන්ධෙ පච්චයෙ, කානුබන්ධප්‍රත්‍යයා පරකල්හි; ගමාදිනං, ගමාදිධාතූන්ගේද; රකාරන්තානං, රකාරාන්තධාතූන්ගේද; අන්තස්ස, අන්තයහට; ලොපොහොතීති, ලොප්වේනුයි; රලොපො, රකාරයහට ලොප්වේ; යා යන ධාතු; පාපුණනෙ, පැමිණීමෙහිවැටේ.

ගම-ගමනත්ථාය අකම්මකාය ආධාරෙයච්යයනු පදයි=ගමනත්ථතො, ගමනාර්ථවූ; අකම්මකතොච, අකර්මකවූද; ක්‍රියත්ථා, ධාතුහු කෙ

ගමනත්ථතො අකම්මකතො ච ක්‍රියත්ථා ආධාරෙ ක්තො හොති කත්තරි භාවකම්මෙසු ච- යාතවන්තො'ස්මිං ති යාතං-(ඨානං)-යාතවන්තො යාතා—යාතං යාතං-යායීත්ථාති යාතො—(පථො)—ආසිතවන්තො'ස්මිං ති ආසිතං—(ඨානං)-ආසිතවන්තො ආසිතා—ආසනමාසිතං—ඤි.

**න්තො කත්තරි වත්තමානෙ.**

ආරද්ධාපරිසමත්තෙ අත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා න්තො හොති කත්තරි.

**කත්තරි ලො.**

ක්‍රියත්ථතො අපරොක්ඛෙසු කත්තුවිහිත මානන්තාදීසු ලොහොති- ලකාරො "ඤි ලස්ස"-ති විසෙසනත්ථො—පචතීති පචන්තො-"මානො"ති කත්තරි මානො—පචමානො.

---

රෙන්; ආධාරෙ, ආධාරකාරකයෙහිද; කත්තරි, කර්තෘකාරකයෙහිද; භාවකම්මෙසුච, භාවකර්මදෙක්හිද; ක්තොහොති, ක්තප්‍රත්‍යයවේ; අස්මිං, මෙහි; යාතවන්තොති, ගියේනුයි; යාතං, යාතනම්වේ; ඨානං, ස්ථානයයි; ආධාරයෙහිකතයි-යාතවන්තො, ගියාහු; යාතා, යාතනම්වේ; කර්තෘයෙහිකතයි—යාතං, යාම; යාතං, යාතනම්වේ; කර්මය අවිවක්ෂිත හෙයින් භාවයෙහිකතයි; යායිත්ථාති, යනලදනුයි; යාතො, යාතනම්වේ; පථො, මාර්ගයයි; කර්මයෙහිකතයි—මේ ගමනාර්ථධාතූන්ට උදාහරණයි; අස්මිං, මෙහි; ආසිතවන්තොති, හුන්නුනුයි; ආසිතං, ආසිතනම්වේ; ඨානං, ස්ථානයයි; ආධාරයෙහිකතයි-ආසිතවන්තො, හුන්නාහු; ආසිතා, ආසිතනම්වේ; කර්තෘයෙහිකතයි-ආසනං, හිඳීම; ආසිතං, ආසිතනම්වේ; ඤි, ඤිආගමවේ; භාවයෙහි—ආසඋපවෙසනෙ යන ධාතුහු අකර්මකහෙයින් නොවේ.

න්තො,-ත්‍රිපදයි—ආරද්ධ, පටන්ගන්නාලදින්; අපරිසමත්තෙ අත්ථෙ, අපරිසමාප්තවූ අර්ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහි; න්තොහොති, න්තප්‍රත්‍යයවේ.

කත්තරි-ද්විපදයි—අපරොක්ඛෙසු, පරොක්ෂාවර්ජිතකොට ඇති; කත්තුවිහිතමානන්තාදීසු, කර්තෘකාරකයෙහි කරණලද මානන්තත්‍යාදීන්පරකල්හි; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන් පරව; ලොහොති, ලවිකරණවේ; ලකාරො, ලකාරතෙම; ඤිලස්සෙති, ඤිලස්ස යන සූත්‍රයෙහි; විසෙසනත්ථො, විශෙෂණය ප්‍රයොජනකොට ඇත්තේයි; පචතීති, පිසේනුයි; පචන්තො, පචන්තනම්වේ; පචපාකෙ යන ධාතු පචයී කියා තිබෙයි; වර්තමානාර්ථයෙහි වැටෙන්නාවූ ධාතුහුකෙරෙන් පරව න්තොකත්තරිවත්තමානෙ යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි

**භාවකම්මෙසු.**

වත්තමානත්‍ථෙ වත්තමානතො ක්‍රියත්‍ථා භාවෙ කම්මෙ ච මානො හොති.

**ක්‍යො භාවකම්මෙස්වපරොක්ඛෙසු මානන්තත්‍යාදිසු.**

භාවකම්මවිහිතෙසු පරොක්ඛාවජ්ජිතෙසු මානන්තාදිසු පරෙසු ක්‍යො හොති ක්‍රියත්‍ථා—කකාරො අවුද්ධත්‍ථො-භාවෙ—භූයතෙති භූයමානං-කම්මෙ—පච්චතෙති පච්චමානො.

**තෙ සස්සුබ්බානාගතෙ.**

අනාරද්ධෙ අත්‍ථෙ වත්තමානතො ක්‍රියත්‍ථා තෙ න්තමානා සස්සුබ්බා හොන්ති සවිසයෙ—ඤ්ඤි—කත්තරි-පච්සස්සන්ති පච්සසන්තා, පච්සස්සමානො-කර කරණෙ.

---

න්තප්‍රත්‍යයවෙයි; කර්තෘකාරකයෙහි කරණලද න්තප්‍රත්‍යයාපරකල්හි ධාතුහුකෙරෙන්පරව කත්තරිලො යන සූත්‍රයෙන් ලවිකරණවෙයි; පචන්තොයනුවේ; මානොති, මානො යන සූත්‍රයෙන්; කත්තරි, කර්තෘ කාරකයෙහි; මානෙ, මානප්‍රත්‍යයකළකල්හි; පචමානො යනුවේ.

භාව එකපදයි—වත්තමානත්‍ථෙ, වර්තමානාර්‍ථයෙහි වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්; භාවෙ, භාවයෙහිද; කම්මෙච, කර්මයෙහිද; මානොහොති, මානප්‍රත්‍යයවේ.

ක්‍යො-සතරපදයි—භාවකම්මවිහිතෙසු, භාවකර්මදෙක්හිකරණලද, පරොක්ඛාවජ්ජිතෙසු, පරොක්‍ෂාවර්ජිතකොට ඇති; මානන්තත්‍යාදිසු පරෙසු, මානන්තත්‍යාදින් පරකල්හි; ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්පරව; ක්‍යොහොති, ක්‍යවිකරණවේ; කකාරො, කකාරතෙම; අවුද්ධත්‍ථො, අවෘද්ධියප්‍රයොජනකොට ඇත්තේයි; ප්‍රත්‍යයාපරකල්හි ඉවර්ණ උවර්ණාන්තධාතුන්ට යුවණ්ණානමෙඔ පච්චයෙ'යි පැමිණි වෘද්ධිය කානු බන්ධප්‍රත්‍යයා පරකල්හි "නතෙකානු බන්ධනාගමෙසු'යි ප්‍රතිෂෙධ වන හෙයින් කකාරො අවුද්ධත්‍ථො'යි කීහු—භාවෙ, භාවයෙහි (මානප්‍රත්‍යය කළකල්හි;) භූයතෙති, විමනුයි; භූයමානං, භූයමානනම්වේ; කම්මෙ, කර්මයෙහි (මානප්‍රත්‍යය කළකල්හි; පච්චතෙති; පිසනු ලැබේනුයි; පච්චමානො, පච්චමානනම්වේ.

තෙස්ස-තෙයස්සුබ්බාය අනාගතෙය යනු පදයි; අනාරද්ධෙ අත්‍ථෙ, පටන්නොගත්නාලද අර්‍ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්පරව; තෙ න්තමානා, ඒ න්තමානප්‍රත්‍යයෝ; සවිසයෙ, ස්වකීය විෂයෙහි; හෙවත් කර්තෘභාවකර්මයෙහි; සස්සුබ්බා හොන්ති, සස්සුපූර්වවූවාහුවෙත්; (ස්සන්තප්‍රත්‍යය ස්සමානප්‍රත්‍යය යන මොහුවෙතියිසේයි) ඤ්ඤි, ඤ්ඤිආගමවේ; කත්තරි, කර්තෘකාරකයෙහි;

**තුං තායෙ තවෙ භාවෙ භවිස්සති ක්‍රියායං තදත්ථායං.**

භවිස්සති අත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා භාවෙ තුං තායෙ තවෙ හොන්ති ක්‍රියායං තදත්ථායං පතීයමානායං—“තුංතුනතබ්බෙසු වා”ති වා අකාරො-අසදිසද්‍ය පරරූපං-කරණාය ගච්ඡතිකාතුං ගච්ඡති කත්තුං, කත්තායෙ වා-තවෙ-“කරස්සා තවෙ” ති ආ කාතවෙ-භාවෙති කිං, කරිස්සාමීති ගච්ඡති -- ක්‍රියායන්ති කිං, භික්ඛිස්සං ඉච්චස්ස ජටා-තදත්ථායන්ති කිං, ගච්ඡිස්සතො තෙ භවිස්සති භත්තං භොජනාය-ගහ උපාදනෙ.

---

පවිසතීති, මතුපිසේනුයි; පවිසතො, පවිසන්තනම්වේ; පවිස මානො, පවිසමානනම්වේ; භාවෙ, භාවයෙහි; භූයිස්සතෙති, අනාගතයෙහි විමනුයි; භූයිස්සමානං, භූයිස්සමානනම්වේ; කම්මෙ, කර්මයෙහි; පවිස්සතෙති, මතුපිසනුලැබේනුයි; පවිස්සමානො, පවිස්සමාන නම්වෙ.

තුං-තුංතායෙතවෙය භාවෙය භවිස්සතිය ක්‍රියායංය තදත්ථායංය යනු පදයි; භවිස්සති අත්ථෙ වත්තමානතො, භවිෂ්‍යදර්ථයෙහි වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; තදත්ථායං, තුමාදි ප්‍රකෘතියගේ ක්‍රියාව ප්‍රයොජනකොට ඇති; ක්‍රියායං, (ගමනාදි) ක්‍රියාව; පතීයමානායං, ගම්‍යමානකල්හි; භාවෙ, භාවයෙහි; තුංතායෙතවෙ හොන්ති තුංතායෙ තවෙ ප්‍රත්‍යයෝ වෙත්; තුං තුන—පෙ—සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; ආකාරො, (ධාත්වන්තයහට) ආකාරාදෙශවේ; අසදිසද්‍ය, ආකාරාදෙශනුවූපක්‍ෂයෙහි; පරරූපං, පරරූපවේ; කරණාය, කිරීම් පිණිස; ගච්ඡති, යෙයි යන අර්ථයෙහි; කාතුංගච්ඡති යනුවේ; කත්තුං කත්තායෙයි කියාහෝවේ; තවෙ, තවෙප්‍රත්‍යයවේ; කරස්සා—පෙ—සූත්‍රයෙන්; ආ, ආකාරාදෙශවේ; කාතවෙයනුවේ; මේ තුමාදි ප්‍රත්‍යයාන්තයන් කෙරෙන් තාදත්ථ්‍ය යන සූත්‍රයෙන් චතුර්ථියවෙයි, මේ සූත්‍රයෙහි හා අනන්තරසූත්‍රයෙහි හදළ ප්‍රත්‍යයන් සදෙනා අන්ත කොට ඇත්තවුන් ස්වභාවයෙන් අසඞ්ඛ්‍යහෙයින් අසඞ්ඛ්‍යහි සඞ්ඛ්‍යා සං’යි චතුර්ථිලොප්වේ. කාතුං, කරණ පිණිස; ගච්ඡති, යේ; කත්තුං කත්තායෙ කාතවෙ යන තන්හිදු මෙම අර්ථයි. භාවෙ, භාවයෙහි (වෙතියි) යනු; කිං, කුමටය; ? කරිස්සාමිති ගච්ඡති යනතන්හි කර්තෘයෙහි තුමාදීන් නොවන පිණිසයි; කරිස්සාමි’යි කර්තෘවිවක්‍ෂිතබැවින් තුංනොවේ, එසේමැයි ‘කටාදිකං කරිස්සාමි’යි සකර්මකහෙයින් මෙහි ක්‍රියාවගේ ප්‍රධාන්‍යය නැති; කරිස්සාමිති, කෙරෙමියි; ගච්ඡති, යේ; ක්‍රියායන්ති, ක්‍රියාවක් ගම්‍යමානකල්හි (වෙති) යනු; කිං, කුමටය? භික්ඛිස්සං ඉච්චස්සං ජටා යන තන්හි ක්‍රියා ස්වරූපනුවූ ජටාවන් ගම්‍යමාන කල්හි තුමාදින් නොවන පිණිසයි, ‘භික්ඛිස්සං– භික්ඛණං

**පුබ්බෙකකත්තුකානං.**

එකො කත්තා යෙසං බ්‍යාපාරානං තෙසු යො පුබ්බො තදත්ථතො ක්‍රියත්ථා තූනත්වානත්වා හොන්ති භාවෙ—ණ්හි.

**ණ්හි ලස්ස ච.**

ණ්හිලානමෙ හොති ක්වචි-ගණ්හණං කත්වා යාති ගහෙතූන යාති ගහෙත්වාන, ගහෙත්වා වා—අස්ස රුධාදිත්තා.

**මං වා රුධාදීනං.**

රුධාදීනං ක්වචි මං වා හොති පච්චයෙති පක්ඛෙ මං භවං අපිමානුබන්ධත්තා අකාරා පරො.

---

කරිස්සං'යි අවිවක්ෂිත කර්මබැවින් ක්‍රියාවගේම මෙහි ප්‍රාධාන්‍යය, ඡටාවෝ තදර්ථයෙහි වෙති, ක්‍රියාරූපනොවෙත්; අස්ස, මොහුගේ; ඡටා, ඡටාවෝ; භික්ඛිස්සංඉති,, භික්ෂාකෙරෙමියි කියායි; තදත්ථාය නති, තදර්ථවූ ක්‍රියාවක් ගම්‍යමානකල්හි (වෙති) යනු; කිං, කුමටය? ගච්ඡස්සතො නෙ භවිස්සති භත්තං භොජනාය යනතන්හි තදර්ථවූ ක්‍රියාවෙන් පිටත්තන්හි තුමාදීන් නොවන පිණිසයි;- භොජනාය'යි භොජනය භාවවෙයි, ගම්හුගේ ක්‍රියාව වනාහි තදර්ථනොවේ; ගච්ඡස්සතො නෙ, යන්නාවූනට; භත්තං, ආහාරය; භොජනාය, අනුභව පිණිස; භවිස්සති, වන්නේයි; ගහ යන ධාතු; උපාදානෙ, ගැන්මෙහි වැටේ.

පුබ්බෙ-පුබ්බාය, එකකත්තුකානංය යනු පදයි—එකොකත්තා, එක්කර්තෘයෙක්; යෙසංබ්‍යාපාරානං, යම් ක්‍රියාකෙනෙකුන්ටද; තෙසු, ඒ ක්‍රියාවන් අතුරෙහි; යො, යම්ක්‍රියාවෙක්; පුබ්බො, පූර්වද; තදත්ථතො, ඒපූර්වක්‍රියාව අර්ථකොට ඇති; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; භාවෙ, භාවයෙහි; තූනත්වානත්වා හොන්ති, තූනත්වානත්වා යන මේ ප්‍රත්‍යයෝ වෙත්; ණ්හි, ණ්හිආගමවේ.

ණ්හිල-ණ්හිලස්සයඑය යනුපදයි; ණ්හිලානං, ණ්හි ආගමලවිකරණයන්ට; ක්වචි, කිසිතැනෙක්හි; එහොති, එකාරාදෙශවේ; ගණ්හණං කත්වා, ග්‍රහණයකොට; යාති, යෙයි යන අර්ථයෙහි; ගහෙතූනයාති යනුවේ; ගහෙත්වාන ගහෙත්වායි කියා හෝවේ; අස්ස, මේ ගහ උපාදානෙ යන ධාතුහුගේ; රුධාදිත්තා, රුධාදිබවහෙයින්.

මංවා-ත්‍රිපදයි—පච්චයෙ, ප්‍රත්‍යයාපරකල්හි; රුධාදීනං, රුධාදි ධාතූන්ට; ක්වචි, කිසිතැනෙක්හි; වා, විකල්පයෙන්; මං හොතීති, මං ආගමවේනුයි; පක්ඛෙ; පක්ෂයෙක්හි; මං, මං ආගමවේ; භවංඅපි, වන්නේද; මනුබන්ධත්තා, මනුබන්ධබව හෙයින්; අකාරපරො, ධාතුහුගේ අකාරයාකෙරෙන් පරවවේ.

**ණොනිගහීතස්ස.**

ගහස්ස නිග්ගහීතස්ස ණො හොති-ගණ්හි තුන, ගණ්හිත්වාන, ගණ්හිත්වා—එකකත්තුකානන්ති කිං, භුත්තස්මිං දෙවදත්තෙන යඤ්ඤදත්තො වජති—පුබ්බාති කිං, භුජති ච පචති ච-අප්පත්වා නදිං පබ්බතො භවති අතික්කම්ම පබ්බතං නදිති භූධාතුස්ස සබ්බත්ථ සම්භවා එකකත්තුකතා පුබ්බකාලතා ච ගම්‍යතෙ.

---

ණො-විපදයි—ගහස්ස, ගහළපාදානෙ යන ධාතුහු සම්බන්ධිවූ; නිග්ගහිතස්ස, නිග්ගහිතයාහට; ණොහොති, ණප්‍රත්‍යයවේ; ගණ්හි තුන යනාදියවේ; එකකත්තුකානන්ති, එකකර්තෘවූ ධාතුන්ටයයනු; කිං, කුමටය? භුත්තස්මිං දෙවදත්තෙ යඤ්ඤදත්තො වජති යන තන්හි අනෙකකර්තෘ විෂයෙහි තුනාදීන් නොවන පිණිසයි; මෙහි ක්‍රියාවන් දෙදෙනාගේ පූර්වාපරත්වය ඇද්ද එක කර්තෘකත්වය නැති හෙයින් තුනාදීහු නොවෙත්; පුබ්බාති, පූර්වක්‍රියාව අවිකොට ඇති ධාතුහුකෙරෙන් වෙත්යයි යනු; කිං, කුමටය? භුඤ්ජතිච පචතිච යන තන්හි තුනාදීන් නොවන පිණිසයි; මෙහි එකකර්තෘකත්වය ඇතද ක්‍රියාවන් දෙදෙනා එකවිට පැමිණි බැවින් එකක්හට පූර්වත්වය නැත්නුයි තුනාදිහු නොවෙත්—පබ්බතො, පර්වතයතෙම; නදිං, නදියට; අප්පත්වා, නොපැමිණ; භවති, වෙයි; පබ්බතං, පර්වතය; අතික්කම්ම, ඉක්ම; නදීභවතීති, නදියවේනුයි කියා; සබ්බත්ථ, හැමතන්හි; භූධාතුස්සසම්භවා, භූධාතුහුගේ සම්භවය හෙතුකොටගෙන; එකකත්තුකතා, එකකර්තෘකත්වයද; පුබ්බකාලතාච, පූර්වකාලත්වයද; ගම්‍යතෙ; දත්නාලැබේ; පතතං කත්වා යන වාක්‍යයෙහි පත පථ ගමනෙ යන ධාතුහුකෙරෙන් "පුබ්බෙකකත්තුකානං"යි කත්වා ප්‍රත්‍යයකොට පර රූපකොට නඤ්සමාසකළ කල්හි අප්පත්වා යනුවේ; අතික්කමණං කත්වා යන වාක්‍යයෙහි අතිපූර්වවූ කම පදවික්ඛෙපෙ යන ධාතුහු කෙරෙන් මෙයින් ක්ත්වා ප්‍රත්‍යයකොට ප්‍රාදිසමාසකළකල්හි 'ප්‍යොවා ත්වාස්ස සමාසෙ'යි ත්වාහට ප්‍යවෙයි; පකාර අප්‍රයොගීවෙයි; යකා රයහට වග්ගලසෙහිතෙ'යි මකාරාදෙශවෙයි, අතික්කම්ම යනුවේ, සියලු ප්‍රථමාන්ත විෂයෙහි භූධාතුහුගේ සම්භවයවෙයි පදාර්ථයෙහි සත්තාව්‍යභිචාරයක් නැතිහෙයින් සියලු වස්තූන්ගේ ආත්මලාභසම කාලවම සත්තාව ඇති බැවින් සත්තාවට පෙරවම අප්‍රාප්තිය ඇති බැවින් පර්වතයාගේ නදියට අප්‍රප්තිය පූර්වයි, ආත්මලාභ සමකාලවම සත්තාව වන බැවින් භවනය පසුයි; භවනයට පෙරවම අතික්‍රමණය වන බැවින් නදියගේ පර්වතය ඉක්මවීම පූර්වයි; ඉක්මවන බැවින් භවනය පසුයි; එහෙයින් මෙහි එකකර්තෘකත්වයද පූර්වකාලත්වයද හැඟෙයි දතයුතු.

යෙභුය්‍යවුත්තියා ලිඞ්ගං දස්සිතං තත්‍ථ සබ්බසො
විසෙසො පන විඤ්ඤූහි ඤෙය්‍යො පාඨානුසාරතො.

තබ්බාදයො.

---

ඉදානි ත්‍යාදසො වුච්චන්තෙ-පච පාකෙ—පච් ඉති ඨිතෙ-ක්‍රියත්‍ථා බහුලම්ති ච සබ්බත්‍ථ වත්තන්තෙ.

**වත්තමානෙ ති අන්ති සිථ මිම තෙ අන්තෙ සෙ ව්හෙ එමෙහ.**

වත්තමානෙ ආරද්ධාපරිසමත්තෙ අත්‍ථෙ වත්තමානතො ක්‍රියත්‍ථා ත්‍යාදයො හොන්ති-නෙසම්පනියමෙ.

**පුබ්බපරච්ඡක්කානමෙකානෙකෙසු තුම්හාමහසෙසෙසු ද්වෙ ද්වෙ මජ්ඣිමුත්තම පඨමා.**

---

ලිඞ්ගං, (යථොක්තවූ ස්ත්‍රීපුන්නපුංසක) ලිඞ්ගයනෙම; යෙභුය්‍ය වුත්තියා, බාහුල්‍ය වෘත්තියෙන්; දස්සිතං, දක්වනලද; තත්‍ථ, ඒලිඞ්ග යෙහි; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; විසෙසො පන, විශෙෂය වනාහි; විඤ්ඤූහි, නුවණැත්තවුන් විසින්; පාඨානුසාරතො, පාළිඅනුසාර යෙන්; ඤෙය්‍යො, දතයුත්තේයි.

තබ්බාදයො.

---

ඉදානි, දැන්; ත්‍යාදයො, ත්‍යාදීහු; වුච්චන්තෙ, කියනු ලැබෙත්; පචයනධාතු; පාකෙ, පිසීමෙහි වැටේ; පච්ඉති, පච්යිසියා; ඨිතෙ, සිටිකල්හි; ක්‍රියත්‍ථා, ක්‍රියත්‍ථා යනුද; බහුලං ඉතිච, බහුලං යනුද; සබ්බත්‍ථ, සියලු ත්‍යාදි කාණ්ඩයෙහි; වත්තන්තෙ, වැටේ.

වත්ත-වත්තමානෙය ති අන්ති යනාදිය හා විපදයි-වත්තමානෙ යයිසේයි; ආරද්ධා, පටන්ගන්නාලදින්; අපරිසමත්තෙ අත්‍ථෙ, නොනිමිඅර්ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්‍ථා, ධාතුහුකෙරෙන්; ත්‍යාදයො හොන්තිති ආදි ප්‍රත්‍යයෝවෙන්; නෙසම්පි, ඒත්‍යාදින්ගේද; අනියමෙ, නියමයක් නැති කල්හි.

පුබ්බ-පුබ්බපරච්ඡක්කානංයෙ එකානෙකෙසුය තුම්හඅම්හසෙසෙසුය, ද්වෙ ද්වෙය මජ්ඣිමුත්තම පඨමාය යනු පදයි—එකානෙකෙසු, එකාර්ථ අනෙකාර්ථයෙහි වැටෙන්නාවූ; තුම්හ අම්හ සද්දවචනීයෙසු; තුම්හ අම්හ ශබ්දයන් විසින් කියයුතුවූද; තදඤ්ඤසද්දවචනීයෙසුච, ඔවුන්කෙරෙන් අන්‍යවූ නශබ්දාදීන් විසින් කියයුතුවූද; කාරකෙසු, කාරකයන් කෙරෙහි; පුබ්බච්ඡක්කානං, පූර්වෂට්කයන් සම්බන්ධීවූද; පරච්ඡක්කානඤ්ච, පරෂට්කයන් සම්බන්ධීවූද; මජ්ඣිමුත්තම පඨමා, මධ්‍යම උත්තම ප්‍රථමවූ; ද්වෙ ද්වෙ, ප්‍රත්‍යයෝ දෙදෙනෙක් දෙදෙනෙක්; ක්‍රියත්‍ථා, ධාතුනුකෙරෙන් පරව; යථාක්කමං, පනතීන්; හො

එකානෙකෙසු තුම්හාම්හසද්දවචනීයෙසු තදඤ්ඤසද්දවචනීයෙසුච කාරකෙසු පුබ්බච්ඡක්කාන පරච්ඡක්කානඤ්ච මජ්ඣිමුත්තම පඨමාවෙ වෙ හොන්ති යථාක්කමං ක්‍රියපාති එකම්හි වත්තබ්බෙ එකවචනං ති —ති අන්ති ඉති පඨමො ආදෙ නිද්දිට්ඨත්තා—සි ථ ඉති මජ්ඣිමො මජ්ඣෙ නිද්දිට්ඨත්තා—මි ම ඉති උත්තමො—උත්තමසද්දොයං සභාවතො තිප්පභුතීනමත්තවයමාහ—එවං පරච්ඡක්කෙකාපි යථාක්කමං යොජනීයං—ත්‍යාදිසු පරභූතෙසු කත්තුකම්මභාව විහිතෙසු ක්‍යලාදයො භවන්තීති "ක්‍යා භාවකම්මෙසවපරොක්ඛෙසු මානන්තත්‍යාදිසු කත්තරි ලො" ඉච්චාදිනා තෙසං විධානා ත්‍යාදයො කත්තුකම්මභාවෙසෙවච විඤ්ඤෙය්‍යන්තීති කත්තරි තිම්හි ලො—පචති—බහුම්හි වත්තබ්බෙ අන්ති

**ඛචි විකරණානං.**

---

න්තීති, වෙත්නුයි; එකම්හිවත්තබ්බෙ, එකාර්ථයක් කියයුතුකල්හි; එකවචනං, එකවචනවූ; ති, තිප්‍රත්‍යයවේ;–මෙහි යථාක්‍රමයෙන්තුම්හ ශබ්ද ප්‍රයොගයෙහි මධ්‍යම පුරුෂවූ සිථ යන ප්‍රත්‍යයන් දෙදෙනාගේ වීමය අම්හශබ්ද ප්‍රයොගයෙහි උත්තම පුරුෂවූ මිම යන දෙදෙනාගේවීමය තශබ්දාදි ප්‍රයොගයෙහි ප්‍රථම පුරුෂවූ ති අන්ති දෙදෙනාගේ වීමයි; සෙස්සෙහිදු මෙමක්‍රමයි—ති අන්තිඉති, ති අන්තියනු; පඨමො, ප්‍රථමපුරුෂයි; ආදෙනිද්දිට්ඨත්තා, ආදියෙහි දක්වනලද හෙයින්; සිථඉති, සිථයනු; මජ්ඣිමො, මධ්‍යමපුරුෂයි; මජ්ඣෙනිද්දිට්ඨත්තා, මධ්‍යයෙහි දක්වනලද හෙයින්; මිම ඉති, මිම යනු; උත්තමො, උත්තම පුරුෂයි; අයං උත්තමසද්දො, මේ උත්තමශබ්දයතෙම; සභාවතො, සවභාවයෙන්; තිප්පභුතීනං, තිශබ්දාදීන්ගේ; අත්තවයමාහ, අන්තව්කය කියා; පරච්ඡක්කෙකාපි, පරෂට්කයෙහිදු; යථාක්කමං, පන්තීන්; එවං, මෙසේම; යොජනීයං, යෙදියයුතුයි; කත්තුකම්මභාවවිහිතෙසු, කර්තෘකර්මභාවයෙහි කරණලද; ත්‍යාදිසු පරභූතෙසු, ත්‍යාදීන් පරකල්හි; ක්‍යලාදයො භවන්තීති, ක්‍යවිකරණ ලවිකරණාදිහු වෙත්නුයි; ක්‍යා—පෙ—කත්තරිලොති, කත්තරිලො යන, ආදිනා, මේ ආදිසූත්‍රයෙන්; තෙසංවිධානතො, ඒක්‍යලාදින්ගේ විධානය හෙතුකොටගෙන; ත්‍යාදයො, ත්‍යාදීහු; කත්තුකම්ම භාවෙසෙවච, කර්තෘකර්මභාවයෙහිම; විඤ්ඤෙය්‍යන්තීති, දන්නාලැබෙත්නුයි; කත්තරි කර්තෘකාරකයෙහි (කරණලද;) තිම්හි, තිප්‍රත්‍යයා පරකල්හි; ලො, ලවිකරණවේ; පචතියනුවේ; බහුම්හිවත්තබ්බෙ, බහවර්ථයක් කියයුතු කල්හි; අන්ති, අන්තිප්‍රත්‍යයවේ.

ඛචි-චිපදයි-විකරණානං, විකරණයන්ට; ඛචි,කිසිතැනෙක්හි ලොපොහොතීති, ලොප්වේනුයි; ලස්ස, ලවිකරණයාගේ; අකාරස්ස,

විකරණානං ක්වචි ලොපො හොතීති ලඝාකාරසස ලොපො—පච න්ති—පචසි පචථ.

**හිමිංමෙසඃසස.**

අකාරසස දීඝො හොති හිමිමෙසු-පචාමි පචාම—පරච්ඡෙකෙ—පච නෙ පචනෙත, පචසෙ පචවෙහ, පචෙ පචාමෙහ—කමෙම—කෙ‍ය්‍යා භාවකමෙම සච්චාදිනා කෙ‍ය්‍යා.

**ක්‍යස්‍ස.**

ක්‍රියනිෂ පරසස ක්‍යසස ඊඤ් වා හොති-ඤකාරෙ ආද්‍යවයවනේ, පච්යන්ති පච්චන්ති.

---

අකාරයහට; ලොපො, ලොප්වේ; පචනති යනුවේ; පචපාකෙයන ධාතු පචයි කියා තිබෙයි; අකාර උච්චාරණ පිණිසය, වර්තමානාපියෙහි වැටෙන්නාවූ ධාතුහුකෙරෙන්පරව "වත්තමානෙති අනති" යනාදි සූත්‍රයෙන් ත්‍යාදීහුවෙති, ඔවුනුදු පුරුෂවචනකාරකානියමයෙන් පත්තෙහි "පුබ්බපරච්ඡකකානං" යනාදි සූත්‍රයෙන් නියමකළහෙයින් ශෙෂකාරකයාගේ එකත්වයක් විවක්ෂිත කල්හි පූර්වෂට්කසම්බන්ධිවූ ප්‍රථමපුරුෂෛකවචනවූ තිවෙයි, වන්නේ භාවකර්මකර්තෘයෙහි විහිත ත්‍යාදීන් පරකල්හි ක්‍යලාදීන්ගේ විධානසාමර්ථ්‍යයෙන් සාධනත්‍ර යෙහි ත්‍යාදීහු දන්නාලදහුනුයි කර්තෘකාරකයක් විවක්ෂිතකල්හි කර්තෘකාරකයෙහි තිවෙයි, බහුත්වයක් විවක්ෂිතකල්හි බහුවචනවූ අනතිවේ; කර්තෘකාරකයෙහි කරණලද ප්‍රත්‍යයාපරකල්හි ධාතුහු කෙරෙන් පරව "කත්තරිලො" යන සූත්‍රයෙන් ලවිකරණවෙයි; ලකාර අප්‍රයොගීවෙයි, අකාරවකාරයෙහි සංහිතවෙයි, පචතියනුවේ. ප්‍රත්‍යයා පරකල්හි ලවිකරණයහට "ක්වචිවිකරණානං" යන සූත්‍ර යෙන් ලොප්වෙයි, පචනති යනුවේ; සො, එතෙම; පචති, දූන්පිසේ; තෙ, ඔහු; පචනති, දූන්පිසෙත්; ත්වං, තෝ; පචසි, පිසෙහි; තුමෙහ, තෙපි, පචථ, පිසහු.

හිමි-විපදයි—හිමිමෙසු, හිම්ම යන මොවුන් පරකල්හි; අකාර සස, (විකරණසම්බන්ධිවූ) අකාරයහට; දීඝො හොති, දිඝීවේ; පචාමි පචාම යනුවේ; අහං, මම, පචාමි; පිසෙමි; මයං, අපි; පචාම, පිසමු; පරෂට්කයෙහිදු අර්මෙසේමැයි;-පරච්ඡකෙක, පරෂට්කයෙහිදු (උදා හරණකියනුලැබේ;) පචතෙ යනාදිවේ; කමෙම, කර්මයෙහි (උදාහර ණකියනුලැබේ;) කෙ‍ය්‍යා භාවකමෙමසුඉති, කෙ‍ය්‍යාභාවකමෙමසු යන; ආදිනා, මේ ආදිසූත්‍රයෙන්; කෙ‍ය්‍යා, ක්‍යවිකරණවෙ.

ක්‍යසස-එකපදයි—ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; පරසස, පරවූ; ක්‍යසස, ක්‍යහට; වා, විකල්පයෙන්; ඊඤ්හොති, ඊඤ්වේ; ඤකාරෙ,

**ගුරුපුබ්බා රස්සා රෙ න්තෙ න්තීනං.**

ගුරුපුබ්බස්මා රස්සා පරෙසං න්තෙ න්තිනං රෙ වා හොති—පචියරෙ පචියන්ති පච්චරෙ පච්චන්ති, පචියසි පච්චසි පචියථ පච්චථ පචියාමි පච්චාමි පචියාම පච්චාම–පචියතෙ පච්චතෙ පචියරෙ පචියන්තෙ පච්චරෙ පච්චන්තෙ, පචියසෙ පච්චසෙ පචියව්හෙ පච්චව්හෙ, පචියෙ පච්චෙ පචියාම්හෙ පච්චාම්හෙ—භාවෙ—භූ සත්තායං—භාවස්සෙකත්තා එකවචනමෙව—තඤ්ච පඨමපුරිසෙයෙව සම්භවති—භූයති දෙවදත්තෙන, භූයතෙ වා—දෙවදත්තස්ස සම්පති භවනන්ති අත්ථො—නෙහ ඊඤ්ඤ් බහුලං විධානා.

ක්‍රියත්ථා කත්තරි ත්‍යාදී කම්මස්මිං සකම්මකා
භාවෙ චා'කම්මකා කම්ම'වචනිච්ඡායමඤ්ඤතො.

---

ඤ්ඤකාරතෙම; ආද්‍යවයවත්ථො, ආද්‍යවයවප්‍රයොජනකොට ඇත්තේයි; පචියති පච්චති යනුයෙ සො, හෙතෙම; පචියති, දූන් පිසනුලැබේ; පච්චති, පිසනුලැබේ.

ගුරු–ගුරුපුබ්බාය රස්සාය රෙයන්තෙ න්තීනංය යනු පදයි—ගුරු පුබ්බස්මා, ගුරු අක්ෂරයක්හු පූර්වකොට ඇති; රස්සා, හ්‍රස්වාක්ෂරයා කෙරෙන්; පරෙසං, පරවූ; න්තෙ න්තීනං, න්තෙ න්තීන්ට; වා, විකල්ප යෙන්; රෙහොති, රෙවේ; පචියරෙ, යනාදිවේ;—තෙ, ඔහු; පචියරෙ, පිසනුලැබෙත්; පචියන්ති, පිසනුලැබෙත්; පච්චරෙ, පිසනුලැබෙත්; පච්චන්ති, පිසනුලැබෙත්; ත්වං, තෝ; පචියසි, පිසනුලැබෙහි; තුම්හෙ නෙපි; පචියථ, පිසනුලබහු; අහං, මම; පචියාමි, පිසනුලැබෙමි; මයං, අපි; පචියාම, පිසනුලබමු; පරෂට්කයෙහිදු අර්ථ මෙම නියායි—භාවෙ, භාවයෙහි (උදාහරණ කියනු ලැබේ;) භූයනධාතු; සත්තායං, විමෙහි වැටේ; භාවස්ස, භාවයානමා; එකත්තා, එකක්බව හෙයින්; එකවචනමෙව, එකවචනමවෙයි; තඤ්ච, හෙද; පඨමපුරිසෙයෙව, ප්‍රථමපුරුෂයෙහිම; සම්භවති, සම්භවවන්නේයි; දෙවදත්තෙන, දෙවදත්තයාවිසින්; භූයති, විමයි; භූයතෙවා, භූයතෙ කියා හෝ වේ;–අර්ථ එසේමයි; දෙවදත්තස්ස, දෙවදත්තයාගේ; සම්පති, දූන්; භවනන්ති අත්ථො, විමය යන අර්ථයි; පූර්වෂට්කයෙහි භූයති යනුවෙයි—පරෂට්කයෙහි භූයතෙ යනුවේ; බහුලංවිධානා, බහුලං විධානය හෙතුකොටගෙන; ඉහ, මේභාවයෙහි; ඊඤ්ඤ්, ඊඤ්ඤ්නෙම; න, නොවේ.

ත්‍යාදී, ත්‍යාදිප්‍රත්‍යයෝ; සකම්මකා ක්‍රියත්ථා, සකර්මකධාතුහුකෙරෙන්; කත්තරි, කර්තෘකාරකයෙහිද; කම්මස්මිං, කර්මකාරකයෙහිද; හොන්ති, වෙති; අකම්මකා, අකර්මකධාතුහුකෙරෙන්; කම්මාවචනි

**භවිස්සති ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හෙ.**

භවිස්සති අනාරද්ධෙ අත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා ස්සත්‍යාදයො හොන්ති.

**අ ඊ ස්සාදීනං බ්‍යඤ්ජනස්සිඤ්.**

ක්‍රියත්ථා පරෙසං අආදීනං ඊආදීනං ස්සාදීනඤ්ච බ්‍යඤ්ජනස්සිඤ් හොති වා-ව්‍යවත්ථිතවිභාසායං ස්සති ස්සාදීනං ස්සච්චාදීනඤ්ඤාවයවො අධිප්පෙතො="ඤි බ්‍යඤ්ජනස්සා"ති සිද්ධෙපි ත්‍යාදිසු පරභූතෙසු එතෙසමෙවාති නියමත්ථොයමාරම්භො—ලස්සාකාරස්ස ලොපෙ-පචිස්සති පචිස්සරෙ පචිස්සන්ති, පචිස්සසි පචිස්සථ, පචිස්සාමි පචිස්සාම—පචිස්සතෙ පචිස්සරෙ පචිස්සන්තෙ, පචිස්සසෙ පචිස්සව්හෙ, පචිස්සං පචිස්සාම්හෙ—කම්මෙ—පචීයිස්සති.

---

චඡායං, විද්‍යමානවූකර්මය අවිවක්ෂිතකල්හි; අඤ්ඤතොව, සකර්මක ධාතුහුකෙරෙන්ද; භාවෙච, භාවයෙහිද; කත්තරිච, කර්තෘකාරකයෙහිද; (හොන්ති, වන්නාහුයි) හොන්ති යනු අධ්‍යාහාරයි.

භවිස්සති-භවිස්සතිය ස්සති ස්සන්ති යනාදි හා විපදයි—භවිස්සතියයිසේයි; අනාරද්ධෙ අත්ථෙ, පටන්නොගන්නාලද අර්ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන් පරව; ස්සත්‍යාදයො හොන්ති, ස්සති ආදිප්‍රත්‍යයෝවෙත්.

අඊස්ස-ත්‍රිපදයි—ක්‍රියත්ථාපරෙසං, ධාතුහුකෙරෙන් පරවූ; අආදීනං, අආදීන්සම්බන්ධිවූද; ඊආදීනං, ඊආදීන්සම්බන්ධිවූද; ස්සාදීනඤ්ච, ස්සාදීන් සම්බන්ධිවූද; බ්‍යඤ්ජනස්ස, බ්‍යඤ්ජනයහට; වා, විකල්පයෙන් ඉඤ්හොති, ඉඤ්වේ; ව්‍යවත්ථිතවිභාසායං, (මේවාශබ්දය) ව්‍යවස්ථිත විභාෂායෙහිවැටේ; ස්සති, ස්සයි; ස්සාදීනං, ස්සාදීන්ගේද; ස්සච්චාදීනඤ්ච, ස්සති ආදීන්ගේද; අවයවො, අවයවතෙම; අධිප්පෙතො, කැමතිවිතලදී; ඤිබ්‍යඤ්ජනස්සාති, ඤිබ්‍යඤ්ජනස්ස යන සූත්‍රයෙන්; සිද්ධෙපි, (ඉකාර) සිඩවුවද; අයං ආරම්භො, මේ සූත්‍රය; ත්‍යාදිසු, ත්‍යාදීන් පරකල්හි; එතෙසමෙවාති, මේ අඊස්ස ආදීන්ටම (ඤි ආගම වන්නේය) යන; නියමත්ථො, නියමය ප්‍රයොජනකොට ඇත්තේයි; ලස්ස, ලවිකරණයාගේ; අකාරලොපෙ, අකාරයා ලොප්කළකල්හි; පචිස්සති යනාදිවේ;-සො, හෙතෙම; පචිස්සති, අනාගතයෙහි පිසන්නේයි; තෙ, ඔහු; පචිස්සන්ති, අනාගතයෙහි පිසන්නාහුයි; මත්තෙහිදු උක්තානුසාරයෙන් අවබිණියයුතු—කම්මෙ, කර්මයෙහි (උදාහරණ කියනුලැබේ;) පචීයිස්සති යනුවේ; සො, හෙතෙම; පචීයිස්සති, අනාගතයෙහි පිසනුලැබේ.

**ක්‍යස්ස ස්සෙ.**

ක්‍යස්ස වා ලොපො හොති ස්සෙ-පචිස්සති පච්චිස්සති, පචියිස්සරෙ පචීයිස්සන්ති පචිස්සරෙ පචිස්සන්ති පච්චිස්සරෙ පච්චිස්සන්තිච්චාදි— කත්තුසමං-ක්‍යොව විසෙසො-භාවෙ-භූයිස්සති භවිස්සති, භූයිස්සතෙ භවිස්සතෙ.

**නාමෙ ගරහාවිම්හයෙසු**

නාමසද්දෙ නිපාතෙ සති ගරහායං විම්හයෙ ච ගම්‍යමානෙ ස්සත්‍යාදයො හොන්ති-ගරහායං-සාපි නාම පචිස්සතීච්චාදි-විම්හයෙ-අච්ඡරියං වත භො අබ්භුතං වත භො අන්ධො නාම පචිස්සතීච්චාදි.

**භූතෙ ඊ උං ඔ ත්ථ ඉං ම්හා ආ ඌ සෙ ව්හං අ ම්හෙ.**

භූතෙ පරිසමත්තෙ අත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා ඊ ආදයො හොන්ති—භූතානජ්ජතනෙ වක්ඛමානත්තා ඉමෙ භූතානජ්ජතනෙ භූත සාමඤ්ඤෙ ච භවන්ති.

---

ක්‍යස්ස-විපදයි—ස්සෙ, ස්ස ප්‍රත්‍යයාපරකල්හි; ක්‍යස්ස, ක්‍යවිකරණයහට; වා, විකල්පයෙන්; ලොපොහොති, ලොප්වේ; කත්තුසමං, කර්තෘකාරකයාහා සමයි; ක්‍යො, ක්‍යවිකරණයම; විසෙසො, විශෙෂ; භූයිස්සති, අනාගතයෙහිවීමයි.

නාමෙ-විපදයි-භූතවර්තමාන විභක්තීන් යථාසම්භවයෙන් ප්‍රාප්ත කල්හි ස්සත්‍යාදිවිධානය සඳහා මේ සූත්‍රය ආරබ්ධයි;—නිපාතෙ, අසඞ්ඛ්‍යවූ; නාමසද්දෙසති, නාමශබ්දයා විද්‍යමානකල්හි; ගරහායං, නින්දාවක්ද; විම්හයෙච, ආශ්චර්යයක්ද; ගම්‍යමානෙ, හැඟෙනකල්හි; ස්සත්‍යාදයො හොන්ති, ස්සති ආදීහුවෙති; ගරහායං, නින්දවක් ගම්‍යමානකල්හි; (නාමශබ්දයොගයෙහි ස්සති ප්‍රත්‍යයකියනුලැබේ;) සාපි නාම පචිස්සති ඉති, සාපිනාම පචිස්සති යන; ආදි, මේ ආදියවේ; සාපිනාම, හොත්; පචිස්සති, පිසන්නීද; විම්හයෙ, ආශ්චර්යයක් ගම්‍යමානකල්හි; (නාමශබ්දයාහා යොගයෙහි ස්සති ප්‍රත්‍යයකියනුලැබේ;) අච්ඡරියං—පෙ—පචිස්සති ඉති, පචිස්සති යන; ආදි, මේ ආදියවේ; අන්ධො නාම; අන්ධයෙක්නම්; පචිස්සති, පිසන්නේද; භො, භවත්නි; වත, ඒකාන්තයෙන්; අච්ඡරියං, ආශ්චර්යයෙකි; තභා, භවත්නි; වත ඒකාන්තයෙන්; අබ්භුතං, අද්භූතයෙකි.

භූතෙ-භූතෙය ඊ උංයනාදියහා විපදයි—භූතෙයයිසේයි; පරිසමත්තෙ අත්ථෙ, පරිසමාප්තවූ අර්ථයෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; ඊආදයොහොන්ති, ඊආදිප්‍රත්‍යයෝ වෙත්; භූතානජ්ජතනෙ, භූතානද්‍යතනයෙහිද; භූතසාමඤ්ඤෙච, භූතසාමාන්‍යයෙහිද; භවන්ති, වෙත්.

අහස්සුභයතො අඩ්ඪරත්තං වා තදුපඩ්ඪකං
අන්තො කත්වාන විඤ්ඤෙය්‍යො අහො අජ්ජතනො ඉති
තදඤ්ඤො පන යො කාලො සො'නජ්ජතනසඤ්ඤිතො.

**ආඊස්සාදීස්වඤ් වා.**

ආආදෙ ඊආදෙ ස්සාආදෙ ච ක්‍රියත්ථස්ස අඤ් වා හොති

**එය්‍යාථ ස්සෙ අ ආ ඊ ථානං ඔ අ අං ත්ථ ත්ථො ව්හොසු.**

ආසහචරිතොව අකාරො ගය්හතෙ—න පරොක්ඛා විහිතො—එ පන 'න්තෙ නිද්දෙසා න්වාදිසම්බන්ධි යෙව න සෙසව වා නිස්සිතත්තා—නිස්සයකරණම්පි හි සුත්තකාරාචිණ්ණං—එය්‍යාථාදීනං ඔආදයො වා හොන්ති යථාක්කමං න්ති ඊස්ස වා ත්ථො-අපචිත්ථො පචිත්ථො අපචව්හො පචව්හො.

---

අහස්ස, දිනයාගේ; උභයතො, දෙකොටියෙන්; අඩ්ඪරත්තං වා, අඩ්රාත්‍රියෙක්හෝ හෙවත් පසළොස් පැයක්හෝ; තදුපඩ්ඪකංවා, එයින් අඩියක්හෝ; හෙවත් සත්පැ සමාරක්හෝ; අන්තොකත්වා; ඇතුළත්කොට; අහො, දිවාභාගයතෙම; අජ්ජතනො ඉති, අජ්ජතන කාලයයි කියා; විඤ්ඤෙය්‍යො, දත යුත්තේය; තදඤ්ඤො, එයින් අන්‍යවූ; යොකාලො, යම්කාලයෙක්ඇද්ද; සොපන, ඒකාලයවනාහි; අනජ්ජතනසඤ්ඤිතො, අනද්‍යතනයයි දන්නාලදි.

ආඊ–ත්‍රිපදයි—ආආදෙ, ආආදින් පරකල්හිද; ඊආදෙ, ඊආදින් පරකල්හිද; ස්සාදෙ, ස්සාදීන්පරකල්හිද; ක්‍රියත්ථස්ස, ධාතුහට; වා, විකල්පයෙන්; අඤ්හොති, අඤ්වේ.

එය්‍යාථ–විපදයි—අකාරො, (මේසූත්‍රයෙහි) අකාරතෙම; ආසහචරිතොව, ආකාරයාහා සහචරිතවූයේම; ගය්හතෙ, ගන්නාලැබෙයි; නපරොක්ඛාවිහිතො, පරොක්‍ෂායෙහි විහිතවූයේ නොගන්නාලැබේ; එපන, එකාරවනාහි; අන්තෙ නිද්දෙසා, (ආදෙශීන්ට) අන්තයෙහි දක්වූහෙයින්; න්වාදිසම්බන්ධියෙව, (සියලු ආඛ්‍යාතික ප්‍රත්‍යයන්ට අන්තයෙහි නිර්දිෂ්ටවූ) නු ආදින් සම්බන්ධිවූයේම; ගය්හතෙ, ගන්නාලැබේ; නසෙසව වා නිස්සිතත්තා, එකාරයාගේම ග්‍රහණයහෙයින් හෝයි;—"නිස්සිතත්තාහි ගහිතත්තා" යනු පඤ්චිකායි—නිස්සයකරණම්පි, නිශ්‍රය කරණයද; සුත්තකාරාචිණ්ණං, සූත්‍රකාරයන් විසින් ආචීර්ණයි;—මේ සූත්‍රයෙහි අකාරය භූතයෙහි හා අනද්‍යතනයෙහි අකාරගතයුතුය, පරොක්‍ෂායෙහි අකාරනොගතයුතුය, එකාර වනාහි ආදෙශින්ට කෙළවර දක්වූහෙයින් සියලු ආඛ්‍යාතික ප්‍රත්‍යයන්ට කෙළවර දක්වූ නු අන්තු යනාදි සූත්‍රයෙහි එකාරම ගතයුතුය යනු අභිප්‍රායයි,—එය්‍යාථාදීනං, එය්‍යාථාදීන්ට; යථාක්කමං, පිළිවෙළින්; ඔ ආද

**ආඊඌම්හාස්සාස්සම්හානං වා.**

එතෙසං වා රස්සො හොතීති පක්ඛෙ රස්ස ච—අපචි පචි අපචි පචි

**උංස්සිංස්වංසු.**

උම්වචස්ස ඉංසු අංසු වා හොන්ති—අපචිංසු පචිංසු අපචංසු පචංසු අපචුං පචුං.

**ඔස්ස අ ඉ ත්ථ ත්ථො.**

ඔස්ස අආදයො වා හොන්ති—අපච පච අපචි පචි අපචිත්ථ පචිත්ථ අපචත්ථ පචත්ථ අපචිත්ථො පචිත්ථො අපචත්ථො පචත්ථො.

**සි.**

ඔස්ස සි වා හොති—අපචිසි පචිසි අපචසි පචසි අපචො පචො.

**ම්හාත්ථානමුඤ්.**

ම්හාත්ථානමුඤ් වා හොති—ඊආදිසම්බන්ධීනමෙව ගහණං—අපචුත්ථ පචුත්ථ

---

යො, ඔ ආදීහු; වා හොන්තීති, විකල්පයෙන් වෙත්නුයි; ඊස්ස, ඊ ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; ත්ථො, ත්ථො යනාදෙශවේ; අපචිත්ථො යනාදිවේ;—සො, හෙතෙම; අපචිත්ථො, අතීතයෙහි පිසී—මත්තෙහිදු මෙම නයයි.

ආඊ—විපදයි—එතෙසං, මේ ආඊ ආදීන්ට; වා, විකල්පයෙන්; රස්සො හොතීති, හ්‍රස්වවේනුයි; පක්ඛෙ, පක්ෂයෙක්හි; රස්ස, හ්‍රස්ව කලකල්හි; අපචි, පචි යනාදිවේ.

උංස්සිං—උංස්සය ඉංස්වංසුය යනු පදයි—උං ඉති, උං යන; අස්ස මෝහට; වා, විකල්පයෙන්; ඉංසු අංසු හොන්ති, ඉංසු අංසු යනාදෙශයෝ වෙත්; අපචිංසු, පචිංසු යනාදිවේ;—තෙ, ඔහු; අපචිංසු, (අතීතයෙහි) පිසූ; මත්තෙහිදු මෙම නයයි.

ඔස්ස—විපදයි—ඔස්ස, ඔ ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; අආදයො හොන්ති, අආදීහුවෙත්; අපච පච යනාදිවේ;—ත්වං, තෝ; අපච, අතීතයෙහි පිසී.

සි—එකපදයි—ඔස්ස, ඔ ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; සිහොති සි යනාදෙශවේ; අපචිසි යනාදිවේ.

ම්හා—ම්හාත්ථානං ය උඤ්ය යනු පදයි—ම්හාත්ථානං, ම්හාත්ථ යන මොවුන්ට; වා, විකල්පයෙන්; උඤ්හොති, උඤ්වේ; ඊ ආදිසම්බන්ධීනං එව, ඊ ආදීන් හා සම්බන්ධීවූ ම (ම්හාත්ථයන්ගේ); ගහණ ගැන්මයි;—තුම්හෙ, තෙපි; අපචුත්ථ, අතීතයෙහි පිසූ; මත්තෙහිදු මෙම නයයි.

**ඉංස්ස ච සිඤ්.**

ඉමිච්චස්ස සිඤ් වා හොති මහාපත්ථානං බහුලං—ඤකාරො ආද්‍යවයවත්ථො—අපචසිත්ථ පචසිත්ථ අපචිත්ථ පචිත්ථ අපචත්ථ පචත්ථ, අපචිසිං පචිසිං අපචසිං පචසිං අපචිං පචිං, අපචුම්හ පචුම්හ අපචුම්හා පචුම්හා අපචම්හ පචම්හ අපචම්හා පචම්හා අපචසිම්හ පචසිම්හ අපචසිම්හා පචසිම්හා අපචිම්හ පචිම්හ අපචිම්හා පචිම්හා අපචම්හ පචම්හ අපචම්හා පචම්හා—පරච්ඡක්කෙ—අපචිත්ථ පචිත්ථ අපචත්ථ පචත්ථ අපච පච අපචා පචා අපචු පචු අපචූ පචූ, අපචිසෙ පචිසෙ අපචසෙ පචසෙ, අපචිව්හං පචිව්හං අපචව්හං පචව්හං—අස්ස වා අමාදෙසෙ—අපචං පචං අපච පච අපචිම්හෙ පචිම්හෙ අපචම්හෙ පචම්හෙ—කම්මෙ—අපචියිත්ථො පචියිත්ථො අපචීයත්ථො පචීයත්ථො අපච්චිත්ථො පච්චිත්ථො අපච්චත්ථො පච්චත්ථො අපචියි පචියි අපචීයි පචීයි අපච්චි පච්චි අපච්චි පච්චි, අපචියිංසු පචියිංසු අපච්චිංසු පච්චිංසු අපචියංසු පචියංසු අපච්චංසු පච්චංසු අපචියුං පචියුං අපච්චුං පච්චුමිච්චාදි-භාවෙ-අභූයිත්ථො භූයිත්ථො අභූයත්ථො භූයත්ථො අභූයි භූයි අභූයී භූයී, අභූයිත්ථ භූයිත්ථ අභූයත්ථ භූයත්ථ අභූය භූය අභූයා භූයා—"සම්භාවනෙවා"ති ඉතො වෙති වත්තතෙ.

**මායොගෙ ඊආආදී.**

මායොගෙ සති ඊආදයො ආආදයො ච වා හොන්ති—අසක්කා

---

ඉංස්ස,—ත්‍රිපදයි;—ඉංඉති, ඉං යන; අස්ස, මොහටද; මහාපත්ථානං, මහාපත්ථ යන මොවුන්ටද; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; වා, විකල්පයෙන්; සිඤ්හොති, සිඤ්වේ; ඤකාරො, ඤකාරතෙම; ආද්‍යවයවත්ථො, ආද්‍යවයව ප්‍රයොජනකොට ඇත්තේයි; අපචිසිත්ථ පචිසිත්ථ යනාදියවේ; උත්තම පුරුෂයෙහි අපචිසිං පචිසිං යනාදිවේ-අහං, මම; අපචිසිං, අතීතයෙහි පිසීම්; මයං, අපි; අපචුම්හ; අතීතයෙහි පිසීමු;—පරච්ඡක්කෙ, පරෂට්කයෙහි; (උදාහරණ කියනු ලැබේ); අපචිත්ථ පචිත්ථ යනාදිය වේ;—අපි පූර්වෂට්කයෙහි කීතියායෙන් දතයුතු-අස්ස, අප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; අමාදෙසෙ, අංආදෙශකළ කල්හි; අපචං පචං යනාදිවේ; අපචීයිත්ථො, (අතීතයෙහි) පිසනලදී;-අභූයිත්ථො, අතීතයෙහි වීමයි; සම්භාවනෙ වාති, සම්භාවනෙවා යන; ඉතො, මේ සූත්‍රයෙන්; වෙති, වා යනු; වත්තතෙ, වැටෙත්තෙහි.

මායොගෙ—ද්විපදයි—මායොගෙ සති, (ප්‍රතිෂෙධාර්ථයෙහි වැටෙන්නාවූ) මා යන අසඞ්ඛ්‍යයා හා යොගයක් ඇතිකල්හි; ඊ ආදයො, ඊ ආදීහුද; ආආදයො, ආආදීහුද; වා හොන්ති, විකල්පයෙන් වෙත්; අයං, ආරම්භො මේ සූත්‍රයතෙම; අසක්කාලත්ථො, * අසච්කාලාඊයි;—

---

* අසක්කාලාඊයි—පොත්

ලත්ථොයමාරම්භො—මා භවං පුනපි එවරූපමපචිත්ථො ඉච්චාදි—වාවිධානතො සසත්‍යාදි එය්‍යාදි ත්‍වාදයොපි හොන්ති—මා භවං පචිස්සති, මා භවං පචෙය්‍ය, මා භවං පචතු ඉච්චාදි.

**අනජ්ජතනෙ ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ.**

අවිජ්ජමානජ්ජතනෙ භූතත්ථෙ වත්තමානතො ක්‍රියත්ථා ආආදයො හොන්ති—වා ත්ථෙ රස්සෙ ච—අපචත්ථ පචත්ථ අපච පච අපචා පචා, අපචු පචු අපචූ පචූ—ඔ—අපච පච අපචි පචි අපචත්ථ පචත්ථ අපචත්ථො පචත්ථො අපචසි පචසි අපචො පචො අපචත්ථ පචත්ථ අපචං පචං අපච පච, අපචම්හ පචම්හ අපචම්හා පචම්හා—අපචත්ථ පචත්ථ, අපචත්ථුං පචත්ථුං අපචසෙ පචසෙ, අපචව්හං පචව්හං අපචසිං පචසිං අපචිං පචිං අපචම්හසෙ පචම්හසෙ—කමෙම—අපචියත්ථ පචියත්ථ අපච්චත්ථ පච්චත්ථ අපචිය පචිය අපචියා පචියා අපච්ච පච්ච අපච්චා පච්චා, අපචියු පචියු, අපචියූ පචියූ, අපච්චු පච්චු අපච්චූ පච්චූච්චාදි—භාවෙ—අභූයත්ථ භූයත්ථ අභූය භූය අභූයා භූයා—අභූයත්ථ භූයත්ථ—“මායොගෙ ඊආආදී”ති ඉමිනා මායොගෙපි ආආදයො හොන්ති-මා භවං අපචිත්ථ ඉච්චාදි

භූතය හා අනද්‍යතනකාලය හැර අන්‍යකාලයෙහිවිම ප්‍රයොජන කොට ඇත්තේයයිසේයි-භවං, පින්වත්තෙම; පුනපි, නැවතද; එව රූපං, මෙබඳුවූ (ඔදනයක්); මා අපචිත්ථො, නහමක් පිසේවා;-මෙහි මා ශබ්දය එෂ්‍යත්ක්‍රියාව වළකා-වා විධානතො, (ඊ ආදීන්ගේ) විකල්ප විධානය හෙතුකොටගෙන; සසත්‍යාදි එය්‍යාදිත්වාදයොපි, සසත්‍යාදි එය්‍යාදි ත්වාදීහුද; හොන්ති; වෙත්, මාභවං—පෙ—පචතු යන; ආදි, මේආදියවේ; භවං, පින්වත්තෙම; මා පචිස්සති, මතු නොපිසන්නේයි; මාපචෙය්‍ය, මතුනොපිසන්නේයි; මා පචතු, මතුනොපිසේවා.

අනජ්ජ—අනජ්ජතනෙය ආ ඌ ඔ යනාදි හා විපදයි-අවිජ්ජමානජ්ජතනෙ, අවිද්‍යමානවූ අද්‍යතනඇති; භූතත්ථෙ වත්තමානතො, භූතාර්ථයෙහි වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; අආදයො හොන්ති, අආදීහුවෙත්; වා, විකල්පයෙන්; ත්ථෙ, (ආකාරයහට) ත්ථද; රස්සෙච, හ්‍රස්වද කළකල්හි; අපචත්ථ පචත්ථ යනාදිවේ;—සො, හෙතෙම; අපචත්ථ, (අතීත රාත්‍රියගේ මධ්‍යම යාමයෙහි පටන් යට) පිසී; මත්තෙහිදු, මෙම නයයි—ඔ, ඔ ප්‍රත්‍යයවේ; අපචපච යනාදිවේ;—මායොගෙ ඊ ආආදීති, මායොගෙ ඊ ආආදියන; ඉමිනා, මේ සූත්‍රයෙන්; මායොගෙපි, මා ශබ්දයා හා යොගයක් ඇතිකල්හිදු; ආආදයො, ආආදීහුවෙත්; මාභවංඅපචත්ථඉති, මාභවංඅපචත්ථයන; ආදි, මේ ආදියවේ.

**පරොක්ඛා අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ.**

අපච්චක්ඛෙ භූතානජ්ජතනෙ වත්තමානතො ක්‍රියත්ථා අආද යො හොන්ති—අපරොක්ඛෙසූති වචනා න විකරණුප්පත්ති

**පරොක්ඛායඤ්ච.**

පරොක්ඛායං පඨමමෙකස්සරං සද්දරූපං ද්වෙ භවති

**ලොපො'නාදිබ්‍යඤ්ජනස්ස.**

ද්විත්තෙ පුබ්බස්සාදිතො'ඤ්ඤස්ස බ්‍යඤ්ජනස්ස ලොපො හොති-පපච පපචු' පපචෙ පපචිත්ථ-ඉඤ්ඤභාවපක්ඛෙ සංයොගාදි ලොපො-පපචත්ථ, පපච පපචිම්හ, පපචිත්ථ පපචත්ථ පපචිරෙ, පපචිත්ථො පප චත්ථො පපචිව්හො, පපචි පපචිම්හෙ—එවං කමෙමපි-ගාවෙ.

---

පරොක්ඛෙ—විපදයි—"අක්ඛානං පරං අක්ඛෙහි වා පරං" යන වාක්‍යයෙහි සමාසවෙයි, මෙම නිපාතනයෙන් පරශබ්දයාගේ පූර්වනි පාතනය වෙයි, අක්ඛශබ්දයාගේ ආදිහට ඔකාරයෙක් වෙයි, පූර්වස්වර ලොප්වෙයි, පරොක්ඛං යනුවේ; පරොක්ඛනම් ඉන්ද්‍රියයන්ට අවිෂයයි-අපච්චක්ඛෙ, අප්‍රත්‍යක්ෂවූ; භූතානජ්ජතනෙ, භූතානද්‍යතනාර්ථ යෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; අආ දයො හොන්ති, අආදිහුවෙත්; අපරොක්ඛෙසූති, අපරොක්ඛෙසුයි; වචනා, කීහෙයින්; නවිකරණුප්පත්ති, විකරණයන්ගේ උත්පත්තිය නැති.

පරෝ—විපදයි—පරොක්ඛායං, පරොක්ෂායෙහි කරණලද ප්‍රත්‍ය යන් පරකල්හි; පඨමං, ප්‍රථමවූ; එකස්සරං සද්දරූපං, එකස්වරවූ ශබ්දරූපනෙම; ද්වෙභවති, ද්විත්වවේ.

ලොපො—ලොපොය අනාදිබ්‍යඤ්ජනස්සය යනු පදයි—ද්විත්තෙ පුබ්බස්ස, ද්විත්වයෙහි පූර්වයාසම්බන්ධිවූ; ආදිතො, ආදිවර්ණයාකෙරෙන්; අඤ්ඤස්ස බ්‍යඤ්ජනස්ස, අන්‍යවූ ව්‍යඤ්ජනයහට; ලොපොහොති, ලොප්වේ; පපච පපචු යනාදිවේ;—පචපාකෙ යන ධාතු පචයි කියා තිබෙයි, අප්‍රත්‍යක්ෂවූ භූතානද්‍යතනයෙහි වැටෙන්නාවූ ධාතුහු කෙරෙන් පරව "පරොක්ඛා අ උ එ ත්ථ" යනාදි සූත්‍රයෙන් පරෂට්ක සම්බන්ධිවූ ප්‍රථම පුරුෂෛක වචනවූ අ වෙයි, පරොක්ෂායෙහි විහිතවූ ප්‍රත්‍යයා පරකල්හි ල විකරණනොවෙයි, පරොක්ෂායෙහි කරණලද ප්‍රත්‍යයා පරකල්හි ප්‍රථමවූ එකස්වරවූ ශබ්දස්වරූපයනෙම "පරොක්ඛායඤ්ච" යන සූත්‍රයෙන් පච පච යි කියා ද්විත්වවෙයි, ද්විත්වයෙහි පූර්වයා සම්බන්ධිවූ ආදිව්‍යඤ්ජනයාකෙරෙන්අන්‍යවූ ව්‍යඤ්ජනයහට "ලොපො නාදිබ්‍යඤ්ජනස්ස" යන සූත්‍රයෙන්ලොප්වෙයි, පරඅකාර චකාරයෙහි සංහිතවෙයි, පපචයනුවේ, සො, හෙතෙම; අපපච, අතීතයෙහිපිසීය;

**හූසස වුක්.**

අආදිසු හූසස වුක් හොති

**පුබ්බස්ස අ.**

අආදිසු ද්විත්ත පුබ්බස්ස හූසස අ හොති.

**චතුත්ථදුතියානං තතියපඨමා.**

ද්විත්ත පුබ්බසං චතුත්ථදුතියානං තතියපඨමා හොන්ති යථාක්කමං නාති බකාරෙ-බභූව බභූවිත්ථ

---

මත්තෙහිදු අථ මෙම නයයි—ඉඤ්ඤභාවපක්ඛෙ, ඉඤ්ඤගමනුවූ පක්ෂයෙහි; සංයොගාදිලොපො, සංයොගාදිහට ලොප්වේ; පපච්ථ යනුවේ; කම්මෙපි, කර්මකාරකයෙහිදු; එවං, මෙසේමැයි;-ක්‍යවිකරණ නොවන හෙයින් කර්මකාරක යෙහිදු රූපමෙම නියාමයයිසේයි—භාවෙ, භාවයෙහි (උදාහරණ කියනු ලැබේ.

හූසස—ෂ්පදයි—අආදිසු, අආදීන් පරකල්හි; හූසස, හූධාතුහට; වුක්හොති, වුක්වේ.

පුබ්බ—ෂ්පදයි—අආදිසු, අආදීන් පරකල්හි; ද්විත්ත පුබ්බස්ස, ද්විත්වයෙහි පූර්වවූ; හූසස, හූධාතුහට; අහොති, අකාරාදෙශවේ.

චතුත්—ෂ්පදයි—ද්විත්ත පුබ්බසං, ද්විත්වයෙහි පූර්වවූ; චතුත්ථදුතියානං, චතුර්ථද්විතීයාක්ෂරයන්ට; යථාක්කමං, පනාතින්; තතියපඨමා හොන්තිති, තෘතියප්‍රථමාක්ෂරයෝ වෙත්නුයි; බකාරෙ, බකාරාදෙශ කළකල්හි; බභූව යනුවේ;—හූසත්තායං යන ධාතුහුකෙරෙන් භාවයෙහි පරොක්ෂා අප්‍රත්‍යයවෙයි, අප්‍රත්‍යයා පරකල්හි හූධාතුහට “හූසසවුක්” යන සූත්‍රයෙන් වුක්වෙයි, වන්නේ “ඤකානුබන්ධාද්‍යන්තා” යන පරිභාෂා සූත්‍රසාමර්ථ්‍යයෙන් අන්තාවයවවෙයි, උකාර උච්චාරණ පිණිසය, කකාර අන්තාවයව පිණිසය, වකාරමාත්‍රයක් තිබෙයි, පරොක්ෂායෙහි කරණලද ප්‍රත්‍යය පරකල්හි ප්‍රථමවූ එකස්වරවූ ශබ්දරූපයනෙම “පරොක්ඛායඤ” යන සූත්‍රයෙන් භූව් භූව් කියා ද්විත්වවෙයි, ද්විත්වයෙහි පූර්වවූ ආදි ව්‍යඤ්ජනයා කෙරෙන් අන්‍යවූ ව්‍යඤ්ජනයහට “ලොපොනාදි ව්‍යඤ්ජනස්ස” යන සූත්‍රයෙන් ලොප්වෙයි, ද්විත්වයෙහි පූර්වයහට “රස්සො පුබ්බස්ස” යන සූත්‍රයෙන් හ්‍රස්වවෙයි, ද්විත්වයෙහි පූර්වවූ චතුර්ථාක්ෂරයහට “චතුත්ථ දුතියානං තතිය පඨමා” යන සූත්‍රයෙන් ද්විතීයාක්ෂරයෙක්වෙයි, බභූව යනුවේ, තෙන, ඔහු විසින්; බභූව, වීමලූ; පරශ්වෛකයෙහි බභූවිත්ථ යනුවේ-අර්ථ එමැයි.

**එය්‍යාදෙ වා'තිපත්තියං ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථස්සිංසු ස්සසෙ ස්සව්හෙ *ස්සං ස්සාම්හසෙ.**

එය්‍යාදෙ විසයෙ ක්‍රියාතිපත්තියං ස්සාදයො හොන්ති විභාසා-විරු
ඬප්පච්චයොපනිපාතනො කාරණවෙකල්ලතො වා ක්‍රියායාතිපතන
මතිප්පත්ති ක්‍රියාතිපත්ති-එතෙවස්සාදයො සාමත්ථියා තීතානාගතෙ
ස්වෙවහොන්ති — න වත්තමානෙ තත්‍ර ක්‍රියාතිපත්ත්‍යසම්භවා — ආර්
ඉච්චාදිනාවා රස්සෙ-අපචිස්ස පචිස්ස අපචිස්සා පචිස්සා, අපචිස්සංසු
පචිස්සංසු ස්සස්ස එය්‍යාථාදිනා වා අකාරෙ-අපචිස්ස පචිස්ස අපචි
ස්සෙ පචිස්සෙ, අපචිස්සථ පචිස්සථ, අපචිස්සං පචිස්සං, අපචිස්සම්හ
පචිස්සම්හ අපචිස්සම්හා පචිස්සම්හා, අපචිස්සථ පචිස්සථ, අපචිස්සිංසු
පචිස්සිංසු, අපචිස්සසෙ පචිස්සසෙ, අපචිස්සව්හෙ පචිස්සව්හෙ, අපචි
ස්සංපචිස්සං, අපචිස්සාම්හසෙ පචිස්සාම්හසෙ-කමෙම-අපචියිස්ස පචියි
ස්ස අපචියිස්සා පචියිස්සා- ක්‍යස්ස වා ලොපෙ-අපචිස්ස පචිස්ස අපචි
ස්සා පචිස්සා අපච්චිස්ස පච්චිස්ස අපච්චිස්සා පච්චිස්සා, අපචියිස්සංසු
පචියිස්සංසු අපචිස්සංසු පචිස්සංසු,, අපච්චිස්සංසු පච්චිස්සංසු, ඉච්චාදි-
භාවෙ — අයිභුස්ස භුයිස්ස අයිභුස්සා භුයිස්සා, අභුයිස්සථ භුයිස්සථ —
වාති කිං, දක්ඛිණෙන චෙ ගමිස්සති නසකටම්පරියා භවිස්සති

---

එය්‍යා — එය්‍යාදෙයවාය අතිපත්තියංය ස්සාස්සංසු යනාදි හා ත්‍රිප
දයි — එය්‍යාදෙ විසයෙ, (අනන්තරසූත්‍රයෙන් විධීයමානවූ) එය්‍යාදීන්
වනවිෂයෙහි; ක්‍රියාතිපත්තියං, ක්‍රියාතිපත්තිය ගම්‍යමානකල්හි; ස්සා
දයොහොන්ති, ස්සාදිප්‍රත්‍යයෝවෙත්; විරුඬප්පච්චය, විරුඬප්‍රත්‍යයන්
ගේ; උපනිපාතනො, ළහවීමෙන් හෝ; කාරණවෙකල්ලතොවා, කාර
ණවෛකල්‍යයෙන් හෝ; ක්‍රියාය, ක්‍රියාවගේ; අතිපතනංයයිසේයි;
අතිප්පත්ති, නොනිපැද්ම; ක්‍රියාතිපත්ති, ක්‍රියාතිපත්ති නම්වේ; එතෙ
වස්සාදයො, මේස්සාදීහුද; සාමත්ථියා, (ප්‍රයොග) සාමර්ථ්‍යයෙන්; අතී
තානාගතෙස්වෙව හොන්ති, අතීතාර්ථයෙහි හා අනාගතාර්ථයෙහිම
වෙති; න වත්තමානෙ, වර්තමානාර්ථයෙහි නොවෙත්; කුමක්හෙයින්ද
යත්? තත්‍ර, ඒ වර්තමානකාලයෙහි; ක්‍රියාතිපත්ත්‍යසම්භවා, ක්‍රියාති
පත්තියගේ සම්භවයක්නැතිහෙයිනි; ආර්ඉති, ආ ර් යන; ආදිනා, මේ
ආදි සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; රස්සෙ, හ්‍රස්වකළකල්හි; අපචිස්ස
පචිස්ස යනාදිවේ; — සො, හෙතෙම; අපචිස්ස, (කාරණ වෛකල්‍ය
යෙක් නොවීනම්) පිසූයේයි; මත්තෙහිදු අපි මෙම නයයි. ස්සස්ස,
ස්සප්‍රත්‍යයහට; එය්‍යාථාදිනා, එය්‍යාථාදිසූත්‍රයෙන්; වා, විකල්පයෙන්
අකාරෙ, අකාරාදෙශකළකල්හි; අපචිස්ස, පචිස්ස යනාදිවේ; ක්‍යස්ස,
ක්‍යවිකරණයහට; වා, විකල්පයෙන්; ලොපෙ, ලොප්කළකල්හි; අප
චිස්ස පචිස්ස යනාදිවේ; වාතිකිං-පෙ-භවිස්සති යන තන්හි ස්සාදීන්
නොවන පිණිසයි.

---

*ස්සිං ඇතැම්.

**හෙතුඵලෙසෙවෙය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම එථ එරං එථො එය්‍යවෙහො එය්‍යං එය්‍යාමෙහෙ.**

හෙතුභූතායං ඵලභූතායච ක්‍රියායං වත්තමානතො ක්‍රියත්ථා එය්‍යාදයො වා හොන්ති.

**එය්‍යෙය්‍යාසෙය්‍යන්නං ටෙ.**

එය්‍ය එය්‍යාසි එය්‍යමිච්චෙසං ටෙ වා හොති-පචෙ පචෙය්‍ය

**එය්‍යුංස්සුං.**

එය්‍යුමිච්චස්ස උං වා හොති-පචුං පචෙය්‍යුං, පචෙ පචෙය්‍යාසි,-වා ඔකාරෙ—පචෙය්‍යාථො පචෙය්‍යාථ, පචෙය්‍යාමි

**එය්‍යාමස්සෙමු ච.**

එය්‍යාමස්ස එමු වා හොති උ ච—පචෙමු පචෙය්‍යාමු පචෙය්‍යාම, පචෙථ පචෙරං පචෙථො පචෙය්‍යවෙහො, පචෙ පචෙය්‍යං පචෙය්‍යාමෙහෙ—කම්මෙ—පච්චියෙ පච්චියෙය්‍ය පච්චෙ පච්චෙය්‍ය, පච්චියුං පච්චියෙය්‍යුං පච්චුං පච්චෙය්‍යුමිච්චාදි භාවෙ-භූයෙ භූයෙය්‍ය, භූයෙථ.

වාතිකිං දක්ඛිණෙන චෙ ගමිස්සති නාසකටම්පරියා භවිස්සති.

පාතො පචෙය්‍ය චෙ භුඤ්ජෙ ඉච්චෙවත්ථ පචනක්‍රියා
හෙතුභූතාති විඤ්ඤෙය්‍යා ඵලත්ථභුඤ්ජනක්‍රියා

---

හෙතු—ත්‍රිපදයි—හෙතුභූතායං, හෙතුවූද: ඵලභූතායඤ්ච, ඵල වූද; ක්‍රියායං, ක්‍රියාවෙහි; වත්තමානතො, වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; එය්‍යාදයො, එය්‍යාදි ප්‍රත්‍යයෝ; වා හොන්ති, විකල්පයෙන්වෙත්.

එය්‍ය—ද්විපදයි—එය්‍ය එය්‍යාසි එය්‍යං ඉති, එය්‍ය එය්‍යාසි එය්‍යං යන; එසං, මොවුන්ට; වා විකල්පයෙන්; ටෙහොති, ටෙ වේ; පචෙ පචෙය්‍ය යනුවේ.

එය්‍යුංස්සුං—එය්‍යුංස්සය උංය යනු පදයි—එය්‍යුං ඉති, එය්‍යුං යන; අස්ස, මෝහට; වා, විකල්පයෙන්; උංහොති, උංවේ; පචුං, පචෙය්‍යුං යනාදිවේ; වා, විකල්පයෙන්; ඔකාරෙ, (එය්‍යාථාදි සූත්‍රයෙන්) ඔකාර කළකල්හි; පචෙය්‍යාථො යනුවේ.

එය්‍යා—එය්‍යාමස්සය එමුය චය යනු පදයි—එය්‍යාමස්ස, එය්‍යාම ප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; එමුහොති, එමුවෙයි; උච, උකාර යෙක්දවේ; පචෙමු යනාදියවේ; වාතිකිං-පෙ-භවිස්සති යන තන්හි එය්‍යාදීන් නොවන පිණිසයි;—චෙ, ඉදින්, දක්ඛිණෙනගමිස්සති, දක්ෂිණභාගයෙන් ගියේවීනම්; නාසකටම්පරියා භවිස්සති, ශකටය නොපෙරළා යන්නේයිසේයි.

**සත්‍යරහෙස්වෙය්‍යාදී.**

සත්තියං අරහත්ථේ ච ක්‍රියත්ථා එය්‍යාදයො හොන්ති–භවං ඛලු භත්තං පචෙය්‍ය, භවං සමත්ථො, භවං අරහො.

**සම්භාවනෙ වා.**

සම්භාවනෙ ගම්‍යමානෙ ධාතුනා වුච්චමානෙ ච එය්‍යාදයො හොන්ති විභාසා–අපි භවං ගිලිතං පාසාණං පචෙය්‍ය උදරග්ගිනා–සම්භාවෙමි සද්දහාමි භවං පචෙය්‍ය, භවං පචිස්සති, භවං අපචි.

**පඤ්හපත්ථනාවිධිසු.**

පඤ්හාදිසු ක්‍රියත්ථතො එය්‍යාදයො හොන්ති

පඤ්හා සම්පුච්ඡනං ඉට්ඨා සිංසනං යාචනං දුවෙ
පත්ථනා භත්තියා වාථ න වා ව්‍යාපාරණා විධි.

---

වෙ, ඉදින්; පාතොපචෙය්‍ය, උදෑසන පිසුයේවිනම්; භුඤ්ජ ඉති, කෑයෙම්වෙයි යන; එත්, මෙහි; පචනක්‍රියා, පචනක්‍රියානොම; හෙතුභූතාඉති, හෙතුවූවයි; විසෙසණයා, දනයුත්තිය; අනුභවක්‍රියාතු, අනුභවක්‍රියාව වනාහි; ඵලන්ති, ඵලවූවයි; විසෙසණයා, දනයුත්තිය.

සත්‍ය—විපදයි—සත්තියං, සාමර්ථ්‍යයෙහිද; අරහත්ථෙච, අර්හාර්ථයෙහිද වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන් පරව; එය්‍යාදයො හොන්ති, එය්‍යාදි ප්‍රත්‍යයෝවෙත්; භවං, පින්වත්තෙම; ඛලු, එකාන්තයෙන්; භත්තං, බත; පචෙය්‍ය, පිසන්නේයි; භවං, පින්වත්තෙම; සමත්ථො, බත්පිසීමට සමර්ථයි; භවං, පින්වත්තෙම; අරහො, බත්පිසීමට යොග්‍යයි;—මේ පදවය පූර්වපදයාගේ විවරණය පිණිස කථිතයි,

සම්භාව—විපදයි—සම්භාවනෙ, සම්භාවනාවක්; ගම්‍යමානෙ, ගම්‍යමානකල්හිද; ධාතුනාවුච්චමානෙච, ධාතුහු විසින් (සම්භාවනාව) කියනු ලබනකල්හිද; විභාසා, විකල්පයෙන්; එය්‍යාදයො හොන්ති, එය්‍යාදීහුවෙත්; භවං, පින්වත්තෙම; ගිලිතං, ගලනලද; පාසාණං අපි, පහණකුදු පචා; උදරග්ගිනා, ජඨරාග්නියෙන්; පචෙය්‍ය, පිසන්නේයි; භවං, පින්වත්තෙම; පචෙය්‍ය, පිසන්නේවිනම්; සම්භාවෙම්යයිසේයි; සද්දහාමි, හදහම්; භවං, පින්වත්තෙම; පචිස්සති, මතුපිසන්නේවිනම්; භවං, පින්වත්තෙම; අපචි, පිසුයේවිනම්; සම්භාවෙම්යයිසේයි; සද්දහාමි, හදහම්.

පඤ්හ—එකපදයි—පඤ්හාදීසු, ප්‍රශනාදියෙහි වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; එය්‍යාදයො හොන්ති, එය්‍යාදි ප්‍රත්‍යයෝවෙත්.

පඤ්හා, ප්‍රශනනම්; සම්පුච්ඡනං, විචාරීමයි; පත්ථනා, ප්‍රාර්ථනානම්; ඉට්ඨාසිංසනං, ඉෂ්ටයක් කැමත්වීමය; යාචනං, යාච්ඤාවය යන; දුවෙ, දෙදෙනය; විධි, විධිනම්; භත්තියා, ආදරයෙන් හෝ; අථ, නැවත; නවා, අනාදරයෙන් හෝ; ව්‍යාපාරණා, මෙහෙයීමයි.

පඤ්හෙ, කිං සො භත්තං පචෙය්‍ය උදාහු බ්‍යඤ්ජනං වා-පත්ථනායං, අහො වත සො පචෙය්‍ය මෙ-විධිම්හි, භවං භත්තං පචෙය්‍ය

**තු අන්තුහිථමිමතං අන්තං ස්සු ව්හො එආමසෙ.**

පඤ්හපත්ථනාවිධීස්වෙතෙ හොන්ති ක්‍රියත්ථතො-පචතු පචන්තු.

**හිස්සතො ලොපො.**

අතො පරස්ස හිස්ස වා ලොපො හොති-පච පචාහි-ථස්ස වාව්හොක් —පචව්හො පචථ, පචාමි පචාම, පචතං පචන්තං, පචස්සු පචව්හො, පචෙ පචාමසෙ-කම්මෙ-පචීයතු පච්චතු පචියන්තු පච්චන්තු ඉච්චාදි —භාවෙ, භූයතු භූයතං-පචිතුං පයුත්තොති වචනිච්ඡායං

**පයොජකව්‍යාපාරෙ ණි ණාපී ච.**

කත්තාරං යො පයොජෙති තස්ස ව්‍යාපාරෙ ක්‍රියත්ථා ණිණාපි හොන්ති බහුලං-"අස්සාණානුබන්ධො"ති ආ-පයොජකව්‍යාපාරෙ ණිණාපීනං විධානා තදන්තස්ස ක්‍රියත්ථාති පාවිසද්දතො ත්‍යාදයො.

---

පඤ්හෙ, ප්‍රශ්නයෙහි (එය්‍යාදීන්ගේ ප්‍රයොගය කියනු ලැබේ); සො, හෙතෙම; භත්තං පචෙය්‍යකිං, බත්පිසේද; උදාහු, නොහොත්; බ්‍යඤ්ජනං වා, ව්‍යඤ්ජන පිසේද; පත්ථනායං, ප්‍රාර්ථනායෙහි (එය්‍යාදි ප්‍රයොගය කියනුලැබේ); සො, හෙතෙම; මෙ, මට; පචෙය්‍ය, පිසූයේ වීනම්; අහොවත, ඉතා යෙහෙකි; විධිම්හි, විධියෙහි; (එය්‍යාදි ප්‍රයොගය කියනුලැබේ); භවං, පින්වත්තෙම; පත්තං, පාත්‍රය; පචෙය්‍ය, පිසේවා.

තු අන්තු—එකපදයි—පඤ්හපත්ථනාවිධීසු; ප්‍රශ්නප්‍රාර්ථනා විධි යෙහි වැටෙන්නාවූ; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන් පරව; එතෙහොන්ති, මේතු ආදි ප්‍රත්‍යයෝවෙත්; පචතු යනාදියවේ;-සො, හෙතෙම; පචතු, පිසේවා.

හිස්ස—හිස්සය අතොය ලොපොය යනු පදයි—අතොපරස්ස, අකාරයාකෙරෙන් පරවූ; හිස්ස, හිහට; වා, විකල්පයෙන්; ලොපො හොති, ලොප්වේ; පච පචාහි යනුවේ; ථස්ස, ථප්‍රත්‍යයහට; වා, විකල්පයෙන්; ව්හොක්, ව්හොක් වේ; පචථ, පචව්හො යනාදියවේ; පචිතුං, පිසන්නට; පයුත්තොති, මෙහෙයයි යන; වචනිච්ඡායං, වචනිච්ඡාවක් ඇතිකල්හි

පයො—ත්‍රිපදයි—කත්තාරං, කර්තෘහු; යො, යමෙක්තෙම; පයොජෙති, මෙහෙයාද, තස්ස, ඒ ප්‍රයොජකයාගේ; බ්‍යාපාරෙ, (ප්‍රශ්නාධ්‍යෙෂණාදි ලක්ෂණවූ) ක්‍රියාවෙහි; ක්‍රියත්ථා, ධාතුහුකෙරෙන්; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; ණි ණාපීහොන්ති, ණි ණාපි ප්‍රත්‍යයෝවෙත්; අස්සා-පෙ-සූත්‍රයෙන්; ආ, ආකාරාදෙශවේ; පයොජකව්‍යාපාරෙ, ප්‍රයොජක

**ණිණාප්‍යාපීහි වා.**

ණ්‍යාද්‍යන්තෙහි ක්‍රියත්‍ථෙහි අපරොක්ඛෙසු කත්තුවිහිත මානන්ත ත්‍යාදිසු ලො හොති විභාසා-"යුවණ්ණානමෙ ඔ පච්චයෙ"ති එකාරෙ "එඔනමයවා සරෙ"ති අයාදෙසෙ ච—පාචයති--අඤ්ඤත්‍ර—පාචෙති-පාචයරෙ පාචයන්ති පාචෙන්තිච්චාදි—කම්මෙ—

**දීඝො සරස්ස.**

සරන්තස්ස ක්‍රියත්‍ථස්ස දීඝො හොති ක්‍යෙ—පාචීයති පාචීයරෙ පාචීයන්තිච්චාදි-වුත්තනයෙන ඤෙය්‍යං-පයොජකව්‍යාපාරෙ ණිණාප්‍යන්තානං සකම්මකත්තා න භාවෙ රූපනයො

අකම්මකාපි හොන්තෙව ණිණාප්‍යන්තා සකම්මකා
සකම්මකා ද්විකම්මාස්සු ද්විකම්මා ච ත්‍රිකම්මකා.

---

යාගේ ක්‍රියාවෙහි; ණිණාපිනංවිධානතො, ණිණාපිප්‍රත්‍යයන්ගේ විධානය හෙතුකොටගෙණ; තදන්තස්ස, ඒ (ණි ණාපි ප්‍රත්‍යයන්) අන්තකොට ඇත්තාහුගේ; ක්‍රියත්‍ථානි, ධාතුබව ඇත්තුයි; පාචිසද්දතො, පාචිශබ්දයා කෙරෙන්; හෙවත් පාචි යන ප්‍රත්‍යය ධාතුහු කෙරෙන්; ත්‍යාදයො, ත්‍යාදීහු වෙත්.

ණි ණා—විපදයි—අපරොක්ඛෙසු, පරොක්‍ෂා වර්ජිතකොට ඇති; කත්තුවිහිතමානන්තත්‍යාදීසු, කර්තෘකාරකයෙහි කරණලද මානන්ත ත්‍යාදීන් පරකල්හි; ණ්‍යාද්‍යන්තෙහි ක්‍රියත්‍ථෙහි, ණිය ණාය ආපිය යන මේ ප්‍රත්‍යයන් අන්තකොටඇති ධාතුන්කෙරෙන් පරව; විභාසා විකල්පයෙන්; ලොහොති, ලවිකරණවේ; යුවණ්ණාන මෙඔපච්ච' යෙති, යුවණ්ණානමෙඔ පච්චයෙ යන සූත්‍රයෙන්; එකාරෙ, (පාචිධාතුහුගෙ අන්තයහට) එකාරද; එඔනමයවාසරෙති, එ ඔ නමයවාසරෙ යන සූත්‍රයෙන්; නස්ස අයාදෙසෙච, ඒ (එකාරය) හට අයාදෙශදකළ කල්හි; පාචයතියනුවේ; අඤ්ඤත්‍ර, ලවිකරණනුවූ පක්‍ෂයෙහි; පාචෙති යනුවේ;-සො, හෙතෙම; පාචෙති, පිසවා; මත්නෙහිදු මෙම නයයි.

දීඝො—විපදයි—ක්‍යෙ, ක්‍යවිකරණයා පරකල්හි; සරන්තස්ස ක්‍රියත්‍ථස්ස, ස්වරාන්තවූ ධාතුහට; දීඝො, දීර්ඝවෙ; පාචීයති යනාදිවේ; වුත්තනයෙන, කියනලද ක්‍රමයෙන්; ඤෙය්‍යං, දතයුතුයි; පයොජකබ්‍යාපාරෙණි ණප්‍යන්තානං, පයොජකබ්‍යාපාරයෙහි කරණලද ණිණප්‍යන්තයන්ගේ; සකම්මකත්තා. සකර්මකබව හෙයින්; නභාවෙරූපනයො, භාවයෙහි රූපක්‍රමයනැති.

අකම්මකාපි, අකර්මකධාතුහුද; ණිණ්‍යාපන්තා, ණිණප්‍යන්තවූවාහු; සකම්මකා හොන්තෙව, සකර්මකවෙත්මැයි; සකම්මකා, සකර්මකධාතුහු ද්විකම්මකා අස්සු, ද්විකර්මකවෙති; ද්විකම්මකාච, ද්විකර්මකධාතුහුද; ත්‍රිකම්මකාඅස්සු, ත්‍රිකර්මකවෙත්.

හවිස්සති—පාචයිස්සති පාචෙස්සති පාචයිස්සරෙ පාචයිස්සන්ති පාචෙස්සරෙ පාචෙස්සන්තිච්චාදි-කම්මෙ-පාචිස්සති-ක්‍යලොපො—පාචිස්සතීච්චාදි-භූතෙ-අපාචයිත්ථො පාචයිත්ථො අපාචයත්ථො පාචයත්ථො අපාචෙත්ථො පාචෙත්ථො අපාචයි පාචයි, අපාචයි පාචයි, අපාචයිංසු පාචයිංසු අපාචයංසු පාචයංසු.

**ඒඔන්තා සුං.**

එආදෙසතො ඔආදෙසතො ච පරස්ස උම්ච්චස්ස සුං වා හොති—අපාචයසුං පාචයසුං අපාචෙසුං පාචෙසුං අපාචයුං පාචයුමිච්චාදි—උස්ස සුමෙව විසෙසො—කම්මෙ-අපාචියිත්ථො පාචියිත්ථො අපාචියත්ථො පාචියත්ථො අපාචියි පාචියි අපාචියී පාචියී ඉච්චාදි—අනජ්ජතනෙ-අපාචයත්ථ පාචයත්ථ අපාචෙත්ථ පාචෙත්ථ අපාචය පාචය අපාචයා පාචයා අපාචයු පාචයු අපාචයූ පාචයූ ඉච්චාදි-කම්මෙ-අපාචියත්ථ පාචියත්ථ අපාචිය පාචිය අපාචියා පාචියා ඉච්චාදි-පරොක්ඛ—

**රස්සො පුබ්බස්ස.**

විනෙන පුබ්බස්ස සරො රස්සො හොති—පපාචය පපාචයු පපාචයෙ පපාචයිත්ථ පපාචෙත්ථ ඉච්චාදි—කම්මෙ—සබ්බං කත්තුසමං-අත්පත්තියං-අපාචයිස්ස පාචයිස්ස අපාචයිස්සා පාචයිස්සා අපාචයිස්සංසු පාචයිස්සංසු ඉච්චාදි—කම්මෙ—අපාචියිස්ස පාචියිස්ස අපාචියිස්සා පාචියිස්සා අපාචිස්ස පාචිස්ස අපාචිස්සා පාචිස්සා ඉච්චාදි-හෙතුඵලෙසු-පාචයෙ පාචයෙය්‍ය පාචයුං පාචයෙය්‍යුමිච්චාදි—කම්මෙ—පාචියෙ පාචියෙය්‍ය පාචියෙය්‍යමිච්චාදි—න්‍යාදිසු-පාචයතු පාචෙතු පාචයන්තු පාචෙන්තු ඉච්චාදි-කම්මෙ—පාචියතු පාචියන්තු ඉච්චාදි-ණාපිම්හි-පාචාපයති පාචාපෙතීච්චාදි ණ්‍යන්තසමං-පාචයිතුම්පයුත්තිති ණ්‍යන්තතොපි ණි.

---

හවිස්සති, භවිෂ්‍යදර්ථයෙහි (උදාහරණ කියනු ලැබේ);-මත්තෙහිදු මෙබඳු තන්හි මෙම නයයි.

ඒ ඔ-එඔන්තායසුංය යනු පදයි—ඒ ආදෙසතොච, ඒ ආදෙශයා කෙරෙන්ද ඔආ දෙසතොච, ඔආදෙශයාකෙරෙන්ද; පරස්ස, පරවූ; උංඉති, උංයන; අස්ස, මෝහට; වා, විකල්පයෙන්; සුංහොති, සුංවේ; අපාචයසුං යනාදිවේ; උංස්ස, උංහට; සුමෙව, සුංකිරීමම; විසෙසො, වෙනසි.

රස්සො-විපදයි—විනෙන පුබ්බස්ස, විනවයෙහි පූර්වයාගේ; සරො, ස්වරතෙම; රස්සොහොති, හ්‍රස්වවේ; පපාචය යනාදිවේ; ණාපිම්හි, (ප්‍රයොජකව්‍යාපාරයෙහි) ණාපි ප්‍රත්‍යයකළකල්හි; පාචාපයති යනු වේ; පාචයිතුං, පිසවන්නට; පයුත්තීති, මෙහෙයයි යන; (විවක්ෂාවක් ඇතිකල්හි;) ණ්‍යන්තතොපි, ණ්‍යන්තයාකෙරෙනුදු; ණි, ණිප්‍රත්‍යයවේ

**ණිණාපීනං තෙසු.**

ණි ණාපීනං ලොපො හොති තෙසු ණිණාපීසූති පුබ්බණිලොපෙ-
පාචයති පාචෙතිච්චාදි සබ්බත්ථ ඤෙය්‍යං—ණාපිම්හෙවං.

භූවාදි නයො

---

අධුනා විකරණප්පභෙදප්පකාසනත්ථං රුධාදීනං අට්ඨගණානමා
දිභූතස්සෙකෙකස්ස ක්‍රියත්ථස්ස කානි චි රූපානි උදාහරියන්තෙ—
රුධ ආවරණෙ—න්‍යාදි

**මඤ්ච රුධාදිතො.**

රුධාදිතො අපරොක්ඛෙසු කත්තුවිහිතමානන්තත්‍යාදිසු ලො
හොති මඤ්චානන්තසරා පරො—රුන්ධති රුන්ධෙ රුන්ධතීච්චාදි—

---

ණිණා-ම්පදයි—ණිණාපීනං ණිණාපිප්‍රත්‍යයන්ට; තෙසු ණිණා
පීසු, ඒණිණාපිප්‍රත්‍යයන් පරකල්හි; ලොපොහොතීති, ලොප්වේනුයි;
පුබ්බණිලොපෙ, පූර්‍වණිහටලොප්කළකල්හි; පාචයති පාචෙති යනු
දවේ; පචපාකෙ යන ධාතුහුකෙරෙන් "පචිතුංපයොජයති" යන
වාක්‍යයෙහි "පයොජකබ්‍යාපාරෙණාපිච" යිණිවෙයි, "අස්සාණානු
[illegible] ධාතුහුකෙරෙන් "පාචයිතුං
නැවත ණිප්‍රත්‍යයකොට ඒණිප්‍රත්‍යයා පරකල්හි පූර්‍වණිහට මෙයින්
ලොප්කොට පරඉකාර පමුණුවා නිපදවූ පාචිධාතුහුකෙරෙන් ණිප්‍ර
ත්‍යයද ලවිකරණලද එ අයදකළකල්හි පාචයති යනුවෙයි; "ණිණා
පීහිවා"යි ලවිකරණනොකොට ඉහට එකළකල්හි පාචෙති යනුවේ;
ණාපිච, ණාපිප්‍රත්‍යයද; එවං, මෙසේමැයි.

භූවාදිනයො.

---

අධුනා, දැන්; විකරණප්පභෙද පකාසනත්ථං, විකරණප්‍රභෙද
ප්‍රකාශකරනු පිණිස; රුධාදීනං, රුධාදිවූ; අට්ඨගණානං, අටගණ
යත්තේ; ආදිභූතස්ස, ආදියෙහිවූ; එකෙකස්ස ක්‍රියත්ථස්ස, එකෙකී
ධාතුවක්හු සම්බන්ධිවූ; කානිචිරූපානි, කිසිරූපකෙනෙක්; උදාහරි
යන්තෙ, කියනුලැබෙත්; රුධ යන ධාතු; ආවරණෙ, වැළකීමෙහි
වැටේ.

මඤ්ච-ත්‍රිපදයි—අපරොක්ඛෙසු, පරොක්ෂාවර්ජිතකොටඇති; කත්තු
විහිතමානන්තත්‍යාදීසු, කර්තෘකාරකයෙහි කරණලද මානන්තත්‍යා
දීන් පරකල්හි; රුධාදිතො, රුධාදිධාතු ගණයාකෙරෙන්පරව; ලො
හොති, ලවිකරණවෙයි; අනන්තසරාපරො, අන්ත්‍යස්වරයාකෙරෙන්පරව;

කමෙම—"මං වා රුධාදීන"නාති වා මං-රුන්ධියති රුජ්ඣතිච්චාදි-පච්චිය සබ්බන් ඡෙදයං.

රුධාදි නයො

---

දිව කීළා විජිගිංසා වොහාරජ්ජුති ථුති ගතිසු

**දිවාදීහි යක්.**

දිවාදීහි ලවිසයෙ යක් හොති—කකාරො කානුබන්ධකාරියත්ථො—එවමුපරිච—දිබ්බති දිබ්බරෙ දිබ්බනාතිච්චාදි-කමෙම-දිවියති දිබ්බති දිවීයරෙ දිවියනාති දිබ්බරෙ දිබ්බනාතිච්චාදි

දිවාදි නයො.

---

තුද ව්‍යථනෙ

**තුදාදීහි කො.**

තුදාදීහි ලවිසයෙ කො හොති-තුදති තුදනාතිච්චාදි—කමෙම—තුදියති තුජ්ජති තුදියරෙ තුදියනාති තුජ්ජරෙ තුජ්ජනාතිච්චාදි

තුදාදි නයො

---

ජි ජයෙ.

**ජ්‍යාදීහි කනා.**

ජිආදීහි ලවිසයෙ කනා හොති—ජිනාති ජිනනාතිච්චාදි-කමෙම-ජියති ජියරෙ ජියන්තිච්චාදි

ජ්‍යාදි නයො

---

කී දබ්බවිනීමයෙ

**ක්‍යාදීහි කණා.**

කීආදීහි ලවිසයෙ කණා හොති

---

මබ, මංආගමදවේ; රුන්ධියනාදීවේ; සො, හෙතෙම; රුන්ධති, කමෙම, කම්කාරකයෙහි; මංවාරුධාදීනනාති, මංවාරුධාදීනං යන සූත්‍රයෙන්; මං, මංතෙම; වා, විකල්පයෙන්වේ; රුන්ධියතිරුජ්ඣති ච්චාදි, රුන්ධියතිරුජ්ඣති යනාදිවේ; සබ්බන්, හැමතන්හි; පච්චිය, පචපාකෙ යන ධාතුහුමෙන්; ඡෙදයං, දනයුතුයි.

රුධාදිනයො.

---

දිව, දිවා යන ධාතු; කීළා, කෙළිමය; විජිගිංසා, දිනනුකැමති බවය; වොහාර, උකතිය; ජුති, ශොභාය; ථුති, ස්තොත්‍රය, ගතිසු, ගමන යන මෙතෙක් අර්ථයෙහි වැටේ.

දිවා-විපදයි—දිවාදීහි, දිවාදිධාතුන්කෙරෙන්; ලවිසයෙ, ලවිකරණවිෂයෙහි; යක්හොති, යක්විකරණවේ; දිබ්බති, කෙළි; තුදයන ධාතු; ව්‍යථනෙ, පෙළීමෙහි වැටේ.

තුදා-විපදයි—තුදා—පෙ—ක්‍යොහොති ක්‍යවිකරණවේ; තුදතිපෙළා.

ජියනධාතු, ජයෙ, දිනීමෙහිවැටේ; ජිනාති, දිනේ; කීයනධාතු; දබ්බවිනිමයෙ, ද්‍රව්‍යපෙරළිකිරීමෙහි වැටේ.

**නාණාසු රස්සො.**

නාණාසු ක්‍රියත්ථස්ස රස්සො හොති-කිණාති කිණන්තීච්චාදි-කමෙම කියති කියරෙ කියන්තීච්චාදි

ක්‍යාදි නයො

---

සු සවණෙ

**සාදිහි ණොණා.**

සවාදිහි ලවිසයෙ ණොණා හොති-සුණොති සුණන්තීච්චාදි, කමෙම-සූයති සූයරෙ සූයන්තීච්චාදි.

සවාදි නයො

---

තන විත්ථාරෙ.

**තනාදිනො.**

තනාදීහි ලවිසයෙ ඔ හොති-තනොති තනොන්තීච්චාදි පරච්ඡකෙක

**ඔවිකරණස්සු පරච්ඡක්කො.**

ඔවිකරණස්ස උ හොති පරච්ඡක්කවිසයෙ—තනුතෙ තනුවනෙත ඉච්චාදි—කමෙම—

**තනස්සා වා.**

තනස්ස ආ හොති වා ක්‍යෙ—තායතී තඤ්ඤති තායරෙ තායන්ති තඤ්ඤරෙ තඤ්ඤන්තීච්චාදි

තනාදී නයො

---

චුර ථෙය්‍යෙ

**චුරාදිතො ණි.**

---

නාණ-විපදයි—නාණාසු, නාණා යන මොවුන් පරකල්හි; ක්‍රියත්ථස්ස, ධාතුහට; රස්සොහොති, හ්‍රස්වවේ; කිණාති, මිලයිගනී. තන යනධාතු; විත්ථාරෙ, පැතිරීමෙහිවැටේ; තනා-තනාදිතොය ඔය යනු පදයි—පරච්ඡක්කවිසයෙ, පරෂට්කවිෂයෙහි කරණලද; ඔවිකරණස්ස, ඔවිකරණයහට; උහොති, උකාරාදෙශවේ; තනොති, පැතිරේ.

තන-තනස්සය ආය වාය යනුපදයි—ක්‍යෙ, ක්‍යවිකරණයා පරකල්හි; තනස්ස, තනවිත්ථාරෙ යන ධාතුහට; වා, විකල්පයෙන්; ආහොති, ආකාරාදෙශවේ.

චුර, යනධාතු; ථෙය්‍යෙ, සොරකම් කිරීමෙහි වැටේ—චුරා—ණිපදයි—චුරාදීහි ක්‍රියත්ථෙහි, චුරාදිධාතුන්කෙරෙන්; සකත්ථෙ, ස්වාර්ථයෙහි; ණි, ණිප්‍රත්‍යයතෙම; පරො, පරවූයේ; බහුලං, ඉෂ්ටපරිද්දෙන්; හොති, වේ;-අර්ථයක් නොදැක්වූහෙයින් ස්වාර්ථයමශ්‍රැතනුයි සකත්ථෙයයි කියනලදී. චුරථෙය්‍යෙ යන ධාතුහුකෙරෙන් "චුරඉච්චයංධාතුඑව" යන වාක්‍යයෙහි "චුරාදිතොණි" යන සූත්‍රයෙන් ස්වාර්ථ

චුරාදිහි ක්‍රියපෙහි සකත්‍ථෙ ණි පරො හොති බහුලං—චොරයති චොරෙති චොරයෙරෙ චොරයන්ති චොරෙන්තීච්චාදි—කම්මෙ—චොරී යති චොරියරෙ චොරියන්තිච්චාදි.

චුරාදි නයො—ත්‍යාදයො.

—————○—————

පරත්‍ථාය මයා ලද්ධං කත්‍වාන පදසාධනං
පුඤ්ඤෙන තෙන ලොකො'යං සාධෙතු පදමච්චුතං.

සුද්ධාසයෙන පරිසුද්ධගුණොදිතෙන
සාරෙන සාරයතිසඞ්ඝනිසෙවිතෙන
රම්මෙ 'නුරාධනගරෙ වසතම්බුජෙන
විචාලිතං නිජවිසුද්ධ කුලද්ධජෙන.

මානෙනෙනන තථාගතං පටිපදායොගෙන සද්ධාලුනා
නිච්චාබද්ධතපො'නලෙහිනිබිලපපාපාරිසන්තාපිනා
සද්ධම්මව්හයසීහතෙලධිතියා චාමීකරත්‍ථාලිනා
නානාවාදිකුදිට්ඨිභෙදපටුනා වාණිච්ඡු සාමිනා.

---

යෙහි ණිප්‍රත්‍යයකොට "ලහුස්සුපන්තස්ස" යී උකාරයහට ඔකාරකොට නිපැදවූචොරි, ධාතුහුකෙරෙන් කීනියෙන් තිප්‍රත්‍යයලවිකරණ ඒ අයාදෙශකළකල්හි චොරයති යනුවේ; චොරයති, සොරකම්කෙරේ.

ත්‍යාදයො

————

පරත්‍ථාය, පරවැඩපිණිස; පදසාධනං කත්‍වා, පදසාධනනම් ප්‍රකරණයකොට; (යං, යම්කුශලයක්;) මයා, මාවිසින්; ලද්ධං, ලබන ලදද; තෙන පුඤ්ඤෙන, ඒ කුශලයකරණකොටගෙන; අයං ලොකො, මේලෝවැසිතෙම; අච්චුතං පදං නිර්‍වාණපදය; සාධෙතු, සිද්ධ කෙරේවා.

සුද්ධාසයෙන, (ඊර්‍ෂ්‍යාදිමලාපගමයෙන්) පවිත්‍රවූ අදහස්ඇති; පරිසුද්ධ, පිරිසුදුවූ; ගුණ, (ශීලාදි) ගුණයෙන්; උදිතෙන, පහළවූ; සාරෙන, (කිසිවෙකින් අචලහෙයින්) සාරවූ; යතිසඞ්ඝ, තපස්විසමූහයා විසින්; නිසෙවිතෙන, සෙවුනාලද; රම්මෙ, රම්‍යවූ; අනුරාධනගරෙ, අනුරාධපුරයෙහි; වසතං, වසන්නාවූ; විචාලිතං, පණ්ඩිතනැමැති භෘඞ්ගයන්ට; අම්බුජෙන, පද්මයක්බඳුවූ; නිජ, ස්වකීයවූ; විසුද්ධකුල, පරිසුද්ධවූකුලයට; ධජෙන, කෙතුවක් බඳුවූ.

පටිපදායොගෙන, ප්‍රතිපත්තියෙහි යෙදීමකරණකොටගෙන; තථාගතං, සර්‍වඥයා, මානෙනෙනන, පුදන්නාවූ; සද්ධාලුනා, ශ්‍රද්ධාබහු

සත්ථානං කරුණාවතා ගතවතා පාරම්පරං ධීමතා
ථෙරේනාතුමපාදපඤ්ජරගතො යො සද්දසත්ථාදිසු
මොග්ගල්ලායනවිස්සුතෙනිහ සුවච්ඡාපො විනීතො යථා
සො'කාසී පියදස්සි නාම යතිදං බ්‍යත්තං සුඛප්පත්තියා.

* වුත්තොව වුත්තමුපභොගිනියා සකාය
පීනප්පයොධරවනාපගසෙවිකාය
රම්භාවිහාරවධුයා තිලකාතුලෙන
සන්තෙන කප්පිණසමවහයමාතුලෙන.

**පදසාධනං නිට්ඨිතං.**

---

ලවූ; නිච්ච, නිරන්තරවූ; අඛණ්ඩ, නොකඩවූ; තපොනලෙහි, තපස් නැමති වහ්නින් කරණකොටගෙන; නිඛිලපාපාරි, සියලු පාප නැමති සතුරන්; සන්තාපිතා, තවනසුලුවූ; සද්ධම්මවහය, සද්ධර්මනම්වූ සිහනෙල, සිංහතෛලයාගේ; ඨිතියා, සිටීමට; චාමීකරත්ථාලිනා, සුවර්ණභාජනයක් බඳුවූ; නානාවාදි, නොයෙක් වාදීන්ගේ; කුදිට්ඨි, කුත්සිතවූ දෘෂ්ටියගේ; භෙද, බිඳීමෙහි; පටුතා, දක්ෂවූ; වාණීවධූ, වාගවධූවට; හෙවත් සරස්වතියට; සාමිනා, වල්ලභවූ.

කරුණාවතා, (පතළාවූ) කරුණා ඇති; සත්ථානං, (සියලු) ශාස්ත්‍රයන්ගේ; පාරං, පරතෙරට; පරං, වෙසෙසින්; ගතවතා, පැමිණියාවූ; ධීමතා, ප්‍රශස්තබුද්ධිඇති; ඉහ, මේලොකයෙහි; මොග්ගල්ලායනවිස්සුතෙන, මෞද්ගල්‍යායන නමින්ප්‍රසිද්ධවූ; ථෙරෙන, ස්ථවිරෙන්ද්‍රයා විසින්; ආතුමපාදපඤ්ජරගතො, තමාගේ පාදපඤ්ජරයට පැමිණියාවූ; යො, යමෙක්තෙම; සද්ද සත්ථාදිසු, ශබ්දශාස්ත්‍රාදියෙහි; සුවච්ඡාපො යථා, ගිරාපොතකයකුමෙන්; විනීතො, හික්මවනලදද; සො පියදස්සිනාමයති, ඒ ප්‍රියදර්ශිනම් තපස්විතෙම; සුඛප්පත්තියා, (ශ්‍රොතෘජනයාගේ) සුවසේ දැන්ම පිණිස; ඉදං, මේ පදසාධනනම් ප්‍රකරණය; බ්‍යත්තං, සුප්‍රකටකොට; අකාසි, කෙළේ.

යස්සාතුලං සමධිගම්ම පරප්පසාදං
සම්පාදිතං පරහිතං විපුලම්මයෙ'දං
සො සඞ්ඝරක්ඛිත ඉතීරිත නාමධෙය්‍යො
භානුව භාතු සුචිරාය මහාදිසාමි

---

* අපදුටු එකසත්තයකවත් මේ ගාථාවට ව්‍යාඛ්‍යානයක් නොපෙණේ. ග්‍රන්ථ කර්තෘගේ කෘතියකැයිද නොහැනේ

සද්ධාධනස්ස පටිපත්තිපරායනස්ස
සල්ලෙඛියෙන ලිඛිතාඛිලසික්ඛියස්ස,
ඔදුම්බරාගිගිත පබ්බතවාසිකස්ස
මෙධඞ්කරව්හය මහා යති පුඞ්ගවස්ස

සීලාදිසෙට්ඨ පටිපත්ති පරායනෙන
සිස්සොරසෙන සපරත්ථරතෙන තෙන,
ආනන්දනාම පතීතෙන තපොධනෙන
සබ්බපනො නිගදිතො පදසාධනත්ථො.

**පදසාධන සන්නය නිමි.**

PRINTED AT THE LANKABHINAWA VISSRUTA PRESS, PETTAH, COLOMBO.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු